# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2017 නොවැම්බර් 14 වන අඟහරුවාදා**
2017 **கார்த்திகை** 14 **செவ்வாய்க் கிழமை**
Tuesday 14th November 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல ,இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09. 30 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.30 **க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.30 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு.தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

## ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ
## GOVERNOR'S PROCLAMATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත නැමැති ශීර්ෂයෙන් යුතු අංක GOS/LEG/නීති කටයුතු මිශ්‍ර හා 2017.11.08 වැනි දිනැති මතු කියැවෙන පණිවිඩය බස්නාහිර පළාතේ ආණ්ඩුකාර කේ.සී. ලෝගේස්වරන් මැතිතුමා විසින් බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් මා වෙත ඉදිරිපත් කර තිබෙනවා."* එම සංදේශය,

*කේ.සී.ලෝගේස්වරන්,*
*බස්නාහිර පළාතේ,*
*ආණ්ඩුකාරවර.*

*මගේ අංකය GOS/LEG/නීති කටයුතු මිශ්‍ර*
*2017.11.08*

*ගරු සභාපතිතුමා,*
*බස්නාහිර පළාත් සභාව.*

*ගරු සභාපතිතුමනි,*

***<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත</u>***

*උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් එවන ලද අංක පීඑස්/සීඑස්ඒ/00/9/4/7 හා 2017.11.07 වැනි දිනැති ලිපියේ පිටපතක් සහ භාෂාත්‍රයෙන් සකස් කරන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතෙහි පිටපතක් 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ ව්‍යවස්ථාවේ 3 අනුව්‍යවස්ථාව යටතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම පිණිස මේ සමඟ එවමි. එම පනත් කෙටුම්පත බස්නාහිර පළාත් සභාවට ඉදිරිපත් කර පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයන් අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීමට හැකි වන පරිදි අද දින සිට දින 12 ක් ඇතුළත මා වෙත එවන මෙන් කාරුණිකව දන්වමි.*

*මීට*
*හිතවත්.*

*කේ.සී. ලෝගේස්වරන්,*
*ආණ්ඩුකාරවර,*
*බස්නාහිර පළාත.*

ගරු මහ ඇමැතිතුමනි, මේ සම්බන්ධව පොඩි ගැටලු කිහිපයක් තිබෙනවා. මම ඒකත් කියන්නම්.

අතිගරු ජනාධිපතිතුමන් විසින් ආණ්ඩුකාරතුමා වෙත එවනු ලදුව මෙම පළාත් සභාව වෙත යොමු කර ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතෙහි පිටපත් භාෂාත්‍රයෙන්ම අද දින ගරු මන්ත්‍රීතුමන්ලාගේ සභා මේසය මත තබා තිබෙනවා. මෙම පනත් කෙටුම්පත සම්බන්ධව පළාත් සභාවේ අදහස් දක්වා යැවීමේදී අනුගමනය කළ යුතු පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සහ කටයුතු පිළිබඳ කාරක සභාවේ විශේෂ රැස්වීමක් අද දින පෙ.ව. 10.30 ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට අදහස් කර තිබෙනවා. එම කාරක සභා රැස්වීමට සහා කටයුතු පිළිබඳ කාරක සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට සහභාගි වන ලෙස මම ඉතාමත්ම ගෞරවයෙන් ආරාධනා කර සිටින අතර, විශේෂයෙන් පළාත් පාලන විෂයය භාර ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, වතු යටිතල පහසුකම් පිළිබඳ විෂයය භාර

ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාටත්, මේ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම පක්ෂ කණ්ඩායම් නායකතුමන්ලාටත්, ගරු විපක්ෂ නායකතුමාටත් මෙම විශේෂ කාරක සභා රැස්වීමට සහභාගි වන ලෙසට ගෞරවයෙන් ආරාධනා කර සිටිනවා.

මෙහිදී වැදගත් තීරණ කිහිපයක් අපට ගැනීමට සිදු වෙනවා. පනත් කෙටුම්පත පිළිබඳව දැනට ලැබී ඇති කාලය ප්‍රමාණවත්ද? ඒක එක ප්‍රශ්නයක්. මොකද එතුමා ලියුම එවලා තිබෙන්නේ 08 වැනිදා. එතකොට දින 12 සම්පූර්ණ වෙන්නේ 20 වැනිදාට. අපේ ඊළඟ සභා රැස්වීම තිබෙන්නේ 21. අපට කාලය මදි වෙනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලාගෙන් අදහස් විමසනවා, මොකද කරන්නේ කියන එක.

**ගරු ඉසුරු දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් ඔබතුමා ඒක සම්බන්ධව -

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධව විග්‍රහ කිරීමෙන් අනතුරුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාව මේ සභාවේ දීර්ඝ වශයෙන් කළ යුතු කාර්යයක් බැවින්, ඒ විශේෂ සභාවක් තියන්න කාලයක්, වකවානුවක් නොමැති නිසා අපි මේ සම්බන්ධව සභාවේ එකඟතාවය විමසලා කල් ගැනීමේ අවස්ථාවක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

21 වැනිදා සභාව තිබෙනවා නේ? එහෙමනම් එදාට ගමු.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Yasapala Koralage - Deputy Chairman

එදාට ගන්නත් බැරි වෙයි. දිනයක් කියන්නේ නැතිව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩි වාක්‍යය දෙකක් තිබෙන්නේ. සතියක කාලයක් ඉල්ලා සිටිමු.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Yasapala Koralage - Deputy Chairman

අවශ්‍ය කාලයක් කල් ගන්නා මෙන් මම සභාවට යෝජනා කර සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

21 වැනිදාට දා ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

21 වැනිදා සභා රැස්වීමට දා ගනිමු. අපට ඒක එදාට අරින්න පුළුවන්.

# සභාපතිවරයාගේ නිවේදනය
ANNOUNCEMENT OF CHAIRMAN

*"අද දින පැවැත්වෙන මෙම අතිරේක සභා රැස්වීම මෙම පළාත් සභාවේ නව කාර්ය පටිපාටි රීති සංග්‍රහය කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීමට පමණක් වෙන් කර ඇති බැවින් 2017.11.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ නිර්දේශය පරිදි අද දින න්‍යාය පත්‍රයට ප්‍රශ්න සහ පෞද්ගලික පැහැදිලි කිරීම් වයන විෂයන් ඇතුළත් කර නොමැති බව කාරුණිකව දැනුම් දෙනවා."*

අද න්‍යාය පත්‍රයේ මොකුත් නැහැ. මේ කාරණය විතරයි තිබෙන්නේ.

# පෙත්සම්
PETITIONS

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, රනාල, බටගෙවත්ත, 650/24 හි පදිංචි ආර්.ඒ.එන්. රංජිත් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මීරිගම, ඉදිපරපේ, ආයුර්වේද රෝහල හි ඩී.ඒ.කේ.ජී. සෝමවර්ධන සහ ධර්මසිරි යන අයවලුන්ගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මඩපාත, කහපොල, අංක 32 හි පදිංචි ඇම්. දයාපාල ප්‍රනාන්දු යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, මට අමාත්‍යවරුන්ගේ නිවේදන යටතේ පොඩි ප්‍රකාශයක් කරන්න අවශ්‍යයි. ඒ මොකද බස්නාහිර පළාත් සභාවේ ඉදි කිරීම් කටයුතු පිළිබඳව. අපි රෝහල්වල ඉදි කිරීම් කටයුතු සඳහා අපි මේ ජනවාරි මාසයේ සිට උත්සාහ කරනවා. තවමත් සමහර ඇස්තමේන්තු හදලා නැහැ. මේ අඩුව බස්නාහිර පළාතේ තිබෙනවා. අපේ විතරක් නොවෙයි. අධ්‍යාපන අමාත්‍යාංශයේත් මේ ප්‍රශ්නය තිබෙනවා. කාර්මික නිලධාරීන්ගේ අඩුව. ඒක නිසා මේකේ දෝෂාරෝපණය අන්තිමට එන්නේ ඇමැතිවරයාට. ඒක නිසයි මේ සභාව දැනුවත් කළේ, අපි කෝටි ගණනක මුදලක් වෙන් කරලා තිබෙනවා. නමුත් ඒ වැඩේ වෙන්නේ නැහැ. එක එක කොමිටි පත් කරගෙන, ඒ කොමිටිවලට මේ ලියකියවිලි එහෙට මෙහෙට මාරු වෙනවා. ගිහිල්ලා ඇස්තමේන්තු හැදුවාට පස්සේ තව කාරණයක් තිබෙනවා, UD එකෙන් අනුමැතිය ගන්න ඕනෑ. UD එකට ඇරියාම කියනවා, පහත් බිම් එකට අරින්න කියලා. පහත් බිම් එකට ඇරියාම කියනවා, පරිසර එකට අරින්න කියලා. මේක හරිම ප්‍රශ්නයක්. මේ බස්නාහිර පළාත් සභාවේ විතරක් නොවෙයි. පළාත් සභාවල මේක ලොකු ගැටලුවක් තිබෙනවා. ආණ්ඩුව සීඝ්‍ර සංවර්ධනයක් කරා යන්න කථා කරනවා. නමුත් සීඝ්‍ර සංවර්ධනයක් කරා යන්න බැහැ. මේවාට හරස් වුණාම අතරමගදී මේවා නවත්වන්න වෙනවා. ඒ නිසා මේවා නිවැරැදි කරගන්න ඕනෑ. මේ පිළිබඳව මධ්‍යම රජය දැනුවත් කරන්නය කියලා මම ඉල්ලනවා. විශේෂයෙන් වම්පික රණවක ඇමැතිතුමා, නාගරික සංවර්ධන ඇමැතිතුමාව දැනුවත් කරන්නය කියලා.

මේ බලය ප්‍රාදේශීය සභාවලට දෙන්න. ඉස්සර අපි ගොඩනැගිලි ඉදි කරන කොට ප්‍රාදේශීය සභාව හෝ නගර සභාවේ සැලැස්ම අනුමත කරලා කළා. ඒකේ කිසිම ගැටලුවක් නැහැ. රජයේ දේපළ මේවා. රජයේ ඉදි කිරීම්. පුද්ගලික ඉදි කිරීමක් නොවෙයි. ඉතින් මට ලොකුම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ රෝහල්වල. ඇත්ත වශයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමා දිස්ත්‍රික්ක තුනට රෝහල් තුනක් දුන්නා. අද වනතුරු ඇස්තමේන්තු ටික හදාගන්න විධියක් නැහැ. දැන් කාලෙත් නැහැ. ඉතින් ඒක නිසා මේවා පිළිබඳව පොඩ්ඩක් සොයා බලන්න ඕනෑ. ඒවා පිළිබඳව තමයි මම ගරු මන්ත්‍රීවරු දැනුවත් කළේ. නැත්නම් දෝෂාරෝපණය මට එයි. ඊළඟට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියයි, මෙච්චර මෙච්චර සියයට ගණනක් - එතුමා තමයි ඕවා සොයාගෙන ඇවිල්ලා කියන්නේ. මෙච්චර සියයට ගණනයි වැඩ කරලා තිබෙන්නේ කියලා. නමුත් අපේ වැරැදි නොවෙයි. මෙන්න මේ වාගේ අඩුපාඩු තිබෙනවා. නිලධාරීන්ගේ. සමහරක් අයගේ. හොඳම නිලධාරීනුත් ඉන්නවා. සමහරක් අයගේ අඩුපාඩු තිබෙනවා. ඒ අය ඒ වාගේ නීතිරීතිවලින් හිර වෙලා ඉන්නවා. ඒක නිසා මේ වැඩ පිළිවෙළ සකස් කරන්න කටයුතු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. අපේ රජයේ

[ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා]

කැබිනට් මණ්ඩලයට මේවා ඉදිරිපත් කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. මේ ගැටලු. අපට මෙහෙම වැඩ කරන්න බැහැයි කියලා. ඇත්ත වශයෙන් රාජිත සේනාරත්න ගරු ඇමැතිතුමා සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට විශාල මුදලක් පළාත් සභාවට දීලා තිබෙනවා. ඒවා වැඩ කරගන්න බැහැ. ඒවායේ ප්‍රතිලාභ - දිවුලපිටියේම අපේ ගරු මන්ත්‍රීතුමාගේ වැඩ වගයක් තිබෙනවා. තවම එතැනමයි. මේ ප්‍රශ්නය අපට විසඳගන්න ඕනෑ. ඒ නිසා මධ්‍යම රජය දැනුවත් කරන්නය කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා ඉදිරිපත් කරන කාරණය සම්බන්ධයෙන් මගේ පුංචි අදහසක් මම ඉදිරිපත් කරනවා. ඇත්ත වශයෙන්ම මේ කාරණය සම්බන්ධයෙන් ගැටලු කිහිපයක් තිබෙනවා. මොකද, හැම අවුරුද්දේම මේ දේ සිද්ධ වෙනවා. ගිය අවුරුද්දේ ගම්පහ දිස්ත්‍රික්ක රෝහලට විශාල මුදලක් ඔබතුමා වෙන් කළා. නමුත් ඔක්කොම කරන්න බැරිව ගියා. මොකද හේතුව, එකක් තමයි අපේ පළාත් සභාව තුළ නැහැ ගෘහ නිර්මාණ ශිල්පීන්. ඒක තමයි ප්‍රධාන එක කාරණාව. අනික් කාරණාව තමයි තාක්ෂණ නිලධාරීන් නැහැ. ඉන්න තාක්ෂණ නිලධාරීන්ට කිසිම ප්‍රායෝගික දැනීමක් නැහැ. ඉන්න අය 75% ක් විතර හැමදාම ප්‍රසූත නිවාඩු. ඉතින් අපේ දෙපාර්තමේන්තුවල, ආයතනවල වැඩ කරන්න නිලධාරීන් නැහැ. ඒක තමයි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ප්‍රධානම ප්‍රශ්නය. අධ්‍යාපනයේත් ඒ ප්‍රශ්නය තිබෙනවා. පළාත් පාලනයේත් ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා මම අමාත්‍ය මණ්ඩලයට යෝජනා කරන්නේ මේ පිළිබඳව, විශේෂයෙන් තාක්ෂණ නිලධාරීන් සම්බන්ධව යම්කිසි තීරණයක් ගන්න. අර ආදේශ ක්‍රමයට හරි, කොන්ත්‍රාත් ක්‍රමයට හරි බඳවාගෙන මේ ව්‍යාපෘති කඩිනම් කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න. නැත්නම් මේ අවුරුද්දෙත් ඒ දේම සිද්ධ වෙනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අපි මීට පෙරත් මේ ගැන සාකච්ඡා කළා. අපට මතකයි බණ්ඩාරගම තිබුණු රැස්වීමේදී අපි කිව්වා, ප්‍රාදේශීය සභාවල ඉන්න SW මහත්වරුන්ව සතියකට සැරයක්වත් ගෙන්න ගෙන මේ කටයුතුවල යොදා ගන්න කියලා කිව්වා. නමුත් මම හිතන්නේ, තවමත් ඒ දේ සිදු වුණේ නැහැ. එහෙම වුණා නම්, මේ අඩුපාඩුව පුරෝගන්න පුළුවන්කම තිබෙනවා. මොකද, ඔවුන්ට මේ දැනුම තිබෙනවා නේ? ඔවුන්ව සතියකට සැරයක් ගෙන්නලා මේ පළාත් සභාවට ගෙන්න ගෙන - දක්ෂ නිලධාරීන් ඉන්නවා. ඒ නිලධාරී අඩුව පුරවන්න පුළුවන් ප්‍රාදේශීය සභාවේ ඉන්න SW මහත්වරුන්ට. ඒ කටයුත්ත කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ රැස්වීම්. ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාට අවස්ථාව -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දිගටම යනවා. අමාත්‍යාංශ නිවේදන ඇමැතිවරු කිව්වාම ඇති. ඒක වෙන අය කියන්න ඕනෑ නැහැ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

හිටපු ඇමැතිවරු නොවෙයි. ඉන්න ඇමැතිවරු.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔයා කට වහගෙන ඉන්න අප්පා. ඔයාට පිස්සු නම් ගිහිල්ලා අංගොඩ ගිහිල්ලා ඔළුව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

රෝස් නිකන් කථා නායක වාගේ. පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අදහස් ඕනෑ නැහැ. අදහස් ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔයා පොඩ්ඩක් සද්ද නැතිව ඉන්න කෝ. මම මෙහෙය වන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය බාධා කිරීම් කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අංගොඩ යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔයා පැටලෙන්න යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අංගොඩ ගිහිල්ලා ඔළුව පරීක්ෂා කරගන්න. කොණ්ඩේ කොටට කපලා නම් කොණ්ඩේ දික් කරගන්න. (බාධා කිරීමක්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම නවත්වන්නම්. ඔයා මේ අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මොනවද කියලා දන්නවද කථා කරන්න ඉස්සෙල්ලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමා, ඔබතුමා මේ මන්ත්‍රීවරු 104 දෙනාටම වග කියන නායකයා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි මෙච්චර කල් කට වහගෙන හිටියේ. මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කෙරුවේ. පසුගිය කාලයේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

දැන් ඇමැතිකන් නැතිව ගිහිල්ලා බණ කියනවා මෙතැන.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කාලය ඉවරයි.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ගෙදර ඇරියා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කරන්න එන්න එපා. අපි දැන් කට ඇරලා ඉන්නේ ඒක තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

අමාත්‍යාංශ නිවේදන අමාත්‍යවරුන්ට පමණයි. හිටපු ඇමැතිවරුන්ට නොවෙයි. මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එළියට දාන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ න්‍යාය පත්‍රයට යන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි හැමදාම කට වහගෙන ඉන්න ඕනෑද? අපි හැමදාම කට වහගෙන ඉන්නේ නැහැ. මේවා නවත්වා ගන්න. එහෙමනම් අපි කට වහගෙන ඉන්නවා. මෙතැන

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කෑ ගහනවා. පැය භාගයක් යනවා හැමදාම ඒකට. අපි ඇවිල්ලා තිබෙන්නේ සභාවේ වැඩ කරන්න. ඒවා නවත්වා ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

ඒවා හැන්සඩ් එකෙන් අයින් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ඒවා මම අයින් කරනවා. කොඩිකාර ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. න්‍යාය පත්‍රයේ මම ප්‍රකාශ කළේ අමාත්‍යාංශ නිවේදන සහ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ තිබෙන්නේ. ඔබතුමාට ඒ සම්බන්ධයෙන් කථා කරන්න අයිතියක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එහෙමනම් කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම කිව්වේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඔබතුමාගේ කන්දෙක ඇහෙන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා කිව්වේ නැහැ නේ? ඔබතුමා සභාව නොමඟ අරින්න එපා. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හරි. මට වරප්‍රසාද ප්‍රශ්නයක් කථා කරන්න අයිතියක් තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අයිතියක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එහෙමනම්, ඔබතුමා මට කියන්නේ මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා 36(1) යටතේ කියලා කිව්වේ නැහැ නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ අර

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

තේරෙන්නේ නැහැ නේ, මේක.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමා, 36(1) කිව්වේ නැහැ. අනික් අයගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරියෙකුටම එහෙම සභාවේ අපහාස කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අඬන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනික් අයගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි කථා කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙයාව රෝහලකට ඇරලා ඔළුව පරීක්ෂා කරලා අංගොඩට අරින්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපේ සහෝදර මන්ත්‍රීවරයෙකුට එහෙම අපහාස කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ වචනය ඔබතුමා කරුණාකරලා ඉල්ලා අස්කරගන්න. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් වශයෙන්

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අර උසාවියේ පොඩි දුප්පත් මිනිස්සුන්ට නඩු කථා කරනවා වාගේ නඩුව කල් දැම්මාම තැන්ක් යූ සර් කියන කට්ටිය මේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක හැන්සාඩ් එකෙන් අයින් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඉල්ලා අස් කර ගන්නේ නැත්නම් ඔබතුමා අයින් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ඉල්ලා අස් කර ගන්නේ නැහැ. මගේ වරප්‍රසාද ප්‍රශ්නය ගැන කථා කරන්නේ. මම ඉල්ලා අස් කර ගන්නම්, මේ පළාත් සභාවේ අපේ සුමිත් ලාල් මැන්දිස් අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය සෞඛ්‍ය අමාත්‍යාංශයට ගිය වෙලාවක ඔළුව පරීක්ෂා කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, පෞද්ගලිකව මඩ ගහනවා නම් මට කියන්න තිබෙනවා, හැටක් විතර. ඔය ගැන. නමුත් මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක්ක කථා කරන්න නොවෙයි අපි ආවේ. අපි මේ වැදගත් විධියට මේ සභාවේ වැඩ කටයුතුවලට ඇවිල්ලා ඉන්නේ. අපි හැමදාම පැය භාගයක් කාලය නාස්ති කරනවා බලාගෙන ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ජ්‍යෝෂ්ට මන්ත්‍රීවරයෙක්. ඔබතුමා කාන්තාවන්ට අපහාස කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අඬන්න එපා. කඳුළු එනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි ඒකයි කියන්නේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

යනවා හිර ගෙදරට. තමුසේගේ ඇප අවලංගු කරන්න ඕනෑ ආයේ සැරයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හැසිරෙන්න ඉගෙන ගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කෑ ගැහුවාට අපි භය වෙන්නේ නැහැ .

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

තමුසෙලාගේ කටවල් වහන්න තමයි අපි ආවේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි,

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ආ......ඇති. ඇති.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා කැමැතිද ඔබතුමාගේ නෝනට මොනවා හරි කියනවා නම්. ඔබතුමා කැමැතිද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ නෝනා දේශපාලන ගෑණියෙක්. ඕනෑ එකක් කියන්න පුළුවන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

එච්චරටම කාන්තාව විවේචනය කරනවා නම් කැත වැඩ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ ගෑණි දේශපාලන ගෑණියක්. ඕනෑම දෙයක් කියන්න පුළුවන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කිව්වාට මම කළබල වෙන්නේ නැහැ. හැබැයි, හැමදාම සභාවේ පැය භාගයක් නාස්ති කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේ ප්‍රධාන සංවිධායක හැටියට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇමැතිවරු කථා කළා කියලා අපි කෑ ගහන්නේ නැහැ. හැමදාම සභාවේ කාලය නාස්ති කරනවා. ඔබතුමා ඒක වළක්වනවා නම් අපි මෙතැන සද්ද නොකර ඉන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමා -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට මුල හැමදාම මොකද, මෙතුමා කථා කරන්න ගත්තාම මෙතුමිය හැම තිස්සේම අනවශ්‍ය ප්‍රශ්න ඉදිරිපත් කරනවා නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම විරුද්ධ වෙන්නේ වරප්‍රසාද ප්‍රශ්න කියලා හැමදාම බොරු නේ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම පිළිගන්නවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ඔබතුමියයි ජෝර්ජ් සංවිධායකතුමයි තමයි සභාව නොමඟ යවන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වරප්‍රසාද ප්‍රශ්න කියලා බොරු කථා කරනවා. අපේ අයිතිවාසිකම් උල්ලංඝණය වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නොවෙයි ගරු මන්ත්‍රීතුමිය. ඔබතුමිය කාන්තා මන්ත්‍රීතුමියක්. මම දැකලා තිබෙනවා ඔබතුමිය ඔය විධියට බාධා කිරීම් කරන්න එපා. එතුමාටත් කථා කරන්න අවස්ථාවක් දෙන්න. එතුමාටත් ඒ අයිතිය තිබෙනවා. බාධා කිරීම්වලට යන්න එපා. ඒක නේ ප්‍රශ්න ඇති වෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හරියට පාලනය කරන්න. එතකොට අපි කෑ ගහන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පාලනය කරන්න බැහැ. මයික්වලට කෑ ගහනවා නේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ඔයා කොහොමද පාලනය කරන්නේ. මෙතැන සභාපතිවරයෙක් ඉන්නවා. ඔයා පැනලා දෙන්නේ නැතිව ඉන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔයා සභාපතිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

මම නොවෙයි සභාපති. මම අහන්නේ ඔයාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ඇයි නැඟිට්ටේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට අවධානය යොමු කරනවා 36(1) සහ 36(3). මීට ඉහතත් ගිය පළාත් සභා රැස්වීමේදීත් ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්න යටතේ අපි යොමු කළා. මේ පරිපූරක මුදල් ගැන. සෑම මන්ත්‍රීවරයෙකුටම ඒක හිමි වෙන්න ඕනෑය කියලා. අපේ වරප්‍රසාද කැඩුණු එක අද ඔබතුමාට අපට පැහැදිලි කරන්න පුළුවන්. සමාන්‍යයෙන් වරප්‍රසාදයක් කඩ වී ඇත්නම් ඒ ප්‍රශ්නය ඔබතුමා සභා කටයුතු කාරක සභාවට යොමු කරලා වරප්‍රසාදය කඩ වී ඇති මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඒ අසාධාරණය වුණු හේතු දක්වලා මේ සභාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. මම හිතන්නේ මීට ඉහත ගණනාවකම වරප්‍රසාද ගැන ප්‍රශ්න කථා කෙරුවාම එහෙම, අපි දැකලා

[ගරු මෙරිල් පෙරේරා]

නැහැ ඔබතුමා සභා කටයුතු කාරක සභාවට යොමු කරලා ඒකට උත්තර ලැබිලා ඔබතුමාගේ නිවේදන යටතේ යොමු කරලා තිබෙනවා. අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එහෙම වරප්‍රසාද ප්‍රශ්නයක් කථා කෙරුවාම ඒකට මැදිහත් වෙලා ඒ මන්ත්‍රීවරයාගේ වරප්‍රසාදය කඩ වී තිබෙනවා නම් ඒ වරප්‍රසාදය ගැන ආවරණය කරන්න. ඔබතුමා ඒ ගැන පරීක්ෂණයක් සිදු කොට ප්‍රකාශ කරන්න, ඔබතුමාගේ නිවේදන යටතේ. ඒ වාගේම තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) කියලා අනවශ්‍ය ප්‍රකාශ කරනවා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අනවශ්‍ය ප්‍රකාශ නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව හැල්ලුවට ලක් වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සාධාරණ විධියට ප්‍රකාශයක් තිබෙනවා නම් ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවධානය යොමු කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හරි. මම මේ ඉල්ලීම කරන්නේ මම ඔබතුමාට ගියවරත් මේක කිව්වා. පළාත් පාලන අමාත්‍යාංශයට මිලියන 300 ක පරිපූරක ඇස්තමේන්තුවෙන් වෙන් කෙරුවා. අපි 104 දෙනාම මේක ඒකමතිකව අනුමත කළා. අද වන කොට තමුන්නාන්සේට පැහැදිලිව කියන්න ඕනෑ. ඒ මුදලෙන් දිස්ත්‍රික්ක තුනට වෙන් වෙලා තිබෙන ප්‍රතිශතය ගත්තොත් ගම්පහට 10% යි. කළුතරට 16% යි. 4% ක් පොදු වලට. 64% ක් වෙන් කරලා තිබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයට. එතකොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තිබෙනවා, බස්නාහිර පළාතේ 40 ක්. එතකොට මේ 40 න් 10 ක් අතහැරලා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 කට තමයි මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ මුදල් වෙන් කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනකට මේ මිලියන 300 න් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනකට මිලියන 180 ක්, ඒ කියන්නේ ලක්ෂ 3000 න් ලක්ෂ 1800 ක් වෙන් කරලා තිබෙන්නේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනකට. ඔබතුමා කියන්නේ සාධාරණද? මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට මිලියන 122 යි. කැස්බෑවට මිලියන 29 යි. කඩුවෙලට මිලියන 26 යි. මිලියන 188 ක් වෙන් කරලා තිබෙන්නේ මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනට. සාධාරණ ද කියලා බලන්න කෝ? ලක්ෂ 3000 ක පරිපූරක ඇස්තමේන්තුව මේ සභාවේ 104 දෙනාගෙන් අනුමත කර ගත්තා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 ක් තිබෙනවා. 40 න් 30 කට වෙන් කරලා තුනකට මිලියන 188 ක් වෙන් කර ගන්නවා නම් මේකේ සාධාරණය මොකක්ද? අපේ වරප්‍රසාද කැඩිලා නැද්ද? අපි ඔබතුමාගෙන් පැහැදිලිව අහනවා. අපි මේ පරිපූරකවලට අත උස්සන්න විතරක් නොවෙයි, මෙතැන ඉන්නේ. මේක පැහැදිලිව කියන්නේ. මේ මුදල් ටික වෙන් කරලා තමුන්ගේ අම්මා අප්පාගේ බූදලය වාගේ බෙදා ගන්න එක නොවෙයි. මේ සෑම මන්ත්‍රීවරයෙක්ම පත් වෙලා ඉන්නේ මහජන ඡන්දයෙන්. මේ සෑම කෙනාටම මුදල් ලැබිය යුතුයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉස්සර හිටපු මහ ඇමැතිතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉස්සර හිටපු මහ ඇමැතිතුමා කරපු දේ ඕනෑ නම් කියන්නම්. තමුන්නාන්සේ අහගෙන ඉන්න. ඉස්සර හිටපු මහ ඇමැතිවරයා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විනාඩියක් දෙන්න. මෙතුමාට උත්තර දෙන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. විවාදවලට යන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉස්සර හිටපු මහ ඇමැතිවරයා බස්නාහිර පළාතට මුදල් වෙන් කෙරුවේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදවලට යන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න. අහගෙන ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පොඩ්ඩක් ඉන්න. අහගෙන ඉඳලා මේවාට උත්තර දෙන්න. ඇයි කලබල වෙන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මමයි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඉස්සර හිටපු අයත් ගම්පහට දා ගත්තා. තමන්ගේ කොට්ඨාශවලට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතුමා කෑ ගහන්නේ එතුමාගේ සල්ලි ලැබිලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඉස්සර හිටපු අයත් සල්ලි බෙදා ගත්තා. තමන්ගේ කොට්ඨාශවලට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම කථා කළාට පස්සේ තමුන්නාන්සේ කථා කරන්න. තමුන්නාන්සේගේ වරප්‍රසාද කැඩිලා තිබෙනවා නම්. වරප්‍රසාද ප්‍රශ්න කථා කරමින් ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේක කියන්න එපැයි. මේක සභාව දැනගන්න ඕනෑ. මීට ඉස්සර හිටපු මහ ඇමැතිවරයා බස්නාහිර පළාතට මුදල් වෙන් කරලා, පාසල් 1270 ටම සල්ලි දුන්නා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපි ගාව විස්තර තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා පොඩ්ඩක් ඉන්න. අහගෙන ඉන්න. දහම් පාසල් 2700 ටම සල්ලි දුන්නා. එහෙමයි මුදල් වෙන් කළේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 ටම දුන්නා. පාසල් 1270 ටම දුන්නා. එහෙම මුදල් වෙන් කළේ. දැන් මේ වෙන් කරන විධිය මොකක්ද? මීට ඉස්සෙල්ලා එන අයවැයට පෙන්වන්නම් කොහොමද මුදල් වෙන් කරලා තිබෙන්නේ කියලා. මේ පරිපූරකයේ මිලියන 300 ක් දාලා මිලියන 188 ක් තමුන්ට විතරක් වියදම් කරන්න ගත්තාම හරි යනවාද? අපි ඉන්නේ අත උස්සන්න විතරද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමාට තමයි පරිපූරකය ඉදිරිපත් කළේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කාටවත් නොවෙයි. පළාත් පාලනය. අනික් අමාත්‍යාංශවලත් අපි ඉදිරිපත් කරන්නම්. අපි ඒක ගියපාර කිව්වා. අපි ඒකයි අහන්නේ. ඔබතුමාගෙන්. මේකේ වරප්‍රසාද අනුව. අද කථා කරන්නේ නැහැ. අද කොලොන්නාවට සල්ලි වෙන් කරලා. මතුගමට සල්ලි වෙන් කරලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කොලොන්නාවට සල්ලි වෙන් කරලා කියන්නේ කවුද? කොලොන්නාවට දීලා තිබෙන යෝජනා ටික කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි කියන්නේ මේකේ සමහර ආසන තෝරාගෙන තමුන්ට හිතවත් ආසනවලට දීලා තිබෙනවා. මා ළඟ ආසන ලැයිස්තුවම තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමා, වරප්‍රසාද ප්‍රශ්නය තවම ඉවර නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඉවරයි. දැන් ඉවරයි. හරි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථාවක් කරන්නේ නැතුව වරප්‍රසාද ප්‍රශ්නය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වරප්‍රසාද තමයි කථා කරන්නේ. ඔබතුමා කථා කරන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමා අයවැයෙන් ලක්ෂ 24 යි මන්ත්‍රීවරයෙකුට දෙන්නේ. මම මන්ත්‍රීවරයෙකුට සල්ලි කීයක් දීලා තිබෙනවාද? මම විතරයි පළාතටම සල්ලි බෙදලා තිබෙන්නේ. මේවා මේ හිතේ අමාරුවට කියන දේවල්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1)

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අනික පරිපූරකයෙන් ලක්ෂ 20 ගණනේ හැම කෙනාටම දීලා තිබෙනවා. ලක්ෂ 20 ගණනේ ඔක්කොටම දීලා තිබෙන්නේ. අහන්න කෝ. නැහැයි කියන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බෙදලා තිබෙන ඒවා ඔක්කොම පැහැදිලිව තිබෙනවා. බෙදලා තිබෙන ඒවා ඔක්කොම අපි ළඟ තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බෙදලා තිබෙන ඒවා ඔක්කොම අපි ළඟ තිබෙනවා. බෙදලා තිබෙන ක්‍රමත් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මන්ත්‍රීවරු 104 ටම බෙදුවාම ලක්ෂ 20 ගණනේ මිලියන කීයක්ද? ගණන් හදලා කියන්න ඔබතුමා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කොහෙද බෙදලා තිබෙන්නේ? මේ වන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමා බෙදුවා. ලක්ෂ 20 ගණනේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ වන කොට ව්‍යාපෘති අංක ගහලා ඔක්කොම අනුමත කරලා ඉවරයි. කාටවත් ලක්ෂ 20 ගණනේ දීලා නැහැ. කොහොද දීලා තිබෙනවා කියන්නේ? ඒක දීලා තිබෙන්නේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ මිලියන 519 න්. ඒ සල්ලියි මේ සල්ලියි වෙනයි. ඒකත් දාගෙන තිබෙන්නේ වෙනමයි. එතකොට මිලියන 819 ක් අරගෙන තිබෙන්නේ ප්‍රධාන ලේකම් කාර්යාලයට සහ මහාමාත්‍යවරයාට.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මිලියන 519 ත් අපි පෙන්වන්නම් ඕනෑ නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, අපේ වරප්‍රසාද ප්‍රශ්නයක්. පොඞ්ඩක් ඇහුමකන් දෙන්න. තමුන්නාන්සේ මේ මුදල් යොදවලා තිබෙන්නේ පළාත් පාලන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ඇයි අපට කථා කරන්න දෙන්න බැරි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා. කථා කරන්න දෙනවා. පොඞ්ඩක් ඉන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්න. කාලය ගත වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතාම කෙටියෙන් කියන්නම්. පසුගිය අවුරුදු 10 තුළ මේ ගොල්ලෝ බෙදා ගත්තු හැටි අපි දන්නවා නේ. විපක්ෂයට ශත පහක්වත් දුන්නේ නැහැ. මේගොල්ලන්ට ඕනෑ විධියට බෙදා ගත්තා. දැනුත් හදන්නේ එයාට ඕනෑ විධියට සල්ලි ටික බෙදා ගන්නයි. එහෙම කරන්න දෙන්න බැහැ. ඒ ප්‍රසන්න රණතුංගගේ කාලයේ ඔයා සිටියා වාගේ ඕනෑ විධියට ඔයා බෙදා ගත්තාට දැන් ඒ පාලනයක් මෙහේ නැහැ. දැන් ඉන්නේ අලුත් මහ ඇමැති කෙනෙක්. ඒක නිසා නිකන් මේ පාට් දාලා සල්ලි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

යහපාලනය කියලා මේ ක්‍රමයටද බෙදා ගන්නේ? යහපාලනය මේකද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

යහපාලනය පාර්ලිමේන්තුවට විතරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙයා තරම් මුදල් ගත්තු කෙනෙක් නැහැ, මේ සභාවේ කොහේවත්. හොයලා බලන්න. මෙරිල් මන්ත්‍රීතුමා තරම් ප්‍රතිපාදන ලැබුණු මන්ත්‍රීවරයෙක් නැහැ, මේ සභාවේ. අපි ඔප්පු කරලා පෙන්වනම්. ගම්පහ දිස්ත්‍රික්කයේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපිත් ඔප්පු කරලා පෙන්වන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රාදේශීය සභාවලින්, නගර සභාවලින් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මතුගමට, බුලත්සිංහලට දීපුවා මේකේ තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමැතිතුමාගේ කාලයේ ඔක්කොම ගන්නේ මෙයා. ඔක්කොම කරගන්නේ මෙයා. එහෙම කරගෙන බොරුවට කෙබර හලන්න එනවා මෙතැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි අද මේ සභාව රැස් කළේ, විශේෂ සභාවක් වශයෙන් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමැතිතුමා ඉන්නේ, මහ ඇමැතිතුමාට ඕනෑ විධියට සල්ලි බෙදන්න. කාටත් ඕනෑ විධියට සල්ලි බෙදන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමා, මෙතුමා කියනවා කොලොන්නාවට දුන්නාලු. කොලොන්නාවේ ඉන්නේ එක පළාත් සභා මන්ත්‍රීවරයයි. ගරු සභාපතිතුමා, -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේවා මහජන මුදල්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඉස්සර මහජන මුදල් නොවෙයි. ඉස්සර ගෙදරින් ගෙනාපුවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමා, මෙරිල් ගරු මන්ත්‍රීතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඉස්සර ඇමැතිවරු සල්ලිත් බෙදුවා නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කොලොන්නාවට දීලා තිබෙනවාලු. කොලොන්නාවට මම දීපු ව්‍යාපෘති ටික පෙන්වන්න. කොලොන්නාවට මම ව්‍යාපෘති දීලා නැහැ. මොකද, කොලොන්නාවේ ඉන්නේ එක පළාත් සභා මන්ත්‍රීවරයායි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපෙන් අහගන්න යන්නේ. රට ගිහිල්ලා අතට සල්ලි දුන්නා ලක්ෂ ගණන් ඇමැතිවරු. අපෙන් අහගන්න යන්නේ ඕවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. අපි අද මේ සභාව කැඳෙව්වේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කොලොන්නාවේ දීලා තිබෙන්නේ ඔයාට නොවෙයි. සෝලංගආරච්චිට. කොලොන්නාවේ සෝලංගආරච්චිට දීලා තිබෙන්නේ. එයා කිව්වේ නැහැ, ඔයාගේ නම. සෝලංග ආරච්චිට තමයි දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එයා නේ යහපාලනයේ ඉන්නේ. ඔයා නොවෙයි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමා ඉතාම වගකීමෙන් කියනවා. 2017 සල්ලි මුළු පළාතටම මම බෙදලා තිබෙන්නේ. මම නියෝජනය කරන කොට්ඨාශයට මම වියදම් කර ගන්නේ නැත්නම් මම මෝඩයෙක් වෙන්න එපැයි. හැබැයි මගේ ළඟට ආපු මන්ත්‍රීවරු ඔක්කොටම, ඔය කථා කරන මන්ත්‍රීවරුත් ඇතුළුව ඔක්කොටම සල්ලි දීලා තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ආන්න අහගන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ සභාව නොමඟ අරින්න බැහැ. අපේ මන්ත්‍රීවරු ළඟට ගිහිල්ලා පරිපූරකයෙන් රුපියලක්වත් ඉල්ලගෙනත් නැහැ. මේ පරිපූරකයේ සල්ලි ගැන කථා කරන්නේ. කාටත් අයිතියක් තිබෙනවා. එහෙම නම් අමාත්‍යාංශවලට ඕනෑවට වැඩිය මුදල් වෙන් කරලා තිබෙනවා නම්, ඒ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට දෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රට ගිහිල්ලා අතට සල්ලිත් ඉල්ලා ගත්තා, සමහරු. මහජන මුදල් තමයි ඒවත්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මිලියන 50 ක් නොවෙයි. අරවත් දෙන්න ඕනෑ. ඒවා ඇමැතිවරයාට විතරක් අයිති නැහැ. අපි ඉන්නේ මෙතැන අත උස්සන්න විතරද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙම කිව්වාට සමාවෙන්න.

[සභාවේ ඝෝෂා]

අද අපි මේ රැස්වීම කැඳෙව්වේ, විශේෂ කාරණාවකට.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එදා කෑම කන්න බැරුව තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා සමාවෙන්න මේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා සමාවෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා මේ අනවශ්‍ය විවාදවලට යන්න එපා. මම මේක කිව්වාට සමාවෙන්න.

[සභාවේ ඝෝෂා]

අනේ නිශ්ශබ්ද වෙන්න කෝ. න්‍යාය පත්‍රයේ ඔක්කොම අයින් කරලා අද අපි මේ සභාව කැඳෙව්වේ. අද පෞද්ගලික පැහැදිලි කිරීම් නැහැ. මේ රීති සාකච්ඡා කරන්න කැඳෙව්වේ. ඒ නිසා අපි මේ ටික යමු.

[සභාවේ ඝෝෂා]

අනේ මන්ත්‍රීතුමන්ලා සමාවෙන්න. මේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි ඇහුවේ වරප්‍රසාද ප්‍රශ්නයක් ගැන. අපි කාටවත් ඇඟිල්ල දික් කළේ නැහැ. මේ සභාවේ අයිතියක් තිබෙනවා මන්ත්‍රීවරයෙකුට -

[සභාවේ ඝෝෂා]

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවේ තත්ත්වය හරිම කනගාටුදායකයි.

[සභාවේ සෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරුන්ගේ අවස්ථාව අහිමි කරන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් ඉවරයි නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම කා ගැනවත් කථා කෙරුවේ නැහැ. මම කථා කෙරුවේ වරප්‍රසාද ප්‍රශ්න ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් පරිපූරකය ගැන ඔබතුමා කථා කෙරුවා. මහ ඇමැතිතුමා උත්තරයක් දුන්නා. ඒ ප්‍රශ්නයට උත්තරයක් දුන්නා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හරි. එතුමාට අයිතියක් නැහැ නේ? පෞද්ගලිකව කථා කරන්න එතුමාට අයිතියක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා දෙන්නාම නිශ්ශබ්ද වන්න. දෙන්නෙක් එකතු වෙලා අනික් මන්ත්‍රීවරුන්ට තිබෙන අයිතිය අහිමි කරන්න එපා. කලිනුත් තිබුණා. ලාන්සා ඇමැතිතුමායි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා ඕක පටන් ගන්න එපා. වැරැදි ක්‍රියාවක්. බලන්න. දැන් වේලාව 10.04 යි. අපි මේ සභාව කැඳෙව්වේ ඉතාම වැදගත් සාකච්ඡාවකට. න්‍යාය පත්‍රය ඔක්කොම අයින් කරලා. ගරු සභා කටයුතු ඇමැතිතුමාට අවස්ථාව පළාත් සභාවේ රැස්වීම සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කරන්න.

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු සුමිත් ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"2017.11.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී එකඟතාවය පළ කළ පරිදි 2017 නොවැම්බර් 21, 2017 දෙසැම්බර් මස 05, 06, 07, 08, 11 හා 12 යන දිනයන් 2018 වර්ෂයේ මුදල් ප්‍රකාශය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු. ගරු සභා කටයුතු අමාත්‍යතුමාට අවස්ථාව පොදු කටයුතු යෝජනාව ඉදිරිපත් කරන්න. සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේකේ ගණපූරණය නැහැ. ගණපූරණය නැතිව කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

මේ අවස්ථාවේදී සභා ගර්භය තුළ ගණපූරණය නොමැති නිසා මෙම සභාව විනාඩි 15 කට කල් තබනවා.

***සභාව් ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුවනාද කරවීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති නොවූයෙන් ගරු සභාපතිතුමා විසින් රැස්වීම තාවකාලිකව අත් සිටුවන ලදින් පූ.භා. 10.27 ට යළිත් රැස් විය.***
*Committee counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, It found no quorum Mr. Chairman, suspended the sitting and it resumed at 10.27 a.m.*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත්ම කනගාටු වෙනවා. සභානායකතුමා නැහැ. ඇමැතිතුමන්ලා දෙන්නෙක් නැහැ. වැදගත් වැඩක් නේ මේක. විනාඩි 15 කට කල් තිබ්බාට පස්සේ. මම ඉතාමත්ම කාරුණිකව ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. අපි මේ කාර්ය පටිපාටි රීති සංශෝධන කෙටුම්පත සාකච්ඡාවට අරගෙන තීරණ ගන්නේ, අවුරුදු 20 කට පස්සේ. 1997 තමයි මුලින්ම මේ රීති සංශෝධනයක් කළේ. ඊට පස්සේ අපි වරින් වර අවස්ථා කිහිපයදී රීති සංශෝධනයක් කළා. ඒත් එක්කම මේ රීති සංශෝධනය සඳහා අපි කාරක සභා රැස්වීම් 47 ක් පැවැත් වූවා. අපේ ශ්‍රීනාත් ම. පෙරේරා නීතිඥතුමා ඇතුළු අපි ඔක්කොම සහභාගි වෙලා 47 ක් අපි

කාරක සභා රැස්වීම් පැවැත් වූවා. මේක මේ දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. එක එක පක්ෂවල තීන්දු නොවෙයි මෙතැන යන්නේ. මෙතැන පොදු ප්‍රශ්නයක් තිබෙන්නේ. අපට මේ රීති අවශ්‍යයි. යම්කිසි තීරණ දෙන්න. ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. කරුණාකරලා ඒ ඔළුවේ තිබෙන වෙන වෙන මත අයින් කරලා ඔබතුමන්ලා සභා ගර්භයට එන්න. ඇවිල්ලා අපට උදව් කරන්න. මේ රීති ටික සංශෝධනය කරලා අපට අනුමත කරගන්න. අපට මේ සභාව වැදගත් සභාවක් වශයෙන් පවත්වාගෙන යන්න අපට සහාය දක්වන්න.

සභා කටයුතු ගරු ඇමැතිතුමාට අවස්ථාව, යෝජනාව ඉදිරිපත් කිරීමට.

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්ය පටිපාටි රීති සංශෝධන පුස්ථක කෙටුම්පත :

CONSIDRING THE DRAFT OF NEW RULES OF PROCEDURE BOOK OF WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**ගරු සුමිත් ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"2017.11.07 දින මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට පිළිගන්වන ලද "බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්ය පටිපාටි රීති සංග්‍රහය - කෙටුම්පත" පිළිබඳව සාකච්ඡා කර අනුමත කළ යුතුය"* යන යෝජනාව මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

## පූර්ණ කාරක සභාව

COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධව සභාවේ සාකච්ඡා කිරීම සඳහා මම මෙම සභාව පූර්ණ කාරක සභා අවස්ථාවට පත් කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේ සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා. මුලින්ම තිබෙන්නේ කෙටුම්පත පිළිබඳ සාකච්ඡා කිරීම. ඊළඟට තිබෙන්නේ වගන්තියෙන් වගන්තිය සාකච්ඡා කිරීම සහ අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන්නයි. අවසානයේ දී තිබෙන්නේ තීරණයට එළැඹීම. මේ සම්බන්ධයෙන් අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ලිඛිතව සංශෝධන යෝජනා වගයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක අපි පස්සේ ගමු. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ඔබතුමන්ලාට අවතීර්ණ වන ලෙසට.

රීති අංක 01, මම ඒක කියවන්නම්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එකින් එක ගන්නවාද? ඉස්සෙල්ලා අදහස් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එකින් එක ගනිමු. මොකද පැහැදිලි වෙනවා. ඔක්කොටම පොත් තිබෙනවා නේ?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

සාකච්ඡාවකට ගිහිල්ලා ඊට පස්සේ ගමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එකින් එක අරගෙන සාකච්ඡා කරමු. එතකොට මග හැරෙන්නේ නැහැ නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඉස්සෙල්ලා සාකච්ඡාවක් දෙන්න. දීලා ඊට පස්සේ එකින් එක ගන්න. අරවා කෝඩ් කරලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඉස්සෙල්ලා සාකච්ඡාව දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමන්ලා හොඳ කණ්ඩායමක් එක්ක නේ මේක ගියේ? ඒක වැරදි නැහැ නේ? සමස්තයක් වශයෙන් මේකේ අදහස් ටික ගත්තා නම් ඒකේ තිබෙන යෝජනාවල් මෙතුමන්ලා දැම්මොත් ගමු.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපට සාකච්ඡාවක් දෙන්න. ප්‍රශ්නයක් නැහැ. මම සොයා ගත්තු දේවල් මම කියන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එකින් එකට යමු. ජෝර්ජ් විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අපි එකින් එකට යමු. එතකොට අපට පැහැදිලිව යන්න පුළුවන්. ඊට පස්සේ අපි පොදුවේ සාකච්ඡා කරමු.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමා මේකේ සමස්තය සම්බන්ධයෙන් වුණත් අපට අදහසක් තිබෙනවා. ඒ නිසා මේක ඉස්සෙල්ලා ඔබතුමා සාකච්ඡාවට ගන්න. ඊට පස්සේ සංශෝධනයන් එකින් එක ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. එකඟයි. අපි එහෙමනම් එහෙම සාකච්ඡා කරමු.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අපි ඉතාමත් සතුටු වෙනවා. අවුරුදු ගණනාවකට පස්සේ බස්නාහිර පළාත් සභාවේ දැනට ක්‍රියාත්මක සභා රීති සංශෝධනය කිරීම පිළිබඳව. කමිටුවේ සභාපතිවරයා හැටියට ඔබතුමාත් අනිකුත් නිලධාරී මහත්වරුත් අපේ මන්ත්‍රීවරුත් අරගෙන මේ ගරු සභාවේ ගරුත්වය රැකෙන ආකාරයට වැඩ කටයුතු කිරීමට මේ රීති සංශෝධනය කිරීම පිළිබඳව අපි ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, අපි මේ රීති සංශෝධනය පිළිබඳව අපේ පළාත් සභා පනතේ තිබෙන කරුණුත්, ඒ වාගේම පරණ රීතිවල තිබුණු කරුණුත් දිහා අරගෙන බලලා අලුතෙන් නව රීති ඉදිරිපත් කිරීමේදී, මම දැක්ක මන්ත්‍රීවරුන්ට ලැබුණු තදබලම වරප්‍රසාදයක් අහිමි කරලා තිබෙනවා. මේකේ තිබෙනවා, රීති අංක 55 විශ්වාසභංග යෝජනා. මේ විශ්වාසභංග යෝජනාවක් ගෙන ඒම මේ සභාවේ මන්ත්‍රීවරු 104 දෙනාගෙන් බහුතරයකගේ ඡන්දයෙන් ලබා ගැනීම - යම්කිසි අමාත්‍යවරයෙකුට එහෙම නැත්නම් සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට විශ්වාසභංග යෝජනාවක් ගෙන ඒමේ අයිතිය අපේ පළාත් සභාවේ මේ මන්ත්‍රීවරු 104 දෙනාට රීති අංක 55 තුළ තිබුණා. නමුත් නව රීති සංශෝධනයේදී විශ්වාසභංග යෝජනා ගෙන ඒම පිළිබඳව.

*“විශ්වාසභංග යෝජනාව පාලක පක්ෂයට හෝ අමාත්‍යවරයෙකුට හෝ එරෙහිව ඉදිරිපත් කළ හැකි ය. එම විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කිරීමට පදනම් වූයේ කුමක්ද යන්න පැහැදිලිව සහ සවිස්තරාත්මකව යෝජනාවේ ඇතුළත් විය යුතුය.”*

මේ අලුත් එක. එතකොට අර පරණ එකේ, අපේ පනතෙත් තිබෙනවා, සභාපතිතුමායි, උප සභාපතිතුමාටයි විශ්වාසභංග යෝජනාවක් ගේන්න පුළුවන් කියලා. ඉතින් මේ සංශෝධන යෝජනාවේ එහෙම නැහැ. ඉතින් ඒ වාගේම පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේදී තිබෙන බලතල පිළිබඳවත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අපි ඒක එකින් එක ගන්න කොට අපි අපේ අදහස් ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගමේ සමිතියකත් තිබෙනවා නේ එහෙම එකක්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක නේන්නම්. මේකේ රීති අංක 55 පැහැදිලිවම තිබෙනවා. පළාත් සභා පනතෙත් පැහැදිලිවම තිබෙනවා. මේ වරප්‍රසාදය මන්ත්‍රීවරු හැමදෙනාටම. එතකොට මේක අරගෙන බැලුවාවම ඔබතුමාට තමයි දෝෂාරෝපණය එන්නේ. ඔබතුමා සභාපතිවරයා හැටියට ඔබතුමාව ඉවත් කරගෙන තිබෙනවා කියන එක තමයි මගේ නම් හැඟීම. නියෝජ්‍ය සභාපතිත් ඒ විධියයි. ඉතින් -

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මම හිතන්නේ එහෙම වෙනසක් කළේ නැහැ. මේ කමිටුවේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා තමයි දැඩි කැප කිරීමක් කරලා, දැඩි වෙහෙසක් දරලා සකස් කළේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙනම් රීතිවලට ඇතුළත් කරලා මේ පොත තිබෙන්න ඕනෑ.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

එහෙමනම් ඒවා නීති රීතිත් තිබෙන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක නිසා මෙවැනි ගොඩාක් දේවල් තිබෙනවා. මම හිතන්නේ ජනතා විමුක්ති පෙරමුණේ අපේ නායකතුමාත්, මම හිතන්නේ කරුණු ඉදිරිපත් කරයි. ඒ අනුව අපි එකින් එක ගනිමු. එකින් එක ගන්න වෙලාවේදී අපි ඒවා පෙන්නලා දෙන්නම්. මම එහෙමනම් මෙම විවාදයට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කාර්යපටිපාටි රීති සංශෝධනය පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡාවකට පස්සේ මම හිතන්නේ, කාරක සභා අවස්ථාවන් 47 ක් විතර මේ රීති සංශෝධනය කිරීම සඳහා තියලා තිබෙනවා. ඒ වාගේම මේකට අපේ පළාත් සභාව ඇතුළේ නීතිය පිළිබඳ ප්‍රාමාණික බුද්ධිමතුන් සියලු දෙනා සම්බන්ධ වෙලා හදපු රීති බවට, මේ රීති පත් වෙලා තිබෙනවා. සමස්තයක් විධියට ගත්තාම මේ රීතිවල බරපතළ කාරණා නැහැ. අපි ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේ රීති සකස් කළාට පස්සේ නැවත වතාවක් කොළඹ නගරයේ වැඩමුළුවක් තියලා රීති සංශෝධවය කරන්න අවස්ථාවක් දීලා තිබෙනවා. මේ රීති සංශෝධනය කිරීමේ අවස්ථාවේදී අපි කාරණා කිහිපයක් කිව්වා. ඒ කාරණා කිහිපයේ සංශෝධනය මේකට ඇතුළත් වෙලා නැහැ. ගරු සභාපතිතුමනි, අපි යෝජනා කරනවා. ඒ රීතිවල එද්දී අමාත්‍යාංශ උපදේශක කාරක සභා, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පළාත් ආදායම් ප්‍රවර්ධන කාරක සභාවේ පත් කිරීමේ බලය ප්‍රධාන අමාත්‍යවරයාට තිබිය යුතුයි කියන සංශෝධනය අපි ඉදිරිපත් කළා. ඒ සංශෝධනය ඇතුළත් විය යුතුයි කියන කාරණය මතක් කරනවා.

ඒ වාගේම තමයි අපි කිව්වා, කාරක සභාවලට පත් කරද්දී කාරක සභාවල නිල කාලය වසර 2 1/2 යි කියන කාරණය අලුත් රීතිවල සඳහන් වෙලා තිබුණා. ඒ නිසා අපි කිව්වා, එය සංශෝධනය කරන්නය කියලා. මම විශ්වාස කරනවා ඕනෑම කාරක සභාවක පෞද්ගලිකව මන්ත්‍රීවරයෙක් අවුරුදු 5 ක් වාගේ කාලයක් ගත කරනකොට තමයි ඒ කාරක සභාව ඇතුළේ වැඩ කරන්න පුළුවන් ආකාරයේ සහ වැඩ කළ යුතු කාරණා පිළිබඳව ඒ මන්ත්‍රීවරයාට විශේෂ ප්‍රාගුණ්‍යයක් ලැබෙන්නේ. ඒ නිසා අවුරුදු පහක්ම කාරක සභාවේ සාමාජිකත්වය තියන්න කියන කාරණය මතක් කළා. විශේෂයෙන්ම පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වසර 21/2 ක් කියලා කියන්නේ, ඉතාම පුංචි කාලයක්. මේ කාරක සභාවට ඇතුළත් වෙලා, කාරක සභාවේ අවුරුදු 02 ක් යන කොට තමයි කාරක සභාවල තමන් කළ යුතු කාරණා පිළිබඳව අත්දැකීම ලැබෙන්නේ. ඒ වන කොට ඒ කාරක සභාවේ අය අයින් කරනවා නම් මම හිතන්නේ කාරක සභාවෙන් ප්‍රයෝජන ගන්න තිබෙන අවස්ථාව නැතිව යනවා. අපි ඌව පළාත් සභාවට ගිහිල්ලා විශේෂ වැඩමුළුවක් තිබ්බා. ඌව පළාත් සභාවේ ගිණුම් කාරක සභාවත් එක්ක. ඒ ගිණුම් කාරක සභා අවස්ථාවට ඒ හිටපු විගණකාධිපති මයාදුන්න මැතිතුමා සහභාගි වුණා. එතුමා ඉතා පැහැදිලිව කිව්වා. ගිණුම් කාරක සභාව ඇතුළේ දීර්ඝ කාලයක් මන්ත්‍රීවරු වැඩ කිරීම තුළ තමයි ඔවුන් අත්දැකීම් ලබමින් මේ කාරක සභාවට තමන්ගේ දායකත්වය නිවැරැදිව දෙන්නේ කියලා. ඒ නිසා කාරක සභාවල දීර්ඝ කාලයක් කටයුතු කරන්න අවස්ථාව දීම වැදගත් කියන කාරණයත් මතක් කරනවා.

ඒ වාගේම එදා මතු වුණු කාරණාව තමයි කාරක සභාවල සියලු මන්ත්‍රීවරුන්ට අවස්ථාව නැති වෙලා යනවා මේ කාලය දීර්ඝ කිරීමෙන් කියලා. එහෙම ප්‍රශ්නයක් මතු වෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. මේකේ කාරක සභා ගණනාවක් තිබෙනවා. අමාත්‍යාංශ උපදේශක කාරක සභා ටික තිබෙනවා. මේ කාරක සභා සියල්ලෙන් ඉන්න

[ගරු මහේෂ් අල්මේදා]

මන්ත්‍රීවරු ගණන බෙදුවාම හැම මන්ත්‍රීවරයෙකුටම පළමුවැනිම අවස්ථාවේම කාරක සභාවක් නියෝජනය කිරීමේ අවස්ථාව ලැබෙනවා. ඒ නිසා හැමෝටම කාරක සභාවක ඉන්න පුළුවන්. ගිණුම් කාරක සභාව කියන්නේ මේ සභාවේ තිබෙන ඉහළම කාරක සභාව කියන විශ්වාසය තමයි මට පෞද්ගලිකව තිබෙන්නේ. ඇත්තටම යම් කාරක සභාවක කාලයක් වැඩ කරලා තමයි ගිණුම් කාරක සභාවට මන්ත්‍රීවරයෙක් පත් වෙන්න ඕනෑ. එහෙම නැතිව ඒ මන්ත්‍රීවරයාට ගිණුම් කාරක සභාවේ වැඩ කරන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ නිසා කාරක සභාවල වැඩ කළ යුතු කාලසීමාව වසර පහක කාලය දක්වා දීර්ඝ විය යුතුයි කියන සංශෝධනය අපි එදා ඉදිරිපත් කළා. අවසාන වැඩමුළුවේදී. ඒ සංශෝධන දෙක ඇතුළත් කරන්නය කියන කාරණාව මතක් කරනවා.

අපි ස්තුතිවන්ත වෙනවා. මේ සභා රීති කාරක සභාවේ වැඩ කරපු මන්ත්‍රීවරුන්ට. දීර්ඝ කාලයක් තිස්සේ වෙහෙසිලා, මහන්සි වෙලා අවුරුදු 30 කට විතර පස්සේ සභා රීති වෙනස් කරලා අදට ගැලපෙන විධියට සභා රීති ගෙන එන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කරලා තිබෙනවා. අපි කාරක සභාවේ සභාපතිවරයාට සහ විශේෂයෙන් ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අපි සුවිශේෂ ස්තුතියක් පුද කරනවා. එතුමාගේ දීර්ඝ කාලීන ව්‍යවස්ථා නීතිය පිළිබඳ තිබෙන අත්දැකීම පාවිච්චි කරලා මේ රීති හදන්න දීපු දායකත්වයට අපි ස්තුතිවන්ත වෙමින්, ඔබතුමාට ස්තුති කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති සංශෝධනයක් අවශ්‍යව තිබෙන බව අපි මේ සභාවේදී පිළිගන්නවා. මොකද කාලයක් ගත වීමත් එක්ක රීතිවලට අනුව කටයුතු කරගෙන යාමේදී ඇති වන අඩුලුහුඩුකම් අවම කර ගැනීමේ අවශ්‍යතාවය අපි මේ සභාවේදී පිළිගන්නවා. නමුත් ගරු සභාපතිතුමනි, මේ රීති සංශෝධනය තුළ අපට ප්‍රධාන වශයෙන් සමහරක් වෙලාවට ඉතිහාසයට බලපාන - ඒ කරුණු කාරණා සම්මත කරගන්න දීලා, අපි ඉතිහාසයේ වැරැදිකරුවන් නොවී මේකට සම්මාදන් වීමේ පැත්තෙන් අපි මේක සලකා බලන්න ඕනෑ. ඒක නිසා තමයි අපි කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ පළාත් සභා පනතින් සීමා පනවා තිබෙන කිසිම ධුරයක් රීතිවලට ඇතුළත් කිරීමේ බලයක් අපට නැහැ, ගරු සභාපතිතුමනි. මොකද එහෙම තැනක් මේකේ හදලා නැහැ. ඒ නිසා සභා නායක ධුරයත්, මෙම රීති මාලාවට ඇතුළත් කිරීමේ හැකියාව අපට නැහැ. ආණ්ඩු පක්ෂ සංවිධායක ධුරය, විපක්ෂ නායක ධුරය, විපක්ෂයේ සංවිධායක යනුවෙන් ධුරයන් ඇතුළත් කර ගැනීම ඇත්තටම මේ රීති මාලාව තුළ තිබෙන ප්‍රධානම ප්‍රශ්නකාරී ප්‍රශ්නයක් බවට පත් වෙනවා. මොකද සභානායක හෝ ආණ්ඩු පක්ෂයේ සංවිධායක ලෙස, දැන් පාර්ලිමේන්තුවේ ආදර්ශයක් තිබෙනවායි කියන කාරණය සමහරක් වෙලාවට තමුන්නාන්සේලාගෙන් මතු වෙනවා. ඒ කියන්නෙ ආණ්ඩු පක්ෂයේ සංවිධායක ඉන්නවා. සභානායක පාර්ලිමේන්තුවේ ධුරයන්ගේ තිබෙනවා. එතකොට පාර්ලිමේන්තුවේ ආදර්ශයන් පළාත් සභාවට ගන්න පුළුවන්. ඒ ආදර්ශයන් අනුව මේ ධුරයන් දෙක එන්න ඕනෑය කියන අදහසක් එදා මේ රීති සම්බන්ධව සාකච්ඡාවේදී, මේ කාරණය සම්බන්ධව අපි කරුණු ඉදිරිපත් කිරීමේදී යම් යම් මන්ත්‍රීවරුන්ගෙන් අවිධිමත් විධියට හරි පැන නැඟුණා.

අපි කියන්නේ ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා කැබිනට් මණ්ඩලය නියෝජනය කරනවා. මොකද ඒගොල්ලන්ට ඒ ධුරයන් දරන්න බැහැ, කැබිනට් මණ්ඩලයේ ඉන්නේ නැතිව. මොකද, ඒ අයගේ රාජකාරිය වෙලා තිබෙන්නේ මේ සභාව කල් තබන අවස්ථාවේදී හෙට උදේ 09.30 දක්වා සභාව කල් තබනවා කියනවා විතරක් නොවෙයි. ඒ අයට විශාල රාජකාරියක් පැවරිලා තිබෙනවා. ඒ අය අනිවාර්යයෙන් ඒ පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ ඉන්නවා. ඕනෑ වෙලාවක ආණ්ඩු පක්ෂයේ සංවිධායක, සභා නායක පාර්ලිමේන්තුවේ සොයා ගන්න පුළුවන්. මොකද, ඒ අයට විශේෂ රාජකාරි පැවරිලා තිබෙනවා. ඒ නිසා මැති ඇමැතිවරු ඇවිල්ලා නැතත් ඒ රාජකාරිය ඉෂ්ට කිරීම සඳහා ඒ අය පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ. ඒ නිසා ඒ අයගේ කාර්යභාරය වෙලා තිබෙන්නේ, මේ ගණපූරණයට කට්ටිය එකතු කරලා දෙන එක නොවෙයි. ඇත්තටම දීලා තිබෙන්නේ, ඒ ගොල්ලෝ ඇමැතිවරු වෙනුවෙන් ඒ සියල්ල සම්බන්ධීකරණය කිරීමේ හැකියාව ඔවුන්ට තිබෙනවා. ඔවුන්ට ඒ අදාළ අමාත්‍යාංශයේ භාරව ඉන්න ඇමැතිවරයාගේ කටයුත්ත, කෙලින්ම අමාත්‍යාංශ ලේකම්වරයා විමසලා ලබා ගන්නට

ඒ ගොල්ලන්ට අයිතිය තිබෙනවා ඒ සම්බන්ධව ප්‍රශ්නවලට උත්තර ගන්න ඒ අයිතිය තිබෙනවා. ඒ නිසා එහෙම බලයක් තිබෙනවා. එහෙමනම් මේ ආණ්ඩු පක්ෂ සංවිධායක හෝ සභානායක අපි පත් කර ගන්නවා නම් පත් කර ගත යුත්තේ, මේ රීතිවලට ඇතුළත් විය යුත්තේ, ඒ අන්තර්ගතය තුළ තිබිය යුත්තේ අමාත්‍යාංශය භාරව ඉන්න ඇමැතිවරු පස්දෙනාගෙන් දෙන්නෙක්. අන්න එහෙමනම් ඒ ගොල්ලන්ට පුළුවන් ඒ ධුරය දරන්න. මොකද ඒ ඇමැති මණ්ඩලය ඒ අය නියෝජනය වෙනවා. එහෙම නැතිව වෙනත් මන්ත්‍රීවරු දෙන්නෙක්, මේ සභාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දෙන්නෙක් ඒ සඳහා පත් කර ගැනීමේ හැකියාවක් නැහැ. ඒක නිසා තමයි තිබුණු වැඩමුළුවේදීත් මම ප්‍රධාන වශයෙන් මේ සම්බන්ධව මගේ පැත්තෙන් කරුණු කාරණා ඉදිරිපත් කළේ. ඒ නිසා අපට 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් තමයි මේ පළාත් සභාවේ කැබිනට් මණ්ඩලය 05 කට සීමා කරලා තිබෙන්නේ. ඒක 05 කට සීමා කරලා තිබෙනවා. ඒ නිසා තව ධුරයන් පවත්වාගෙන යාමේ හැකියාවක් මේක ඇතුළේ නැහැ. ඒ නිසා බැරි වෙලාවක් මේකට අපේ අනුකූලතාවය අපිත් ලබා දුන්නොත් ඉතිහාසයට කොයි මොහොතේ හෝ වැරැදිකාරයෝ, අපිත් ඒ වැරැදි කාරයෝ බවට පත් වෙනවා.

ඒ නිසා අපි කියන්නේ, රීති සංශෝධනයත් සමඟ එකී ධූර දෙක දරන්න පුළුවන්. හැබැයි, කැබිනට් මණ්ඩලයේ පස් දෙනාගෙන් දෙන්නෙක් තමයි ඒක දරන්න පුළුවන්. දැන් අපි දන්නවා. මේකේ ළඟම තිබෙනවා, ගීතා කුමාරසිංහ මැතිනියගේ සිද්ධිය. අධිකරණයට ගිහිල්ලා අධිකරණය ඉදිරියේ මේ සම්බන්ධව සාකච්ඡා කරලා අධිකරණයෙන් තීන්දුවක් ආවොත් මොකද වෙන්නේ? දැන් එතුමියට වෙලා තිබෙන්නේ ඒකයි. එතුමිය තමන්ට අයිති නැති ධූරයක්, මන්ත්‍රීධූරයක් දරලා තිබෙනවා. ඒ මන්ත්‍රීධූරය දැරීමේදී තමන් ලබපු සියලු වරප්‍රසාද, ඒකේ ප්‍රතිලාභ ආපහු ගෙවන්න වෙලා තිබෙනවා. ඒ නිසා මේ රටේ අපි යන්න ඕනෑ නැහැ. මේ රටේ කවුරු හරි සිවිල් පුරවැසියෙක් අධිකරණයට ගිහිල්ලා ඒගොල්ලෝ කිව්වොත් එහෙම, මේ පළාත් සභාවේ අපි ඡන්දය දීලා යවපු අයගෙන් - ඒකේ මහජන නියෝජිතයෝ හැටියට ඒගොල්ලෝ අපේ මුදල් ටික අරගෙන තිබෙනවා, මේ මේ ධූරයන් හරහා. ඒගොල්ලෝ වරප්‍රසාද භුක්ති විඳලා තිබෙනවා. ඒකට මේ තරම් ප්‍රමාණයක් වැය වෙලා තිබෙනවා. ඒක නැවත රටට ඕනෑය කියලා අධිකරණය ඉස්සරහාට ගිහිල්ලා මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරලා ඉදිරියට ගියොත් සමහර වෙලාවට ඒ ධූරය දරපු කට්ටියට මේවා ගෙවන්නත් - ඒක කියන්න බැහැ. ඒක රීතිවලින් කෙළින් කරන්න බැහැ. ගරු සභාපතිතුමනි, ඒක රීතිවලින් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. ඔබතුමන්ලා හිතනවා රීති වලින් පුළුවන් කියලා දැන් අපට පේනවා. මේ රීති සංශෝධනය ඇතුළේ අන්න ඒ වැඩේ මේක ඇතුළේ තිබෙනවා. නමුත් ඒක වැරදියි. ඒ නිසා මේ රීති සංශෝධනයට මේ ධූරයන් ඇතුළත් කරනවා නම් අනිවාර්යයෙන්ම මේ රීතිවලට එරෙහිව අපට ඡන්දය පාවිච්චි කරන්න වෙනවා. අපට කරන්න දෙයක් නැහැ. අපට මේ හෙක්ටර් බෙත්මගේ මැතිතුමා එක්කවත්, එහෙම නැත්නම් චන්දන ජයකොඩි මැතිතුමා එක්කවත් එතුමන්ලා එක්ක තිබෙන පෞද්ගලික ප්‍රශ්නයක්වත් නොවෙයි මේ. ඒක තේරුම් ගන්න ඕනෑ. එහෙම නැත්නම් මේ අපට තිබෙන ඊර්ෂ්‍යාවක්. අපට දරන්න බැරි ධූරයන් ඒගොල්ලෝ දරනවාය කියලා ඒ සම්බන්ධව තිබෙන අපට කැක්කුමක් නොවෙයි මේ තිබෙන්නේ. අපි මේ සභාවක කටයුතු කරනවා නම්, ඒ සභාවේ ඒ නීතිරීතිවලට, ව්‍යවස්ථාවලට අදාළව අපි කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතිව අපට අයිතියක් නැහැ. අපට වැරදි විදියට රීතිවලට ඒක ඔබලා ඉවර වෙලා අපට ඒවා සකස් කර ගැනීමේ ඉඩක් ව්‍යවස්ථානුකූලව අපට ලැබිලා නැහැ. ඒ නිසා ඔන්න ඔය ප්‍රශ්නය තිබෙනවා. ඒක තමයි මේ රීතිවල අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය. ප්‍රධානම ගැටළුව බවට පත් වෙලා තිබෙන්නේ.

ඊට පස්සේ ගණපූරණය. දැන් මෙම රීතිවලට අනුව ගරු සභාපතිතුමනි, වගකීම තිබෙන්නේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට හා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට. මේ රීතිවල තිබෙනවා, ආණ්ඩු පක්ෂයේ සංවිධායක හා විපක්ෂයේ සංවිධායක. ගරු සභාපතිතුමනි, ඒක වැරදියි. මේ සභාවේ ගණපූරණය - දැන් අදත් ප්‍රශ්නය මතු වුණේ? මේ ගණපූරණයේ වගකීම තිබෙන්නේ තනි පුද්ගලයෙකුට කවුරුහරි ධූරයකට නොවෙයි. ඒකේ වගකීම සමස්ත සියලුම මන්ත්‍රීවරුන්ට තියෙන්නේ. මාධ්‍ය හරහා යනවා නම් බස්නාහිර පළාත් සභාවේ ගණපූරණය නැහැයි කියලා. ඒකට අපිත් වගකියන්න ඕනෑ. තමුන්නාන්සේලාත් වගකියන්න ඕනෑ. මේ ඔක්කොම වගකියන්න ඕනෑ. මන්ත්‍රීවරු හැටියට අපි අසමත් වෙලා තිබෙනවා, මේකේ ගණපූරණය රැක ගන්න. අපට අයිතියක් නැහැ කිසියම්

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ධූරයකට ගණපූරණය දෙන්න. පාර්ලිමේන්තුවේ ඒක තමයි මම කිව්වේ ආණ්ඩු පක්ෂයේ සංවිධායක, සභානායක ඉන්නේ ගණපූරණය හදලා දෙන්න නොවෙයි. දැන් මොකද වෙන්නේ? අදත් මේ ප්‍රශ්නය මතු වුණා. ගණපූරණය සම්බන්ධ ප්‍රශ්නය. අපි හිතමු මේ රීතිවලින් අපි දැම්මොත් ආණ්ඩු පක්ෂයේ සංවිධායකටයි ආණ්ඩු පක්ෂයේ ගණපූරණය රැකීමේ වගකීම තිබෙන්නේ කියලා. දැන් මේ රීතිවල තිබෙන්නේ එහෙමයි. ආණ්ඩු පක්ෂයේ ගණපූරණයේ වගකීම දරන්න ඕනෑ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක කියලා. ඔය පැත්තෙන් වැඩිපුර ගණපූරණය ප්‍රශ්නය එනවා. ඇයි? තමන් අයිති නැහැ ඒකට. ගණපූරණය ප්‍රශ්න කරන මන්ත්‍රීවරයාට ඒක අදාළ නැහැ. තමන් අයිති නැහැ. මොකද, නිතර නිතර ගණපූරණය ප්‍රශ්නය මතු කරලා මේ සභාවේ ගණපූරණය නැති කළාට පස්සේ ඒකේ වගකීම තිබෙන්නේ කාටද? කවුද අසමත්. අසමත් ආණ්ඩු පක්ෂයේ සංවිධායක. අසමත්. ඊට පස්සේ එයාට විශ්වාසභංගයක් ගේන්න මේක පෙරළා පාවිච්චි කරන්න පුළුවන්. එයා අසමත් වෙලා තිබෙනවා ධූරය දරන්න. ධූරයේ රාජකාරිය කරන්න. ධූරයේ වගකීම දරන්න. විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් එක්ක - අපි දන්නවා සමහර තිබෙන ප්‍රතිවිරෝධයන් කෙළින් පේන්නේ නැහැ. ඒවා ඇතුළේ තිබෙන්නේ. ඒවා කවුරුවත් කෙළින් කියන්නේ නැහැ. විපක්ෂයේ සංවිධායක ධූරය දරන මෙතුමා සම්බන්ධව ඒ තිබෙන මොකක් හරි ප්‍රතිවිරෝධයක් තිබෙනවා නම් එහෙම, ඒ ප්‍රතිවිරෝධය පාවිච්චි කරන්න පුළුවන් මෙහෙන් නිතර නිතර ගණපූරණය ප්‍රශ්න කරලා. ප්‍රශ්න කරලා - ගණපූරණය නැත්තේ කොහේද? ගණපූරණය රැක ගන්න අසමත් වෙලා තිබෙන්නේ වැඩිපුර විපක්ෂය. ඒ නිසා ඒක අදාළ කර ගන්න පුළුවන් විපක්ෂයේ සංවිධායක තනතුරෙන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය මග හදා ගන්න. මේ රීතිවල නැහැ, ගණපූරණය නැති වුණු නිසා මේ ධූරය ආලා යන්න ඕනෑය කියලා. නමුත් ඒකට මග හදා ගන්න පුළුවන්. ඒ නිසා මේ රීතිවලට මේ ගණපූරණය ඇතුළත් කළොත් මේ සභාවේ මේ තරමින්වත් මේක අරගෙන යන්න බැරි විධියට නිතර නිතර නිතර ගණපූරණය ප්‍රශ්නය මේ සභාවේ එනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා ඇත්තටම ගණපූරණය හරි නම් මේකට අදාළ කර ගන්න බැහැ.

ඒ වාගේම තමයි. මේකේ සාධනීය කාරණයක් හැටියට සභාවේ වැඩ කටයුතු සවස 2.00 දක්වා දීර්ඝ කිරීම සම්බන්ධව අපි සතුටු වෙනවා. මොකද, ඇත්තටම මේ තිබෙන තත්ත්වයන් ඇතුළේ විශේෂයෙන්ම පෞද්ගලික පැහැදිලි කිරීම්වලට විශාල කාලයක් යනවා. ඒකත් එක්ක තව පැය භාගයක් හරි මේකට - අන්න ඒක අපට කර ගන්න පුළුවන්. රීතිවලින් සකස් කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඊට පස්සේ මේකේ තිබෙනවා, 29 වන පිටුවේ 20(2) යටතේ ගරු සභාපතිතුමනි, ලිපි ලේඛන පිළිගැන්වීම. මේ ලිපිලේඛන පිළිගැන්වීම යටතේ - ඒක පරණ එකෙත් තිබුණා. හැබැයි, ගරු සභාපතිතුමනි, ඒක යටතේ තිබෙනවා, මේ ලිපි ලේඛන පිළිගැන්වීම යටතේ 29 වන පිටුවේ. එකේ තිබෙනවා, මෙන්න මෙහෙම. 20(2) යටතේ තිබෙන්නේ.

*"කිසියම් ලිපිලේඛනයක් පිළිගැන්වීමේදී එහි අඩංගු කරුණු ගැන කෙටියෙන් විස්තරයක් කළ හැකිය. එහෙත් ඒ සම්බන්ධයෙන් විවාදයක් නොපැවැත්විය යුතුය."*

ඒක ඇත්ත ගරු සභාපතිතුමනි. අපි පිළිගන්නවා. නමුත් මේකෙන් සීමා කරනවා නම්, එකී ලිපිලේඛනයක තිබෙන මොකක් හරි අඩුපාඩුවක්. ඒක ප්‍රායෝගිකව වෙන්න පුළුවන්. ඒ අඩුපාඩුව පෙන්වා දීමේ හැකියාව ඒ ලිපිලේඛන පිළිගන්වන අවස්ථාවේදී ඒ සම්බන්ධව විවාදයක් නොවෙයි. කෙටියෙන් මන්ත්‍රීවරයෙකුට පෙන්වා දීමේ හැකියාව තිබෙන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම විස්තරයක් කළ හැකිය කියන්නේ මන්ත්‍රීවරයාට නොවෙයි නේ? ඒක ඒ ලිපිලේඛන පිළිගන්වන ගරු සභාපතිතුමාට ඒ හැකියාව තිබෙනවා ඒ සම්බන්ධව විස්තරයක් කරන්න පුළුවන්. ඒකෙන් මෙතැනට ඇතුළත් වෙන්න ඕනෑ එකී ලිපිලේඛන සම්බන්ධව මන්ත්‍රීවරයෙකුට පැන නැගෙන මොකක් හරි අඩුපාඩුවක් සම්බන්ධව මේ ගරු සභාවට පෙන්වා දීමේ හැකියාව තිබෙන්න ඕනෑය කියන කාරණාව. පොදුවේ.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි. ඊළඟ කාරණය හැටියට පෙත්සම්. මේකේ තිබෙනවා, 31 වැනි පිටුවේ, 5 යටතේ. ඒක ඉවත් කළ යුතු වගන්තියක්. මම ඒක

කලිනුත් එදා වැඩමුළුවේදීත් කිව්වා. මේක මෙතැනින් ඉවත් වෙන්න ඕනෑ. මොකද, මේකේ තිබෙනවා,

*"අදාළ පෙත්සම්කරු පදිංචි දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු විසින්ම පෙත්සම ඉදිරිපත් කළ යුතු අතර, එකී පෙත්සම පැවැත්වෙන අනුකාරක සභාවට එකී දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් ඇතුළත් නොවිය යුතුය."*

කියලා. මේක පිළිගන්න බැහැ ගරු සභාපතිතුමනි. මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් කියලා කියන්නේ, මේ පළාත නියෝජනය කරන්නේ. ඔහු පත් වෙන්නේ දිස්ත්‍රික්කයකින් තමයි. ඇත්ත. නමුත් දිස්ත්‍රික්කයකින් පත් වුණාට ඒ පළාත තුළ තිබෙන මහජනතාවගේ ප්‍රශ්නයක් ඔහු පළාත් සභා මන්ත්‍රී. දැන් පාර්ලිමේන්තුව කියන්නේ ජාතික ආයතනය. එතකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට පෙත්සමක් ඉදිරිපත් කරලා තිබෙනවා. අරහේ හම්බන්තොට ප්‍රදේශයේ කවුරුහරි කෙනෙකුගේ වුණත් තමන්ට හැකියාව තිබෙනවා ඉදිරිපත් කරන්න. දැන් මේකේ හැම දිස්ත්‍රික්කයක්ම නියෝජනය කරන පක්ෂවල මන්ත්‍රීවරු ඉන්නවා. හැබැයි, සමහර විට මේකේ ඉන්න පුළුවන්. කොයි යම් හෝ අවස්ථාවකදී ඒ මන්ත්‍රීවරයා විතරයි ඒ පක්ෂය නියෝජනය කරන්නේ. ඔහු පළාත් සභා මන්ත්‍රී. ඒ නිසා ඔහු දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි කොහේ හරි තැනක තිබෙන පෙත්සමක් වුණත් ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා. මේකේ අත්දැකීම තිබෙනවා අපට. අපට 1997 පාර්ලිමේන්තුවේ අපට හිටියේ එක මන්ත්‍රීවරයායි. නිහාල් ගලප්පත්ති මන්ත්‍රීවරයා විතරයි. හැබැයි, අපි මේ කොළඹ තිබෙන සමහර ප්‍රශ්න නිහාල් ගලප්පත්ති ගරු මන්ත්‍රීතුමා හරහා පෙත්සම් ආකාරයෙන් අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඒ මන්ත්‍රීවරයාගෙන් මුළු රටේම වැඩ අරගෙන තිබෙනවා. නමුත් ඒකේ තිබුණා නම් එහෙම හම්බන්තොට මිනිස්සුන්ගේ දෙයක් විතරයි පාර්ලිමේන්තුවට ගෙනියන්න පුළුවන් කියලා අපට එහෙම කරන්න බැහැ. ඒ නිසා මේ වගන්තිය සම්පූර්ණයෙන් වැරදියි. ඒ නිසා මේ වගන්තිය ඉවත් කළ යුතු වගන්තියක් හැටියට අපි දකිනවා ගරු සභාපතිතුමනි. ඒ වාගේම තමයි කල් තැබීමේ යෝජනාව යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එතකොට මන්ත්‍රීතුමන්ලා පෙත්සම් කාරක සභාව නියෝජනය කිරීම.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. ඒකත් එහෙමයි. ඒ නිසා ඒකේ අනු කාරක සභාවට එකී දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් ඇතුළත් නොවිය යුතුය. ඒක කරන්න බැහැ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ අපි ඒකෙන් අදහස් කළේ. දැන් එතැන අසාධාරණයක් වෙන්න පුළුවන්නේ. යම් මන්ත්‍රීවරයෙකු පෙත්සම ගෙනාපු කෙනාට. සමහර විට වෙනවා එහෙම.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා කියන එක මම පිළිගන්නවා. මට තේරෙනවා මේකේ ප්‍රායෝගික පැත්ත. නමුත් එහෙම කියලා අපට වැඩ බෙදීමක් කරන්නේ නැහැ. මොකද, ඒ මන්ත්‍රීවරයාගේ සදාචාරය සම්බන්ධ ප්‍රශ්නයක් ඒක. එහෙම පක්ෂග්‍රාහීව - පෙත්සම් කාරක සභාව කියලා කියන්නේ, ඇත්තටම පෙත්සම් කාරක සභාවේ හරය තමයි අසාධාරණයක් සිදු වුණු කෙනෙකුට සාධාරණය ඉෂ්ට කර දීම සඳහා තිබෙන කාරක සභාවක් වීම. කොහේ හරි තැනක අසාධාරණයක් වුණු කෙනෙකුට සාධාරණත්වය ඉෂ්ට කිරීම වෙනුවෙන්, ඔහු ගැන සලකා බැලීම වෙනුවෙන්. ඒ නිසා තමයි සමහර වෙලාවට අපට ඇත්තටම නීතිමය ප්‍රතිපාදන ඇත්තෙත් නැහැ, ඔහු වෙනුවෙන් ඒ සාධාරණය ඉෂ්ට කරන්න. නමුත් සමහර වෙලාවට අපි අමාත්‍යාංශ ලේකම්වරයෙකුට කියනවා, මේ සම්බන්ධව ඔබතුමා සළකා බලන්න. ඔහුට මේ සඳහා ඉඩකඩක් දෙන්න පුළුවන්ද කියලා. ඒ කියන්නේ අර පෙත්සම්කරු වෙනුවෙන් අඩුම ගණනේ වචනයකින් හරි සාධාරණයක් ඉෂ්ට කරන්න හදන්නේ. ඒ නිසා අන්න ඒ හැකියාව තමයි මේ පෙත්සම් කාරක සභාවේ තිබෙන්නේ. ඒ නිසා කවුරු හරි පක්ෂග්‍රාහීව එහෙම කටයුතු කරනවා නම් ඒක සම්බන්ධ වෙනම කාරණයක්. ඒකට ප්‍රධාන කාරක සභාවේ සාකච්ඡා කරලා ඇත්තටම ස්වාධීනව ඒ තීරණයකට එන්න ඕනෑ, එහෙම කරන්න එපාය කියලා. එහෙම නැතිව කිසියම් හෝ මන්ත්‍රීවරයෙකුට මේ පෙත්සම් කාරක සභාවේ කටයුතු කිරීමේදී අහවල් අහවල් දිස්ත්‍රික්කය කියලා නම් කරලා බැහැ. ඇත්ත නේ? තමන් ඉදිරිපත් කරපු පෙත්සමක් විභාග කිරීමේදී ඒ පෙත්සම් කාරක සභාවේ වාඩිවෙලා ඉන්න එක වැරදියි. ඒක ඇත්ත. ඒක පිළිගන්නවා. අඩු ගණනේ තමන් සදාචාරාත්මකව හිතන්න

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ඕනෑ, මේ මගේ පෙත්සමක්. ඇත්තටම ඒක නීතියෙන් කරන්න ඕනෑ දෙයකුත් නොවෙයි. මේ මගේ පෙත්සමක්. ඒ නිසා මම මේකට අත ගහන්න නරකයි. මම මේ කාරක සභාවෙන් නැගිටලා යනවා. අනික් මන්ත්‍රීවරුන්ට ඒ ඉඩකඩ දීලා. ඒක තමයි ඇත්තටම කරන්න ඕනෑ. හැබැයි, දැන් අපි කරන්නේ, ඔබතුමා දන්නවා. දැන් මම අද පෙත්සමක් ඉදිරිපත් කළා. මම ඉන්නවා අනුකාරක සභාවක. නමුත් ඒ අනුකාරක සභාවට මේ පෙත්සම ගේන්න එපාය කියලා මම කියනවා. මොකද, මේක මම ඉදිරිපත් කරපු පෙත්සමක්. අපි එහෙම ගන්නේ නැහැ. නමුත් මෙතැනදී ඒ අනුකාරක සභාව නියෝජනය කරන්න බැහැයි කියලා තිබෙන එක ඇත්තටම වැරදි කාරණයක් හැටියටයි අපි දකින්නේ.

ඊට පස්සේ මේකේ ගරු සභාපතිතුමනි, මෙහි පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ මේක පෙර දින 4.15 ට පෙර ලිඛිතව ලබා දීම. අපි විශ්වාස කරනවා, ඇත්තටම මේකේ කිසියම් ප්‍රමාණයකින් පෞද්ගලික පැහැදිලි කිරීම්වලට වෙනත් වෙනත් දේවල් එවෙලේ ගෙන ඒම වළක්වා ගැනීම පැත්තෙන් මේකේ ටිකක් සාධාරණයක් තිබෙනවා. ඒක ඇත්ත. ඒක අපි පිළිගන්නවා. රීති අංකය 36(1). 51 පිටුව. ඒකේදී අපි ඒකට එකඟ වෙනවා. ඒක හොඳයි. ඒ වාගේම තමයි මෙහෙම ප්‍රායෝගික ගැටළුවක් එනවා ගරු සභාපතිතුමනි. පෙර දින නිවාඩු දිනයක් නම් මොකද කරන්නේ කියලා. ඒ නිසා මේකට එතැනට සංශෝධනයක් එන්න ඕනෑ. ඊට පෙර රජයේ වැඩ කරන දිනයක් විය යුතුයි කියන කාරණය.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

නිවාඩු දිනයක් නම් ඊට පෙර දින -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඊට පස්සේ ගරු සභාපතිතුමනි, මෙතැන දැන් මේ පළාත් සභාව දිහා බැලුවාට පස්සේ, මේක අපි ආණ්ඩු පක්ෂය කියලා ඉන්නවා. විපක්ෂය කියලා ඉන්නවා. එතකොට මේක රීතිවලදී අවධානය යොමු විය යුතු කරුණක් හැටියට මම දකිනවා. අපි දකිනවා. ඒ මන්ත්‍රීවරයා නියෝජනය කරන්නේ, ආණ්ඩුවද? නැත්නම් විපක්ෂය ද කියලා. ඇත්තටම දැන් අපේ බස්නාහිර පළාත් සභාව පැත්තෙන් ගත්තොත් එහෙම මේක සොයා ගන්න බැරි විකෘතියක් බවට පත් වෙලා තිබෙන්නේ. දැන් උදාහරණයක් හැටියට අපි දන්නවා. සරත් ෆොන්සේකා මැතිතුමා නියෝජනය කරමින් මේ සභාවට මට මතක හැටියට ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය නියෝජනය කරන කණ්ඩායමක් ඉන්නවා. ඒකේ කණ්ඩායම් නායකයෙකුත් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද නම් නැහැ හැබැයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අද නැහැ. කණ්ඩායම් නායකයෙකුත් ඉන්නවා. අද අපට ප්‍රශ්නයක් තිබෙනවා. එකක් තමයි ඒ ප්‍රශ්නය අද තිබෙනවාද නැත්නම් ඔවුන් එක්සත් ජාතික පක්ෂයට පත් වෙලාද කියන එක තේරෙන්නේ නැහැ. ඒ නිසා ඇත්තටම අපි සභාව හැටියට ඒක පැහැදිලි කර ගත යුතු වෙනවා. එතුමන්ලා මේ විපක්ෂය නියෝජනය කරන හැටියට. ඒ නිසා ඒකට උත්තර දෙන්න පුළුවන් ඇත්තටම සමතෙක් නැහැ. මට හිතාගන්න බැහැ එතුමන්ලාටවත් ඒකට උත්තර දෙන්න පුළුවන්ද කියලා. තමන් නියෝජනය කරන්නේ අර ආපු පක්ෂයද? එහෙම නැත්නම් එක්සත් ජාතික පක්ෂයද? මෙතැන කණ්ඩායම් නායකයෙක් ඉන්නේ එහෙම පක්ෂයක් තිබෙන නිසා. ඒ නිසා එතුමා මෙතැන ඉඳගෙන ඉන්නවාට ප්‍රශ්නයක් නොවෙයි මේ තිබෙන්නේ. එතුමා මෙතැන ඉඳගෙන ඉන්නේ එහෙම පක්ෂයක් තිබෙන නිසා. නමුත් ඇත්තටම මේ මහපොළොවේ එහෙම පක්ෂයක් තිබෙනවාද කියලා ගැටළුවක් තිබෙනවා. ඒ නිසා මේ සභාවේ ඒවා සොයලා බලලා ඒක නිරවුල් කර ගන්න ඕනෑ. ඒ වාගේම මේ රීති සංශෝධනයෙන්වත් ඒකට විසඳුමක් නැහැ. ඒ වාගේම තමයි ජාතික හෙළ උරුමය පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් මේ සභාව තුළ ඉන්නවාද? ඒ මන්ත්‍රීවරුන් නම් වශයෙන් කවුරුන්ද? දැන් ඒක සොයා ගන්නත් අමාරුයි. ඒගොල්ලෝ නම් වශයෙන් කවුරුන්ද? මොකද, ඒගොල්ලෝ ඉන්න තැන් අනුව. ඒ නිසා ඔවුන් මේ සභාවේ අයත් වන්නේ ආණ්ඩු පක්ෂයටද? නැත්නම් විපක්ෂයටද? ඒකත් සොයා ගන්න බැහැ. එතුමන්ලා එහේ තමයි වාඩි වෙලා ඉන්නේ. ඒ පැත්තේ තමයි වාඩි වෙලා ඉන්නේ. නමුත් ජාතික දේශපාලනය වෙන එකක්. දැන්

මට හිතෙන්නේ, එහෙම කටයුතු කරන්න පුළුවන්ද කියන එක. මොකක් හරි කියන කොට අනන්‍යතාවයක් තිබෙනවා නේ? මෙතැන එක අනන්‍යතාවයක්. එළියට යන කොට වෙන එකක්. අපට එක හැඳුනුම්පතයි තිබෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇයි බැරි. ඔබතුමන්ලා එළියේ ආණ්ඩුවට විරුද්ධව කථා කරලා ඇතුළේ අත උස්සන්නේ? පුළුවන්ද එහෙම.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කොහේද අත ඉස්සුවේ. අපි හැම එකකටම විරුද්ධව අත උස්සන්නේ නැහැ. දැන් තමුන්නාන්සේලාට වෙලා තිබෙන්නේ ඒක නේ? දැන් තමුන්නාන්සේලාට වෙලා තිබෙන්නේ, මේ ගරු මන්ත්‍රීතුමා, මේ රීති සම්බන්ධ ප්‍රශ්නය අද ගණපූරණය නැති කරන්න මොකක්ද තමුන්නාන්සේලාට බලපාන කාරණය. මොකක්ද බලපාන කාරණය? අර පොඩි ළමයින් බඩු පොළොවේ ගහන්නේ. මෙතැන අද උදේ වුණේ ඒකනේ. අර බඩු පොළොවේ ගහනවා වාගේ වැඩක් කළානේ අර එක මන්ත්‍රීවරයෙක්. ඉතින් ඒ නිසා දේශපාලනය කියන්නේ ගරු මන්ත්‍රීතුමා ඒක නොවෙයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දේශපාලනය කියන්නේ එළියේ කෑ ගහලා ඇතුළේ අත උස්සන එකද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒවා මොකක් හරි මතවාදී ප්‍රශ්න තිබෙනවා නම් ඒවා බේරා ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කරන්න එපා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

දේශපාලනය, කුමාර ගුණරත්නම් මහත්තයා ඕගොල්ලන්ට රීයේ කියලා දුන්නා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙමත් නැත්නම් දැන් සමහර මන්ත්‍රීවරු ඉන්නවා ඇත්තටම. එහෙටත් නැහැ, මෙහෙටත් නැහැ. ඒක සොයා ගන්න බැහැ. මේ පැත්තෙත් ඉන්නවා වාඩි වෙලා. අපට සොයා ගන්න බැහැ ඒගොල්ලෝ කොයි පැත්තේද ඉන්නේ කියලා. ඇත්තටම විපක්ෂය ද ඒගොල්ලෝ නියෝජනය කරන්නේ? එහෙම නැත්නම් ආණ්ඩු පක්ෂය නියෝජනය කරනවාද? ඒක පැහැදිලි නැහැ.

ඊළඟ එක තමයි ගිණුම් කාරක සභාවට පත් කිරීම. මේකේ ගරු සභාපතිතුමනි, අවුරුදු දෙකකට සාමාජිකත්වය සීමා වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙකහාමාරකට.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දෙකහාමාරකට. නමුත් ඒකෙන් අර නැවත පත් කිරීමේ ආකාරය පැහැදිලි කිරීමක් නැහැ. එතකොට ඒ අවුරුදු දෙකහාමාර තුළ හිටපු අයට ආපහු පත් වෙන්න පුළුවන්ද? ඒක වෙන්නේ කොහොමද? ඒක මේ රීතිවල අඩංගු වෙන්නේ නැහැ. ඊට පස්සේ විශේෂයෙන්ම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා වාගේ ඇත්තටම ගිණුම් කාරක සභාව කියලා කියන්නේ, ඒක අපි නියෝජනය කරන හින්දා කියනවා නොවෙයි. ඇත්තටම මේ පළාත් සභාවේ මේ අමාත්‍යාංශවල, මේ මණ්ඩලවල, එහෙම නැත්නම් මේ අධිකාරීවල සැහෙන වැඩ කටයුතු ටිකක් පරීක්ෂා කරන, ඒ වාගේම තමයි පළාත් පාලන ආයතන සම්බන්ධව ගොඩක් තොරතුරු එකතු කරන එහෙම තැනක්. එතකොට දැන් ඒ වාගේ තැනක ඇත්තටම ඒකේ වැඩ බලන සභාපති ධුරය ගරු සභාපතිතුමනි, ස්වාධීන වෙන්න ඕනෑ. ඒක ඇත්තටම මට මතක හැටියට පනතින් ගරු මහ ඇමතිතුමා තමයි ඒකේ සභාපති. එතකොට ඇත්තටම ප්‍රායෝගිකව බැලුවොත් එහෙම, මහ ඇමතිතුමාට ඒකේ සභාපති ධුරයේ සතියකට සැරයක් ඇවිල්ලා, ඒකේ වාඩි වෙලා, ඒක කරන්න ඇත්තටම අපහසුතාවයක් ප්‍රායෝගිකව තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. ඒ නිසා ඉතිහාසයේ සිට වෙලා තිබෙන්නේ, වැඩ බලන

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

සභාපතිවරයෙක් පත් කර ගන්නවා. එහෙම තමයි පත් කරන්නේ. ඒ වැඩ බලන සභාපතිතුමාව එතුමා තමයි පත් කරලා එවන්නේ. දැන් අපට ප්‍රශ්නය තිබෙන්නේ, වැඩ බලන සභාපතිවරයෙක් පත් කරලා එව්වාට පස්සේ, ඒ වැඩ බලන සභාපති තමන්ගේ කාර්යභාරය ස්වාධීනව කර ගෙන යනවා නම්, එකපාරටම මහ ඇමතිතුමා විසින් ඒ වැඩ බලන සභාපති ඉවත් කිරීමේ සදාචාරය මොකක්ද? එතකොට ඒ ගිණුම් කාරක සභාවේ වැඩ බලන සභාපතිත් එක්ක ඒ අවශ්‍ය කටයුතු ටික අපි කරනවා. ඒක ගැටළුවක් බවට පත් වෙලා නැහැ. නමුත් මේ සභාවට ආවාට පස්සේ අපට දේශපාලන මතවාද තිබෙනවා. වැඩ බලන සභාපතිවරයා එක මතවාදයක ඉන්නවා. ඒකම නියෝජනය කරන අපි මෙහේ වෙන මතවාදයක ඉන්නවා. නමුත් ඒක අපි ගිණුම් කාරක සභාවේදී අදාළ කර ගන්නේ නැහැ. අපි ඒක ස්වාධීනව පවත්වාගෙන යනවා. ඒක ස්වාධීනව පවත්වාගෙන යෑම සඳහා අපි හැම මන්ත්‍රීවරයෙක්ම ඒ සම්බන්ධව කැප කිරීමක් කරනවා.

එතකොට එහෙම තිබෙද්දී එක පාරට ඒ ඇති වුණු මොකක් හරි, තම තමන් තුළ තමන්ගේ පක්ෂවල ඇති වුණු දේශපාලන තත්ත්වයන් ඇතුළේ එක පාරටම වැඩ බලන සභාපති ඒකෙන් ඉවත් කරනවාය කියන්නේ, අපේ ස්වාධීනත්වය සම්බන්ධ ප්‍රශ්නයක්. මොකද, අපි ඒ ගිණුම් කාරක සභාවට - දැන් සමහර වෙලාවට සතියකට එක දවසයි. සමහර වෙලාවට සතියට දවස් දෙකක් අපි ඔය ගිණුම් කාරක සභාවට එනවා. වෙන වැඩ නැතිවාට නොවෙයි. අපි ඒකේ වටිනාකම දන්න නිසා. ඒක අපි නියෝජනය කරන්න ඕනෑ නිසා. එහෙම කටයුතු කරන තැන. එතැන එහෙම අපි කටයුතු කරද්දී, එකපාරටම අපි වැඩ බලන සභාපති ඉවත් කරලා මහ ඇමතිතුමා වෙනත් කෙනෙකු මේකට උඩින් පත් කරලා එව්වාට පස්සේ - අපි මේ වැඩ කරන්නේ ආයතනයක සේවකයෝ ලෙස නොවෙයි. අපි මේ ආයතනයේ පඩියට වැඩ කරන කට්ටිය නොවෙයි. අපි මහ ඇමතිතුමාගේ පඩියෙන් මේ ගිණුම් කාරක සභාවේ සේවය කරන මිනිස්සු නොවෙයි. අන්න ආයතනයක ප්‍රධානියෙකු තමන්ගේ ආයතනයේ වැඩ කරපු කෙනෙක් ඉවත් කරලා, වෙන කෙනෙකු එව්වාට පස්සේ අපි සේවකයෝ නේ? ස්වාමියා කියන දේ අපි භාර ගන්න ඕනෑ. ස්වාමියාගේ මොකක් හරි ප්‍රශ්නයක් නිසා ඒ ආයතනයේ හිටපු ප්‍රධානියාව, එහෙම නැත්නම් මැනේජර්ව ඉවත් කරනවා. අපට අයිතියක් නැහැ ස්වාමියාගෙන් අහන්න, බොස් ඇයි එහෙම කළේ? ඒක වැරදි නේ කියලා කියන්න අපට අයිතියක් නැහැ. නමුත් මේකේ අපි සේවකයෝ නොවෙයි. මේ ගිණුම් කාරක සභාවේ මහජන නියෝජිතයෝ. අපි මහජන මන්ත්‍රීවරු. ඒ නිසා ඒ වැඩ කටයුත්ත කරන, ඒ කටයුත්ත කර ගෙන යන අපට ඒකේ ගැටළුවක් නැත්නම්, ඒ වැඩ බලන සභාපති ඉවත් කිරීමේ හැකියාවක්, එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම් තිබෙන්න ඕනෑ, කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධව ඔබතුමාගේ අදහස ප්‍රකාශ කරන්න. මොකක්ද රීතිය? අපි කොහොමද වෙනස් කරන්න ඕනෑ කියන එක සම්බන්ධව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේකේ සඳහනක් නැහැ ගරු සභාපතිතුමනි. මම ඒකයි කියන්නේ. ඒක ඇතුළත් කරන්න ඕනෑ. මගේ සංශෝධනවලත් මම ඒක දාලා නැහැ. ඒක ටිකක් විවාදයට භාජනය වන එකක් නිසා. ඒ නිසා ඒකට ඇතුළත් කරන්න ඕනෑ, ඇත්තටම ඒක ඉවත් කිරීමේ බලය. මොකක් හරි ගැටළුවක් තිබෙනවා නම්, මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් වෙන්න ඕනෑ. ඒ වාගේම තමයි තමුන්නාන්සේලා නියෝජන කරන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කියන්නේ කාරක සභාවේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විනාඩියක් දෙන්න සමාවෙලා. එහිදී මහ ඇමතිතුමාගේ නියෝජිතයෙකු හැටියට නේ පත් කරන්නේ. ඉතින් මහ ඇමතිතුමාත් එක්ක සම්බන්ධතාවයක් නැති, විශ්වාසයක් නැති කෙනෙකු වුණාම, එතුමාට කැමැති කෙනෙකුව පත් කරන්න අවශ්‍ය පසුබිම තිබෙන්න ඕනෑ. මොකද, එතුමා වෙනුවෙන් පෙනී සිටින කෙනෙක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක එක එක විධියට අපට පේනවා. නමුත් ප්‍රායෝගිකව අපි දන්නවා. ඒ විශ්වාසවන්තකම - මොකද, එක පාරට - දැන් අපි නම් කියලාම කියමුකෝ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සම්බන්ධව ගිණුම් කාරක සභාවේ විශ්වාසවන්ත භාවය බිඳුණේ කොහොමද? ඒක අපට කවදාවත් දැනිලා නැහැ. මොකද, ඒ රාජකාරියේදී එතුමා - දැන් අද උදෙත් එහෙම නේ? මෙතැනදී ඇති කරන ගැටුමක් ගිණුම් කාරක සභාවේදී එතුමා වැඩ බලන සභාපති හැටියට ඒ කටයුතු කිරීමේදී එහෙම තැනකට එතුමා යන්නේ නැහැ. එහෙම තැනකට යන්න අපි ඉඩ දෙන්නෙත් නැහැ. දැන් එහෙම නම් එතුමා හිටපු මහ ඇමතිතුමාගේ කාලයේ ඒ සමහර සමහර සිද්ධි, ඒවා සියල්ලක්ම සමහර සමහර වැරදි ගෙනැල්ලා අවුස්සලා එළියට ගත්තා නේ? එතුමා ඒවා වහගෙන ඉන්න කටයුතු කළේ නැහැ. මම දන්නේ නැහැ. අපි දැනුවත්ව. ඉතින් එහෙම කටයුතු කළේ නැහැ. ඒ වාගේම තමයි දැන් එතුමාට අලුතෙන් නියෝජිතයෙකු පත් කරලා එවන්න පුළුවන්. ඒක මම පිළිගන්නවා. එතුමානේ පත් කරලා එවන්නේ. පත් කරලා එවන්න පුළුවන්. හැබැයි, කාරක සභාවේ සභාපති. මුල් අවස්ථාවේ පත් වුණාට පස්සේ අලුතෙන් පත් වෙනවා නම්, ඒ වෙන හේතුවක් නැතිව අලුතෙන් පත් වෙනවා නම් ඇත්තටම මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන්, එහෙම නැත්නම් මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරලා තමයි වැඩ බලන සභාපති ධූරය පත් කරන්න ඕනෑ. මොකද, සභාපති ධූරය එතුමාට තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාරක සභාවේ මන්ත්‍රීතුමන්ලාගෙන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. කාරක සභාවේ මන්ත්‍රීතුමන්ලාගෙන්. මොකද, ඇත්තටම දැන් මෙතුමා කියන විධියට ඒ විශ්වාසවන්ත බව සම්බන්ධ ප්‍රශ්නයක් නම් මහ ඇමතිතුමාට පුළුවන් තමන් සභාපති හැටියට වරක් දෙකක් එනවා. නැවිත්ම ඉන්නේ නැතිව. වරක් දෙකක් ඇවිල්ලා ඒ කාරක සභාවේ සභාපති පුටුවේ වාඩි වෙලා එහෙම පරික්ෂා කරන්න පුළුවන්. ඒ වාගේම තමයි එතුමාට ඕනෑ වෙලාවක පුළුවන් ඒකේ කටයුතු පරික්ෂා කරන්න. මම කියන්නේ, එතුමාට විතරක් නොවෙයි. ඕනෑම මන්ත්‍රීවරයෙකුට හැකියාවක් තිබෙනවා. දැන් මේකේ එක ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම ගිණුම් කාරක සභාවේ නියෝජනය කරන මන්ත්‍රීවරු ටිකමයි ඉන්නේ කියලා. හැබැයි, ඒකේ ගැටළුවක් වෙන්නේ නැහැ. ඕනෑ වෙලාවක - දැන් පාර්ලිමේන්තුවේ ඒක අලුතෙන් ඇතුළත් කරලා තිබෙනවා මම දැක්කා. ඒකෙත් අලුතෙන් සභා රීති ආවා. සභාවට. ඒකේ තිබෙනවා, ඕනෑම මන්ත්‍රීවරයෙකුට නිරීක්ෂණ මට්ටමෙන් ගිණුම් කාරක සභාවට යන්න පුළුවන්. නිරීක්ෂණ මට්ටමෙන් යන්න පුළුවන්. එයා නිත්‍ය සාමාජිකයෙකු නොවෙයි. හැබැයි, යන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. තමන්ට අවශ්‍ය ලිපි ලේඛන ඉල්ලාගෙන පරික්ෂා කරන්න පුළුවන්. ඒ විනිවිද භාවය තිබෙනවා. ඒ නිසා එතුමාට අපි කිව්වා. මම කියන්නේ මේකයි. ඇත්ත ප්‍රශ්නය එතුමාව ඉවත් කරන්න, ඒ කියන්නේ වැඩ බලන සභාපතිකම ඉවත් කරන්න හේතු වුණේ, ගිණුම් කාරක සභාවේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක අදාළ -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, වෙන අය යන්නේ කොහොමද? ඉන්න අය එන්නෙත් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ වාගේම තමයි. මම මේක අවසන් කරන්නම්. මෙන්න විශේෂයෙන්ම මම මේකේදී පෙන්වා දුන්නා. ධූරයන් පත් කිරීමේදී තිබෙන ගැටළුව. ඒක මේකේ විශේෂයෙන්ම තිබෙනවා. ඒ නිසා අන්න ඒ ධූරයන් සම්බන්ධව තවදුරටත් මේකේ ඇතුළත් කරනවා නම් - හැබැයි, අපි සලකන්නේ ඔබතුමන්ලා පිළිගන්නවා නම් මේ ධූරයන් කියලා කියන්නේ අර මම කිව්ව විධියට විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂ සංවිධායක ධූරයත්, සභානායක ධූරයත්, අමාත්‍ය මණ්ඩලයේ පස් දෙනාගෙන් කවුරු හරි දෙන්නෙක් කියලා සලකනවා නම් අපට මේකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, එහෙම නැතිව මේ දැන් ඉන්නවා වාගේ වෙනම මන්ත්‍රීවරු දෙන්නෙකුගේ ධූරයන් මේකේ සභාගත කළොත් මේකට ඇතුළත් කළොත් කවදා හරි, කවුරු හරි මේ රටේ පළාතේ සිවිල් පුරවැසියෙකු හරි අධිකරණයට ගියොත් ඒකේ වගකිවයුත්තන් බවට අපිත් පත් වෙනවා. ඒ නිසා ඒක මේකේ ඇතුළත් කරනවා නම්, මේ අලුත් රීතිවලට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, එතකොට විපක්ෂ නායක, විපක්ෂයේ සංවිධායක -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව් ඒකත් අදාළයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ හතරම.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. ඒවාත් අදාළයි. ඒකනේ මම කිව්වේ. ඒක මෙහෙමයි. දැන් ඒවා තිබෙනවා නේ? නමුත් ඒවාත් එක්ක අපි හැප්පෙන්න යන්නේ නැහැ නේ? කමක් නැහැ තිබෙනවා. ඒක එතුමන්ලා පාවිච්චි කරනවා. මොකද, අපි එන්න ඉස්සෙල්ලා ඉඳන් ඒවා හදාගෙන තිබුණා නේ? ඒක අපි අදාළ කර ගන්නේ නැහැ. නමුත් මේ අපි නියෝජනය කරන මේ සභාවේ අපිත් අත උස්සලා මේකට ඇතුළත් කළොත් අපි කවදා හරි වැරදිකාරයෝ වෙනවා. තමුන්නාන්සේලා පවත්වාගෙන යන ඒවා අපට ගැටළුවක් නැහැ. ඒ නිසා මේ සභා රීතිවලට ඇතුළත් කිරීම අපට ගැටළුවක් වෙනවා කවදා හෝ. ඒ නිසා ඒක මේකේ ඇතුළත් වුණොත් මේ සභා රීති සම්බන්ධව අපට බෙදීමක් ඉල්ලලා, ඊට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්න වෙන බව. දේශපාලනික කරුණකින් මම මේක පැහැදිලි කළේ. නැත්නම් පුද්ගලිකව සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ රීති විතරක් ඔබතුමන්ලා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම මේ සම්බන්ධව සංශෝධන ටික ඔබතුමාට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සංශෝධන ගන්න වෙලාවේදී මම එකින් එක ඉදිරිපත් කරන්නම්. මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, අපි අද අනුමත කරන්න යන අපේ කාර්ය පටිපාටි රීති කාරක සභාවේ මේ පොතේ - මම හිර ගෙදර ඉන්න කොට තමයි මට මේක කියවන්න ලැබුණේ. මේකේ තිබෙනවා, පෞද්ගලික පැහැදිලි කිරීම් කියලා. එතකොට ඒකේදී කියනවා - ඒක තිබෙන්නේ, 51 වන පිටුවේ. 34 වන වගන්තිය යටතේ. ඒකේ කියනවා, පෞද්ගලික පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මන්ත්‍රීවරයෙකු ඒ සම්බන්ධයෙන් කල් ඇතිව සභාපතිවරයාට දැනුම් දී අවසර ලබා ගත යුතුය. ඒ වාගේම ඒකේ කියනවා, පෞද්ගලික ප්‍රකාශ කිරීම කාලීන වැදගත්කමකින් යුක්ත ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මන්ත්‍රීවරයෙකු විසින් සිය ප්‍රකාශය සවිස්තරාත්මකව ලියා සභා රැස්වීමට පෙර දින සවස 4.15 ට - එතකොට දැන් කළුතර ඉන්න මන්ත්‍රීවරයෙක් එන්න ඕනෑ සභාවට ඉස්සෙල්ලා දවසේ 4.15 ට කලින් තමුන්නාන්සේගේ කාර්යාලයට. එහෙම නැත්නම් අපේ මීගමුවේ ඉන්න මන්ත්‍රීවරයා එන්න ඕනෑ තමන්ගේ පෞද්ගලික ප්‍රකාශයක් කරන්න භාර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම එන්න අවශ්‍ය නැහැ. ෆැක්ස් තිබෙනවා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමන්ගේ ඉල්ලීම කරන්න කියලා තිබෙන්නේ. එන්න අවශ්‍ය නැහැ. එන්න කියලා නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එන්නේ නැතිව ඉල්ලීම කරන්නේ - කවුරු හරි කෙනෙකු යවන්න එපැයි. මම කියන දේට ඇහුම්කන් දෙන්න කෝ? මට මේක තේරුණේ මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරයාගේ ලේකම්වරයෙක් හෝ මන්ත්‍රීවරයාගේ කවුරු හරි පුද්ගලයෙකු එවන්න ඕනෑ මෙතැනට. මේ ලියුම සභාපතිතුමාගේ කාර්යාලයට භාර දෙන්න. එතකොට කළුතර කෙළවරේ ඉන්න මන්ත්‍රීවරයා එන්න ඕනෑ, රු. 2000 ක 3000 ක පෙට්‍රල් ගහලා මේ ලිපිය භාර දෙන්න. නැත්නම් එයාගේ ලේකම්වරයෙක් එන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම කියලා නැහැ ඔතැන. ෆැක්ස් තිබෙන්නේ ඒකට තමයි. ඊ මේල් තිබෙන්නේ ඒකට තමයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එහෙම නම් මොකක්ද කියන්නේ කියලා ඔබතුමාම නැගිටලා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දෙන්න එතුමාගේ කථාව කර ගෙන යන්න. කමක් නැහැ අපි ඒක -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙතෙක් කල් තිබුණේ උදේ 9.30 ට කලින් ඇවිල්ලා මේක භාර දුන්නා. එතකොට මේක භාර දෙන්න කියන්නේ මේ විධියට. එතකොට දැන් මේ කාරක සභාවට පත් කරලා තිබෙන මන්ත්‍රීවරුන්ගෙන් 13 දෙනාගෙන් කී දෙනාද දැන් මෙතැන ඉන්නේ කියලා බලන්න. දැන් මෙතැන ඉන්නේ පස් දෙනයි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නේ හතර දෙනයි. බලන්න ගණන් කරලා. මොනවාද තව කථා කරන්නේ. මේගොල්ලෝ එක්සත් ජාතික පක්ෂයේ නොවෙයි. මෙතුමා ජේ.වී.පී. එකේ. අර මන්ත්‍රීතුමාත් පැහැදිලි කළෙත් ඒක නේ? මෙතුමා මේ සභාවට අපි දන්න විධියට ආවේ ජෙනරාල්ගේ පක්ෂයෙන්. මේ දෙන්නාම ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේ රීති කෙටුම්පතට අදාළව කථා කරන්න. ඔබතුමා මේ සභාවේ කාලය විනාශ කරන්න එපා. රීති කෙටුම්පත ගැන කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මැතිවරණ කොමසාරිස්ගේ ලැයිස්තුවේ තිබෙන්නේ මේගොල්ලෝ ජෙනරාල්ගේ පක්ෂයේ ඉන්නවා කියලා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, මේ අපේ ප්‍රකාශය නිකුත් කරන්න අපට උදේට ඇවිල්ලා දෙන්න අවසර දෙන්න කියලා මේක සංශෝධනය කරන්න. හරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ වාගේම මේකේ තිබෙනවා, වරප්‍රසාද සම්බන්ධව. වරප්‍රසාද සම්බන්ධව මේකේ රීතියෙන්ම කියන්න තමාගේ වරප්‍රසාදයක් ඉදිරිපත් කරන කොට ඊළඟ මන්ත්‍රීවරයෙකුට කථා කරන්න අයිතියක් නැහැයි කියලා ඇතුළත් කරන්න. දැන් මෙතැන වෙලා තිබෙන්නේ, තමන්ගේ වරප්‍රසාදයක් කියන කොට ඊළඟ එක්කෙනා මොකක් හරි කියලා කුලප්පු කරනවා. කුලප්පු කළාම එයාගේ කාලයත් නැති වෙනවා. කියන දේ සභාගත වෙන්නේත් නැහැ. ඒ නිසා ඒ මන්ත්‍රීවරයා බැනුම් අහ ගන්නවා අනික් මන්ත්‍රීවරුන්ගෙන්. ඒ නිසා මේක පැහැදිලි කර ගන්න. ඒක ඔබතුමාට තිබෙන වරප්‍රසාදයක්. ඔබතුමා නායකයා හැටියට විසඳන්න ඕනෑ ප්‍රශ්නයක් මේක.

ඊට පස්සේ මේකම කියනවා, ප්‍රශ්න ඇසීමේ කාල සීමාව සම්බන්ධව. දැන් ප්‍රශ්නයක් අහන්න මේකේ ක්‍රම දෙකක් දාලා තිබෙනවා. එකක් තියෙනවා, සභාවේ උදේ නවයට පෙර ඉදිරිපත් කරලා සභාවේ ඇමතිවරයෙක් නැගිටලා යන්න කලින් ඒ සභාවේ උත්තරයක් ගන්න පුළුවන්. නමුත් කිසිම දවසක මේ සභාවේ ඔබතුමාගෙන් වරප්‍රසාද ප්‍රශ්නයක් ඇහුවොත් අමාත්‍යාංශයක හෝ ඇමතිවරයෙක් හෝ මොකක් හරි පළාත් සභාවේදී කිසි දවසක ඔබතුමා උත්තරයක් දීලා තිබෙනවාද මේ සභාවට. දැන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා අද උදේ ඇහුවා, පරිපූරකය සම්බන්ධව. මම ගියවර සභාවට කලින් සභාවේ ඇහුවා, පරිපූරකය සම්බන්ධව. ඔබතුමා එතකොට ඒ අමාත්‍යාංශයට කථා කරලා, අහලා මෙතැන ප්‍රකාශයක් නිකුත් කරලා තිබෙනවාද? මේවා ඇතුළත් කරන්න. ඔබතුමාටයි මේකේ තිබෙන්නේ බලය. එතකොට මේ බලය සභාපතිතුමාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මේ අවුල් ඇති වෙන්නේ නැහැ. හරිද? එතකොට වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධව තිබෙන ප්‍රශ්න සම්බන්ධව ඔබතුමා ප්‍රකාශයක් කරනවා නම් එතකොට මේ සභාවේ ආපහු ඒක අහන්න එන්නේ නැහැ. එතකොට දිගින් දිගට ඇදෙන්නේ නැහැ. මොකද, මේකේ වාඩි වෙලා තිබෙන්නේ විශේෂඥ මන්ත්‍රීවරු. මේකේ හෙක්ටර් බෙත්මගේලා වාගේ මිනිස්සු මේක හදලා තිබෙනවා. අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ නායකත්වයෙන්.

ඊට පස්සේ මේකේ තව තිබෙනවා, පොදු කටයුතු ආරම්භ කිරීමට ඉස්සෙල්ලා පොදු කටයුතු ආරම්භයේදී පූර්ව දැනුම් දීමකින් අවශ්‍ය කොටස් යෝජනා කරන්න. එතකොට මොකක්ද ඒක. දැන් ඒ කියන්නේ, ස්ථාවර නියෝග අත් හිටුවලා පොදු කටයුත්තක් ආරම්භ කරන්න ඉස්සෙල්ලා වෙනත් කරුණක් ගේනවා නම් ගේන්න. එතකොට දැන් මේකේ කියන්න ඕනෑ. පොදු කටයුත්තක් කරන්න ස්ථවාර නියෝග අත්හිටුවනවා නම්, කීයක ඡන්දයකින්ද? මේකේ නැහැ ඒක. එතකොට මේකේ කී දෙනෙකුගේ ඡන්දයකින්ද? මේකේ 104 ක් ඉන්නවා. මේකේ කීයකින්ද ඒක අනුමත වෙන්න ඕනෑ. දැන් එක්කෙනකේ යෝජනාව ගේන හින්දා - අපි ගන්නවා පොඩි පක්ෂයකින් ගේනවා යෝජනාවක්. ගෙනැල්ලා ඒ දෙන්නා කැමැත්තෙන් අනුමත කර ගන්න කිව්වොත්, මේක ඡන්දයකට ගිහිල්ලා කැමතිද නැද්ද කියලා ඒක අහන්නේ නැහැ. එතකොට ඒක ඇතුළත් කරන්න ඕනෑ. මේක කරන්න පුළුවන් මෙපමණ ඡන්ද සංඛ්‍යාවකින් තිබෙන්න ඕනෑය කියලා. නැත්නම් ආණ්ඩු පක්ෂයක්, විපක්ෂයක් කියලා අවශ්‍ය නැහැ නේ? අද විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා - මේ පත්තරේ තිබෙනවා මුල් පිටුවේම දාලා. මොකක්ද? ව්‍යවස්ථාවට බෝම්බයක්. එතකොට කියනවා, මේ හැට දෙලක්ෂයක් ඉන්න රටේ ජනතාව ඡන්දය දීලා - හරිද? එක් කෝටි විසි හය ලක්ෂයක් ඉන්න මිනිසුන්ගෙන් මේ හැට දෙලක්ෂයෙන් මෙහෙම දෙයක් කරන්න බැහැයි කියලා. මේ නීති පොතේ තිබෙනවාය කියලා. නමුත් කථානායකවරයා ඒක කළා. එතකොට තමුන්නාන්සේට තිබෙන බලය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේ රීති කෙටුම්පත සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්න. මේ බස්නාහිර පළාත් සභාව නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

අපි එතුමාට විරුද්ධ වෙන්නේ නැහැ. කථා කරන්න දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න දෙනවා. ඉතාම වැදගත් කථාවක් ඔබතුමා කළා. මට පැහැදිලියි ඒක. ඉතා වැදගත්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේට මම කිව්වා නේ දැන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාට කථා කරන්න දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේට මම කිව්වා, ඉස්සෙල්ලම පොළට ගිහිල්ලා ගන්න කිරි පනු ගායට බෙහෙත් තිබෙනවා. කසායවල් තිබෙනවා. ඒ ටිකක් අරගෙන බොන්න කියලා. ඊට වඩා මම මේ ගැන කථා කරන්න යන්නේ නැහැ. ඊට පස්සේ, මේ 104 දෙනාටම තිබෙන වරප්‍රසාදයක් තමයි ගිණුම් කාරක සභාව. එතකොට ගිණුම් කාරක සභාවේ අද වන තුරු මේ සභාවේ - දැන් අවුරුදු 30 කට ආසන්න වෙන්න යනවා මේ සභාවට. ගිණුම් කාරක සභාවෙන් ගත්ත තීරණයක් කොයි නිලධාරී මහත්තයෙකුට හෝ සභාවේ නිලධාරී මහත්මයෙකුට හෝ සභාවේ වැඩ කරන සේවකයෙකුට හෝ මන්ත්‍රීවරයෙකුට හෝ යම් වරදක් කරලා තිබෙන එකකින් දඬුවම් කරලා තිබෙන්නේ කොතැනද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක වැරදියි. දඬුවම් කරලා තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නැහැ මට කියන්නකෝ. එහෙම දඬුවම් කරලා හැන්සාඩ් ගත වෙලා තිබෙන තැනක් මට කියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ගිණුම් කාරක සභා වාර්තා සියල්ල මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකේ කියලා තිබෙනවා, දඬුවම් කරපු හැටි. Surcharge කරපු හැටි. සියලු දේවල්. මේකට එනවා වාර්තාව. සභාගත වෙනවා.

**ගරු අනන්ද හරිශ්වන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දැන් මේ ටික කියෙව්වෙත් මේ බන්ධනාගාරය හන්දා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ වාර්තා බන්ධනාගාරයට යවලා බලමු.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම කිව්වානේ දැන්. ඒ නිසා මම කියපු දේ. 4.15 ට පෙර දෙන්න කියන එක ඉවත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි ඒක සලකලා බලන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඊට පස්සේ ඕනෑම මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද සම්බන්ධව කථා කරන්න. ඊළඟට රීති අත්හිටුවලා ගෙනෙන කොට කී දෙනෙකුගෙන්ද ඒක ගේන්න ඕනෑ කියලා මේකට ඇතුළත් වෙලා නැහැ. ඒවා ඇතුළත් කරන්න. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. බොහොම ස්තුතියි. අපි එකින් එක යමුද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට එක විනාඩියක් දෙන්න. ඉතාමත් කෙටියෙන් යෝජනා දෙකක් ඉදිරිපත් කරන්න. පළමු වැනි යෝජනාවට මම දන්නේ නැහැ මේ සභාව කැමැති වෙයිද නැද්ද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට විනාඩියක් දෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

*ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.*
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහෝ දුරට ගොඩක් දෙනෙක් මේකට කැමැති වෙයිද මම දන්නේ නැහැ. මගේ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්නේ. අපේ පළාත් සභාවේ දැන් වෙන කොට පෞද්ගලික මන්ත්‍රී යෝජනා විශාල ප්‍රමාණයක් ගොඩ ගැහිලා තිබෙනවා. ඒ වාගේම මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න ගැන කථා කරන්න ගොඩක් වෙලාවට ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා. මේ සභාව අඩුම ගණනේ සුමානයකට සැරයක්වත් පවත්වන්න පුළුවන් ආකාරයට මේ රීති වෙනස් කරන්නය කියලා. මොකද, එතකොට මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න ගොඩක් - අපට කෑ ගහ ගන්නේ නැතිව අපට වෙලාව තිබෙනවා මේ ප්‍රශ්න ගැන කථා කරන්න. තමන්ගේ ප්‍රදේශවල තිබෙන ප්‍රශ්න. ඒ අඩුපාඩුව අපට විශාල වශයෙන් තිබෙනවා. සභාව මාසයකට හතර වරක් - සුමානයකට එක පාරක්වත් සභාව පවත්වන්න අවශ්‍ය කටයුතු යෙදුවා නම් හොඳයි කියලා මගේ විශ්වාසය.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අලුත් තාක්ෂණයත් එක්ක අපි ඉස්සරහාට යන මොහොතක මම හිතන්නේ, මම විශ්වාස කරනවා. මේ රීති පොතේ තිබෙනවාද දන්නේ නැහැ ජංගම දුරකථන සභාවට ගේන්න බැහැයි කියලා තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. මට ඒක කියවන්න බැරිව ගියා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නමුත් දැන් තාක්ෂණය භාවිතා කරන ක්‍රමය අනුව මේ ලැප්ටොප් කවුරුවත් උස්සාගෙන යන්නේ නැහැ. ඒ කියන්නේ ටැබ් අරගෙන යන්නෙත් නැහැ. ගොඩක් දෙනෙකුගේ තිබෙන්නේ, ඔය සෑම පහසුකමක්ම තිබෙන ජංගම දූරකථනයයි. දැන් ලැප්ටොප් විධියට භාවිතා කරන්නේ ජංගම දූරකථනය. අන්තර්ජාලයට යන්න ඕනෑ නම් ඕනෑම දෙයක් අපට ගන්න පුළුවන් ජංගම දූරකථනයෙන්. අපි දැන ගන්න ඕනෑ සභාවේ තමන්ගේ හැසිරීම කොහොමද කර ගෙන යන්න ඕනෑ කියලා. නමුත් අපට ඒ අවශ්‍ය තාක්ෂණය ගන්න අපි හැම කෙනා ළඟම අද ලැප්ටොප් හරි, ටැබ් හරි නැහැ. නමුත් ජංගම දූරකථනය හරහා මේ සියලු දේවල්ම කර ගන්න පුළුවන්. ඉතින් ඒ අවසරය මම හිතන්නේ අපි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අලුත් ගොඩනැගිල්ලට ගියාම තමන්ගේ මේසයේම තිබෙනවා ඔක්කොම. සියල්ලක් ලැහැස්ති කරලා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්නේ, අලුත් ගොඩනැගිල්ලට යන කල් හරි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මාර්තුවල යනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකද, හදිසියකට ගෙදරටවත් අපව සම්බන්ධ කර ගන්න බැහැ. මොකද, අතන විවේකාගාරයට කෝල් එකක් එද්දී අපි මෙතැනින් නැගිටලා යන්නේ නැහැ. කාටද එන්නේ කියලා දන්නේ නැහැ නේ? මේ තාක්ෂණය අද ඔරලෝසුවෙත් තිබෙනවා. අපට ඕනෑ නම් ඔරලෝසුවක් දා ගෙන එන්න පුළුවන්. ෆෝන් එක නාද වන කොට කෝල් එකට answer කරන්න පුළුවන්. මේ සභාවේ බුද්ධිමත් අය ඉන්නේ කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා අපට තාක්ෂණය ඕනෑ නම් අවභාවිතා කරන්නත් පුළුවන්. ජංගම දූරකථනය නැතිව ඔරලෝසුවේ දා ගෙන ඇවිල්ලා කෝල් එකක් ගන්න පුළුවන් තාක්ෂණය දැන් ඕනෑ තරම් තිබෙනවා. අපට ඒකත් ඕනෑ නම් කරන්න පුළුවන්. නමුත් එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා මම හිතන්නේ, බුද්ධිමත් මන්ත්‍රීවරු පිරිසක් ඉන්නවා. තමන්ගේ ඒ බුද්ධිමත්භාවය පාවිච්චි කර ගෙන - මම හිතන්නේ, පාර්ලිමේන්තුවේත් අද දූරකථනය ගේන්න අවසර දීලා තිබෙනවා. ඒ නිසා ඒ අවස්ථාව මන්ත්‍රීවරුන්ටත් ලබා දෙන්න. මොකද, හදිසියකට හරි ගෙදරකින්, තමන්ගේ ගෙදර කරදරයක් වුණොත් හරි silent දාලා හරි ෆෝන් එක තියා ගන්න පුළුවන්. ඒ සම්බන්ධතාවය තියා ගන්න වෙන හැකියාවක් නැහැ අපට. ඒ නිසා ඒ අවස්ථාව රීති පොතට ඇතුළත් කරන්නය කියලා මම ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති මාලාවේ වැදගත්කම සම්බන්ධව නිසා තමයි ඒ කාරක සභාව විසින් වසර ගණනාවක් මේවා ගැන සාකච්ඡා කරලා, කාරක සභා රැස්වීම් තියලා මේ අද සම්මත කර ගන්නා අවස්ථාව උදා වී තිබෙන්නේ. ඉතින් කනගාටුවට කරුණක් තමයි පළමුවෙන්ම ගණපූරණය ඇදීම. ඒ නිසා මම මෙතැනදී පළමුවෙන්ම ඒ යෝජනාව ගේනවා. යම් යම් අය කියන්න පුළුවන් වගන්ති අනුව කියලා. අපි අද කාර්ය පටිපාටි රීති අනුමත කරන්නේ ඇයි? ඒ රීතියක් හදා ගන්න. ඉතින් හදා ගන්න එකේදී අපට ඕනෑ විධියට හදා ගනිමු. ඒකට බැරියර් ගේන්න යන්න එපා. මගේ අදහස මම කියන්නේ. 35 දෙනෙකු කියලා තිබෙනවා. හැබැයි, වගන්තියේ තිබෙන්න පුළුවන්. වගන්තියේ තිබුණා එහෙම නම් උප සභාපතිටත්, සභාපතිටත් විශ්වාසභංගය දාන්න පුළුවන් කියලා. ඒක අයින් කළා. ඒ වගන්තිය. මේකේ තිබුණා. ඉතින් මම ඉල්ලීමක් කරනවා. අලුත් ව්‍යවස්ථාව අනුව හෙට අනිද්දා අලුත් පළාත් සභාවට බස්නාහිර පළාත් සභාවට එන්නේ මන්ත්‍රීවරු 104 දෙනෙකු නොවෙයි. මන්ත්‍රීවරු 102 යි. හරිද? 102 ක් නිසා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

102 යි. බෝනස් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නැහැ. බෝනස් එකත් එක්ක 102 යි. ගම්පහ දිස්ත්‍රික්කයේ 20 ද බෝනස් 20 යි. 40 යි. කොළඹට 20 ද 20 යි බෝනස්. 40 යි. එතකොට 80 යි. අරකට 11 යි. 22 යි 102 යි. බෝනසුත් එක්ක. 102 එන්නේ එහෙමයි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

බෝනස් නැහැ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

බෝනස් දෙක නැහැ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

බෝනස් දෙක නැහැ. 102 යි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔක්කොම 102 යි. ඔබතුමන්ලාට දැන් ලියුම් ඇවිල්ලා තිබෙනවා නේ? බලන්න කෝ. 102 යි. 102 න් මම ඉල්ලීමක් කරනවා, 1/5 ක් ගණපූරණයට තියන්න කියලා. 1/5 ක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මේක රීතියට ඇතුළත් කරන්න. නැත්නම් හැමදාම අලුත් පළාත් සභාවට හරි කොයි පළාත් සභාවට හරි ගන්න තීන්දුවක් මේක. අපි මේක ඇතුළත් කරමු. මොන වගන්ති හරි කමක් නැහැ. අපේ රීතියක් නේ අපි හදන්නේ. අපට ඕනෑ විධියට. බස්නාහිර පළාත් සභාව නොවෙයි හැම පළාත් සභාවක්ම මේ වාගේ රීති හදලා තිබෙනවා. මේ අඩුපාඩු අපි හදා ගනිමු කියලා අපි ඉල්ලීමක් කරනවා.

අනික් එක සභාපති, උප සභාපති විශ්වාසභංගයේදී අයින් කරලා තිබෙනවා. ඒක අපේ හිටපු විපක්ෂ නායකතුමාත් පෙන්නුම් කරලා දුන්නා. රීති අංක 55. ඒ රීති අංක 55 පෙර තිබුණු තත්ත්වයේම තියන්න කියලා ඉල්ලීමක් කරනවා. එතකොට ගණපූරණයේ රීති අංකය 12. ඒක 1/5 ක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම රීති අංක 13. ජනතා විමුක්ති පෙරමුණ පොඩි චෝදනාවක් කළා, ධූරධාරීන් සම්බන්ධව. මම අනික් පළාත් සභා එක්ක කථා කළා. මම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයට ලියුමක් ඇරියා. ජයම්පති මැතිතුමාට. එතුමන්ලා අපට උත්තරය එව්වේ, මේක ඔබතුමන්ලාගේ පළාත් සභාවෙන් කළ යුතු දෙයක්. අපි රීතියක් හදන්නේ එක නේ? අපි වරදක් වෙලා තිබෙනවා නම් කෙළින් කරන්න නේ දෙයියනේ? ඉතින් රීතියට ඒකවත් රිංගමු. මේකේ සම්ප්‍රදාය ඇවිල්ලා ඇති. ඒ සම්ප්‍රදාය ඇතුළත් කරමු අපි. මේක ඇතුළත් කරන්නය කියලා අවංක ඉල්ලීමක් කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඇයි මන්ත්‍රී වරප්‍රසාද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එක එක්කෙනාගේ මතවාද තිබෙන්න පුළුවන්. ඒකේදී විරුද්ධත්වය ප්‍රකාශ කරන්න. විරුද්ධත්වය තියලා තියන්න. එයාලා උසාවි යනවා නම් බේරෙන්න එහෙම කරනවා නම් කමක් නැහැ. ඒක එයාලාගේ අයිතිය නේ? වැරැද්ද එහෙම නම් දිගටම වෙලා තිබෙනවා නේ? එහෙම නම් එදා යන්න තිබුණා නේ උසාවි. මම අහන්නේ. ඒ දේ කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

88 ඉදන් ඇවිල්ලා තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අනික් එක රීති අංක 22 පෙත්සම් සම්බන්ධව. දැන් ඉදිරියට ගරු මහ ඇමතිතුමනි, දිස්ත්‍රික්ක මන්ත්‍රීවරයෙක් කියලා නොවෙයි එන්නේ. කොට්ඨාශ මන්ත්‍රීවරයෙක් එන්නේ. එදාට එන්නේ නැහැ දිස්ත්‍රික්කවලින්. දැන් මම එනවා නම්, මම කැලණියේ මන්ත්‍රී කියලා එන්නේ. අලුත් පළාත් සභාවේ තිබෙන්නේ එහෙමයි. මම ඉල්ලීමක් කරනවා, දිස්ත්‍රික්ක කියන වචනය අයින් කරන්න. කොට්ඨාශයෙන් පත් වන මන්ත්‍රීවරු එන්නේ. ඒ නිසා ඒකට ගැලපෙන තීන්දුවක් ඒ පෙත්සම් කාරක සභාව සම්බන්ධයෙන් ගන්නය කියන එක ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. මේක දීර්ඝ කාලයක් සාකච්ඡා කරපු යෝජනා හැටියට. මම දැක්කා අඩුපාඩුවක් තිබෙනවා. ප්‍රශ්න ඇසීම්වල. 21 සිට 30 දක්වා කරුණු තිබෙනවා. මේ ප්‍රශ්න ඇසීම්වලදී අතුරු ප්‍රශ්න අහන කොට කාලය ගන්නවා ලබන සභා වාරයේදී අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙනවා කියලා. නමුත් ඒ අතුරු ප්‍රශ්නයට පිළිතුරු ලබා ගැනීම මේ න්‍යාය පත්‍රයේ හෝ මේ අපේ වැඩ සටහනක කොහේවත් සඳහන් වෙන්නේ නැහැ. ඒ ප්‍රශ්නය මන්ත්‍රීවරයාම මතු කරලා හදිසියේවත් අමාත්‍යවරයෙකුට කියන්න පුළුවන් මගෙන් එහෙම එකක් ඇහුවේ නැහැයි කියලා. එතකොට ඒ ගැන කිසිම පිළිවෙළක් නැහැ. මාසයක් ඇතුළත ලිඛිතව අඩුපාඩුවක් තිබෙනවා නම් අහන්න කියන එක මේකේ ඇතුළත් වෙලා තිබෙනවා. නමුත් ඊළඟ සභාවේදී පිළිතුරු දෙනවා හරි, ඉදිරිපත් කරනවා හරි කිව්වොත් ලිඛිතව ඉදිරිපත් කිරීමක් ගැන සඳහනක් කොහේවත් වෙන්නේ නැහැ. දැන් උදාහරණයක්. මම එක්තරා අමාත්‍යවරයෙකුගෙන් යම්කිසි ලේඛන ඉදිරිපත් කරනවාද කියලා ඇහුවාම ලබන සභා වාරයට ඉදිරිපත් කරනවාය කිව්වා. දැන් අද තමයි ලබන සභා වාරය. අද අපි විශේෂ කාරණාවකට අරගෙන තිබෙන්නේ. අර ප්‍රශ්නය එතැනින්ම යට යනවා. ඒ විධියට ප්‍රශ්වලින් රිංගලා යන්න අවස්ථාවක් හම්බ වෙලා තිබෙනවා. දැන් ලිඛිතව මාසයක් ඇතුළතදී ඉල්ලුවත්, ඒක ලබා නොදුන්නත් එතකොට සභාවේ කථා කරන්න අවස්ථාවක් එන්නේ නැහැ. ඒ නිසා මේ අතුරු ප්‍රශ්නයට පිළිතුරු ලබන සභා වාරයේදී දෙනවා කිව්වොත්, අර ප්‍රශ්න 15 අහලා ඊට පසු අතුරු ප්‍රශ්නවලට අවස්ථාවක් ලබා දෙනවා නම් හොඳයි. මේ සභාව කියන්නේ වැදගත් අවස්ථාවක්. මේ අවස්ථාවේදී ලබන සභා වාරයට ඉදිරිපත් කරනවාය කියන කාරණාව ඇතුළත් කරලා අතුරු ප්‍රශ්න සඳහා අවස්ථාවක් ඒ අයට ලබා දෙන්න ඕනෑය කියලා මේ රීතිවලදී යෝජනා කරනවා.

ඒ එක්කම වරප්‍රසාද සම්බන්ධයෙන් අපි හැමදාම 36(1) යටතේ කථා කළාට ඒක වැරදි විධියට පාවිච්චි කරන එකකුත් තිබෙනවා. නමුත් එහි අන්තර්ගතයක් වෙන්න ඕනෑය කියලා මම කල්පනා කරනවා. මන්ත්‍රීවරයෙක් ලෙස පත් වුණාම කාර්ය මණ්ඩලය, යම්කිසි ගෙවීම්, මන්ත්‍රීවරයාගේ ධූරය පහසු කරන්න යම් යම් දේවල් ලැබෙනවා. ඒ ලැබිය යුතු හැම දෙයක්ම මන්ත්‍රීවරයා පත් වෙලා පළමු අවස්ථාවේ සභාවට ආවාට පස්සේ ඒ කෙටි කලක් තුළම ඒ සියලු දේ ලැබිය යුතුයි කියන වගන්තියකුත් ඇතුළත් වෙන්නය කියලා. මොකද, සමහර අවස්ථාවලදී මන්ත්‍රීවරයාගේ ධූර කාලය අවසන් වෙලා තමයි තව සමහර වරප්‍රසාද ලැබෙන්නේ. මම කියන්නේ, එවැනි දෙයක් ඇතුළත් කිරීම - ඔබ සියලු දෙනාම දන්නවා මොකක්ද මම අදහස් කරන්නේ කියලා. සමස්ත මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදවලට ඒක ඇතුළත් වෙන එක හොඳයි. නැත්නම් වර්ෂය අවසානයේ - දැන් උදාහරණයක් හැටියට පර්මිට් එක තවම නැහැ. අපි කිව්වොත් පත් වෙලා මුලදීම ඒ ලැබිය යුතු වරප්‍රසාදය ලැබෙන්න ඕනෑය කියලා, ඒ පළමු වැනි දෙවැනි සතියේම එන්න ඕනෑ. එතකොට ඒ අවුරුදු පහට වැඩ කරන්න එතුමාට අවස්ථාවක් තිබෙනවා. එය වැදගත් කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පාර්ලිමේන්තුවේ එහෙමයි. පාර්ලිමේන්තුවේ වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක අපේ රීතිවල ඇතුළත් වෙන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මම අවධානය යොමු කරන්නේ. මේ පළාත් සභාවට යම් යම් විෂයයන් සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවට සහ අපට ලබා දෙන මුදල් සහ වෙනත් දීමනා සම්බන්ධයෙන් තීරණ ගන්න පුළුවන්. නමුත් අපි මේ රීතිවල ඇතුළත් කරලා ඒ පිළිබඳව ජනාධිපතිවරයා දැනුවත් කිරීමක් කළොත්, මන්ත්‍රීවරයෙකුට දෙන වරප්‍රසාදය අවුරුදු පහකට වැඩ කරන්න නම් වර්ෂය අවසාන අවුරුද්දේ ලැබිලා වැඩක් නැහැ. ඒ මන්ත්‍රීවරයා අවුරුදු පහක් වැඩ කරන්න ඕනෑ. ඒ නිසා ඒ කටයුත්ත ඇතුළත් කිරීම වැදගත් කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක හොඳ යෝජනාවක්. දැන් අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා,

ගණපූරණය 1/5 ක් කරමුයි කියලා. දැන් ඊළඟ පළාත් සභාවේ ක්‍රමය අනුව මම හිතන්නේ, ආණ්ඩු පක්ෂය වශයෙන් ආවත් 60% ක් 70% ක් ගන්න බැහැ. ළඟ ළඟ තමයි ආණ්ඩු පක්ෂයයි, විරුද්ධ පක්ෂයයි යන්නේ. ඒ කියන්නේ, විරුද්ධ පක්ෂයෙන් යෝජනාවක් ගෙනාවත් 35 ප්‍රමාණය විරුද්ධ පක්ෂයේ ඉන්නවා. ඒ තරම් ප්‍රමාණයක් ඉන්නවා. අලුත් ක්‍රමය. මොකද, 50% නේ යන්නේ. සමානුපාතික ක්‍රමයෙන් 50% යි. පත් වෙන්නේ 50 යි. ඒ කියන්නේ විරුද්ධ පක්ෂය ගත්තත් මන්ත්‍රීවරු 102 න් 40 ට වඩා ඉන්නවා.

එහෙම නම් තමන්ගේ කණ්ඩායමේ මාසයකට දෙපාරක් නම් මේ සභාවට එන්නේ. තමන්ගේ කණ්ඩායමේ ගණපූරණය රැක ගැනීම තමන් සතු කාර්යයක්. ඒ මන්ත්‍රීවරුන්ට වගකීමක් සහ යුතුකමක් තිබෙනවා, මේ වරප්‍රසාද ගන්නවා හා සමානව මෙතැනට එන්න. එතකොට මේ ගණපූරණය 20 ට අඩු කළාම 1/5 ට අඩු කළාම ඒකේ වටිනාකමක් නැතිව යනවා. තව ටික කාලයක් ගියාම කියයි 1/10 ට අඩු කරන්නය කියලා. මරණාධාර සමිතියක් ගත්තත්, ගණපූරණය 1/3 ක් වෙන්න ඕනෑ. ඒ නිසා පාර්ලිමේන්තුවේ එහෙමයි. මේ පළාත් සභාව ඒ තරම් පහත් කරන්න එපාය කියන එක මම ඉල්ලා සිටිනවා. ගණපූරණය තිබෙන විධියටම තියන්න. සහභාගී වීම මන්ත්‍රීවරුන්ගේ යුතුකමක් සහ තමන්ගේ කණ්ඩායමේ ගණපූරණය රැක ගැනීම තමන් සතු කාර්යයක්. පළාත් සභාව එතරම් පහත් කරන්න එපාය කියන එක මම ඉල්ලා සිටිනවා. 34 එහෙම්මම තිබෙන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී කාරණා කිහිපයක් මතු කරන්න සූදානම්. ඇත්ත වශයෙන්ම මේ සංශෝධන පිළිබඳ එක්තරා අවස්ථාවකදී මන්ත්‍රීවරු ගණනාවක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමනි, 10(4) නීතිය අනුව ඒක පනතින් ආපු ප්‍රතිශතයක්. ඒක අපට වෙනස් කරන්න බැහැ. පළාත් සභා පනතේ 10(4) වගන්තියේ 7(1) රීතියේ තිබෙනවා ඒක.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මීට පෙර අවස්ථාවකදී මේ සංශෝධන පිළිබඳව දීර්ඝ වශයෙන් මන්ත්‍රීවරු සාකච්ඡා කළා 2017 ජූලි මාසේ 28 වැනිදා. නමුත් ඒ අවස්ථාවේදී සහභාගී වුණේ මන්ත්‍රීවරුන්ගෙන් 1/3 ක් විතර. මම හිතන්නේ, ගොඩක් දෙනෙක් ඒකට සහභාගී වුණේ නැහැ. හැබැයි, බොහෝ දෙනාගේ අදහස් ඇති. එහිදී අපි ඉදිරිපත් කළ අදහස් කොයි තරම් දුරකට මේකට ඇතුළත් වුණාද කියන එක ගැන දැනට අපට අවබෝධයක් නැහැ. මොකද, මේකේ සෑම කාරණයක්ම අපි කියවලා තේරුම් අරන් නැහැයි කියන එක යථාර්ථයක්. ඒක පිළිගන්න ඕනෑ. කෙසේ වෙතත් එම කාරණා - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කථා කරන්න අවස්ථාව දෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා මේක පාලනය කර ගන්නේ නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා ජූලි මාසේ 28 වැනිදා අපි පදනම් ආයතනයේදී රැස් වෙලා කථා කරපු කාරණා පිළිබඳව ඒවා කොයි තරම් දුරට ඇතුළත් වෙනවාද? ඒවා කොහොමද කෙරෙන්නේ කියන එක ගැන නිසි අවබෝධයක් නැහැ. මම හිතනවා, අපි කාරණා වශයෙන් වෙන් වෙන්ව කථා කරන කොට අපට පුළුවන් අවධානය යොමු කරන්න. විශේෂයෙන්ම මම යළිත් මතු කරලා පෙන්වන්න කැමැතියි. වසර දෙකහමාරකට පමණක් කාරක සභාවක සාමාජික කාලය සීමා කිරීම කියන එක. විශේෂයෙන්ම මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඒ ගැන අදහස් දැක්වූවා. මමත් පෞද්ගලිකව විශ්වාස කරන කාරණයක්

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

තමයි වසර දෙකහමාරක වාගේ කාලයක් ප්‍රමාණවත් නැහැ මන්ත්‍රීවරයෙකුට ඒ යම්කිසි විෂයයක් පිළිබඳව විශේෂ ප්‍රාගුන්‍යයක් ලබා ගන්න. ඒ නිසා ඒක ධූර කාලය දක්වා - එහෙම නම් ටික කාලයක් යන කොට අනික් අය සමහර වෙලාවට කියන්න පුළුවන් මේ ඇමතිවරුන්ගේත්, මහ ඇමතිවරයාගේත් ධූර කාලය වසර දෙකහාමාරකට සීමා කරන්න කියලා. මම හිතන්නේ, ඒක යථාර්ථයක් කර ගන්න බැහැයි කියන එක තමයි මගේ අදහස. ඒක එහෙම නොවෙයි විය යුත්තේ. යම් කාලයක්, මන්ත්‍රීවරුන්ට ප්‍රමාණවත් කාලයක් දෙන්න ඕනෑ. මේකේ ප්‍රශ්නය තිබෙන්නේ, ඉස්සෙල්ලාම පළමුවන වරට කාරක සභාවට පත් කරන කොට දැන් අපි දන්නවා මේක තවදුරටත් පුළුල් වෙන කොට කාරක සභාවල සභික සංඛ්‍යාව වැඩි වෙනවා. ඒ නිසා මේ තෝරා ගන්න කොටම අදාළ සංවිධායකවරු කල්පනා කරන්න ඕනෑ කවුද අපි හරියටම පත් කරන පුද්ගලයෝ කියලා. අනික් එක තමයි අපි දන්නවා. දැන් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ ඉන්න කෙනෙකු විධියට මම දන්නවා, පළමුවෙන්ම පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට ආපු මන්ත්‍රීවරුන්ට වඩා සම්පූර්ණයෙන් වෙනස් පිරිසක් අද ගිණුම් කාරක සභාවේ ඉන්නේ. මොකද, ගොඩක් අය එන්නේ නැතිව ගිහිල්ලා. සමහර අය ස්වේච්ඡාවෙන්ම අයින් වුණා. සමහර අයට අයින් වෙන්න බල කරනු ලැබුවා. එහෙම වෙනස් වුණු අවස්ථා තිබෙනවා. ඒ නිසා මේකට අවශ්‍ය නම් තමන්ගේ හොඳම පුද්ගලයෝ ටික තෝරලා දාන එක ඒ ඒ පක්ෂවල සංවිධායකවරුන්ගේ වගකීමක් කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මේක මේ අවුරුදු දෙකහමාරකට සීමා කරනවාය කියන කාරණය පිළිබඳව යළිත් සිතා බැලිය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ඊළඟට සෙංකෝලය පිළිබඳව කාරණය. මොකද, අපි දන්නවා. මේ සභාවේ පාර්ලිමේන්තුවේ වුණත් බල අධිකාරියේ සංකේතය සෙංකෝලයයි. ඒ නිසා මේක රීතියක් හැටියට නොවෙයි මම ගේන්නේ. මේකේ රීතියක් හැටියට මට මේක ඇතුළේ සොයා ගන්න බැරි වුණා. ඒ නිසා තමයි ගේන්නේ. හැබැයි, මේක පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 77 යටතේ පාර්ලිමේන්තුව තුළ විනය කියන කාරණය ඇතුළේ මේක මනාව පැහැදිලි කරලා තිබෙනවා. එහි 77 (3) (1) සහ (2) යටතේ. පාර්ලිමේන්තුව ඇතුළේ මන්ත්‍රීවරයෙක් මේ සෙංකෝලයට අත තිබ්බා නම් - දැන් අපි දැක්කා. මේ සෙංකෝලයට හානි කළා. ලක්ෂ ගණනක් වියදම් වෙනවා ඒකට. මේකට හානි කිරීම නොවෙයි. මේක බල අධිකාරියේ සංකේතයයි. ඒ නිසා මේකට මේ සභාව ඇතුළේ විනය ආරක්ෂා කරන සංකේතය හැටියට මේ සංකේතයට හානි කිරීම කොයි තරම් බරපතළද කියන කාරණය හිතලා බලන්න. ඒ නිසා මම යෝජනා කරනවා. මේක දැන් පාර්ලිමේන්තුවේදී යෝජනා කරලා තිබෙන්නේ, සති හතරක් මන්ත්‍රීවරයාගේ සභාවට පැමිණීම තහනම් කිරීම. වාර හතරක්. සති හතරක් කියලා තිබෙන්නේ. සති හතරක් කියන්නේ මාසයක්. මාසයකට සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව අට වරක් රැස් වෙන්න ඕනෑ. එහෙම නම් අපේ සභාව හැටියට නම් මාස හතරක්. අපි මාසයකට දෙසැරයයි නේ රැස් වෙන්නේ. එහෙම නම් අඩුම ගණනේ ඒ සභිකයාගේ, හානිකරපු පුද්ගලයාගේ මාස හතකරක් සභාව තහනම් කරන්න ඕනෑ. ඒක මම යෝජනා කරනවා මෙන්න මෙහෙම.

*"සෙංකෝලය පළාත් සභා ගර්භය ඇතුළත තැන්පත් කර ඇති විට යම් මන්ත්‍රීවරයෙකු එය ස්පර්ශ කිරීම හෝ, එසවීම හෝ කිසියම් හෝ අලාභයක් සිදු කිරීම බරපතළ විනය විරෝධී ක්‍රියාවක් වන අතර, එම වරද කරනුයේ පළමුවරට කියන කාරණය නොසලකා -*

පළමු සැරේ කළත් ඉවරයි. දෙවැනි සැරේ කළත් වරද වරදම තමයි. අපි මේ බල අධිකාරියට හානි කරන්නේ.

*"නොසලකා එම මන්ත්‍රීවරයාට පළාත් සභාව මාස හතරකට අත්හිටුවනු ලැබිය යුත්තේ ය"* කියලා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

එතකොට මන්ත්‍රී ධූරය අහෝසි වෙනවා මාස තුනකින්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා, එතැන ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ කියන්න හදන ඊළඟ කාරණය. දැන් අපේ සාමාන්‍යයෙන් මාස තුනක් ගියොත් මන්ත්‍රී ධූරය අහෝසි වෙනවා. ඉතින් ඒ නිසා මේක සාකච්ඡාවට ලක් කළ යුතුයි. විවාදයට ලක් කළ යුතුයි කියන කාරණය මම මතු කරනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

වැටුප් හා දීමනා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පාර්ලිමේන්තුවෙත් ඒක ඇතුළත්. සියලු දීමනා අහෝසි වෙනවා ඒ කාලය අතුළත.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මාසයක වැටුපයි සියලු දීමනා අහෝසි වෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක ඉබේම සිද්ධ වෙනවා. ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "ඉහත රීතියට අනුකූලව එක් මන්ත්‍රීවරයෙකුට වඩා වැඩි පිරිසක්. නැත්නම් මේ කට්ටියම ඇවිල්ලා සෙට් වෙලා මේකට වැඬේ කරන්න පුළුවන්. හරිද? ඒ නිසා එහෙම කළොත් එවලේ කිසිම කෙනෙක්ව නම් කරන්න බැහැ. පුද්ගලයෙක් තනිව නොවෙයි. කට්ටියක් ඇවිල්ලා මේකට පිරිසක් ඇවිල්ලා යම් හානියක් කළොත් එවෙලේ නම් කරන්න බැහැ. එය වරප්‍රසාද කාරක සභාවට යොමු කොට විමර්ශනයකින් අනතුරුව අදාළ මන්ත්‍රීවරුන් වරදකරුවන් වන්නේ නම් ඉහත රීතිය අනුව කටයුතු කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඒක අපි සාකච්ඡා කරමු. ඒක විවාදයට ලක් විය යුතු නම් විවාදයට ලක් කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල තිබෙන එකක් මේකත්. 47 (2) (ආ) යටතේ තිබෙන කාරණයක්. දැන් අපි විද්‍යුත් - දැනට නම් අපි අත ඔසවලා ඡන්දය ප්‍රකාශ කරන්නේ. නැත්නම් රහස් ඡන්දයක් විමසනවා. දැන් අපි දන්නවා, අපි අලුත් ගොඩනැගිල්ලට එහෙම යන කොට මම හිතන්නේ, විද්‍යුත් ක්‍රමයට අනුගත වෙන්න සිද්ධ වෙයි. විද්‍යුත් ක්‍රමය ඇතුළත් වෙයි කියලා මම විශ්වාස කරනවා. එහෙමද මම දන්නේ නැහැ. ඒ ගැන මට අවබෝධයක් නැහැ. හැබැයි, එහෙම නම් මම හිතනවා, අපි ඒකටත් අවශ්‍ය ප්‍රතිපාදන ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සකස් කරලා තියා ගත්තොත් විද්‍යුත් ඡන්ද සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතයෙන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒකත් ලැහැස්ති කරලා තිබෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

*"ඡන්දය විමසන විට මන්ත්‍රීවරුන් සභාපතිතුමා විසින් නියම කරනු ලබන කාල සීමාව තුළ ඔවුන්ගේ තීරණය දැක්වීම සඳහා අදාළ බොත්තම එබිය යුත්තේ ය."* කියලා. ඒක අපි සාකච්ඡා කරන්න ඕනැ. අපි අලුත් ක්‍රමවලට යනවා නම්. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරන්න කැමැතියි. ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමනි, එක කාරණයක් තිබෙනවා. 26 වන පිටුවේ. 14(4) යටතේ. මාධ්‍ය සම්බන්ධයෙන් කාරණයක්. ඒකේ තිබෙනවා,

රැස්වීමට පැමිණීමට ප්‍රවෘත්ති මාධ්‍යයක නියෝජිතයෙකුට හෝ නියෝජිතයන් කිහිප දෙනෙකුට හෝ අවසර දීමට සභාපතිවරයාට පුළුවන.

*"පළාත් සභාවේ හෝ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය වන වාර්තාවක් හෝ අසත්‍ය වාර්තාවක් එම ප්‍රවෘත්ති මාධ්‍ය තුළ කළහොත් අවවාද කිරීම හෝ සභාපතිතුමාගේ අභිමතය පරිදි කටයුතු කිරීම හෝ කළ හැක්කේය."* කියලා තිබෙනවා. දැන් අවවාද කිරීම පමණක් මම හිතන්නේ නැහැ මේකට ප්‍රමාණවත් වෙයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනමාධ්‍ය කිසියම් වැරැද්දක් කළොත් ඒක වාර්තා කරන්න, ඒ පිළිබඳව පැමිණිලි කරන්න අද අදාළ අධිකාරියක් තිබෙනවා. පුවත්පත් පැමිණිලි කොමිසම. අපට දාන්න පුළුවන් ඒ අදාළ අධිකාරිය, පුවත්පත් සම්බන්ධයෙන් කිසියම් වූ තීරණයක් ගනු ලබන, කිසියම් වූ වැරැද්දක් කළොත් ඒ පිළිබඳව ක්‍රියා කරන අදාළ අධිකාරියට පැමිණිලි කරන්න සභාපතිතුමාට පුළුවන්. ඒ නිසා සභාපතිතුමාගේ අභිමතය කියන කාරණය තිබෙද්දීම ඔහුට ඊට වඩා යම් පියවරක් ගන්න පුළුවන්. හැබැයි, ජනමාධ්‍ය වැරැද්දක් කළොත් අවවාද කිරීම පමණක් ප්‍රමාණවත් නැහැයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මොකද දන්නවාද? ඒක ඊට පස්සේ නෛතික කාරණයක් බවට පරිවර්තනය වෙන්න පුළුවන්, ඔහුගේ කීර්තිනාමයට යම් හානියක් වුණොත්. ඒ නිසා නිල ආයතනයකට, පුවත්පත් පැමිණිලි කොමිසම හෝ ඒ හා සමාන වෙනත්

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

නිල ආයතනයකට. එක්කෝ ජනමාධ්‍ය අමාත්‍යාංශයට හෝ මේ නිල හැඳුනුම්පත දරන මාධ්‍යවේදියාට විරුද්ධව පැමිණිලි කරන්න පුළුවන් ආයතන ගණනාවක් තිබෙනවා. අන්න ඒ නිල අධිකාරියට පැමිණිලි කිරීම කියන කාරණය මේකට ඇතුළත් වුණොත් හොඳයි කියලා මම යෝජනා කරනවා. එතකොට අපට පොඩි නෛතික වටිනාකමක් එනවා. කිසියම් ආකාරයකට අපේ වරප්‍රසාද කඩ වුවහොත් පමණක් නොවෙයි, තමන්ගේ කීර්තිනාමයට හානියක් වුණොත් ඒ නීතියට යන කොට ඒක අපට ලොකු සාක්ෂියක් බවට පත් වෙන්න පුළුවන්.

ඒ නිසා මෙන්න මේ කාරණය වාගේම තවත් කාරණයක් තිබෙනවා. මම හිතන්නේ, මේක අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කථා කළා. හැබැයි, මේ කාරණය මතු කරන්න ඕනෑ. මොකද, අපි දන්නවා දැන් උදාහරණයක් විධියට ගිණුම් කාරක සභාව. ගිණුම් කාරක සභාවට වැඩ බලන සභාපතිවරයා පත් කළාම, ඒ වැඩ බලන සභාපතිවරයාට ඒ ධූරය අහිමි වෙන්න පුළුවන් ප්‍රධානම කාරණා දෙකක් තියෙනවා. එකක් තමයි, එක්කෝ ඔහු ඒ කාරක සභාවෙන් ඉල්ලලා අස් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඔහු වාර තුනකට වැඩි කාලයක් මේකට නැවිත් ඉඳලා, නොපැමිණීම මත ඔහුව ඉබේම ඉවත් වෙන්න පුළුවන්. හැබැයි, ඒ කාරණා දෙක හැරෙන්න වැඩ බලන සභාපතිවරයා දේශපාලන හේතු මත ඉවත් කළොත් මෙතැන ප්‍රශ්නයක් මතු වෙනවා කියන කාරණය - මම කියන්නේ, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉවත් කිරීම කියන කාරණය ගැන හිතලා නොවෙයි. හැබැයි, අපි පෞද්ගලිකවම දන්නා කාරණයක්. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉතා හොඳින් ඒ කටයුත්ත කළා. වෙන දේශපාලන කාරණයක් නැතිව. මම අවංකව කියන දෙයක්. එතුමා ඉතාම හොඳින් ඒ ගැන අධ්‍යයනය කරලා - අපේ සාමාජිකයෝ ඒක පිළිගනියි. ඒක ඉතා හොඳින් කර ගෙන ගියා. නමුත් ඒ ඉවත් කිරීම දේශපාලන හේතු මත නොකළ යුතුයි කියන එක අපේ අදහස වන්නේ. ඒක වැඩේ තිබෙන්නේ ප්‍රශ්නය මේකයි. ඒ පුද්ගලයා මොනවා වුණත් ජනතා නියෝජිතයෙක් නේ. අපි දැක්කා පත්තරවල ලොකුවට Head line දානවා. මෙරිල් පෙරේරා ඉවතට කියලා. ඒ නිසා ඔහුගේ අභිමානය, ගෞරවය පිළිබඳව ප්‍රශ්නයක්. ඔහුගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා මේ කාරණය යම් ආකාරයකට - මට තේරෙන්නේ නැහැ මේක කොහොමද විසඳ ගන්න ඕනෑ කියලා. යම් ආකාරයකට ඔහුගේ අයිතිවාසිකම් තහවුරු වන විධියේ යම් අවධානය යොමු විය යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ඊළඟ එක. මම මීට කලින් සාකච්ඡාවේදී මතු කරපු කාරණයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මන්ත්‍රීවරුන්ගේ හැසිරීම කියන කාරණය. එදා ඒ වැඩ මුළුවේදී ජූලි මාසේ 28 තිබුණු වැඩ මුළුවේදී ගනු ලැබූ සටහන්වල තිබෙනවා. මත්ද්‍රව්‍යයක් පානය කර ඇති බවට යම් මන්ත්‍රීවරයෙකු පැමිණිලි කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අභිමතය පරිදි ක්‍රියා කළ හැකිය යනුවෙන් රීතියක් සකස් කරන ලෙසට මවිසින් යෝජනා කළාය කියලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක්තරා අවස්ථාවකදී මම අපේ මන්ත්‍රීවරයෙක් අපට ස්ථිර වශයෙන්ම තහවුරු වුණා ඔහු බීමත්ව පැමිණියාය කියලා. පුවත්පත් වාර්තාවකුත් මා ළඟ තිබෙනවා. ඒ පුවත්පත් වාර්තාවේ ඡායාරූපයකුත්. එතුමා ප්‍රකාශ කළා කොහේද රීතියක් තිබෙන්නේ බීලා එන්න බැහැයි කියලා. ඒ නිසා මේ බීමත්ව එන කෙනෙකු මේ සභාව ඇතුළේ එක අතකින් අපේ අයිතිවාසිකම්, අපේ වරප්‍රසාද කඩ කරනවා විතරක් නොවෙයි. මේ සභාවට හානියක් කරනවා. ඔහු හැසිරෙන්නේ කොහොමද කියලා ඔහු නොදැන ඉන්න පුළුවන්. ඒ නිසා ඒක ටිකක් බරපතළ කාරණයක් නිසා මේක කොයියම් හෝ ආකාරයකට ඇතුළත් විය යුතුයි කියලා මා දැඩිව විශ්වාස කරනවා. ඒ නිසා ඒ කාරණය ගැන යළිත් අවධානය යොමු කරන්නය කියලා ඉල්ලනවා. තවත් යම් යම් -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඒක විතරක් නොවෙයි. බුලත් විට කෑමත් තහනම් කරන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක නොමනා හැසිරීමට වැටෙනවා. කිසියම් දෙයක් හැපීම. හප හපා ඉන්න බැහැ. හප හපා ඉන්න විතරක් නොවෙයි පත්තරයක්වත් කියවන්න බැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාරණා මතු කරන ගමන් අපි ඉදිරියේදී සාකච්ඡා කරන අතරදීත් විශේෂ කාරණා

පිළිබඳව සාකච්ඡා කරමුයි කියලා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. හොඳ කරුණු ටිකක් ඉදිරිපත් කළා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති අංක 87. මහජන පෙත්සම් කාරක සභාව සම්බන්ධයෙන් සංශෝධනයක් කරන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා අද මේ වැඩ සටහන විශේෂ සභාවක් පවත්වාගෙන කරන්නේ මේක මාස ගණන්, සති ගණන් සාකච්ඡා කරලා මම හිතන්නේ විශේෂයෙන්ම ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා එහෙම මහා කැප කිරීමක් කරපු වැඩක්. ඒ නිසා හැමෝටම අවස්ථාව දෙන්න ඕනෑ නිසා දිගින් දිගටම එක්කෙනා කථා කරන්නේ නැතිව අනික් අයටත් අවස්ථාව දීලා කථා කරන්න. තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහජන පෙත්සම් කාරක සභාවේ කලින් අනු කාරක සභා දෙකක් තිබුණේ. මේ අනු කාරක සභාවලට මේ මන්ත්‍රීවරු පත් කරලා පෙත්සම් විභාග කළේ දිස්ත්‍රික්ක පදනමින් නොවෙයි. අලුත් යෝජනා අනුව කොළඹ පෙත්සමක් ගම්පහ සහ කළුතර අයට විභාග කරන්න පුළුවන්. කොළඹ දිස්ත්‍රික්කයේ සාමාජිකයන් කවුරුත් ඉන්න බැහැ. ඒ ආකාරයෙන් තමයි දිස්ත්‍රික්ක අතහැරලා තමයි මේ කමිටුව නිර්දේශ කරලා තිබෙන්නේ. කමිටු තුනක්. දැන් කමිටු දෙකක් ක්‍රියාත්මක කරනවා. කමිටු දෙකටවත් ගණපූරණය නැහැ. කමිටු දෙකට ප්‍රමාණවත් නිලධාරීන් නැහැ. මේ කමිටු දෙකේ වැඩත් මාස තුන හතරක් යන කොට- කමිටු තුනක් දා ගත්තාම මේ එක වැඩක්වත් කෙරෙන්නේ නැහැ. කමිටු දෙකක් දාලා මේ මන්ත්‍රීවරු සියලුදෙනා සහභාගී වෙලා - ගණපූරණය හදාගන්න අමාරුවෙන් තමයි මේ කමිටු දෙක ක්‍රියාත්මක කරන්නේ. අනු කාරක සභා දෙක. දැන් කමිටු තුනක් දැම්මාම මම හිතන්නේන නැහැ, මේක ප්‍රායෝගික වැඩක් කියලා. දෙකවත් හරියට කරන්න බැරි තරමට කමිටු තුනක් පත් කිරීම මම හිතන්නේ අසාධාරණ ක්‍රියාවක්. මහජන පෙත්සම් ඉදිරිපත් කරන අයට තමයි අසාධාරණය. මම හිතන්නේ පරණ ක්‍රමයටම නැවත වතාවක් මේ කමිටු දෙකම තියලා සහ පෙත්සම් විභාගය කිරීමේදී -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා සාමාජිකත්වය වැඩි කරලා තිබෙනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

22 ක් කරලා තිබෙනවා. සාමාජික සංඛ්‍යාව වැඩි කළාට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැමිණීම අපි දන්නවා නේ. තිබෙන කමිටු දෙකෙත් ගණපූරණය තියාගන්න බැහැ. අනික් එක මන්ත්‍රීවරුන්ව මේකේ කොටු කරලා තිබෙනවා. දිස්ත්‍රිකයටද මන්ත්‍රීවරු පත් වෙන්නේ. බස්නාහිර පළාතේ මන්ත්‍රීවරු. මන්ත්‍රීවරුන්ට කොළඹ දිස්ත්‍රික්කයේ නම් කොළඹ දිස්ත්‍රික්කයේ පෙත්සමක් විභාග කිරීමට තිබෙන අවස්ථාව සහ ඒකට සහභාගි වන අවස්ථාව අහිමි කරලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ මේකෙන් කවදාවක්වත් ගැටලුක් මතු වුණා කියලා පෙත්සම් කාරක සභාවෙන් වැරැදි තීන්දුවක් දුන්නා. ඒකපාර්ශිකව පැත්තක් ගත්තා කියලා කවදාවක්වත් හිටපු මන්ත්‍රීවරයෙක් පැමිණිල්ලක් හෝ එහෙම හිත් රිදවීමක් හෝ අසාධාරණයක් වුණු අවස්ථා නැහැ. මොකද මේකේ සියලුම පක්ෂවල නියෝජිතයෝ ඉන්නවා. සියලු දෙනා කවදාවක්වත් බලන්නේ නැහැ. පෙත්සම ඉදිරිපත් කළේ කවුද? පෙත්සම ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා කවුද? පක්ෂ පාට කවදාවක්වත් බලලා නැහැ. මේ සියලු මන්ත්‍රීවරු ඒකට සාක්ෂි දරනවා ඇති. මම හිතන්නේ මේක තවත් මහජනතාවට සේවය ඉක්මණට ලබාදීම තවත් ඈතට දාන එකක්. මම හිතන්නේ මේ අනු කාරක සභා දෙක ක්‍රියාත්මක කරන්නත් ප්‍රමාණවත් නිලධාරීන් නැති කොට පෙත්සම් විභාග කරලා මාස දෙකක්වත් යනතුරු ඒ වාර්තා ටික යවාගෙන ඒ තීන්දු ටික යවා ගන්න බැරි නිලධාරී ප්‍රමාණයක් ඉන්න කොට, ඉතාමත් අල්ප නිලධාරීන් ප්‍රමාණයක් ඉන්නේ. මේ කමිටු දෙකේ වැඩ කරගන්න බැරිව තුනක් දාලා කොහෙවත් නැති ප්‍රශ්නයක් මේ නිර්මාණය කරන්නේ. මේකේ විනිවිදභාවය

[ගරු සලෝචන ගමගේ]

ජේන්න නම් මේ දිස්ත්‍රික්ක වෙන් කරන්නේ. මම හිතන්නේ ඒක සභාවේ මන්ත්‍රීවරුන්ගේ තිබෙන විශ්වාසය නැති වෙලා හරියට මේ මන්ත්‍රීවරු පෙත්සම් කාරක සභාව තමයි මේකේ තිබෙන ලොකුම ප්‍රශ්නය පෙත්සම් කාරක සභාව කියලා නිගමනය කරලා තමයි මේ දිස්ත්‍රික්කයේ ඉන්න අය ඒ දිස්ත්‍රික්කයේ පෙත්සම් විභාග කිරීමෙන් ඉවත් කරලා තිබෙන්නේ. මම හිතන්නේ ඒක සුදුසු නැහැයි කියලා. කිසි මන්ත්‍රීවරයෙක් අසාධාරණ තීන්දුවක් අරගෙන නැහැ. එහෙම ගන්නෙත් නැහැ. එහෙම ගන්නත් බැහැ. මේ තිබෙන නීති රාමුව සහ මේ තිබෙන ප්‍රතිපත්ති එක්කලා. ඒ නිසා කරුණාකරලා තිබුණු විධියට, අනු කාරක සභා දෙකක් තියලා සහ දිස්ත්‍රික්කයේ ඕනෑම මන්ත්‍රීවරයෙක්ට ඒ අනු කාරක සභාව සහ පෙත්සම් කාරක සභාව නියෝජනය කිරීමේ අවස්ථාව නැවත ඇති කරන්නය කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකටම අදාළ දෙයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනු කමිටු සභාපතිවරයෙක් හැටියට මමත් සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා කියපු ඒ යෝජනාවට කැමැත්ත පළ කරනවා. මොකද ඇත්තටම අපි කවදාවක්වත් අපේ පෙත්සම් කාරක සභාවේ ඉන්න සියලුම පක්ෂවල මන්ත්‍රීවරු සාක්කි දරනවා ඇති. කවදාවත් කිසිම දවසක පාට, පක්ෂ, නමුත් පුද්ගලිකව තිබෙන හිතවත්කම්වල පෙත්සම් කාරක සභාවෙන් කවදාවත් අද වනතුරු වැඩ කටයුතු කරලා නැහැ. පෙත්සම් කාරක සභා තුනක් දැමීමෙන් වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම දැනට පෙත්සමක් විභාග කරන කොට පෙත්සම් ටික එකතු වෙලා දින 14 කට ඉස්සෙල්ලා අදාළ පාර්ශවයන්ට කැඳවීමේ ලිපි යවන්නට ඕනෑ. එතකොට දින 14 කින් පස්සේ තමයි ඕනෑම පෙත්සමක් කැඳවන්න තිබෙන අවම අවස්ථාව උදා වෙන්නේ. එතකොට මේ පෙත්සම් ටික එකතු කරලා, ඊට පස්සේ ප්‍රධාන පෙත්සම් කාරක සභාවට දාලා, කුමන පෙත්සම් ද ඊළඟ පෙත්සම් කාරක සභාවට ගන්නේ කියන එක තීන්දු කරන්න තව සතියක්, එකහාමාරක් යනවා. ඉන් අනතුරුව තමයි අනුකමිටුවලට ඒ පෙත්සම් ටික භාර දෙන්නේ. ඒක නිසා මම හිතන්නේ නැහැ. ප්‍රායෝගිකව පෙත්සම් කාරක සභා අනු කමිටු තුනක් දැමීම තුළින් ඒකට අතීතයේ යම්කිසි වරදක් වෙලා තිබෙනවා නම් තුනක් දැම්මාට ප්‍රශ්නයක් නැහැ. නමුත් ඉතිහාසය දිහා බලන කොට පෙත්සම්වලට එක කාරක සභාවයි තිබිලා තිබෙන්නේ. නමුත් අද පෙත්සම් කාරක සභා දෙකක් තිබෙන්නේ කාර්යක්ෂමතාවය වැඩි කරන්න මිසක් මේ දිස්ත්‍රික්කවල තිබෙන ප්‍රශ්න කවදාවක්වත් ඇති වෙලා නැහැ. කාර්යක්ෂමතාවය අද තිබෙනවා. අද පෙත්සම් එකතු වෙලා නැහැ. ඉතින් නිකන් අනවශ්‍ය විධියට පෙත්සම් අනුකමිටු තුනක් දැමීම තුළින් මේක තවත් ප්‍රශ්න සහගත තත්ත්වයන්ට තුඩු දෙන හේතුවක් නිසා මම යෝජනා කරනවා. සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා කියපු විධියට අනු කමිටු දෙකක් තිබීම ප්‍රමාණවත්. ඒ වාගේම තවත් මන්ත්‍රීවරුන් පිරිසකට මේකට සහභාගි වීමට අවශ්‍යතාවය තිබෙනවා නම් දැනට පෙත්සම් කාරක සභාවට සහභාගි නොවන මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අවස්ථාව ඒ කැමැති මන්ත්‍රීවරුන්ට ලබා දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා එක පාරක් කථා කළා. බොහොම කෙටියෙන් -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ කථා කළේ මේ කාර්යපටිපාටි සම්බන්ධව. දැන් කථා කරන්නේ මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් ගැන. මම මේක මතු කරන්නේ වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් දේශපාලන සිරකරුවෙකු බවට පත් වුණොත් එතුමාට තිබෙන වරප්‍රසාද ප්‍රමාණයක් තිබෙනවා. එතකොට පළාත් සභාවේ හොරකම් කරලා, දූෂණය කරලා,වංචා කරලා එහෙම නැතිව දේශපාලනික හිරකරුවෙක් - දැන් මම වාගේ කට්ටිය එහෙම අය ඉන්නවා. එතකොට මේ අයට සභාවේ තිබෙන වරප්‍රසාද මොනවාද කියලා කිසිම තැනක සඳහනක් කරලා නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන එකෙන් භාගයක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම හිරගෙදර බන්ධනාගාර කොමසාරිස්වරයා එක්ක කථා කරපු වෙලාවේ මෙට පෙන්නුවා ඒ හැන්සාඩ් එකේ තිබෙනවා, පාර්ලිමේන්තුවේ තිබෙන ගැසට් එකේ තිබෙන ඒ මේවා ටික. එතකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ තිබෙනවා. මේ අපටත් අයිතියක්. මේ 13 වැනි සංශෝධනයේ තිබෙනවා. ඒ නිසා ඔබතුමා හරහා මේක අපේ ලේකම්වරයා හරහා පාර්ලිමේන්තුවට ලියලා මේක කොයි කොයි දේශපාලඥයන්ට, අපේ මන්ත්‍රීවරුන්ට වෙන්න පුළුවන්. අපට විතරක් නොවෙයි. පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට වෙන්න පුළුවන්. ඒ නිසා මේකත් මේකට ඇතුළත් කරන්න කටයුතු කරන්න. වරප්‍රසාද හැටියට තිබෙන.

තව ප්‍රශ්නයක් තිබෙනවා. පාර්ලිමේන්තුව අනුමත කළා, අපේ වත්කම් බැරකම් ප්‍රකාශය සම්බන්ධව. එතකොට අද ලක්ෂයක් දඩ ගහනවා වත්කම් බැරකම්වලට. දානවා උසාවියට හිරගෙදරට. එතකොට දැන් මේ පළාත් සභාවේ වරප්‍රසාද යටතේ ඒ දවස්වල වත්කම් බැරකම් ප්‍රකාශයක් අපි පුරෝලා දුන්නා. දැන් අපට කිසිම දවසක එහෙම මේකෙන් එන්නේ නැහැ. වාර්ෂිකව සැරයක් වත්කම් බැරකම් ප්‍රකාශයක් එන්නේ. මම ආණ්ඩුකාරතුමාගේ ලේකම්වරයාට කථා කළා. ආණ්ඩුකාරතුමාගේ ලේකම්වරයා කිව්වා ඒක පළාත් සභාවට අයිති නැහැයි කියලා. නමුත් පාර්ලිමේන්තුවේ කියනවා ඒක පළාත් සභා, පාර්ලිමේන්තු, සියලුම පළාත් පාලන ආයතන, නගරාධිපතිවරුන්ට සියලුම අයට මේක තිබෙනවා කියලා ඒ ගැසට් එකේ තිබෙනවා. එතකොට හදිස්සියේ දැන් පැමිණිල්ලක් දාලා අපේ මන්ත්‍රීවරයෙකුට හොර වත්කම් බැරකම් ප්‍රකාශ නිකුත් කරනවා කියලා FCID ගෙනිච්චොත් නැවත අපට කූඩුවට යන්න වෙනවා. මම හිතන්නේ මෙතැන කවුරුත් පුරෝලා නැහැ. ඉස්සර අපට තිබුණා, දිවුරුම් දෙන කොටම, සභාවට එනකොටම ප්‍රකාශයක් නිකුත් කරන්න. අවුරුද්දෙන් අවුරුද්දට ඒක ඇතුල් කරන්න. ඉතින් ඒ නිසා තමයි මේක ගැනත් සභාව අවධානය යොමු කරන්න. අපේ නීතිඥ මහත්වරු ඉන්නවා. දක්ෂ නීතිඥ මහත්වරු. මේවා ගැනත් කතා කරලා මේක කාටත් පොදුයි. මට වෙච්ච නිසා නොවෙයි. මට වෙච්ච නිසා තමයි මේ අත්දැකීම් ලබා ගන්න පුළුවන්කමක් වුණේ. එතකොට මෙන්න මේවා ටිකත් මේවාට ඇතුළත් කරගන්න කියලා ඉල්ලමින්, මම ගිය මාසයේ 10 වැනිදා හම්බන්තොට උසාවියේ මා ඇතුළු 40 දෙනෙක් බන්ධනාගාරගත කළා. එතකොට මේ බන්ධනාගාර ගත කිරීම වෙලාවේ ඉඳලා මට ඊයේ නිදහස ලැබෙන තුරුම අපට මේ පළාත් සභාවෙ මන්ත්‍රීවරු ඇවිල්ලා මට දීපු සහයෝගය සම්බන්ධව, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ SP මහතා ඇතුළු බන්ධනාගාර නිලධාරීන් සියල්ලක්ම මට සහාය දැක්වූවා. ඒ වාගේම අපට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඇතුළු -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේවාත් එනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ අවස්ථාව හැමෝටම දෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අලුත් රීතිවලට මේවත් එනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න. එහේ බලන්න එපා. ඔබතුමා අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කාරක සභා අවස්ථාවේදී කරන්න බැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාව ඉවර කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ කාරක සභාවේ වරප්‍රසාද අහන්න බැරිද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වරප්‍රසාද නොවෙයි නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වරප්‍රසාද අහන්න බැරිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වරප්‍රසාදයක් කිව්වා නම් ඒක කථා කරලා අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මේක කාරක සභාවක් කරලා කථා කරන්න බැරි නම් වරප්‍රසාදයක් වශයෙන් ආයේ වෙලාවක් නැහැ මට කියන්න. ඒ නිසා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඇතුළු ඒකාබද්ධ විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත්, මේ පළාත් සභාවේ, පළාත් පාලන ආයතනවල, ඒ වාගේම මහා සංඝරත්නය මට ඇවිල්ලා ආශිර්වාද කිරීම සම්බන්ධව පූජකතුමන්ලා, ඒ අනුව මේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන් ඒ සියලුම බන්ධනාගාර දෙපාර්තමේන්තුවට මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට පුද කරන අතරම මහජනතාවට ඒ වාගේම -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා එහේ බලන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් මෙතැන වේලාසන ඉඳලාම අපි කිව්වා නේ. මේ අයට හැසිරෙන්න ඉගෙන ගන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ කාර්ය පටිපාටිය මොනවාටද මේකේ අනුමත කරන්නේ? මේ අයට හැසිරෙන්න දන්නේ නැත්නම්. (බාධා කිරීම්)

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මේක වැදගත් වැඩක්. මේකට කාලය යනවා. අනවශ්‍ය කථා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හිඟන නළුවෝ නොවෙයි අපි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අනවශ්‍ය කථාවලට ඇද ගන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි මේ වාගේ හිඟන නළුවෝ නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කොඩිකාර මන්ත්‍රීතුමා ඔබතුමා අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හරිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කොඩිකාර මන්ත්‍රීතුමා කාටවත් උත්තර දෙන්න යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ වාගේම අපේ මාධ්‍ය ආයතනවලට, ඒ වාගේම -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේක හරි නැහැ නේ. තේරෙන්නේ නැද්ද? මාධ්‍යයට ස්තුති කරනවා. මොකක්ද මේක. ඔබතුමාගේ වගකීම හරියට ඉෂ්ට කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වරප්‍රසාදයක් ගැන කථා කරන්න කෙනක් ඉල්ලුවාම අවස්ථාව අපි දෙනවා. නමුත් ඒක කෙටියෙන් ඉවර කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක හරි. වරප්‍රසාද ප්‍රශ්නයට වෙන දේවල් අයිති නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කෙටියෙන් ඉවර කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතුමා හිරේ හිටපු වෙලාවේ උදව් කරපු අයට ස්තුති කරනවා. මොකක්ද මේ. විහිළුවක් නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වරප්‍රසාදය අරගෙන තිබෙනවා. ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් නේ. එතකොට මම කථා කළේ මගේ වරප්‍රසාදය මම කථා කළේ. මාව හිර කූඩුවට දාපු හින්දා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හිර කූඩුවට දැම්මේ වරදක් කරපු නිසා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මොකක්ද කරපු වරද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඇද ගන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වැටක් කඩලා තිබෙනවා. පුච්චලා වැට - මේ තිබෙන්නේ චාර්ජ් එක. දෙලක්ෂ තිස් හත්දාකට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නිකන් දන්නේ නැතිව කථා කරන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේලා හිරේට ගියාම මට්ටු වෙයි. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ වත්කම් බැරකම් සම්බන්ධව පාර්ලිමේන්තුවට තිබෙන වරප්‍රසාදය

[ගරු උපාලි කොඩිකාර]

සම්බන්ධව පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් හිර කූඩුවකට ගියාම ඒ වරප්‍රසාද සම්බන්ධවත් මේවාට ඇතුල් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස උද්ඝෝෂණය කරන්න තිබෙන අයිතියට කිසිවෙකුට බාධා කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී උද්ඝෝෂණ මර්දනය කරන්න නීතිය යොදා ගන්නවා නම් ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. හැබැයි, පළාත් සභාවේ හෝ පාර්ලිමේන්තුවේ හෝ ප්‍රාදේශීය සභාවේ හෝ යම්කිසි මන්ත්‍රීවරයෙක් නීති විරෝධී, හොරකම්, වංචා, දූෂණ, එහෙම නැත්නම් තවත් නීති විරෝධී වැඩ කරලා ඇතුළට ගියාට පස්සේ මන්ත්‍රීවරුන් නිසාම වරප්‍රසාද ඉල්ලනවා නම් මම හිතන්නේ මේ රටේ සමස්ත ජනතාවටම කරන අගෞරවයක් ඒක. මොකද රටේ ජනතාවට ඒ නීතිය සමාන වෙන්න ඕනෑ. පොදු වෙන්න ඕනෑ. හොරකම් කරලා, වංචා කරලා හිරේ ඇතුළට ගිහිල්ලා මන්ත්‍රීවරුන් නිසා වරප්‍රසාද ඉල්ලනවා නම් ඒකට අපට එකඟ වෙන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒවාට වරප්‍රසාද නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒවාට වරප්‍රසාද නැහැ. නමුත් මෙතුමා මතු කරපු කාරණය මොකද ප්‍රජාතන්ත්‍රවාදී උද්ඝෝෂණ කරන එකක් මර්දනය කරන එකට අපි එකඟ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් මෙතුමාට කිව්ව දේ ඇහුණේ නැහැ නේ. මම කිව්වේ දේශපාලනය කරලා තිබෙනවා නම්. හොරකම් කරලා, මැරකම් කරලා නොවෙයි මම කිව්වේ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාර්ය පටිපාටි සම්බන්ධව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව නවත්වන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගණපූරණය නැහැ. ගණපූරණය නැතිව මේක පවත්වන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මෙහෙම කළොත් අද රෑ වනතුරු - දැන් මේ එකින් එක ගන්න ඕනෑ. ආයි සැරයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගණපූරණය නැහැ නේ. ගණපූරණයක් නැති එකක් අනුමත කරන්නේ කොහොමද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එකින් එක අරගන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අපරාධ කරන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේක විහිළුවකට ගන්න එපා. හරි. ඔබතුමන්ලාගේ පෙන්වා දීම් ටික අවසන් නම් අපි එකින් එක මේ - රීති අංක 01 සිට ඉස්සරහාට අර ගන්නවා. පිළිවෙලට.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියොජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අදාළ රීතියේ ඊට පස්සේ ඒක වෙනස් කිරීම් කරන එක කථා කරලා එකින් එක අපි අවසන් කරන්නයි ඕනෑ. දීර්ඝ වැඩක්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

රීති 110 ක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔව්. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම මේකේදී මම අදහසක් හැටියට ඉදිරිපත් කරන්නේ. විශේෂයෙන් මේකේදී අපි හැම තිස්සේම කථා කරපු පෙත්සම් කාරක සභාව. ඒ පෙත්සම් කාරක සභාව තුළින් මේ ලොකු සේවාවක් වෙනවා. ඒකත් එක්කම මේකේ එක තැනක තිබෙනවා. මීට ඉස්සෙල්ලත් කථා වුණා. මමත් ඒ අදහස අනුමත කරනවා. මොකද මේ පෙත්සම් කාරක සභාවේ මේ මන්ත්‍රීවරු වැඩි කිරීම තුළ ගණපූරණය ආරක්ෂා කර ගැනීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පෙත්සම් කාරක සභාව තුළ. ඒ නිසා මම හිතනවා, ඒ පෙත්සම් කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරු සංඛ්‍යාව ප්‍රමාණවත් කියන එකයි මගේ හැඟීම. මොකද, මන්ත්‍රීවරු වැඩි කිරීම තුළ, මම ගොඩක් වෙලාවට දැකලා තිබෙනවා. ගණපූරණය නැතිව ඒක කරගෙන යන්න බැරි වුණු අවස්ථා. ඒ අදාළ සභාපතිවරුන්ට වුණු අවස්ථා තිබෙනවා. ඒක ගරු මන්ත්‍රීවරුන්ගේ වගකීමක්. මේකට පත් වුණාට පස්සේ ඒ මන්ත්‍රීවරයා අනිවාර්යයෙන්ම මේකට සහභාගිවීම. ඒ කෙසේ වෙතත් ප්‍රායෝගික ගැටලුවක් මේ ප්‍රශ්නය. ඒ නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කියන කථාවට විසඳුමක් වශයෙන් තමයි මන්ත්‍රී සංඛ්‍යාව වැඩි කරලා තිබෙන්නේ. ඒ වැඩි කළාම ගණපූරණය පවත්වාගෙන යන්න පුළුවන් නිසා. නේද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ සංයුතිය ඇති. මන්ත්‍රී සංඛ්‍යාව වැඩි කරන්න එපා කියලා මම කියන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක රීතිය එද්දී කථා කරමු.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒක මගේ අදහසක්. ඒකත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ නම්, කළුතර දිස්ත්‍රික්කයේම මන්ත්‍රීවරයෙකුට ඒ පෙත්සම් කාරක සභාවේ වාඩි වෙන්න බැහැයි කියන එක. මම කැමැතියි, යෝජනාව දාපු මන්ත්‍රීවරයා ඒ පෙත්සම් කාරක සභාවේ ඉන්නවා නම් ඒකේ වාඩි නොවීම ගැටලුවක් නැහැ. ඒකේ වාඩි වෙන්නේ නැති එක හොඳයි. නමුත් අනික් දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු ඉන්න එක තුළ ඒක අපි හැමතැනම දැකපු දෙයක්. මේ පෙත්සම් කාරක සභාවේ ඇත්තටම කවදාවක්වත් දේශපාලන වශයෙන් තීන්දු තීරණ ගත්තේ නැහැ. හැම පක්ෂයකම අය බොහොම සාධාරණව තීන්දු තීරණ ගත්තා. මොකද, අපි කළුතර දිස්ත්‍රික්කයේ නම් කළුතර දිස්ත්‍රික්කයේ එකක් ආවාම අපිත් දන්නවා. මෙතැන සාධාරණ තීන්දුව මොකක්ද කියලා. අපි ඒක ප්‍රායෝගිකව දන්නවා. ඒ නිසා මගේ අදහස තමයි, මගේ හැඟීම තමයි මේකේ පෙත්සම් කාරක සභාවට දැන් තිබෙන ක්‍රමයම - මොකද, කාරක සභාවේ ඉන්නවා නම් ඒ යෝජනාව ඉදිරිපත් කරපු කෙනා ඒ කාරක සභාවේ වාඩි නොවුණාට කමක් නැහැ. නමුත් දිස්ත්‍රික්කයේ අය එතැන ඉන්න ඕනෑ. මොකද, එතකොට තමයි ඒ දිස්ත්‍රික්කය පිළිබඳව අවබෝධය ඒ සියල්ල තිබෙන්නේ. ඒ අදහසත් ඉදිරිපත් කරනවා.

මේකට කොහේ හරි ඇතුළත් විය යුතු දෙයක් තිබෙනවා. මොකද, මම කියන්නේ අපි සාමාන්‍යයෙන් පෞද්ගලික යෝජනා මේ සභාවේ ඉදිරිපත් කරනවා. පෞද්ගලික යෝජනා අපි සභාවේම, මුළු සභාවම එකතු වෙලා දවසක් තිස්සේ සාකච්ඡා කරනවා. සාකච්ඡා කරලා මන්ත්‍රීවරු සියලු දෙනාගෙන්ම මේක අනුමත වෙනවා. අනුමත වුණාම සමහර වෙලාවට අපි දැකලා තිබෙනවා, මේක සාමාන්‍යයෙන් අපේ කවදාවත් මේ පෞද්ගලික

[ගරු ලලිත් එල්ලාවල]

මන්ත්‍රී යෝජනා එතැනින් එහාට යන්නේ නැහැ. එතැනින් එහාට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පළාත් සභාව තුළ ක්‍රියාත්මක කළ යුතු දෙයක්වත් වෙන්නේ නැහැ. අනිත්මට අපට සිද්ධ වෙනවා - මට මතකයි, මම පෞද්ගලික යෝජනා දාන කොට අපේ හිටපු අපේ දිවංගත රාජා මන්ත්‍රීතුමා පැත්තකට වෙලා ඉන්න කොට මම එක දවසක් ඇහුවා, ඇයි සභාවට ඇවිල්ලා සභාවේ ඉන්නේ නැතිව ඉන්නේ. අඩුම ගණනේ මේ යෝජනාවක්වත් දාලා - මට එදා කියපු දේ තමයි මල්ලියේ උඹ දාලා බලහන්. අපිත් මුල් කාලයේ මේ සභාවට ඕනෑ තරම් යෝජනා දැම්මා. උඹට තව ටිකක් කල් යන කොට මේක එපා වෙයි කියලා. ඉතින් ඇත්තටම ඒ තත්ත්වය අපටත් අද ඇති වෙලා තිබෙන්නේ. මේ යෝජනා කොච්චර කළත් ඒ යෝජනාව මේ සභාවේ සම්මත වුණත් එතැනින් එහාට මේක ක්‍රියාත්මක වීමක් නැහැ. ඒකට යාන්ත්‍රණයක් තිබෙන්න ඕනෑ. ඒක ක්‍රියාත්මක වෙන්න. යාන්ත්‍රණයක් තිබෙන්න ඕනෑ. මේ සභාවේ ඒ පිළිබඳව පසු විපරමක් තිබෙන්න ඕනෑ. මේ යෝජනාවට මොකද වුණේ කියලා. මොකද මේක නිකන් මන්ත්‍රීවරයෙක්ගේ පෞද්ගලික යෝජනාවක් නොවෙයි. මන්ත්‍රීවරයා යෝජනාව දැම්මාම මුළු සභාවම තමයි, මන්ත්‍රීවරු 104 දෙනාම තමයි අනුමත කරන්නේ. මේ සභාවට ඒ යෝජනාව වෙනුවෙන්ම දවසක් ගත කරනවා. ඉතින් මේ කරන්නේ හරි අපරාධයක්. මේකට නීතියක් තිබෙන්න ඕනෑ. හරි අපරාධයක්. මේ යෝජනාව ගත්තාට පස්සේ ඒක කොළ කැල්ලක් බවට පරිවර්තනය වෙනවා. මේ යෝජනාව සම්මත වුණාට පස්සේ. ඉතින් ඒක දැන් අපටත් එපා වෙලා. දිවංගත රාජා මන්ත්‍රීතුමා කියපු දේ අද අපටත් සිද්ධ වෙලා තිබෙනවා. අද අපට සභාවට යෝජනා දාන්න එපා වෙලා තිබෙනවා. මොකද, යෝජනාව දැම්මාට වැඩක් නැහැ. මේක කථා කරනවා.

අපි යෝජනාවක් දැම්මාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඕනෑම මන්ත්‍රීවරයෙක් යෝජනාවක් දැම්මාම මේ දවස් ගණනක් තිස්සේ කරුණු සොයාගෙන ඇවිල්ලා ඒ කරුණු ඉදිරිපත් කරගෙන තමයි මේක කරන්නේ. එතකොට මේකට කැප වෙන්න හිතෙන්නේ නැහැ. ඒ නිසා මේ ඕනෑම මන්ත්‍රීවරයෙක් පෞද්ගලික යෝජනාවක් දාන්නේ මේ පළාත වෙනුවෙන් හිතලා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා. යෝජනාවක් සම්මත වුණාට පස්සේ අඩුම ගණනේ අනිවාර්යයෙන්ම මේ අයවැය වෙලාවේදීවත්, අයවැයේ ඒ අදාළ අමාත්‍යාංශයේ ඒකට ඇතුළත් විය යුතුයි. කවදාවක්වත් ඒක වෙන්නේ නැහැ. දැන් අපි හිතමු අපි යෝජනාවක් දැම්මාට පස්සේ ඒක සම්මත වුණා කියලා. ඒක මොකක් හරි අමාත්‍යාංශයකට කොයි හරි අමාත්‍යාංශයකට අයිතියි. ඒක අමාත්‍යාංශය හරහා කරන්න පුළුවන් කියලා. ඒක කෙරෙන්නේ නැහැ. ඒ යෝජනාව ගණන් ගන්නේ නැහැ. ඒ නිසා මේකේ කොහෙට හරි ඇතුළත් වෙන්න ඕනෑ, ඒ පෞද්ගලික යෝජනාවක් සම්මත වුණාට පස්සේ ඒ අදාළ අමාත්‍යාංශය හරහා ඒ අයවැයේදී අනිවාර්යයෙන්ම ඒකට ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. ඒ යෝජනාව. ඉතින් මම ඉල්ලා සිටිනවා. අන්න ඒක කරන්න. එහෙම නැති වුණොත් එහෙම මන්ත්‍රීවරු තව ටිකක් කල් යන කොට මේ යෝජනා දාන එක සම්පූර්ණයෙන්ම නවතිනවා. බස්නාහිර පළාතේ පොදු යහපත වෙනුවෙන් කරන යෝජනා. ඉතින් ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මෙන්න මේ ටික ඉදිරිපත් කරන්න කියලා. මේ සඳහා ඇතුළත් කරන්න කියලා.

ඒ වාගේම අපි ඉල්ලා සිටින්නේ, පැහැදිලිවම මේ ගණපූරණය ප්‍රශ්නය කථා වුණා. ගණපූරණය ප්‍රශ්නයේදී එක එක යෝජනා මම දැක්කා. හැබැයි එක දෙයක් තිබෙනවා. ඉතින් ඒවා නොවෙයි අදාළ. මේ ගණපූරණය අහන්න ඕනෑ. අහන්න ඕනෑ වෙන මොකුත් නිසා නොවෙයි. මේ මන්ත්‍රීවරු මේ සභාවට පැමිණෙන්න ඕනෑ. මන්ත්‍රීවරු සියලු වරප්‍රසාද ලබනවා නම් ඒ මන්ත්‍රීවරයාට හැකියාව තිබෙන්න ඕනෑ, සභාවට ඇවිල්ලා, අත්‍යවශ්‍යම දෙයක් නැත්නම් සභාව ඉවර වනතුරු ඉන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වැරැදි තෝරා ගැනීම් නේ තිබෙන්නේ වැඩි හරියක්. ඒකයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒක දැන් ජනතාව දන්නේ නැහැ නේ. ජනතාව ඒක දන්නේ නැහැ. මේ සභාවට එන්නේ නැහැයි කියලා ජනතාව දන්නේ නැහැ. හැබැයි, බලන්න. මන්ත්‍රීවරු කී

දෙනෙක් අවුරුද්දක් තිස්සේ මේ සභාවට ඇවිල්ලා තිබෙනවා ද කියලා. ඉතින් මම කියන්නේ, මම ප්‍රාදේශීය සභාවේ ඉන්න කොට මට මතකයි පළාත් සභාවෙන් චක්‍රලේඛයක් එව්වා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ප්‍රාදේශීය සභාවට එන්නේ නැත්නම් ආපු නැති දවසට එයාට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන්න කියලා. මේ පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් තමයි අපට එව්වේ. හැබැයි, පළාත් සභාවෙන් ප්‍රාදේශීය සභාවලට නීති දානවා. හැබැයි, පළාත් සභාව ඒවා ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඉතින් අපි ආදර්ශමත් වෙන්න ඕනෑ. පළාත් පාලන ආයතනවලට මෙහෙම යවනවා නම් අපි පළාත් සභාවක් හැටියට අපි ආදර්ශමත් වෙන්න ඕනෑ. මොකද, අපේ යුතුකමක් තිබෙනවා. වගකීමක් තිබෙනවා. අනිවාර්යයෙන්ම සභාවට පැමිණෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නම් ගණපූරණය අහනවාට කිසිම විරුද්ධත්වයක් නැහැ. මොකද හේතුව ජනතාව මාධ්‍ය හරහා හරි දැනගන්න ඕනෑ, මේකට නොඑන මන්ත්‍රීවරු කවුද කියලා. මේ සියලුම වරප්‍රසාද ටික සියල්ල අරගෙන, මෙතැන ඇවිල්ලා වරප්‍රසාද ටික ගැන හැම තිස්සේම කථා කරනවා. වරප්‍රසාද ටික ගන්න ඔක්කොම කථා කරනවා. මේ ජනතාවගේ සල්ලි, ජනතාවගේ දේවල් ගන්නේ. හැබැයි මන්ත්‍රීවරු මේකට සහභාගි වෙන්නේ නැහැ. සමහර මන්ත්‍රීවරු එනවා. ඇවිල්ලා ඇඟිල්ල ගහනවා. ඇඟිල්ල ගහලා යනවා යන්න. ඉතින් මේක හරි අපරාධයක්. ඉතින් ඒ නිසා මම කියන්නේ මෙන්න මේකටත් මේකේ ඇතුළත් වෙන්න ඕනෑ, මේකේ සභාවට පැමිණිලා - (බාධා කිරීම්) ඇඟිල්ල ගහන එකේවත් වටිනාකම දන්නේ නැහැ. ඉතින් ඒක නිසා මම කියන්නේ මේකට ඇතුළත් වෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මොකක් හරි ක්‍රමයක්. සභාවට ආවේ නැත්නම් අඩුම ගණනේ අපි පළාත් පාලන ආයතනයට යවනවා නම් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන්න කියලා අසනීපයි කියලා. එහෙමනම් අපි ඒක ආදර්ශමත් වෙලා අපි ඒක කරන්න එපැයි. පළාත් සභා මන්ත්‍රීවරු. එහෙම වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පැහැදිලිවම ඉල්ලා සිටින්නේ. සභාවට එන්නේ නැති, සභාවේ ඇවිල්ලා ඇඟිල්ල ගහලා විතරක් යන මන්ත්‍රීවරුන්ට මේකේ මොකක් හරි මේකට නීතියක් ඇතුළත් කරන්න ඕනෑ. මේ අයව ගෙන්න ගන්න වැඩ පිළිවෙළක්. ඉතින් අපි කිව්වාට ජනතාව තීන්දු කරන්න ඕනෑය කියලා. ජනතාව දන්නේ නැහැ. මේ සභාවේ ඕනෑ තරම් ඉන්නවා. සභාවේ මම දන්න අය ඉන්නවා. එක වචන දහයක් කථා කරලා නැති මන්ත්‍රීවරු ඉන්නවා. එක වචන දහයක් සභාවේ කථා කරලා නැති මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එක්කෙනාට එක්කෙනා අඳුරන්නේ නැති මන්ත්‍රීවරුත් ඉන්නවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔව්. ඒක ජනතාව දන්නේ නැහැ. ඉතින් ඒක නිසා එහෙම එකක් තිබෙනවා. ඒ නිසා මම කියන්නේ මෙන්න මේවාට වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. අපි පළාත් පාලන ආයතනවලට චක්‍රලේඛ යවන්නට පෙර, අපේ වරප්‍රසාද ගන්නට පෙර මෙන්න මේවා ගැන හිතන්න කටයුතු කරන්න ඕනෑය කියලා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ ටික නොකළොත් එහෙම මේ නවක මන්ත්‍රීවරුනුත් මේ සභාවට එන එක අඩු වෙයි. මෙහෙම වුණොත් එහෙම ගණපූරණය හැමදාම නැති වෙයි. ඒ නිසා මෙන්න මේකට ඒ වාගේ නීතිමය තත්ත්වයක් ඇති කරන්නය කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මා අවසන් කරනවා. බොහොම ස්තුතියි.

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්ය පටිපාටි රීති සංශෝධන පුස්ථක කෙටුම්පත සලකා බැලීම

CONSIDRING THE DRAFT OF NEW RULES OF PROCEDURE BOOK OF WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි එහෙමනම් එකින් එක අර ගනිමු. ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා, අපට එකින් එක අරගන්න සිදු වෙනවා. සංශෝධනය කළ යුතු අදාළ රීතියේදී විතරක් අවශ්‍ය කරුණු හා සංශෝධනය ඉදිරිපත් කරන්න. මම යෝජිත රීතිය කියවනවා. අපි එකින් එක අවසන් කරමු. ඔබතුමන්ලා සියලු දෙනා ළඟම මේ රීති පොත තිබෙනවා. ඒ අනුව

[ගරු නියෝජ්‍ය සභාපතිතුමා]

පළමුවැනි එක අපි දැනට සංශෝධනය ඉදිරිපත් කරලා තිබෙනවා.

ප්‍රතිඥාව හෝ දිවුරුම

රීති අංක 1(1) -

*"සෑම මන්ත්‍රීවරයකු විසින්ම මන්ත්‍රීවරයකු වශයෙන් සභාවේ අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට පෙර පළාත් ආණ්ඩුකාරවරයා හෝ ආණ්ඩුකාරවරයා විසින් නම් කරනු ලබන වෙනත් අයෙකු ඉදිරියේ හෝ සභාපතිවරයා ඉදිරියේ, පනතේ 4 වැනි වගන්තියෙන් නියමිත පරිදි සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනය අනුව 7 වන උප ලේඛනය ප්‍රකාර ප්‍රතිඥාව හෝ දිවුරුම දී ඊට අත්සන් තැබීම කළ යුතු ය."*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සංශෝධනයේ ගැටලුවක් තිබෙනවා නම් ඔබතුමන්ලා කථා කරන්න ඕනෑ. පළමුවැනි එක ගැටලුවක් නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 1(2) -

*"එසේ ප්‍රතිඥා නැතහොත් දිවුරුම් දුන්නා වූ මන්ත්‍රීවරුන් පිළිබඳ සභාපතිවරයා ඊළඟ සභාව ආරම්භයේදී ම සභාව දැනුවත් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 1(3) -

*"ඉහත 01(1) අනු රීතියේ නියම කොට ඇති දිවුරුම් දී අත්සන් කිරීම හෝ ප්‍රතිඥා දී අත්සන් කිරීම යම් මන්ත්‍රීවරයකු පැහැර හැරියහොත් එවන් තැනැත්තෙකු සභාවේ අසුන් ගැනීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීම නොකළ යුතු අතර සභාවේ අසුන් ගෙන සිටී නම් සභාපතිවරයා විසින් ඔහුට වහාම සභාවෙන් ඉවත් වීමට නියම කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 1(4) -

*"ඉහත 01(3) අනු රීතිය අනුව සභාපතිවරයා විසින් කරන ලද නියමය නොතකා එම තැනැත්තා තවදුරටත් අසුන්ගෙන සිටී නම් හෝ ඡන්දය ප්‍රකාශ කිරීමේ කටයුත්තේ නියැලී සිටී නම්, එම තැනැත්තා සම්බන්ධයෙන් පනතේ 6 වෙනි වගන්තිය යටතේ කටයුතු ආරම්භ කරන ලෙස සභාපතිවරයා විසින් නියෝග කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පළාත් සභා මැතිවරණයකට පසුව පැවැත්වෙන ප්‍රථම රැස්වීම.

රීති අංක 2(1) -

*"පළාත් සභාවට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා පවත්වනු ලබන මැතිවරණයකින් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීමේදී සභාවේ ලේකම්වරයා විසින් ආණ්ඩුකාරවරයාගේ රැස්වීම කැඳවීමේ නිවේදනය කියවිය යුතු ය. ඉන් අනතුරුව සභාව පහත දැක්වෙන කාර්යයන් සිදු කළ යුතු ය."*

*(අ) සභාපතිවරයෙකු තෝරා ගැනීම.*

*(ආ) නියෝජ්‍ය සභාපතිවරයෙකු තෝරා ගැනීම*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 2(2) -

*"එසේ සභාපතිවරයකු හා නියෝජ්‍ය සභාපතිවරයකු තෝරා පත් කර ගැනීම කාර්ය පටිපාටි රීති අංක 04 සහ 05 හි විධිවිධාන පරිදි සිදු විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 2(3) –

සංශෝධන තිබෙනවා නම් කියන්න.

"එකී කාර්යයන් නිම වීමෙන් පසුව, එදින සිට දින 21 ක් නොඉක්මවා සභාවේ දෙවන රැස්වීම පැවැත්වීමටත්, ඉන් පසුව පැවැත්වෙන රැස්වීම් කාර්යය පටිපාටි රීති විධිවිධාන අනුව පැවැත්වීමටත් ක්‍රියා කළ යුතුය."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මන්ත්‍රීවරුන් අසුන් ගැනීම.

රීති අංක 3(1) -

*"පළාත් සභාවට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා පවත්වනු ලබන මැතිවරණයකින් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීමේදී සහ ඉන් පසුව ඒ ඒ මන්ත්‍රීවරයාට ආසනයක් වෙන් කරන තුරු, මන්ත්‍රීවරුන් සඳහා පනවා ඇති ඕනෑම අසුනක මන්ත්‍රීවරයෙකුට අසුන් ගත හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 3(2) -

*"සභාපතිවරයා විසින් හැකි ඉක්මණින් සෑම මන්ත්‍රීවරයෙකුටම ආසනයක් වෙන් කළ යුතු අතර අවශ්‍ය පරිදි වරින් වර එම ආසන වෙන් කිරීම වෙනස් කළ හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 3(3) -

*"පළාත් සභාවේ ඒ ඒ මන්ත්‍රීවරයාගේ ජ්‍යෙෂ්ඨත්වය ද, මන්ත්‍රීවරයා අයත් දේශපාලන පක්ෂයේ සංයුතිය ද සභාවේ ඊට අදාළ නියෝජ්‍යත්වය ද හැකිතාක් සැලකිල්ලට ගනිමින් තම අභිමතය පරිදි සභාපතිවරයා විසින් අසුන් වෙන් කිරීම කළ යුතුය. ඒ සම්බන්ධයෙන් සභාපතිවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා මේ සඳහා අවධානය යොමු කරන්න. මම කථා කරමින් යනවා. අනුමත කරමින් යනවා. ගරු සභානායකතුමා. මේ ගැන කාරක සභාවේ ඉන්න මන්ත්‍රීතුමන්ලා විශේෂයෙන්ම දැනට මේ වෙනස්කම් කරන්න ඕනෑ මොකක්ද? නැත්තේ මොකක්ද කියලා කථා කරන්න. මොකද එකසිය ගණනක් තිබෙනවා.

රීති අංක 3(4) –

*"පළාත් සභා පනතේ 8 වැනි වගන්තිය පරිදි සභාපතිවරයාව ධුරයෙන් ඉවත් කිරීම සඳහා යෝජනා*

*සම්මතයක් සැලකිල්ලට භාජනව පවත්නා විට සභාපතිවරයාට එම පනතේ 8(2) වගන්තිය පරිදි සභා රැස්වීමේදී කථා කිරීමටත්, රැස්වීමේ කටයුතුවලට අන්‍යාකාරයෙන් සහභාගිවීමටත් හැකිවන පරිදි නියෝජ්‍ය සභාපතිවරයා අසුන් ගන්නා ආසනය වෙන් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාපතිවරයෙකු තෝරා පත් කර ගැනීම - ප්‍රථම සභා රැස්වීම.

රීති අංක 4(1) -

*"පළාත් සභාව සඳහා පැවැත්වෙන මැතිවරණයකින් පසුව පළාත් සභාවේ පැවැත්වෙන ප්‍රථම සභා රැස්වීමේදී ම සභාපතිවරයෙකු තෝරා ගැනීමට සභාව ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(2) -

*"සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගැනීම සඳහා කිසියම් මන්ත්‍රීවරයකුගේ නම යෝජනා කරන මන්ත්‍රීවරයකු විසින් පළමු කී මන්ත්‍රීවරයා සභාපති ධුරයට පත් කර ගනු ලැබුවහොත් එම ධුරය භාර ගැනීමට ඔහු කැමති බව නාම යෝජනා කිරීමට පෙර නිශ්චිතව තහවුරු කරගෙන සිටිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(3) -

*"යෝජක මන්ත්‍රීවරයා සභාවේ ලේකම්වරයා අමතා එම අවස්ථාවේ සභා රැස්වීමට පැමිණ සිටින ඉහත අංක 04(2) හි අවශ්‍යතාවය සපුරාලන මන්ත්‍රීවරයකුගේ නම සඳහන් කරමින් ".......(මන්ත්‍රීවරයාගේ නම)......." මෙම සභාවේ සභාපතිවරයා ලෙස පත් කර ගත යුතු යැයි යෝජනාවක් ඉදිරිපත් කළ යුතු අතර, එකී යෝජනාව වෙනත් මන්ත්‍රීවරයකු විසින් ස්ථිර කළ යුතුය. ඒ සම්බන්ධයෙන් විවාදයක් ඇති නොවිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(4) -

*"එක් මන්ත්‍රීවරයකුගේ නම පමණක් යෝජනා වී ස්ථිර වූ විට ඔහු සභාපති ධුරයට තෝරා පත් කර ගනු ලැබූ බව ලේකම්වරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(5) -

*"එක් මන්ත්‍රීවරයකුට වැඩි දෙනෙකුගේ නම් ඉහත සඳහන් ප්‍රකාර යෝජනා කරනු ලැබ ඇත්නම් ද, ස්ථිර කරනු ලැබ ඇත්නම් ද විනාඩි දෙකක් කැඳවීම් සීනුව නාද කරවීමෙන් පසුව ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීම පවත්වා සභාපතිවරයා තෝරාපත් කර ගැනීමට සභාවේ ලේකම්වරයා ක්‍රියා කළ යුත්තේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(6) (1) -

*"සභාවේ ලේකම්වරයා විසින් එක් එක් මන්ත්‍රීවරයා කැඳවා නිල මුද්‍රාව සහ අත්සන පමණක් සහිතව නිකුත් කරනු ලබන ඡන්ද පත්‍රිකාව බැගින් සැපයිය යුතු ය. අදාළ මන්ත්‍රීවරයා විසින් තමන් ඡන්දය පාවිච්චි කරන්නේ කුමන මන්ත්‍රීවරයාට ද යන වග තීරණය කර, පැහැදිලිවම එකී අපේක්ෂක මන්ත්‍රීවරයාගේ නම පමණක් ලියා ඡන්ද පෙට්ටියට බහාලිය යුතු ය".*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(6) (2) -

*"ඡන්දය ප්‍රකාශ කිරීම අවසානයේදී ලේකම්වරයා විසින් තමන් විසින් කැඳවා ගනු ලබන තවත් නිලධාරියකු හෝ නිලධාරීන් සාක්ෂි වශයෙන් තබාගෙන ඡන්ද ගණන් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(6) (3) -

*"එසේ ගණන් කිරීමේදී යම් ඡන්ද පත්‍රිකාවක සටහන් කර ඇති මනාපය කවුරුන් වෙනුවෙන් පළ කරන ලද්දක් දැයි නොපැහැදිලි නම්, එය නරක් වූ ඡන්ද පත්‍රිකාවක් සේ සලකා කටයුතු කළ යුතු ය. මේ සම්බන්ධයෙන් ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(7) -

*"ඡන්ද ගණන් කර අවසාන වූ පසු සියලුම මන්ත්‍රීවරුන්ට පෙනෙන පරිදි ධූරාපේක්ෂක ඒ ඒ මන්ත්‍රීවරයා ලබා ගත් ඡන්ද සංඛ්‍යාව අවරෝහණ පිළිවෙළට අනුව සටහන් කිරීමට ලේකම්වරයා පියවර ගත යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(8) -

*"සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමේ දී යම් මන්ත්‍රීවරයෙකු ඡන්දය දීමෙන් වැළකී සිටියහොත් ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනවාත් සමඟම ඡන්දය දීමෙන් වැළකුණු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් ප්‍රකාශයට පත් කිරීමට ලේකම්වරයා පියවර ගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(9) -

*"සභාපති නිලවරණය සඳහා අපේක්ෂකයන් ලෙස මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පමණක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක, ඔවුන් දෙදෙනා අතරින් සභාපතිවරයකු තෝරා ගැනීම සඳහා ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීමක් කළ යුතු අතර, අදාළ සභා රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කළ මන්ත්‍රීවරුන්ගේ ඡන්ද සංඛ්‍යාවෙන් බහුතර ඡන්දය යම් අපේක්ෂක මන්ත්‍රීවරයෙකු ලබා ගෙන ඇත්නම්, එම අපේක්ෂක මන්ත්‍රීවරයා සභාපතිවරයා ලෙස පත් වූ බව ලේකම්වරයා විසින් ප්‍රකාශ කළ යුතුය. මේ අවස්ථාවේදී ලේකම්වරයා විසින් 04(7) හා 04(8) අනුරීති අනුගමනය කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(10) -

*"අපේක්ෂකයන් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇති අවස්ථාවක දී එක් අපේක්ෂකයකු අනෙක් අපේක්ෂකයින් සියලු දෙනාම ලබා ගන්නා මුළු ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා නොගනී නම්, අඩුම ඡන්ද සංඛ්‍යාව ලබා ගන්නා අපේක්ෂකයාගේ නම ඡන්ද විමසීමෙන් බැහැර කොට, යළිත් ඉතිරි අපේක්ෂකයන් අතර ඡන්දය විමසිය යුතුය. මෙසේ සෑම විමසීම් වාරයකදීම අඩුම ඡන්ද සංඛ්‍යාව ලබා ගන්නා අපේක්ෂකයා ඡන්ද විමසීමෙන් බැහැර කරමින්, එක් අපේක්ෂකයකු ඉතිරි අපේක්ෂකයා ලබා ගන්නා ඡන්ද සංඛ්‍යාවට හෝ ඉතිරි අපේක්ෂකයින් සියලු දෙනා ලබා ගන්නා මුළු ඡන්ද සංඛ්‍යාවේ එකතුවට හෝ වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා තෙක් අවස්ථානුකූලව ඡන්ද විමසීම කරගෙන යා යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(11) (1) -

*"අපේක්ෂකයින් තිදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු අතර පැවැත්වෙන ඡන්ද විමසීමකදී අපේක්ෂකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු එක සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා අවස්ථාවකදී,මෙහි 04(10) අනු රීතිය යටතේ ඉන් එක් අපේක්ෂකයකු ඡන්ද විමසීමෙන් බැහැර කළ යුතු වන විට, එක සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා අපේක්ෂකයින් අතුරින් බැහැර කළ යුතු අපේක්ෂකයා හඳුනා ගැනීමට, එම සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයන් අතර නැවත ඡන්ද විමසීමක් සිදු කළ යුතුය. එවිටත් සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබුණ හොත් ලේකම්වරයා තීරණය කරන අන්දමට කුසපත් ඇදීම මගින් බැහැර කළ යුතු අපේක්ෂකයා හඳුනාගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(11) (2) -

*"මේ ආකාරයට බැහැර කරමින් අපේක්ෂකයින් දෙදෙනෙකු අතර නිල වරණය පැවැත්වෙන අවස්ථාව දක්වා එළැඹුණු විට අවස්ථාවෝචිතව රීති අංක 04(9) හෝ 04(12) රීතීන් අනුගමනය කර ඡන්ද විමසීම පවත්වා සභාපතිවරයා තෝරා පත් කර ගත යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(12) -

*"අපේක්ෂකයින් දෙදෙනෙකු අතර පැවැත්වෙන ඡන්ද විමසීමකදී ඡන්ද සංඛ්‍යාව සමසේ බෙදී යන්නේ නම්, නැවත වරක් ඡන්දය විමසිය යුතු අතර, එම ඡන්දය විමසීමේදී ද ඡන්ද සමසේ බෙදී යන්නේ නම්, ඡන්ද විමසීමෙන් බැහැර කළ යුතු අපේක්ෂකයා තෝරා ගැනීම, ලේකම්වරයා තීරණය කරන අන්දමට කුසපත් ඇදීම මගින් සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(13) -

*"ගණන් කරනු ලබන ඡන්ද පත්‍රිකා පෙට්ටියක තැන්පත් කළ යුතු අතර, යම් මන්ත්‍රීවරයකු සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ බව ප්‍රකාශයට පත් කරනු ලැබූ විට, එම ඡන්ද පෙට්ටිය සභාව ඉදිරියේ මුද්‍රා යොදා තුන් මාසයක*

*කාලයක් ලේකම්වරයා භාරයේ තැබීමෙන් අනතුරුව සභා කටයුතු කාරක සභාවේ අනුමැතිය අනුව ලේකම්වරයා විසින් එකී ඡන්ද පත්‍රිකා සහ ඡන්දයට භාවිතා කළ අනිකුත් ලියවිලි පුළුස්සා දමා, එසේ කළ බව එළැඹෙන සභාවට දැනුම් දිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(14) -

*"ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කිරීමෙන් පසුව, හිස් ඡන්ද පත්‍රිකා සහ ඡන්දය සඳහා භාවිතා කළ අනෙකුත් ලියකියවිලි මුද්‍රා තබා, මාස තුනක් ගත වන තුරු ලේකම් භාරයේ තබා ගැනීමෙන් අනතුරුව, සභා කටයුතු කාරක සභාවේ අනුමැතිය අනුව එකී හිස් ඡන්ද පත්‍රිකා පුළුස්සා දමා, එසේ කළ බව එළැඹෙන සභාවට දැනුම් දිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 4(15) -

*"මෙම විධිවිධාන යටතේ සභාපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා පවත්වන ඡන්ද විමසීමක් අඩාලව කල් තැබිය නොහැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 5.

පහේ පරණ රීතියමයි යන්නේ.

නියෝජ්‍ය සභාපතිවරයෙකු තෝරා පත් කර ගැනීම.

රීති අංක 5(1) සංශෝධන රීතිය -

*"නියෝජ්‍ය සභාපතිවරයා තෝරා පත් කර ගන්නා අවස්ථාවේදී සභාපතිවරයා මූලසුන දැරිය යුතු අතර, නියෝජ්‍ය සභාපතිවරයා තෝරා ගැනීම සඳහා වන ඡන්ද විමසීම මෙහෙයවීම ද සභාපතිවරයා විසින් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 5(2) -

*"නියෝජ්‍ය සභාපතිවරයා තෝරා පත් කර ගැනීමේදී සභාපතිවරයා තෝරා ගැනීමේදී අනුගමනය කළ යුතු රීති අංක 04 හි දක්වන්නා වූ අනුරීතිවල සඳහන් කර ඇති ක්‍රියා පිළිවෙතම අනුගමනය කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාපති හෝ නියෝජ්‍ය සභාපති ප්‍රතිඥා හෝ දිවුරුම් දීම.

රීති අංක 6 -

*"දැනටමත් මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දී තිබෙන නමුත් සභාපති ධූරයට හෝ නියෝජ්‍ය සභාපති ධූරයට තේරී පත් වූ තැනැත්තන් ප්‍රතිඥාව හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් ඔහුගේ ධූරයේ කාර්යය ආරම්භ නොකළ යුත්තේ ය. පළාත් සභාවේ සභාපතිවරයා පළාත් සභාවේ ලේකම්වරයා ඉදිරියේදී ද, නියෝජ්‍ය සභාපතිවරයා පළාත් සභාවේ සභාපතිවරයා ඉදිරියේදී ද ප්‍රතිඥාව හෝ දිවුරුම දිය යුතු ය. "*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය හිස් වූ අවස්ථාවක සභාපති හෝ නියෝජ්‍ය සභාපති තෝරා පත් කර ගැනීම.

රීති අංක 7(1) -

*"සභාවේ මන්ත්‍රී ධූරය අහෝසි වීම නිසා හෝ විධිමත් ඉල්ලා අස්වීමේ ලිපියක් මගින් ඉල්ලා අස්වීම නිසා හෝ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 7(2) (ඇ) වගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කිරීම නිසා හෝ මරණයට පත්වීම නිසා හෝ, සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය හිස් වන සෑම අවස්ථාවකම සභාව විසින් අවස්ථාවෝචිත පරිදි සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය දැරීම සඳහා මන්ත්‍රීවරුන් අතුරින් සුදුස්සෙකු තෝරා ගත යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 7(2)(අ) -

*"සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය හිස් වූ අවස්ථාවක, ලේකම්වරයා විසින් එසේ ධූරය හිස් වී ඇති බව, ඒ අවස්ථාවට පසුව පවත්වනු ලබන පළමු සභා කටයුතු පිළිබඳ කාරක සභාවට වාර්තා කළ යුතු අතර, සභා කටයුතු පිළිබඳ කාරක සභාව විසින් ඊළඟ ආසන්නතම සභා රැස්වීමේදී හිස් වූ සභාපති ධූරය හෝ නියෝජ්‍ය සභාපති ධූරය තෝරා ගැනීමට හැකිවන පරිදි න්‍යාය පත්‍රය සකස් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 7(2)(ආ) -

*"එසේ වුවද, සභා කටයුතු කාරක සභා රැස්වීම්, පළාත් සභා රැස්වීමක් අතර කාල සීමාව තුළ දී එකී ධූරයන් හිස් වූ විට හදිසි සභා කටයුතු කාරක සභාවක් කැඳවා එය පිළිබඳව දැනුවත් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 7(3) -

*"එසේ න්‍යාය පත්‍රය සකස් කිරීමේදී එකී තෝරා ගැනීම, එදිනට නියමිත න්‍යාය පත්‍රයේ ප්‍රථම කටයුත්ත ලෙස ඇතුළත් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 7(4) -

*"එසේ ධූරය හිස් වූ අවස්ථාවක සභාපති හෝ නියෝජ්‍ය සභාපති තේරීම සඳහා ඡන්ද විමසීමේ කටයුතු රීති අංක 05 හි සඳහන් විධිවිධානවලට අනුව සිදු කළ යුතුය."*

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 7(4). *"එසේ ධූරය හිස් වූ අවස්ථාවක සභාපති හෝ නියෝජ්‍ය සභාපති තේරීම සඳහා ඡන්ද විමසීමේ කටයුතු රීති අංක 05 හි සඳහන් විධිවිධානවලට අනුව සිදු කළ යුතුය."* කියල තිබෙන්නේ.

මම හිතුවේ ඒක *"රීති අංක 04 සහ 05*, අනුව වෙනස් විය යුතුය කියලා සංශෝධනය විය යුතුයි කියලා යෝජනා කරනවා.-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඊළඟට සභාපති නාමාවලිය.

රීති අංක 8(1) -

*"එක් එක් සැසිවාරය ආරම්භයේදී සභාපතිවරයා විසින් හෝ නියෝජ්‍ය සභාපතිවරයා විසින් මන්ත්‍රීවරුන් තිදෙනෙකුගෙන් යුත් සභාපති නාමාවලියක් නම් කළ යුතුය. එකී නාමාවලිය සකස් කිරීමේදී අදාළ මන්ත්‍රීවරයාගේ ජ්‍යෙෂ්ටත්වය ද සැලකිල්ලට ගත යුතුය. සභාපති තනතුර හෝ නියෝජ්‍ය සභාපති තනතුර හෝ පුරප්පාඩුවීම හෝ ඒ දෙදෙනාගෙන් කවරෙකුවත් සභා රැස්වීමේ මූලාසනය නොදැරීම හෝ සිදුවන අවස්ථාවලදී ඉහත කී සභාපති නාමාවලියට නම් කර ඇති මන්ත්‍රීවරුන්ගෙන් එක් අයෙකු, නම් කර ඇති අනුපිළිවෙළ අනුව පනතේ 7(3) ඡේදය යටතේ සභාපතිවරයාගේ රාජකාරී ඉටු කිරීම හෝ පනතේ 7(4) ඡේදය යටතේ සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම හෝ කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 8(2) -

*"සැසිවාරය තුළදී සභාපති නාමාවලියේ හටගන්නා පුරප්පාඩුවක් වන්නේ නම්, නම් කිරීමක් මගින් එම පුරප්පාඩුව පිරවීමට සභාපතිවරයා ක්‍රියා කළ යුතු ය. සභාපති නාමාවලියේ නම්වල අනුපිළිවෙළෙහි වෙනසක් කිරීමට ද සභාපතිවරයාට හැකි විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 8(3) -

*"සභාපතිවරයා සහ නියෝජ්‍ය සභාපතිවරයා ද සභාපති නාමාවලියේ සාමාජිකයන් සියලුදෙනා ද නොමැති අවස්ථාවකදී රැස්ව සිටින මන්ත්‍රීවරුන් අතරින් එක් අයකු සභාපතිවරයා වෙනුවෙන් එම අවස්ථාවේදී සභාවේ කටයුතු පවත්වාගෙන යාමට සභාව විසින් පත් කර ගත යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාපතිවරයාගේ බලතල සහ වගකීම්. රීති අංක 9(1) -

*"සභා භූමිය හා ගොඩනැගිලි, සභාවේ ආරක්ෂක විධිවිධාන හා සභා ගර්භය පිළිබඳ සාමාන්‍ය පරිපාලනය සභාපතිවරයාගේ මෙහෙය වීම හා පාලනය යටතේ ඉටු විය යුතු අතර, ඒ සඳහා සියලු බලතල ඔහු සතු විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(2) -

"ඉහත 09(1) හි සඳහන් බලතල වනුයේ ස්ථිර, තාවකාලික හා ආනුෂාංගික රීති බලාත්මක කිරීමේ අයිතිය වන අතර, ස්ථිර රීති හැර තාවකාලික හා ආනුෂාංගික රීති සභාපතිවරයාගේ අභිමතය පරිදි ලිහිල් කළ හැක්කේය."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(3) -

*"සභාපතිවරයාගේ නියෝගවල බලාත්මක භාවය තහවුරු කිරීම සඳහා වන රීති උල්ලංඝණය වන අවස්ථාවන්ට අදාළව සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක වන ආකාරය පරිශිෂ්ටයේ සඳහන් වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(4) -

*"මීට සමාන්තරව 72 සිට 78 දක්වා රීති යටතේ වන බලතල ක්‍රියාවට නැඟීමේ අභිමතය සභාපතිවරයා සතු විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(5) -

*"කාරක සභාවලදී කාරක සභාවල සභාපතිවරුන්ගේ බලතලද, සභාපතිවරයාගේ බලතල යටතේ පැන නඟින අතර, යම් හෙයකින් එකී කාරක සභාවලට සාක්ෂිකරුවන් හා ලේඛන කැඳවීමේදී එකී පුද්ගලයන් එකී කැඳවුම් නියෝග කඩ කළ අවස්ථාවකදී, එය පළාත් සභාවේ වරප්‍රසාද කඩ කිරීමක් ලෙස සැලකිය යුතු ය. එවැනි අවස්ථාවක අදාළ නිලධාරීන් හෝ පුද්ගලයන්ට එකී වරප්‍රසාද කඩ කිරීම සම්බන්ධයෙන් වගකීම පැවරීම ආයතන සංග්‍රහයේ හා පවතින නීතියේ ප්‍රතිපාදන අනුව සිදු කළ යුත්තේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(6) -

*"සභාවේ කටයුතු සම්බන්ධයෙන් මෙම රීති මගින් විධිවිධාන සලස්වා නොමැති සියලුම කරුණු, අවස්ථානුකූලව මෙහෙයවීමේ බලය සභාපතිවරයා සතු වන්නේ ය ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(7) -

*"සභාපති ධූරය හිස්ව පවතින විට හා සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණ ඇති විට මූලසුන හොබවන තැනැත්තා සභාපතිවරයා සතු බලතල හා වගකීම් ක්‍රියාත්මක කළ යුත්තේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(8) -

*"සභාවේ කටයුතු සම්බන්ධයෙන් සභාපතිවරයා සතු අභිමතයට අභියෝග කළ නොහැක්කේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(9) -

*"සභාපතිවරයා විසින් සභාවේ කටයුතු කාර්යක්ෂම හා සඵල ආකාරයට ඉටු කර ගැනීම සඳහා අදාළ කාරක සභා පත් කළ යුත්තේ ය. මෙකී කාරක සභාවල බලතල 82 සිට 98 දක්වා වගන්තිවල සඳහන් වන අතර එකී කාරක සභාවල*

*සභාපතිවරුන්ට, සභාපතිවරයාගේ බලතල යටතේ බලය ලැබෙන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(10) -

*"මන්ත්‍රීවරයෙකු සභාව හමුවේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළ විට ඒ පිළිබඳ කටයුතු කිරීමේ පූර්ණ බලතල සභාපතිවරයා සතු වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 9(11) -

*"සභාවේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක්, යෝජනාවක්, වරප්‍රසාද ප්‍රශ්නයක් සභාවට හෝ කාරක සභාවට ගෙන එන්නේ නම් හෝ යොමු කරන්නේ නම් එම කාරණාව අදාළ අමාත්‍යවරයා වෙත යොමු කිරීම සහ එකී අමාත්‍යවරයාගෙන් පෙරළා පිළිතුරක් ලබා ගැනීම සභාපතිවරයාගේ වගකීම වන අතර ඒ සම්බන්ධව ගත් ක්‍රියා මාර්ගය පිළිබඳව අදාළ මන්ත්‍රීවරයා දැනුවත් කිරීමට සභාපතිවරයා කටයුතු කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නියෝජ්‍ය සභාපතිවරයා සතු බලතල සහ වගකීම.

රීති අංක 10(1) සහ 10(2)

*"සභාපති ධූරය හිස්ව පවතින අවස්ථාවකදී හෝ සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණ ඇති විට පනතේ 7(3) හා 7(4) වගන්ති ප්‍රකාරව සභාපතිවරයා සතු බලතල හා වගකීම් නියෝජ්‍ය සභාපතිවරයා විසින් ඉටු කරනු ලැබිය යුතුය."*

*"සභාවේ සභාපතිවරයා යම් කාරක සභාවක සභාපති ධූරය හොබවයිද ඔහු නොමැති අවස්ථාවකදී එකී කාරක සභාවන්හි මූලාසනය නියෝජ්‍ය සභාපතිවරයා විසින් දැරිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එකොළහේ තිබෙන්නේ, සාකච්ඡා වුණු කරුණක්. රීති අංක 11. සභාපති සහ නියෝජ්‍ය සභාපති ධූරයෙන් ඉවත් කිරීම.

*"සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා ධූරයෙන් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාවකදී පනතේ 7(2)(ඇ) සහ 8 රීති අනුව කටයුතු කළ යුතු ය."*

විශ්වාසභංග යෝජනාව කියන්නේ ඒක තමයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති අංක 55 තිබුණු ආකාරයටම අමාත්‍යවරුන් සහ සභාපති, නියෝජ්‍ය සභාපතිවරුන් යන විධියටම තිබෙන්න ඕනෑ. මම එතැනට එනතුරු සිටියේ. ඒ විධියටම තිබෙන්න ඕනෑය කියලා අපි යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ගැටලුවක් නැහැ නේ?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මට ඒ පිළිබඳව යම් අදහසක් ප්‍රකාශ කරන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපට පනතේ ප්‍රශ්නයක් තිබෙන්නේ, නේද?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම හිතන්නේ, රීති අංක 11 න් ඒක ආවරණය වෙනවා කියලා. රීති අංක 11 යේ, සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා සම්බන්ධ යෝජනාවකදී පනතේ 7(2)(ඇ) කියන්නේ, බහුතර මන්ත්‍රීවරුන්ගේ යෝජනාවක් මගින් ඔවුන් ඉවත් කළ හැකිය කියලා කියනවා. ඒ නිසා තමයි මේක ඇතුල් කරලා තිබෙන්නේ. මේක ඇතුල් කරලා තිබෙන නිසා තමයි අනික් ස්ථානයේ අපි සභාපති, නියෝජ්‍ය සභාපති ඉවත් කිරීම පිළිබඳව සටහනක් නොකළේ කියන එකයි මගේ මතකය. නිවැරදි කිරීමකට යටත්ව මම කියන්නේ. ගරු මන්ත්‍රීතුමා, එතැන මම හිතන්නේ පරණ එකේ තිබුණා සභාපතිව සහ නියෝජ්‍ය සභාපතිව ඉවත් කරන්න පුළුවන් කියලා. යෝජනාවක් මගින්. ඒක අපි එතැන අඩු කරලා තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අදහස වුණේ -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉඩ දුන්නා නම් මම පැහැදිලි කරන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 11

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

පරණ එකේ 55.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම මේක සලකා බැලීම සඳහා පමණයි කියන්නේ. රීති අංක 55 –

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පනතත් එක්ක යන්න වෙනවා නේද?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

55 යේ තිබුණේ,

*"විශ්වාසභංග යෝජනාවක් පාලක පක්ෂයට හෝ අමාත්‍යවරයෙකුට හෝ සභාපතිවරයාට හෝ නියෝජ්‍ය සභාපතිවරයාට හෝ එරෙහිව ඉදිරිපත් කළ හැකි විය යුතුය."*

කියලා විධානයක් තිබුණා. අපි ඒකේ ඒ විධානයම දැම්මා. හැබැයි සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා කියන එක එතැනින් ඉවත් කළා. මම හිතන හැටියට, මගේ මතකය නිවැරදි නම් ඒ ඉවත් කළේ 11 යේ ඒ කාරණාව සඳහන් වන නිසා. මොකද, 11 යේ කියනවා,

*"සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාවකදී පනතේ 7(2)(ඇ) යන්න,*

*7(2)(ඇ) යන්නෙන් කියනවා, මම ඉංග්‍රීසියෙන් කියවන්නම්. මේක කියන්නේ,*

*A member holding office as Chairman or Deputy Chairman of a provincial Council –*

*May be removed from his office by a resolution of the Council passed by majority of the whole number of members of the Council (including those not present):*

ඒ කියන්නේ පනතෙන් කියනවා, යෝජනාවක් සම්මත කිරීමෙන් සභාපති හෝ නියෝජ්‍ය සභාපති ඉවත් කළ හැකිය කියලා. ඒ පනතේ තිබෙන විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුයි කියලා සභාපති හෝ නියෝජ්‍ය සභාපතිට අදාළව 11 යේ අපි කියනවා. එහෙම කියලා නැවත වාරයක් 55 යෙත් ඒක කීමේ අවශ්‍යතාවයක් පැන නගින්නේ නැහැ. නැවත කිව්වොත් ඒක නැවත අර repetition එකක්. ඒ කියන්නේ එකම දේ තැන් දෙකක කියන නිසා විය යුතුයි කියන එකයි මගේ මතකය. එතැනින් ඉවත් කරලා මෙතැනට දැම්මේ. කොහොම වුණත්

මම මේ අදහස ප්‍රකාශ කරන්නේ ගරු මන්ත්‍රීවරුන්ට සලකා බලන්න ඉඩ තියලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු මන්ත්‍රීතුමා අපි ස්ටාර් මාර්ක් එකක් දාලා 11 යේ ඇත කියලා දැම්මොත් මොකද වෙන්නේ?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු මන්ත්‍රීතුමා, තේරුණේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ශ්‍රීනාත් ම. පෙරේරා නීතිඥ මහත්මයා එතුමා කියන ක්‍රමයයි, මේ සභා රීති 55 යේ තිබෙන ක්‍රමයයි අතර පරස්පර අදහසක් තිබෙන්නේ. අපි කියන්නේ රීති අංක 55 ට දාන්නත් ඕනෑ. 55(2) කියනවා,

*"එවැනි යෝජනාවක් මන්ත්‍රීවරු දෙදෙනෙකුගේ හෝ කීප දෙනෙකුගේ අත්සන සහිතව සභාපතිවරයාට භාර දිය හැකිය."*

ඊට පස්සේ ඔබතුමන්ලා 55 යේ එක වෙනස් කරලා තිබෙනවා.

*"එවැනි යෝජනාවක් ලිඛිතව පළාත් සභාවේ සමස්ත මන්ත්‍රීවරු (නොපැමිණි මන්ත්‍රීවරුද ඇතුළත්ව) සංඛ්‍යාවෙන් 1/5 ක් හෝ ඊට වැඩි පිරිසකගේ අත්සන් සහිතව සභා ලේකම්වරයාට භාර දිය යුතු ය."*

එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මතය අරගෙන බැලුවාම මේක පරස්පර මත දෙකක්. මෙතුමා පනතත් එක්ක 11 සංශෝධනයක් ගැන කථා කරනවා. අපි පළාත් සභාවේ පනතත් එක්ක 55 තිබෙන එක ඉස්සෙල්ලා තිබුණු ආකාරයටම තැබිය යුතුයි කියන යෝජනාව තමයි අපි ඉදිරිපත් කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි පනතත් එක්ක යන්න ඕනෑ. ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා, පනතේ තිබෙන විධිය කිව්වා නම් හරි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඔබතුමා මට අවසර දෙනවා නම් මම නැවතත් කියන්නේ. අපට පනත වෙනස් කරන්න බැහැ. පනතේ තිබෙන විධිවිධාන අපි අනුගමනය කළ යුතුමයි. ඒ නිසා පළාත් සභා පනතේ කොහෙවත් කියලා නැහැ, ඇමැතිවරයෙක්ව යෝජනාවක් මගින් අස් කරන ක්‍රමවේදයක් ගැන. ඒක පනතේ කියලා නැහැ. ඒක අපි රීතිවලින් තමයි කියන්නේ. නමුත් සභාපති සහ නියෝජ්‍ය සභාපති අස් කිරීම පනතෙන් කියලා තිබෙනවා. එතකොට පනතේ කියලා තිබෙන දෙයක් අපට රීතිවලට යොමු කරලා රීතියේ වෙනස් විධිවිධානයන් සමඟ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මට සමාවෙන්න. ගරු සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මතයක් විතරයි මම ප්‍රකාශ කරන්නේ. ඔබතුමන්ලා අවසාන තීන්දුවකට එන්න. කිනම් ආකාරයකට ඒක කළ යුතුයිද කියන කාරණාවට. ගරු සභාපතිතුමනි, මෙතැන ගැටලුවක් මතු වෙලා තිබෙනවා. 55 වන රීතියේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. මට විනාඩියක් දෙන්න. මේ මොහොතකට පෙර මාගේ නිල කාමරයේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන කණ්ඩායම් නායකයෝ සහ අපේ සභා කටයුතු කාරක සභාව රැස් වුණා. අපි එතැනදී තීරණයක් ගත්තා, අතිගරු ජනාධිපතිතුමා විසින් එවන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය පිළිබඳ කෙටුම්පත පිළිබඳව. උදේ තීරණය කළේ අපි 21 වැනිදා ගනිමුයි කියලා. නමුත් දැන් මහ ඇමැතිතුමා ඇතුළු

[ගරු සභාපතිතුමා]

කණ්ඩායම් නායකයෝ එකඟ වුණා. ඒකේ වචන කිහිප යයි තිබෙන්නේ. ඒ නිසා අද මේ කෙටුම්පත අවසානයේදී අපි ඒක සාකච්ඡා කරමු කියලා. ඒ නිසා මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා රැඳී සිටින්න. වචන දෙකයි ඒකේ තිබෙන්නේ. සම්මත කරන්න. අපි ආයේ වෙන දවසකට යන්න ඕනෑ නැහැ. මොකද, 21 ගරු මහ ඇමැතිතුමා මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරන දවස. අපි එතුමාට ඒ අවස්ථාව ලබා දෙමු. අපි අද මේක අවසන් කරමු. හරි. මේක ඉවර වෙලා. අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මෙතැනදී අදහසක් ප්‍රකාශ කෙරුණා, 55 රීතිය සම්බන්ධයෙන්. නමුත් 55 කියවද්දී අපි 11 ත් කියවන්නට ඕනෑ. 55 රීතියේ, 55(1) කලින් තිබුණේ,

*"විශ්වාසභංග යෝජනාවක් පාලක පක්ෂයට හෝ අමාත්‍යවරයෙකුට හෝ සභාපතිවරයාට හෝ නියෝජ්‍ය සභාපතිවරයාට හෝ එරෙහිව ඉදිරිපත් කළ හැකි විය යුතුය."*

55. ඔබතුමාට ඒක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අපි ඒක වෙනස් කරලා ඒකේ තිබුණු සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා කියන දෙක එයින් අයින් කළා. හේතුව මට මතක හැටියට, නිවැරදි කිරීමකට යටත්ව මම මේ පැහැදිලි කිරීමක් විතරයි කරන්නේ. අපි එහෙම කරන්න හේතුව වුණේ, අමාත්‍යවරු ඉවත් කිරීම විශ්වාසභංග යෝජනාවකට අදාළව මට මතක හැටියට පනතේ විධානයක් නැහැ. ඒකට යම් විධානයක් අවශ්‍ය නිසා රීතිවලට එම විධානය ඇතුළත් කරලා තිබුණා. පරණ එකේ. පරණ එකෙත් තිබුණා. අපි අලුත් එකටත් ඒක දැම්මා. තිබුණු විධියටම. සභාපති සහ නියෝජ්‍ය සභාපති සම්බන්ධයෙන් අපි 11 කියන විධානය ඇතුළත් කළා. 55 න් කඩලා අරගෙන 11 ට ඒක දාන්න හේතු වුණේ, සභාපති සහ නියෝජ්‍ය සභාපති කියන කාරණාව සම්බන්ධයෙන් පනතේ විධානයක් තිබෙනවා. 7(2)(ඇ) යන්න. අවසර ඇතිව මම ඒක නැවත වාරයක් ඉංග්‍රීසියෙන් කියවන්නම්.

*A member holding office as Chairman or Deputy Chairman of a provincial Council –*

*May be removed from his office by a resolution of the Council passed by majority of the whole number of members of the Council (including those not present):*

දැන් පනතේ තිබෙන දේවල් අපට රීතිවලින් වෙනස් කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. කොහොමත් බැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒ නිසා තමයි අපි හිතුවේ - මොකද, 55 තවත් විවිධ කාරණා තිබෙනවා. එතකොට අපි 55 ට මේක පරණ රීතිවල තිබුණා. අපි කල්පනා කළේ පරණ රීතිවල වැරැද්දක් තිබුණොත් ඒ වැරැද්ද අපි මේ අලුත් රීති හදන කොට නිවැරදි කළ යුතුයි කියන ස්ථාවරයේ මමත් සිටියේ. ඒ නිසා තමයි අපි කිව්වේ 55 ඕක ඇතුල් කරලා තිබුණා නම්, 55 රීතියේ තව විවිධ විධානයන් අපි ඇතුල් කරලා තිබුණා. අපට ඕනෑ විධියට සභාපති සහ නියෝජ්‍ය සභාපතිට අදාළ යෝජනාවක් ඒ විධානයන්ට යටත් කරන්න බැහැ. ඒක පනතේ සඳහන් කරලා තිබෙන නිසා. ඒ නිසා තමයි අපි හිතුවේ එතැනින් ඒක ගලවලා වෙනම 11 යටතේ, අපි 11 යටතේ කිව්වේ මෙහෙමයි.

*"සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා ධූරයෙන් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාවකදී පනතේ 7(2)(ඇ) සහ 8 රීති අනුව කටයුතු කළ යුතු ය." කියලා.*

එතකොට අපේ රීතිවලින් ඒක වෙන් කරන්නේ නැහැ. අපි කියන්නේ නීතිය ක්‍රියාත්මක වෙන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් මට අවසර දෙන්න. ඔබතුමන්ලා ඕනෑ තීන්දුවක් ගන්න. ඒක මට ප්‍රශ්නයක් නැහැ. නමුත් මට ඕනෑ මේක වාර්තා වෙන්න විතරයි. එතකොට අපි මෙතැනට දැම්මේ නීතිය අනුව කටයුතු කෙරෙන්නයි අපි ඒකට වෙල්ඩින් කරන්නේ නැහැ. එහා මෙහා කරන්නේ නැහැ. පනතේ තිබෙන වගන්තිය ක්‍රියාත්මක වෙනවා. ඇමැතිවරුන්, පාලක පක්ෂය ඒවා සම්බන්ධයෙන් පනතේ එහෙම විධානයක් නැහැ. ඒ නිසා විය යුතුයි පරණ රීතිවලත් ඕක ඇතුල් කරලා තිබුණේ. නමුත් ඒ පරණ රීති හදද්දී ඔවුන්ගේ අවධානයට යොමු නොවෙන්නට ඇතිය කියලා මම හිතනවා. සභාපති සහ නියෝජ්‍ය සභාපති සම්බන්ධයෙන් පනතේ ප්‍රකාශිත විධිවිධාන තිබෙන බව. ඒ නිසා තමයි අපි 55 රීතියට සීමා කළා, පාලක පක්ෂය සහ ඇමැතිවරු. 55 යෙදෙන්නේ පාලක පක්ෂය සහ ඇමැතිවරුන්ට. අපි ඒක පිළිබඳ ක්‍රියාදාමයකුත් සඳහන් කළා. කොහොමද කෙරෙන්න ඕනෑය කියලා. නමුත් සභාපති සහ නියෝජ්‍ය සභාපති ඒකට ඇතුල් වෙලා තිබුණා. මම දැකපු හැටියට එතැනට ඇතුල් කිරීමේ යම්කිසි ගැටලු සහගත නීතිමය තත්ත්වයක් තිබෙන නිසා - ඒක අභියෝගයට ලක් වුණාද? නැද්ද? කියන එක මම දන්නේ නැහැ. එහෙම තිබෙන නිසා ඒක එතැනින් ගලවලා අරගෙන 11 වැනි රීතිය හැටියට සටහන් කළා. මේ සභාව දැනුවත් කිරීම සඳහා පමණයි මම මේ අදහස ප්‍රකාශ කළේ. මගේ මතය මේ යෝජිත සංශෝධනය ඒ ආකාරයෙන් තිබිය යුතුයි කියන එක. නමුත් සභාව යෝජනා කරනවා නම් එසේ නොවිය යුතුයි කියලා ඒ යෝජනාවට මම හිස නමනවා. ගරු සභාපතිතුමනි, ස්තුතියි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට පනතේ තිබෙන දෙයක් ගැන අපට රීති හැදීම අවශ්‍ය වෙන්නේ නැහැ. ඒක පනතේ තිබෙනවා නම් ඒ පනත ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව මේ 13 වැනි ව්‍යවස්ථාවේ සියලු දේ වෙන්නේ ඒ විධියට. රීති හදාගන්න ඕනෑ නැහැ. රීති හැදීම පිළිබඳව තිබෙන්නේ, මේ සභාවේ වැඩ කටයුතු කරගෙන යෑමේදී සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට මේ වැඩ කටයුතු කරගෙන යන්නයි. ඒ ආකාරයේ වැඩ පිළිවෙළක් කරන්න. හැබැයි, අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා පුන පුනාම කියනවා, මේ පනතේ තිබෙන්නේ මේ ආකාරයට කියලා. එතකොට මම පැහැදිලි කරන්න ඕනෑ. එතුමාට මම මතක් කරලා දෙනවා. මේ අමාත්‍යවරු පනතේ නැද්ද? පළාත් සභා පනතේ අමාත්‍යවරුන් පිළිබඳව පනතේ නැද්ද?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අයින් කරන ක්‍රමයක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි. අයින් කරන ක්‍රමවේදය පිළිබඳව තමයි අපි මේ 55 යේ රීතියෙන් දාලා තිබුණේ. වරප්‍රසාදය මන්ත්‍රීවරුන්ට තිබුණු එක. දැන් මේ මන්ත්‍රීවරුන්ට තිබුණු වරප්‍රසාදයේ තනතුරු දෙකක් ඇරලා ඇමැතිවරුන්ව එතැනට ඔබලා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඒක පත් කරන්නෙත් වෙන ක්‍රමයකට නේ. ඇමැතිවරු පත් කරන්නේ පක්ෂයෙන් සහ ජනාධිපතිවරයා නම් මේක සභාවෙන් පත් කරන්නේ. ඒක වර්ග දෙකක් නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේක සභාවේ මන්ත්‍රීවරුන්ගෙන්. ඒක තමයි ඩික්සන් ජේ. මන්ත්‍රීතුමා සභාපති හැටියට මන්ත්‍රීවරු පත් කළා. පත් කරලා අධිකරණයට ගියා. මම හිතන්නේ හෙක්ටර් බෙත්මගේ ඇමතිතුමා හිටියා. රෙජිනෝල්ඩේ කුරේ මහත්තයා මහ ඇමැති හිටියා. මම විපක්ෂ නායක හිටියා. අධිකරණයෙන් අන්තිමේදී දුන්නේ මොකක්ද? එතුමාට භාර දෙන්නය කියලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැහැ. නැහැ. ඒක වුණේ මෙහෙමයි. ඩික්සන් ජේ. පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ first count එක ගත්තා. first count එක ගත්තාම එයා දිනලා. අපි ඔක්කොමලා කිව්වා, වැරදියි කියලා. ආපසු රී කවුන්ට් කළාම ඩික්සන් ජේ. පරාදයි. මෙතුමන්ලා උසාවියට ගියා. මම හිතන්නේ X part යැව්වේ. ඒකේදී උසාවියට දුන්නා පළමුවැනි කවුන්ට් එක නම් එයා තමයි නීත්‍යානුකූල කියලා. අපි කිව්වා. නැහැ, දෙවැනි කවුන්ට් එකයි හරි කියලා. ඊට පස්සේ හිටපු කෙනාම හිටියා. ශ්‍රේෂ්ඨාධිකරණය දුන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒක මෙතනට අදාළ වෙන්නේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

පනතේ තිබුණු ප්‍රශ්නය -

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒක අදාළ වෙන්නේ නැහැ. ඒකයි මම කියන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මම යෝජනාවක් විතරයි කරන්නේ. මම දන්නේ නැහැ. මේකේ මන්ත්‍රීවරු 104 දෙනාට තිබෙන බලයක් තමයි මේ අභිමි කරන්න හදන්නේ. එතකොට විශ්වාසභංග යෝජනාවක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අභිමි කිරීමක් නැහැ. පැහැදිලිව 11 කියලා තිබෙනවා. අයින් කරන්න පුළුවන්. කොහෙවත් කියලා නැහැ -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

11(7) එතකොට විශ්වාස භංගයක් ගේන්න පුළුවන් ක්‍රමවේදය 55 කියනවා. මන්ත්‍රීවරු මේ 104 දෙනාගෙන් දෙන්නෙකුට අත්සන් කරලා දෙන්න පුළුවන් කියලා. දැන් පනතේ තිබෙන එකෙන් මොකක්ද කියලා තිබෙන්නේ? විශ්වාසභංගය ගේන්නේ කොහොමද? ගේන්න පුළුන් කී දෙනෙක් අත්සන් කරලාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම එකක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කී දෙනෙක් අත්සන් කරලාද ගේන්න පුළුවන්. කියන්න කෝ මට. මට පැහැදිලි කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

පනතේ නැත්නම් දාන්න වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කියන එකේ යම්කිසි පොයින්ට් එකක් තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. නැත්නම් මේ මන්ත්‍රීවරු 104 දෙනා කොහොමද ගේන්නේ සභාපතිටයි නියෝජ්‍ය සභාතිටයි. මෙතුමාටවත් ඔබතුමාටවත් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. මේ මන්ත්‍රීවරු 104 දෙනාට ඉවත් කරන්න කොහොමද ගේන්නේ. මේ පනතක් ගැන කථා කරනවා නම්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම ඒකට උත්තරයක් දෙන්නම්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

හා. හොඳයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඇමැතිවරයෙක් ඉවත් කරන්න මට තේරෙන හැටියට මේ සභාවට බැහැ. බලතල නැහැ. ඒ බලතල තිබෙන්නේ ජනාධිපතිතුමාට. ගරු සභාපතිතුමනි, සමාවෙන්න. යම් ඇමැතිවරයෙක්ගේ ක්‍රියා කලාපය කෙරෙහි අපට විශ්වාසයක් නැත්නම් අපට අයිතියක් තිබෙනවා, යෝජනාවක් සම්මත කරගන්න පුළුවන්. හැබැයි ඒ යෝජනාව සම්මත කළ පමණින් නීත්‍යානුකූලව මට තේරෙන හැටියට ඔහුව ඉවත් කරන්න බැහැ. අපට ඒක ආණ්ඩුකාරතුමා හරහා ජනාධිපතිතුමාට යවන්න පුළුවන්. එතකොට ජනාධිපතිතුමාට තේරෙනවා නම් සභාවේ -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අයින් කරලා තිබෙනවා ඕනෑ තරම්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

සමාවෙන්න. ජනාධිපතිතුමාට වැටහෙනවා නම් සභාවේ නිගමනය අනුව විශ්වාසයක් නැති කෙනෙක් තමයි මම මේ පත් කරගෙන ඉන්නේ. ඒක පිළිබඳව තීන්දුවක් ගැනීමේ හිමිකම තිබෙන්නේ ජනාධිපතිතුමාට. අපි මෙතැන කළේ මේ රීතිය දාලා මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් දුන්නා, තමන්ගේ විශ්වාසයක් නැත්නම් ඒ පිළිබඳව යම්කිසි ක්‍රියාවලියක් ආරම්භ කරලා ජනාධිපතිතුමා කෙරෙහි යොමු කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මම උත්තරයක් දෙන්නම් ඒකට.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පොඩ්ඩක් ඉන්න. ඒ නිසා මම හිතනවා, (බාධා කිරීමක්) ඔබතුමා මට කථා කරන්න ඉඩ දෙන්න ඉස්සෙල්ලා. ඔබතුමාගේ අදහස කියන්න. මගේ යුතුකමක් තිබෙනවා, අපි මේ තීන්දුවට ආවේ ඇයි කියලා සාධාරණීකරණය කරන්න. එතකොට මන්ත්‍රීවරුන්ව දැනුවත්ව තමයි ගන්න තීන්දුවක් ගන්නේ. එතකොට ඒ අවස්ථාවත් මම හිතනවා ඒ නිසා තමයි වර්තමාන රීති හදන අවස්ථාවේ (බාධා කිරීමක්) මම ඒකේ සාමාජිකයෙක් නොවෙයි. නමුත් ඒ රීති හදපු කවුරු හෝ ඒ රීතිය හදන්නට ඇත්තේ මේ සභාවේ ඉන්න අයට අවස්ථාවක් දෙන්න යම් ඇමැති කෙනෙක් කෙරෙහි විශ්වාසයක් නැත්නම් ඒ විශ්වාසය නැති බව ජනාධිපතිතුමාව දැනුවත් කිරීමට අවස්ථාවක් ලබාගැනීමේ අරමුණින් තමයි කෙරෙන්න ඇත්තේ. නමුත් ඒ ගොන්නට සභාපතිතුමාවයි, නියෝජ්‍ය සභපාතිතුමාවයි දාන්න බැහැ. ඒ සඳහා නීතිය යටතේ ක්‍රමවේදයක් දීලා තිබෙනවා. තමන්ට ඕනෑ නම් ඉවත් කරන්න පුළුවන්. ඒ නිසා තමයි අපි ඒක එතැනින් ගලවලා අරගෙන, අපි තීන්දු කළේ මට මතක හැටියට අර ගොන්නේ තියන්නේ නැතිව - ඒ කියන්නේ අමාත්‍යවරු නීතියෙන් ඉවත් කරන්න අපට බලයක් නැහැ. ඒක තමයි ඇත්ත. අපට අපේ අප්‍රසන්නතාවය යෝජනාවක් මගින් ජනාධිපතිතුමාව දැනුවත් කරන්න පුළුවන්. ඒ නිසා ඒ ගොන්න ඒ විධියටම එතැනින් තියන්න ඇරලා සභාපතිතුමා සහ නියෝජ්‍ය සභාපති ඉවත් කිරීම සඳහා නීතිය යටතේ බලතල තිබෙන නිසා ඒක වෙන ගොන්නකට දාලා, 11 හැටියට අපි ඇතුල් කළා. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, දැන් මේ සම්බන්ධව ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන එක එතුමා මොකක් හරි ස්ථාවරයක සිට කරන්නේ. නමුත් මේකේ මේ සභාවේම සභාපතිතුමන්ලාට විශ්වාසභංග යෝජනා අපි ගෙනැල්ලා තිබෙනවා. ඒ ගේන්න අවශ්‍ය කාරණාත් ඉස්මතු වෙලා තිබෙනවා. ඒ නිසා මේකේ කිසි ගැටලුවක් වෙන්නේ නැහැ. මේකේ තිබ්බ කොටස ඒ විධියට තිබ්බා නම් සංශෝධනය නොකර. ඒක මන්ත්‍රීවරුන්ගේ අයිතියක් හැටියට මේක තිබෙන්න ඕනෑ.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒ කියන්නේ මන්ත්‍රීවරු දෙදෙනෙක් හෝ - දෙදෙනෙක් අත්සන් කළත් ඇතියි කියන එක නේ කියන්නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

55 යේ තිබෙන විධියට තියන්න කියන යෝජනාව අපි ගේන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විශ්වාසභංග යෝජනා ගේන්න ඇති. නමුත් පරාජය කරන්න බහුතරය ඕනෑ නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පරාජය කරන්න බහුතරය ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නෙක් ඇති.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

විශ්වාසභංග යෝජනාව දෙන්නෙක් ගේන්න පුළුවන්. බහුතරයක් ඕනෑ, පරාජය වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් එක්ක එකඟ වෙනවා, මේ කාරණයේදී. මෙතැන මේ ක්‍රියාවලිය ගැන ප්‍රශ්නයක් තිබෙන්නේ. ක්‍රියාවලිය කොහොමද වෙන්නේ කියලා මෙතැනට ඇතුළත් කළාට ප්‍රශ්නයක් නැහැ. නමුත් 11 යේ පනතේ තිබෙන විධිවිධාන අනුව මේක ප්‍රශ්නයයක් නොවෙයි තිබෙන්නේ. මෙතැන මන්ත්‍රීවරුන්ට සැකයක් තිබෙනවා. මේකේ ක්‍රියාවලිය මොකක්ද කියන එක පැහැදිලි නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ක්‍රියාවලිය එහෙමනම් එතැනට දාන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකට පනත වෙනස් කරන්න බැහැ නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මේකේදී ශ්‍රීනාත් ම. පෙරේරා ජනාධිපති නීතිඥතුමයි, අපියි අදහස් කළේ, දැන් අපි දැනගත්තා පසුගිය කාලපරාසයන් තුළ ඇමැතිවරයෙකුත් එක්ක පෞද්ගලික තරහක් තිබෙනවා නම් දෙන්නෙක් අත්සන් කරලා යෝජනාවක් භාර දෙනවා. ඊට පස්සේ මේක ආකූල ව්‍යාකූල තත්ත්වයන් සභාවේ ගිහිල්ලා අන්තිමට ඉල්ලලා අස් කර ගන්නවා. නැත්නම් වෙනත් වෙනත් ක්‍රමවේදයන්ට යනවා. මේ සභාවේ ගරුත්වය, අභිමානය රැක ගැනීම තමයි අපේ යුතුකම තිබෙන්නේ. නැත්නම් සිල්ලර වාගේ විශ්වාසභංග යෝජනා ගෙන ඒමක් නොවෙයි. මේ කාරණාවේදී සභාපති තනතුරයි, නියෝජ්‍ය සභාපති තනතුරයි කියන්නේ උත්තරීතර තනතුරු දෙකක්. ඒක සුනිල් විජේරත්නවත්, මෙතුමාවත් නොවෙයි. එතකොට අපි පෘතග්ජන මිනිස්සු හැටියට ඇත හිතන්නේ නැතිව කවුරු හරි පොඩි අමනාපයක් වුණු ගමන් දෙන්නෙක් අත්සන් කරලා මේක දෙනවා. දීපුවාම මේක හා හෝ ගාලා රැව් පිළි රැව් දෙන කාරණාවක් වෙනවා. එහෙම වෙන්න ගියොත් නිරන්තරයෙන්, නිරතුරුවම අපේ අභිමානයට, සභාවේ ගරුත්වයට, සභාපති ධූරය කියන එකට පොඩි සමච්චලයක්. ඒ නිසා තමයි මට මතක විධියට අපි කල්පනා කළේ ඒ අත්සන් කරලා දෙන එකත් හරි එකක් වෙන්න නම් ටිකක් වැඩි දෙනෙකුගේ කැමැත්තක් අවශ්‍යයි. ඒ නිසා තමයි අපි එදා 1/5 ක්, 1/5 ක් කියන්නේ 20 දෙනෙක්වත් අත්සන් කරලා දෙන්න ඕනෑ. ඒක සත්භාවයෙන් කළේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඒකට අපි විරුද්ධයක් නැහැ. ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

දැන් මෙතැන තිබෙන්නේ පරණ තැනටම ගියොත් දෙන්නෙක් එක්ක අත්සන් කරලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගේන්න බැහැයි කියන එක.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගේන්න බැහැයි කියන එක.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. ඒක නේ අපි කියන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගේන්න බැහැයි කියලා නැහැ නේ මේකේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගේන්න බැහැයි කියලා නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මේක පැහැදිලිව කියන්න ඕනෑ. පනත අපට වෙනස් කරන්න බැහැ නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, අපට පැහැදිලි කරලා දෙන්න කියන්න ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාට. මේකේ විධියට සභාපතිවරයායි, නියෝජ්‍ය සභාපතිවරයායි අයින් කරන්නේ කොහොමද කියලා. දැන් අපට ප්‍රශ්නය තිබෙන්නේ අයින් කරන්න බැරිද කියලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පුළුවන්. අයින් කරන්න පුළුවන්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කොහොමද කරන්නේ. පැහැදිලි කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

කරගන්න පුළුවන් නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මහේෂ් ගරු මන්ත්‍රීතුමා කියපු විධිය හරි. ක්‍රමය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ක්‍රමය මොකක්ද කියලා කියන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ක්‍රමවේදය තිබෙනවා. මේ ක්‍රමවේදය හංගලා ගහන්න එපා. හංගලා ගහන්න එපා. කෙලින්ම ගහන්න. අපට එච්චරයි ඕනෑ. ඒක

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කාටත් අයිතියි නේ. පොදු දෙයක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

එච්චරයි අපි ඉල්ලන්නේ. හංගලා ගහන්න එපා. අධිකරණයට යන විධියට ඇති කරන්න එපා. අධිකරණයට යන විධියක් ඔබතුමන්ලා ඇති කරනවා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

නැහැ. නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මේකේ ලූස් පොයින්ට් එකක් පෙන්වනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හෙක්ටර් බෙත්මගේ ගරු සභානායකතුමා, ක්‍රමවේදය මේකට ඇතුළත් කරලා දෙන්න කෝ. ඉවරයි නේ කථාව.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මොකක්ද ක්‍රමවේදය?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

11 වන රීතියට මේ ක්‍රමවේදය දාන්න. ඉවරයි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ ගැන ගොඩක් කථා කළා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම ක්‍රමවේදය කියලා දෙන්නම්. මේ රීති යටතේ යම්කිසි කාරණාවක් පිළිබඳව නීතිය හෝ රීතිවල කරුණක් සඳහන් වන්නේ නැත්නම් මේ නීතියේ විධානය යටතේ කොහොමද යෝජනාව සම්මත කරන්නේ කියන කාරණාව, කොහොමද කරන්නේ කියලා නැහැ. නීතියේ සහ හෝ නීතිවල ඒ ක්‍රමවේදය සඳහන් වෙන්නේ නැත්නම් සභාපතිතුමා හෝ සභාපතිතුමා වෙනුවෙන් ඒ පුටුවේ වාඩි වෙලා ඉන්න පුද්ගලයාට හිමිකම තිබෙනවා, ඒ ක්‍රමවේදය පිළිබඳව තීන්දුවක් ගන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒ කියන්නේ මොකක්ද?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මට කියන්න බැහැ. මන්ත්‍රීවරයෙක් හැටියට මට තීන්දු කරන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි අපි පැහැදිලිව කියන්නේ 55 තියන්න කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

55 ඒ විධියට තියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි මෙහෙම කරමු කෝ. අපි 55 –

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

සභාපතිතුමාට ඒ බලය නැහැ. සභාපතිතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් වෙනවා නම් සභාපතිතුමාට ඒ පුටුවේ වාඩි වෙලා ඉන්න බැහැ. ඒ විශ්වාසභංග යෝජනාව සාකච්ඡා වෙන අවස්ථාවේදී. ප්‍රකාශිතව රීතිවල කියලා තිබෙනවා. මෙතැන පුටුවක වාඩි වෙලා කථා කිරීමේ අයිතිය විතරයි තිබෙන්නේ කියලා. එතකොට වෙනත් කෙනෙක් තමයි මේ පුටුවේ වාඩි වෙලා ඒ යෝජනාවට අදාළව කටයුතු කරන්නේ. එතකොට ඒ කටයුතු කරන පුද්ගලයා පවත්නා නීතිය යටතේ හෝ රීතිය යටතේ මේ විධානයක් නැත්නම් එදාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමැතිතුමා මේ සම්බන්ධව දිගින් දිගටම සාකච්ඡා වුණා. බොහොම ස්තුතිවන්ත වෙනවා. අපි 55 රීතියේ එහෙමම තියලා 11 එක අපි එතැනට දාමු. අපි එහෙම නම් 11 එක එතැනට ජොයින්ට් කරනවා. හරි නේ. අපි මේ සකස් කළේ මෙහෙමයි. අපි දෙන්නා වෙනුවෙන් නොවෙයි. අනාගතයට.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම සභාපති වෙන්න බලාපොරොත්තුවකුත් නැහැ. නියෝජ්‍ය සභාපති වෙන්න බලාපොරොත්තුවකුත් නැහැ. මට රැක ගන්න දෙයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා හරි නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

හරි. ඒ විධියට 55 විධියට තිබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි 11 යේ ටික ඒකට එකතු කරනවා. (බාධා කිරීම්)

මම ඒක පොඩ්ඩක් පැහැදිලි වෙන්න කියන්නද? ගරු මන්ත්‍රීතුමන්ලා මම ඒක පොඩ්ඩක් පැහැදිලි කරන්නම්. මොකද දිගින් දිගට සාකච්ඡා වුණු ප්‍රශ්නයක් නේ ඒක. මමත් මූලාසනයේ ඉන්න කෙනෙක් නේ. ඒක නිසා අපි මෙහෙමයි තීරණය කළේ. සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා ධූරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් යෝජනාවේදී පනතේ 7(2)(ඇ) යන්න 8

රීතිය අනුව කටයුතු කළ යුතුයි කියන එකට 55 ත් එකතු කරලා තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

55 අහෝසි කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ අහෝසි කරන්නේ නැහැ. එතැනට එකතු කරනවා. පැහැදිලියි නේද?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, පැහැදිලි නැහැ. ඒ කියන්නේ 11 කපලා දානවද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. 55 එකතු කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

55 අහෝසි කරපු කෑල්ල නැතිව ඒකත් එකතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංශෝධන ඇතිව. ඒ කියන්නේ මෙහෙම ආවොත්,

*"සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා ධූරයෙන් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාවකදී පනතේ 7(2)(ඇ) සහ 8 වගන්ති සහ 55 රීතිය අනුව කටයුතු කළ යුතු ය."* -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 12(1) තිබෙන්නේ ලේකම්වරයාගේ රාජකාරී.

*"පනතේ 17(1) ප්‍රකාරව සභාවේ ලේකම් කාර්ය මණ්ඩලයක් විය යුතු අතර ලේකම් කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා සභාවේ ලේකම් වරයා විය යුතුය."*

ඒක තමයි අලුත් රීතිය. හරි නේද? පොත් තිබෙනවා නේද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊළඟ එක, රීති අංක 12(2) -

*"සභා රැස්වීමකදී හෝ සභාවේ පූර්ණ කාරක සභා රැස්වීමකදී ගනු ලැබූ තීරණයන් හා පැමිණිලි හා නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නම් සටහන් කළ කාර්ය සටහන්වල පිටපතක්, එම සභා රැස්වීම් දිනට පසුව එළැඹෙන පළමු සභා රැස්වීමේදී ලේකම්වරයා විසින් මන්ත්‍රීවරුන් අතර බෙදා දිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 12(3) -

*"සභා රැස්වීමකදී හෝ සභාවේ පූර්ණ කාරක සභා රැස්වීමකදී සිදු වූ කටයුතුවල සියලු විස්තර ඇතුළත් නිල වාර්තාවක පිටපතක් ලේකම්වරයා විසින් මන්ත්‍රීවරුන්ට ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය. එම නිල වාර්තාව සකස් කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 12(4) -

*"සභාවේ රැස්වීම්වල න්‍යාය පත්‍රය පිළියෙල කොට බෙදා හැරීමද, මෙම රීති අනුව හෝ ප්‍රඥප්ති අනුව හෝ අවශ්‍ය වන*

*ලිපි ලේඛන හා පොත්පත් පවත්වාගෙන යෑමද, මෙම රීති හෝ ප්‍රඥප්ති අනුව නියම කෙරෙන සියලුම කටයුතු ඉටු කිරීම ද ලේකම්වරයාගේ රාජකාරිය සහ වගකීම විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 12(5) -

*"පොත්පත්, වාර්තා, සටහන් සහ වෙනත් ලේඛනවල ආරක්ෂාව තහවුරු කිරීම ලේකම්වරයාගේ වගකීම වන්නේය. මන්ත්‍රීවරුන්ට එම පොත්පත්, වාර්තා සටහන් සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ලේකම්වරයා විසින් ඒ සඳහා ඉඩ සලසා දිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 12(6) -

*"පටිගත කළ හෝ රූපගත කළ මන්ත්‍රීවරුන් විසින් සභාවේදී කරන ලද කථාවලට සවන් දීමට හෝ පිටපත් ගැනීමට කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් සභාපතිවරයාගේ කැමැත්තට යටත්ව අදාළ රැස්වීම් දිනයේ සිට තුන් මාසයක් ගත වන තුරු ඉඩ සැලසීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 12(7) -

*"ආරක්ෂා කර තබා ගත යුතු බවට සභාවේ හෝ සභාපතිවරයාගේ හෝ නියෝගයක් නොමැති නම් යම් රැස්වීම් දිනයක සිට හය මාසයක් ඉක්ම ගිය පසු එම රැස්වීමේදී පටිගත කරන ලද කථා මකා දමා පටිගත කිරීම සඳහා භාවිතා කළ අයිතමයන් යළි පරිහරණය කිරීම සඳහා යොදා ගැනීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට ලේකම්වරයාට හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 12(8) -

*"සභාවේ රැස්වීම්වල න්‍යාය පත්‍රය පිළියෙල කිරීමටද, එම න්‍යාය පත්‍රය ගරු මන්ත්‍රීවරුන් වෙත බෙදා හැරීමටද, එම න්‍යාය පත්‍රය පිළිබඳව මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමටද, ලේකම්වරයා විසින් අවස්ථානුකූලව, සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ අදහස පරිදි හෝ සභාපතිවරයාගේ නියමය පරිදි හෝ තම අභිමතය පරිදි හෝ හැකි සියලු පියවර ගත යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊළඟට තිබෙන්නේ, ධුරධාරීහු. 13(1) (අ) මොකද අපි ඒක කරන්නේ. ඔබතුමා අර උදේ කථා කරපු එක.

***ධුරධාරීහු :***

***සභා නායක ධුරය : 13(1)***

*(අ) සභාවෙහි සභානායක ධුරයක් තිබිය යුතු ය. ප්‍රධාන අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමකට අනුව, සභාපතිවරයා විසින් සභානායකවරයා පත් කළ හැක්කේ ය.*

*(ආ) පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු විසින් සභාවෙහි ඉදිරිපත් කළ යුතු යෝජනාවක් හැරෙන්නට සභාවෙහි කටයුතු කරගෙන යාම*

සඳහා අවශ්‍ය වන සියලු අනිකුත් යෝජනා සභා නායකවරයා විසින් ඉදිරිපත් කළ යුතු ය. සභානායකවරයා නොමැති අවස්ථාවක අමාත්‍යවරයෙකුට එකී යෝජනාව ඉදිරිපත් කළ හැක්කේ ය.

(ඇ) පළාත් අමාත්‍යවරයෙකු සභාව නියෝජනය නොකරනු ලබන අවස්ථාවක එකී පළාත් අමාත්‍යවරයා විසින් පවරනු ලබන කටයුතු ඔහු වෙනුවෙන් සභාව තුළදී ඉටු කළ යුත්තේය.

**(2) විපක්ෂ නායක ධූරය :**

(අ) සභාවෙහි විපක්ෂ නායක ධූරයක් තිබිය යුතුය. සභාවේ විපක්ෂයේ දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් අතර වැඩිම මන්ත්‍රී කණ්ඩායමක් සිටින පක්ෂයට හෝ කණ්ඩායමට විපක්ෂ නායක ධූරය හිමි විය යුතු ය.

(ආ) සභාවේ කටයුතුවලදී විපක්ෂයේ පක්ෂ හෝ කණ්ඩායම්වල මන්ත්‍රීවරුන් වෙනුවෙන් ක්‍රියා කිරීම, විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන් නියෝජනය කිරීම, විපක්ෂයට අදාළව ගත යුතු තීරණ පිළිබඳව අවශ්‍ය අවස්ථාවලදී සභාපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම විපක්ෂ නායකවරයාගේ කාර්යභාරය වේ.

**(3) ආණ්ඩු පක්ෂයේ සංවිධායක ධූරය :**

(අ) සභාවෙහි ආණ්ඩු පක්ෂයේ සංවිධායක ධූරයක් තිබිය යුතුය. ප්‍රධාන අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමකට අනුව, සභාපතිවරයා විසින් ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා පත් කළ යුතුය.

(ආ) සභාව හමුවේ ඇති යෝජනා සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂය සංවිධානය කර, සභාවේ කාර්යය පහසු කරලීම සහ ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායම්වල ගණපූරණය පවත්වාගෙන යාම පිළිබඳව කටයුතු කිරීම, සභාවේ පැවැත්ම හා ක්‍රියාකාරීත්වය වෙනුවෙන් වැදගත් වන්නා වූ කාරණාවන්හි දී, ඒ පිළිබඳ සාකච්ඡා කොට තීන්දු ගැනීමට සහ සභාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ සියලුම දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නායකයින්ගේ අදහස් ලබා ගැනීම සඳහා සභාපතිවරයාට සහාය වීමද, ආණ්ඩු පක්ෂ සංවිධායකගේ කාර්යභාරය වේ.

**4. විපක්ෂයේ සංවිධායක ධූරය :**

(අ) සභාවෙහි විපක්ෂයේ විපක්ෂ සංවිධායක ධූරයක් තිබිය යුතුය. විපක්ෂ නායකවරයා විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමකට අනුව, සභාපතිවරයා විසින් විපක්ෂයේ සංවිධායකවරයා පත් කළ යුතුය.

(ආ) සභාව හමුවේ ඇති යෝජනා සම්බන්ධයෙන් විපක්ෂය සංවිධානය කර, සභාවේ කාර්ය පහසු කරලීම සහ එමගින් සභාවේ වැඩ කටයුතුවලට විපක්ෂයේ පක්ෂ හා කණ්ඩායම්වල සහාය ලබා දීම, ගණ පූරණය පවත්වාගෙන යාම පිළිබඳ කටයුතු කිරීම, සභාවේ පැවැත්ම සහ ක්‍රියාකාරීත්වය වෙනුවෙන් වැදගත් වන්නා වූ කාරණාවන්හිදී, ඒ පිළිබඳව සාකච්ඡා කොට තීන්දු ගැනීම සහ සභාවේ නියෝජනය වන සියලුම විපක්ෂයේ දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන්ගේ අදහස් ලබා ගැනීම සඳහා සභාපතිවරයාට සහාය වීම විපක්ෂයේ සංවිධායකවරයාගේ කාර්යභාරය විය යුතුය.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

13(1)(අ) මම හිතන්නේ අදහසක් ප්‍රකාශ වුණා. කවුරු හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එතැනට ධූරධාරීන් හැටියට එන්න ඕනෑ, ගරු සභාපතිතුමා, ආණ්ඩු පක්ෂයේ සංවිධායක හා සභානායක යන ධූරයන් අමාත්‍ය මණ්ඩලයේ දෙදෙනෙකු නියෝජනය කළ යුතුයි කියලා. ඒක නැත්නම් ඒ ධූරධාරීන් කියන එකට අපේ විරුද්ධත්වයක් තිබෙනවා. ඒ කියන්නේ සියලුම ධූරධාරීන් සම්බන්ධ ඡේදයන්ට අපේ විරුද්ධත්වයක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමන්ලාගේ විරෝධතාවය ලියාගන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේකේ දැන් සම්ප්‍රදායන් තමයි රීති වෙලා තිබෙන්නේ. අවුරුදු 25 ක් තිස්සේ ප්‍රැක්ටිස් කරපු එකක් තමයි මේ දාලා තිබෙන්නේ. අවුරුදු 25 ටම ප්‍රශ්නයක් මතු වෙලා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. ඒක හරි. නමුත් අපට -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභානායක තනතුරක් මේකේ තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම කථාවේදී පැහැදිලි කරන්නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි විරෝධය ලියා ගනිමු.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම කථාවේදී පැහැදිලි කළා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභාවේ බහුතරයක් ඉන්න සභානායක තනතුර තිබෙන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ ධූර ධාරීන් කියන එකට විරෝධය සටහන් කරගන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට විතරක්. ඒ කියන්නේ ධූරධාරීන්ට විතරයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සටහන් වෙන්නේ කොහොමද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා විරුද්ධයි කියලා ලියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම බැහැ. ඒකට ඡන්දයක් තියන් ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඡන්දයක් ගන්න වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ කොටසට ඕනෑ නම් ඡන්දයක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඡන්දයක් ගන්න වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සටහන් කරන්න බැරි වෙයි අපට එහෙම එකක්. නේද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා කියන හැටියට සටහන් වෙන්නේ කොහොමද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම බැහැ. ඡන්දයක් ගන්න වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඡන්දයක් ගන්න වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ කොටසට ඕනෑ නම් ඡන්දයක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ගන්න වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු මහ ඇමතිතුමා, ඒ ඡේදයට ඡන්දක් ගන්න යනවා. ධූරධාරීන්ගේ එකට ඡන්දයක් ගන්න - කමක් නැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බහුතර එකඟතාවය.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඡන්දයක් ගන්න. අපේ කිසි ගැටළුවක් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

බහුතර එකඟතාවය නේ? ප්‍රශ්නයක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මම පොඩ්ඩක් අවස්ථාව ගන්නම්. 2013 සැප්තැම්බර් මස 03 වන දින ජනාධිපති කාර්යාලයෙන් එවපු ලිපියක්[1] අපට ආණ්ඩුකාර ලේකම්තුමා ඉදිරිපත් කරලා තිබෙනවා. මම ඒක කියවන්නම්.

*බස්නාහිර පළාත් සභාවේ කාර්ය පටිපාටි රීති සංශෝධනය - 2011*

*ඔබේ අංක 1/AA/PA හා 2012.06.13 වන දිනැති ලිපිය සමඟ යොමු කරන ලද බස්නාහිර පළාත් සභාවේ කාර්ය පටිපාටි රීති සංශෝධනය - 2011 සම්බන්ධයෙනි.*

*පළාත් සභා තනතුරුවලට අදාළ වැටුප් හා දීමනා වරප්‍රසාද ලබා දීම සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍යතුමා විසින් දැනටමත් අමාත්‍ය මණ්ඩල සංශෝධනයක් ඉදිරිපත් කර ඇති බැවින් එහි අවසන් තීරණයට එළඹෙන තුරු උක්ත කාර්ය පටිපාටි රීති සංශෝධන 1 ඡේදයේ අ, ආ, ඇ උප වගන්ති යටතේ හා 2 ඡේදයේ අ, ආ, ඇ උප වගන්ති යටතේ දක්වා ඇති ධූරවලට අදාළව ඉදිරි කටයුතු කිරීමට ඉඩකඩ නොමැති බව නිරීක්ෂණය කරමි.*

*40 වන ඡේදයේ 5 උප වගන්තිය හා 49 වන ඡේදයේ 2 උප වගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති යෝජනා සම්බන්ධයෙන් මෙම කාර්යාලයේ අනුමැතිය ලබා දීමට හැකියාව නොමැති බවත් කාරුණිකව දන්වමි.*

*ජනාධිපති අතිරේක ලේකම්.*
*ජනාධිපති ලේකම් වෙනුවට.*
*අනුර දිසානායක.*

එහෙම එකක් එවලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

බලයක් නැහැ. ඒක තමයි කියන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

බලයක් නැහැයි කියලා, කියලා තිබෙන්නේ.

---

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒගොල්ලෝ පිළිගන්නේ නැහැයි කියලා තමයි කියලා තිබෙන්නේ. ජනාධිපති ලේකම් කාර්යාලය පිළිගන්නේ නැහැ. ධූරධාරීන්. අපි ඇරියා නේ ඒක.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මෙහිදී නීතිය හා රීතිය කියලා දෙකක් තිබෙනවා. දැන් සෑම පළාත් සභාවක්ම -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි. මම ඇත්තටම ලැජ්ජා වෙනවා. ගරු සභාපතිතුමනි, මම දෙවැනි පළාත් සභාවේ ඉඳන් ඉන්න කෙනෙකු හැටියට - දෙවැනි පළාත් සභාවේ හිටපු අය ඉන්නේ, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමායි මමයි මෙතුමායි විතරයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම කියන්න ගත්තේ. මම කියලා ඉවර කරන්නම්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැහැ. මට කියන්න දෙන්න. මේ ඕගොල්ලෝ ඔක්කොම අලුත් අය හැටියට නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ඒ රීතිය වර්ෂ ගණනාවක ඉඳලා ආපු රීතියක්. ඒ නිසා අපි මේක ඒ විධියට කර ගෙන යමු. හැම පළාත් සභාවකම වාගේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, පළමු වැනි පළාත් සභාවේ ඉඳන් මේ ධූර තිබෙන්නේ. සුසිල් මුණසිංහ මහ ඇමතිතුමාගේ කාලයේ පළමු වැනි පළාත් සභාවේ ඉඳන් මේ ධූර තිබෙන්නේ. මේ අනුර දිසානායක - කවුද දන්නේ නැහැ. ඔය ජනාධිපති ලේකම්ලා එක එක වර්ගයේ අය ඉන්නවා. හරිද? ඔය කොහෙන් හරි කියවන්නේ නැතිව මැද්දෙන් එවන ලියුම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. එපමණ ඒ ගැන හය වෙන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැහැ. මගේ තනතුර නොවෙයි. මම කියන්නේ, අනාදිමත් කාලයක ඉඳන් තිබුණු -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඕගොල්ලන් සභා සම්මත කරන්න. මේගොල්ලන්ගේ විරෝධතාවය සටහන් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එපමණයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මේක අවුරුදු 28 ක ඉඳන් තිබුණා. අනික් එක මේක බස්නාහිර විතරක් නොවෙයි. මුළු ලංකාවේම පළාත් සභාවල තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම නම් මේක මුළු ලංකාවේම වෙනස් කරන්න එපැයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ලැජ්ජා නැතිව මේක කියවනවා නේ? ලියුමක්. මේ ලියුමට උත්තර ලියන්න එපැයි ඒ දවස්වල. ඒ එවපු ලියුමට අපේ සභාවෙන් උත්තරයක් දාලා තිබෙනවාද? නැහැ නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කාරක සභාවට ඕනෑ නැහැ නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඒ ලියුම පැත්තකින් තියලා මේ රීතිය සම්මත කරමු.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කාරක සභාව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, රීතිය සම්මත කරමු.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් කාරුණික ආයාචනයක් කරනවා. ඒ ලිපිය නැවතත් කියවන්න කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ කියවන්න කියන්නේ ඔබතුමා නොකර ඉන්න නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අවශ්‍ය නැහැ නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පැහැදිලියි නේ? කොපියක් දෙන්න කෝ. ඉවරයි නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කැබිනට් මණ්ඩලය තීරණයක් දැම්මා නම්, කරන්න එපැයි කියලා තිබෙනවා නම් අපට කරන්න බැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නියෝජ්‍ය ලේකම් කෙනෙක්. අතිරේක ලේකම් කෙනෙක්. කොපිය දෙන්න කෝ? ඉවරයි නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඒ ලිපියේ පිටපතක් අපට ලැබෙන්න සලස්වන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

සභා ලේකම් කාර්යාලයේ කාර්යාල දීලා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම කියන්නේ, සෑම පළාත් සභාවක්ම භුක්ති විඳින ඒ වරප්‍රසාදය ඒ විධියටම තියන්න. ප්‍රශ්නයක් ආවොත් අපි පසුව බලමු.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

වසර 30 ක් විතර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ රීතියට ජනතා විමුක්ති පෙරමුණෙන් පොඩි විරෝධතාවයක් තිබෙනවා. ඒ නිසා අපි ඒකට මේ සභාවේ එකඟතාවය ගනිමු.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මුළු ලංකාවේම තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා රීතියක් ගන්නවා නම් - මේක කාරක සභාවක්. මේක මහ සභාවක් නොවෙයි. ඔබතුමා හැමදාම නීති හදන්න යන්න එපා. ඔබතුමාට නොකර ඉන්න ඕනෑ නම් අපි නැගිටලා යන්නම්. මේ රීති පැත්තකට දාන්න. කෙරෙන්න ඕනෑ නම්. මේ නීති හද හදා ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මෙතුමා -

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ජෝර්ජ් මහත්තයාගේ කථාව ඇත්ත.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙයා ඇවිල්ලා නීති පෙන්වනවා එතැන ගිහිල්ලා. මේ යන්නේ කාරක සභාවක්. මෙතැනදී අපි අනුමත කරමු. මෙතැනට මොකක්ද ගන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ජනාධිපති ලේකම් කාර්යාලයේ ලියුම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඒක අදාළ නැහැ. මට අදාළත් නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒ අතිරේක ලේකම් කෙනෙක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සභාවේ තීන්දුවක් ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි සභාවේ තීන්දුවක් ගනිමු කෝ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දෙන්නේ නැහැ නේ? මොකක් හරි දානවානේ බැරියර් එකක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මගේ විරෝධතාවයක් නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඔබතුමා විරුද්ධ වුණත් අපට කමක් නැහැ. අපට ඕනෑ සභාවේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඕනෑ විධියට සම්මත කරන්න කෝ? රීතියක් ඕනෑ නැහැ නේ? ඒක සම්මත කරන්නකෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙහෙම නේ? මට උපදෙස් දෙන්නේ ලේකම්තුමා සහ හැන්සාඩ් සංස්කාරතුමා. එතුමා මට පැහැදිලිව ප්‍රකාශ කරනවා. එතුමා ඇවිල්ලා මට රීතියක් පෙන්වනවා. දැන් මේ වාගේ කෙටුම්පතක් සම්මත කරනවා නම් එහෙම ගණපූරණය තිබෙන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

දැන් කාරක සභා අවස්ථාවකට ඇවිල්ලා තිබෙන්නේ. ගණපූරණයක් අවශ්‍ය නැහැ නේ? මේ හැන්සාඩ් සංස්කාරකතුමාටත් උපදෙස් දෙන්න වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කාරක සභාවක් නේ තිබෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගණපූරණය ගැන මම පොඩ්ඩක් කියවන්නද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, එහෙම නම් අපි තව දවසකට කල් දාමු. ප්‍රශ්නය මෙතැනින්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ කිසිම විරෝධතාවයක් නැහැ ඒකට. නමුත් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි මේක මේ විධියටම තියමු. රීති කාරක සභාවෙන් ආපු විධියටම තියමු. අපි -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. අපි මේක සම්මත කරලා ඉවර කරමු. අපි අවුරුදු ගණනාවක් පාවිච්චි කරපු තනතුරක් මේ සභාවේ රීතිවලට දාලා තිබෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි ගෙනිච්චා නේ මේ පළාත් සභාව අවුරුදු 30 ක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, කලබල වෙන්න එපා. අපි මෙපමණ මහන්සි වෙලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නැහැ. ඒක නේ දැන් පෙන්නුවේ. පෙන්නුවේ ඒක නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේක සභාව සම්මත කරන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දැන් රීතිය පෙන්නුවානේ මෙයා. දැන් කරන්න බැහැ. දැන් නැගිටින්න. ඔබතුමාත් දැන් ගණපූරණය නැහැයි කියලා කිව්වා කටින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම තවම කිව්වේ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාත් දැන් ගණපූරණය නැහැයි කියලා කිව්වා. දැන් බැහැ. දැන් යමු. මෙතැනින් ඉවරයි. මෙතුමා පෙන්වලා දුන්නා. සහකාර ලේකම්තුමා පෙන්වලා දුන්නා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පොඩ්ඩක් අපි තරහා ගන්නේ නැතිව. කෑ ගහන්නේ නැතිව -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කථා කරන්න දෙයක් නැහැ දැන්. මෙයා බැරියර් දානවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ, මෙතැන අපි තරහා පෙන්වලා, කෑ ගහලා ඇති වැඩක් නැහැ. අපට අදහසක් තිබෙනවා නම්, ඒ අදහස අපට බොහොම සාමකාමීව ඉදිරිපත් කරන්න හැකියි. ඒ අදහස පිළිගන්නවාද නැද්ද කියන එක වෙනම ප්‍රශ්නයක්. මම දකින හැටියට මේ ලියුම 2011 දී යවපු යෝජනාවකට අදාළ ලියුමක්. ඒ නිසා ඒ යෝජනාවට අදාළ ලියුම මේ රීතිවලට අදාළ වෙනවාද කියන කාරණාව ගැන මගේ සිතේ සැකයක් මතු වෙනවා. මම දන්නේ නැහැ මම කියන දේ තේරෙනවාද කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ ලියුම පෙන්වන්න මොකක්ද වුවමනාව?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

කරුණාකරලා කියන්න දෙන්න කෝ. මම මන්ත්‍රීවරයෙක්නේ. මෙතැන මේ තග දාලා නවත්වන්න පුළුවන් තැනක් නොවෙයි නේ? ඒක ඔබතුමා කැලණියේ කරන්න. මෙහේ කරන්න බැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාට නම් පක්ෂයෙනුත් කරනවා. හෙට අනිද්දා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

කරන්න. කරන්න. දෙන්න. චෝදනා ඉදිරිපත් කරන්න. අපි උත්තර දෙන්නම්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාට විනය පරීක්ෂණය ඇවිල්ලා ඉවරයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඇවිල්ලා ඉවරයි. මම දන්නවා. මට විනය පරීක්ෂණය ඉදිරිපත් කරලා තිබෙන්නේ? මොනවාටද දන්නවාද? චෝදනාව තමයි 20 වන සංශෝධනයට -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ සභාවේ විනය පරීක්ෂණ නැහැ. ඒවා පක්ෂය ඇතුළේ බේරා ගන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මේ පළාත් සභාවේ සභාය නොදීම මට ඉදිරිපත් කරලා තිබෙන චෝදනාව. මගේ හෘදය සාක්ෂියට එකඟව 20 වන සංශෝධනයට අදාළව මම මේ සභාවේ කරපු ප්‍රකාශය තමයි මට විරුද්ධව ඉදිරිපත් කරලා තිබෙන චෝදනාව. මෙන්න මේක තමයි එක්සත් ජාතික පක්ෂයේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. පළාත් සභා මන්ත්‍රීවරයෙකුට තමන්ගේ අදහස් පළාත් සභාවේ කථා කරන්න

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අන්න අහගන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

කථා කළොත් ඒකට චෝදනා ඉදිරිපත් කරන එක තමයි මේ වර්තමාන එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අදාළ කරුණට සීමා කර ගනිමු. අදාළ කරුණට සීමා වෙන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අපි ඒකට උත්තර දෙන්නම්. අපි ආසාවෙන් බලාගෙන ඉන්නේ. ඔය චෝදනාවට ඇවිල්ලා කොහොමද උත්තර දෙන්නේ කියලා. උත්තර දීලා අපි ඒක - ගරු සභාපතිතුමනි, -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක පස්සේ කරලා ඉස්සෙල්ලා රීතිවල වැඩ කර ගෙන ඉන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මේක මම පොතක් ගහලා ඔක්කෝටම බෙදලා දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි දැන් ඕක දිගින් දිගට සාකච්ඡා කරන්න ඕනෑ නැහැ. අපි සම්මත කරමු. එපමණයි තිබෙන්නේ දැන්. අපි ඡන්දයකට යමු.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මට කියන්න ඕනෑ මෙපමණයි. මම මේ කාටවත් පක්ෂව කථා කරනවා නොවෙයි. 2011 -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පරණ ලියුමක්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඉතින් මේක මේකට අදාළ වෙනවාද කියන එක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. අවශ්‍ය නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ශ්‍රීනාත් මන්ත්‍රීතුමා, ජෝර්ජ් නැත්නම් ඕකත් චෝදනාවකට දායි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මට එක විනාඩියක් දෙන්න. මේ නීතිය පැත්තෙන් මෙතැනදී යමක් කියන්න ඕනෑ. අපට මේ කාරණාවට විතරක් ඡන්දය විමසන්න බැහැ. අවසානයේ ඕනෑ නම් මේකට කැමැති ද අකමැතිද කියලා ඡන්දයක් විමසුව ඇහැකි. එතකොට බහුතරයෙන් සම්මත කරන්න පුළුවන්. අනික් කාරණාව තමයි. යම්කිසි ලියුමකට මේ සභාවට තිබෙන බලය සීමා කරන්න බැහැ. මොනවා හරි අවශ්‍ය නම් මධ්‍යම ආණ්ඩුව නීතිය පනවලා සංශෝධනයක් කරලා එවන්න ඕනෑ. අන්න එදාට අපි ඒ රීතිය වෙනස් කර ගන්නවා. ඒකයි කරන්න තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එහෙම නම් මේක -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

කැලණියේ සංවිධායකකමක්වත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට දීලා විරෝධතා ලියන්න බැහැ. තිබෙන ප්‍රශ්නය ඒකයි. කැමැත්ත අකමැත්ත ලියන්න ඕනෑ. අපි අවසානයට ලියමුද ඔය ටික?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලා දැන් ලියුම පැත්තකට දාන්න කෝ. ලියුම ඕනෑම නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඕනෑම නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හැබැයි, මම දැන් මේ සම්බන්ධව මගේ විරෝධතාවයක් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාට මේක කර ගෙන යන්න නම්, එක්කෝ මේ ධූරධාරීන් කියන කොටස සම්පූර්ණයෙන්ම මේකෙන් ඉවත් කරන්න ඕනෑ. ඉවත් කරලා තමුන්නාන්සේලාගේ ධූරයන් අහිමි වෙන්නේ නැහැ නේ? මෙතුමා ඉන්නවා. මෙතුමන්ලාත් ඉන්නවා. ඔය තිබෙන විධියට තියෙයි. මම කියන්නේ, එහෙම නම් තමුන්නාන්සේලාට මේකෙන් - දැන් මම මේ විරෝධය ප්‍රකාශ කරපු නිසා මේ ටික සම්පූර්ණයෙන්ම ඉවත් කරලා මේක සම්මත කර ගන්න වෙනවා, ඉතිරි ටික. එහෙම නැත්නම් -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමාගේ තනි විරෝධයට මේකේ සියල්ල අයින් කරන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම නැත්නම් මම මේ -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමාට අවසාන ඡන්දය විමසීමේදී ඒක කියන්න කියන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙම කරමු. අපි දිගටම ගිහිල්ලා අවසානයේ ඔබතුමා ඔය ප්‍රකාශ කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම නැත්නම් මේ වගන්තියට අදාළව තමුන්නාන්සේලා මේකේ අනිවාර්යයෙන් ඡන්දය විමසන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවසානයේ ඡන්දයක් තියමු.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේකේ මේ වගන්තියට ඡන්දය විමසන්න බැහැ. අවසානයේදී අපි ඡන්ද විමසීම කරමු. එතකොට සංශෝධනය ගැන කියන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. වගන්තියට පුළුවන්. මොකද, අපි මේ සමස්තයට විරුද්ධ නැහැ නේ? අපි ඒ වගන්තිය විතරයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා, අපි සමස්තයට විරුද්ධ නැහැ. ඒ නිසා ඒකට ඡන්දය විමසන්න තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නමුත් ගරු සභාපතිතුමනි, වාක්‍යයෙන් වාක්‍යයට ඡන්දය තියන්න බැහැ. අවසානයට තමයි -

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මමත් මේ සභා කටයුතු එකේ ඉන්නවා නේ? මේ අහන්න. දැන් අපි මෙතැනින් එකින් එක අරගෙන එන්නේ සාකච්ඡා කර ගෙන. එතකොට එකින් එක කියාගෙන යන කොට විරෝධයක් නැත්නම් අපි එකඟයි කියනවා. දැන් ප්‍රශ්නයක් ආවාම තමයි මේ ප්‍රශ්නයට කරුණු ඉදිරිපත් කරන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක අන්තිමට ගමු.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැහැ. දැන් ආපහු ඔක්කොම ගිහිල්ලා ගන්නවාට වඩා එතැනදීම දැන්ම ගනිමු. මේ කාරණය පිළිබඳව සභාවේ එකඟතාවය.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු මන්ත්‍රීතුමා, තව එනවා. තව සංශෝධනය වන වගන්ති ඉස්සරහාට එනවා. එතකොට එකින් එකට ඡන්දය විමසන්න වෙනවා. අන්තිමට ඡන්දය ගන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මොකක්ද මේ හැමදාම. වරුණ මහත්තයා, මේක හැමදාම කරන එක. අපි පනත් එහෙම සංශෝධනය කරලා තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු මන්ත්‍රීතුමා, එක එක වගන්තියට ඡන්දය විමසන්න බැහැ. අවසානයට ඡන්දය විමසීම කරන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒ සමස්තයට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි අවසානයේ ගනිමු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවසානයේ තමයි ඕක ගන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අවසානයට ගනිමු.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ජෝර්ජ්, මේකටත් විරුද්ධ වුණාය කියලා තව චෝදනාවක් දාන්න ශ්‍රීනාත් මන්ත්‍රීතුමාට.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම ආසාවෙන් බලාගෙන ඉන්නවා චෝදනා එනකල්. මගේ සාක්කිය මෙහෙයවන දවස එන කල්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අදාළ කාරණාවලට යන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මටත් පිටපතක් ආපු නිසයි මම මේ සිද්ධිය දන්නේ. නැත්නම් අනේ - (බාධා කිරීම්) ඒ චෝදනා පත්‍රය -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

කියන්න ඕනෑ ඒවා කියලා ඉවර වෙලා -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මාව යවන්න එපමණ ලෙහෙසි වෙන්නේ නැහැ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ජරා වචන ඔක්කොම කියලා. ගෙදර යවනවාය කිව්වා. සති දෙකයි කිව්වා තිබෙන්නේ. ගෙදර යවනවා කිව්වා. දැන් බොරුවට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනේ මේ. අදාළ කාරණාවට යන්න කෝ. දැන් වෙලාව එකත් වෙලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඊළඟ එකට යමු.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

හරි. බලමු කෝ ආරක්ෂා කරයිද කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පොදු ජන පෙරමුණ කියලා නිර්මාණය කරලා. අපේ පක්ෂයෙන් තව පක්ෂයක් නිර්මාණය කරන්න බැහැ. වෙන චෝදනාවක් නොවෙයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ජනාධිපති නීතිඥවරයෙක්ව ඔබතුමා ආරක්ෂා කරන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේට බැහැ-

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අදාළ කාරණාවට යන්නකෝ. ඕවා අහන්න ඕනෑ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වෙන පක්ෂයක් දාන්න -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඔබතුමා කරුණු දන්නේ නැතිව කථා කරන්න එපා. ගාමිණී අතුකෝරළ මහත්තයා අපට ආරාධනා කළා. මේ බොරු කතන්දර කියන්නේ. කරුණු දන්නේ නැතිව. අපි 2001 දී - (බාධා කිරීම්)

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

චෝදනා පත්‍රයේ තිබෙනවා. (බාධා කිරීම්)

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, සභාව අවශ්‍ය තැනට ගේන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඔබතුමා කරුණු දන්නේ නැතිව කථා කරන්න එපා. ගාමිණී අතුකෝරළ මහත්තයා අපට ආරාධනා කළා. මේ බොර කතන්දර කියන්නේ. දන්නේ නැති මඟුල් කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා මම මේක අරගෙන යන්නම්. මට එක එක්කෙනා නියෝග දෙන්න ලැහැස්ති වෙන්න එපා. මම පවත්වාගෙන යන්නම්.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

එතුමා ජනාධිපති නීතිඥවරයෙක්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

දන්නේ නැති කතන්දර. ගිහිල්ලා අහන්න මැතිවරණ කොමසාරිස්ගෙන්. කවදාද අපි අපේ පක්ෂය අපි ලියාපදිංචි කළේ කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අවශ්‍ය වැඩේ කරන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය මයික් එක ඕෆ් කර ගන්න කෝ. ඔබතුමිය සද්ද නැතිව ඉන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පක්ෂයක් පිහිටුවීමක් සම්බන්ධයෙන් නොවෙයි. කථා කරන්න එපා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ජෝර්ජ්ලා බොරුවට කෑ ගැහුවාට කැලණියේ සංවිධායකකමත් හම්බ වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මීළඟට තිබෙන්නේ, 14(2) අනේ මේ මට වරින් වර රෝස් මන්ත්‍රීතමිය අවවාද දෙන්න එපා. උපදෙස් දෙන්න එපා. මම මේක කර ගෙන යන්නම්. බාධා කිරීම් කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා බලාගෙන ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෑ ගහන කොට බලාගෙන ඉන්නේ පොඩ්ඩක්. මටත් පොඩි ජොලියක් තිබෙන්න ඕනෑ. මීළඟට 14(1) –

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා සභාපති -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, පොඩ්ඩක් සමාවෙන්න. මම කරන දේ කරන්නම්. ඔබතුමිය මයික් එක ඔන් කර ගෙන උපදෙස් දෙන්න එපා. සභාවක් මේක. උදෙත් ඒක නේ? කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කථා කරන කොට ඔබතුමිය අනවශ්‍ය ප්‍රකාශ කළා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතුමියගේ ආසාව නේ? පුටුව පොඩ්ඩක් දුන්නා නම් හරි. දවසකට ඕක දුන්නා නම් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රැස්වීම.

*රීති අංක 14 (1) -*

*"සෑම වර්ෂයකම පවත්වනු ලබන ප්‍රථම සභා රැස්වීම ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානවත්වයෙන් රැස් විය හැක්කේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14 (2) (අ) -*

*"සභාව වෙනත් තීරණයක් නොගනී නම්, සෑම මාසයකම පළමු වන ඉරු දිනට සහ තුන්වන ඉරුදිනට පසුව එළැඹෙන අඟහරුවාදා දිනයෙහි සභා රැස්වීම පැවැත් විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14 (2) (ආ) -*

*"එසේ වුවද, එවැනි දිනයන් අදාළ මාසයට නොයෙදෙන්නේ නම්, ඒ සඳහා අදාළ මාසයේ අවසානයේ ඇති වැඩ කරන දිනය යොදාගත යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14(3) -*

*"හදිසි වැඩ කටයුතු ගැන ක්‍රියා කළ යුතුව ඇති අවස්ථාවලදී ඉහත 14(1) රීතියේ විධාන නොසලකා, සභා රැස්වීමකදී දිනය සඳහන් කරමින්, ".............. දින මෙම සභාව රැස්විය යුතුය.........." යන යෝජනාව සම්මත කර ගැනීමෙන්, එදිනට රැස් විය හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14(4) -*

*"ආණ්ඩුකාරවරයා විසින් කැඳවනු ලබන රැස්වීමකට ඉහත අංක 14(1) හා 14(2) රීති බලනොපානු ඇත."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14(5) -*

*"සභා රැස්වීමක් පෙරවරු 09.30 ට ආරම්භ විය යුතුය. එසේ වුවද ආණ්ඩුකාරවරයා විසින් කැඳවනු ලබන රැස්වීමක්, ඒ වෙනුවෙන් ආණ්ඩුකාරවරයා විසින් නිකුත් කරනු ලබන දැන්වීමෙන් නියම කෙරෙන වේලාවට ආරම්භ විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14(6) -*

*"පස්වරු 02.00 ට අවධානයට යොමුව ඇති කටයුත්තක් වෙතොත් එය නිම විය යුතු අතර, සභාව කාරක සභා අවස්ථාවේ පසු වේ නම්, නැවත සභා අවස්ථාවට පැමිණ 31 වන රීතිය යටතේ කටයුතු කරගෙන යා හැකිය. දිනට නියමිත න්‍යාය පත්‍රයෙහි ඇතුළත් සභාවේ වැඩ කටයුතු පස්වරු 02.00 ට අවසන් විය යුතුව ඇත්නම්, සභාව කල් තැබීමේ වේලාවේ සිට විනාඩි 30 කට නොවැඩි කාලයක් 31 වන රීතිය යටතේ කටයුතු සඳහා යොදා ගත හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14(7) (අ) -*

*"රීති අංක 107 යටතේ ඉදිරිපත් වූ යෝජනාවක් හෝ වෙනත් යෝජනාවක් විවාද වී 15(6) රීතිය ප්‍රකාරව කටයුතු කොට පස්වරු 02.00 ට කලින් අවසන් වූයේ නම්, 31 වන රීතිය යටතේ කටයුතු සඳහා යොදා ගත හැකිය."*

*මෙහි 107, 110 ලෙසත්, 15(6), 14(6) ලෙසත් අංකනය වෙනවා.*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මගේ යෝජනාවක් තිබුණා සභා රැස්වීම් ගැන. පිටු අංක 20. සභා වාරය මාසයකට දෙපාරක් නොවෙයි. ඒක වැඩි කරන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පරණ රීති කියන්නේ. අලුත් රීති මම කියන්නේ. අලුත් රීතිය ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකේ දෙක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම සංශෝධන රීති කියවන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔව්. එකේ 2(අ) යටතේ සභා වාරය වැඩි කරන්නය කියලා යෝජනාව ගෙනාපු එක ගැන මම කථා කරන්නේ. මේකේ තිබෙන්නේ දෙවරක් කියලා නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මාසයකට දෙපාරක් තමයි දැන් සභා වාරය පවත්වන්නේ. දැන් මේ මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික යෝජනා තිබෙනවා ගොඩ ගැහිලා. අවුරුදු දෙක තුන තිබුණු ඒවා. ඒ ගැන තමයි මේ කියන්නේ. ඒ නිසා යෝජනාවක් කරන්න බැරිද? අඩු ගණනේ මාස දෙකකට සැරයක් හරි කමක් නැහැ විශේෂ සභාවක් දාලා හරි මේ යෝජනා ටික කඩිනමින් අවසන් කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් මම යෝජනා කළේ රැස්වීම සුමානයකට වරක් තියන්න කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු මන්ත්‍රීතුමා, ඒක තිබෙනවා. 14(3) හි තිබෙන්නේ ඒක තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සුමානයකට එකක් තියන්න පුළුවන්. තිබුණත් ප්‍රතිඵලය මෙපමණ නේ? ප්‍රතිඵලය පේනවා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක කොහොමත් එහෙම නේ? ඒක වෙනසක් වෙන්නේ නැහැ නේ? එන කට්ටිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි කියන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, සභා වාර වැඩි කර ගන්න ඕනෑ නම්, ඒකට අදාළ රීතියක් තිබෙනවා මේකේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තමයි අපි කියන්නේ. වැඩි කරන්න කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ රීතිය තිබෙනවා. වැඩි කරන් දෙයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. හදිසි අවස්ථාවක නොවෙයි. අපි කියන්නේ වැඩි කරන්න කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම වැඩි කරන්න එපා. හදිසි අවස්ථාවක වැඩි කර ගනිමු. තේරුමක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එන්නේ නැති කට්ටිය කොහොමත් එන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*අපි ඊළඟ එකට යමු.*

*මීළඟට රීති අංක 14(7) (ආ) -*

*"පස්වරු 2.30 හෝ 31 වන රීතිය යටතේ කටයුතු අවසන් කිරීම හෝ යන දෙකින් වඩාත්, කලින් එළැඹෙන අවස්ථාවේදී සභාපතිවරයා සභාව කල් තැබිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14(7) (ඇ) -*

*"දිනට නියමිත න්‍යාය පත්‍රයේ කිසියම් විශේෂිත කාර්යයක් එදිනම නිමාවට පත් කර ගත යුතු යැයි සලකතොත්, 14 වන රීතියේ (5) වන හා (6) වන අනු රීතිවල බලපෑමෙන් නිදහස්ව එය කරගෙන යා හැක්කේ, ඒ පිළිබඳව සභානායකවරයා හෝ අමාත්‍යවරයකු විසින් ගෙන එනු ලබන යෝජනාවක් සම්මත කර ගැනීමෙනි. "න්‍යාය පත්‍රයේ අංක ...... දරන විෂයය පිළිබඳ වැඩ කටයුතු අංක 14(5) හා 14(6) රීතිවල විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතුය" යනුවෙන් සඳහන් විය යුතු එම යෝජනාව විවාදයට භාජනය නොවිය යුතුය. ඒ යෝජනාව සම්මත වුවහොත් ඒ අනුව කටයුතු කරගෙන යා හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14(7) (ඈ) -*

*"සභාපතිවරයාගේ අවසරය ලැබෙන ඕනෑම අවස්ථාවක 14(7)(ඇ) හී සඳහන් පරිදි යෝජනාව ඉදිරිපත් කළ හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 14(8) -*

*"රීති අංක 14(7)(ආ) යටතේ වන විෂයයක් සම්බන්ධයෙන් කෙරෙන වැඩ කටයුතු පස්වරු 2.00 පසුවී නිමා වන්නේ නම් හා 31 වන රීතිය යටතේ දැනුම් දී ඇති ප්‍රශ්න ඉතා හදිසි ස්වරූපයේ ඒවා බව සභාපතිවරයා නිගමනය නොකරන්නේ නම්, කල් තැබීමේ යෝජනාවක් නොමැතිව සභාව වහාම කල් තැබීමට සභාපතිවරයාට හැකි විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*කල් තැබීම හා අත්හිටුවීම. රීති අංක 15(1) (අ)*

*"සභානායකවරයාට හෝ ඇමතිවරයකුට හෝ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 15(1) (ආ) -*

*"නියමිත දිනයක් සඳහන් නොකර, "දැන් සභාව කල් තැබිය යුතුය" යනුවෙන් යෝජනා කරන්නේ නම්, ඊට සභාවේ එකඟත්වය විමසා, සභාව ඊට අවසර දෙන්නේ නම් එහි අදහස විය යුත්තේ, රීති අංක 14(2) යටතේ ඊළඟට සභාව රැස් විය යුතු දින පෙරවරු 09.30 දක්වා සභාව කල් තැබීමය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 15(1) (ඇ) -*

*"යෝජනාවේ නියමිත දිනයක් හා වේලාවක් සඳහන් වන්නේ නම්, එම යෝජනාව සම්මත වූ විට එකී දින එකී වේලාවට සභාව රැස් විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 15(1) ඈ -*

*"දින නියමයක් නොමැතිව සභාව කල් තැබිය යුතුය" යනුවෙන් යෝජනාවක් ඉදිරිපත් කළ නොහැකිය.*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 15(8)(2) (අ) -*

*"සභාවක හෝ පූර්ණ කාරක සභාවක නොසන්සුන්තාවයක් ඇති වුවහොත් සභාපතිවරයා නියම කරන කාලයකට එම සභාව හෝ පූර්ණ කාරක සභාව තාවකාලිකව අත් සිටුවිය හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 15(8)(2) ආ -*

*"සභාපතිවරයාගේ අභිමතය පරිදි ඉහත කාරණාවලින් බැහැරවවුවද, සභාව හෝ පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවිය හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 15(8)(2) (ඇ) -*

*"සභාවේ දැඩි නොසන්සුන්තාවයක් ඇති වුවහොත් එය පාලනය කිරීමට සභාව කල් තැබිය යුතු යැයි සභාපතිවරයා අදහස් කරන විට, සභාව කල් තැබීමට සභාපතිවරයා පියවර ගත යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 15(8)(2) (ඇ) -*

*"ඉහත 2(ඇ) වගන්ති අනුව සභාව කල් තැබුවහොත් එකී කල් තබන අවස්ථාවේදී විවාදගතව පැවති යෝජනාව, ඊළඟ සභා වාරයේ න්‍යාය පත්‍රයට අනිවාර්යයෙන් ඇතුළත් කොට ප්‍රමුඛතාව ලබා දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 15(8) (3) -*

*"සභාව කල් තැබෙන අවස්ථාවේදී සාකච්ඡාවට නොගැණුනු න්‍යාය පත්‍රයේ අඩංගු සියලු කරුණු ඊළඟ සභා රැස්වීමේ දින න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*ගණපූරණය.*

*රීති අංක 16(1) -*

*"පනතේ 10(4) වන වගන්තියෙන් නියමිත පරිදි සභාවේ ගණපූරණය මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුය. සභාවේ ගණපූරණයක් නොමැති බව සභාපතිවරයාට පෙනී යන හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් මන්ත්‍රීවරයකු විසින් සභාපතිවරයාගේ අවධානය යොමු කරවනු ලබන සෑම විටකදීම, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කළ යුතුය. විනාඩි 5 ක කාලය ඇවෑමෙන් ගණපූරණයක් ඇති නොවේ නම්, පනතේ 10(5) වගන්ති අනුව සභාව කල් තැබීමට හෝ ගණ පූරණයක් ඇති වන තුරු රැස්වීම අත්සිටුවීමට හෝ සභාපතිවරයා ක්‍රියා කළ යුතුය. ගණපූරණය ගණන් ගැනීමේදී සභාපතිවරයා ද ඊට ඇතුළත් විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 16(2) -*

*"මුළු සභාවම පූර්ණ කාරක සභාවක් වශයෙන් රැස්වන විට අවශ්‍ය ගණ පූරණය ද සභාව සඳහා අවශ්‍ය ගණපූරණයම විය යුතුය. මුළු සභාවම කාරක සභාවක් වශයෙන් රැස් වන අවස්ථාවේදී ගණපූරණයක් නොමැති බව සභාපතිවරයාට පෙනී යන හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් මන්ත්‍රීවරයකු විසින් ඔහුගේ අවධානය යොමු කරවනු ලබන සෑම විටකදීම කැඳවීම් සීනුව නාද කරවීමට සභාපතිවරයා විසින් නියෝග කළ යුතු අතර, විනාඩි 5 ක කාලයක් අවසානයේදීත් ගණපූරණයක් ඇති නොවේ නම්, යළි සභා අවස්ථාවට එළැඹිය යුතුය. යළිත් ගණපූරණයක් නොමැති නම්, සභාපතිවරයා සභාව කල් තැබීම හෝ ගණපූරණය ඇති වන තුරු අත්සිටුවීම හෝ කළ යුතුය. ගණපූරණය ගණන් ගැනීමේදී සභාපතිවරයා ද ඊට ඇතුළත් විය යුතුය."*

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට අදාළව මට කියන්න තිබෙන්නේ මෙපමණයි. පනතේ 10(4) වගන්තියේ කියනවා, ගණ පූරණය 1/3 ක් විය යුතුය කියලා. මම ඒක කියවන්නම්. ඒ නිසා අපට ඒක අඩු කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මතු වෙනවා. 10(4) –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ නේද? ඒක තමයි. එතැන ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පළාත් සභා පනතේ 10(4) කියලා තිබෙන්නේ, The quaram to constitute a meeting of a Provincial Council shall be one-third of the total number of members of the Council. Where one-third of the number of members is an integer and fraction, the integer

[ගරු ශ්‍රීනාත් ම. පෙරේරා]

immediately higher to that integer and fraction shall be deemed to be the one-third of the number of members for the purpose of this section. පනතේ එහෙම කියලා තිබෙනවා.

ඒ කියන්නේ 1/3 ක් තමයි ගණපූරණය. එතකොට පනතෙන් ඒ ආකාරයට ප්‍රකාශ - ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා පළ කළ අදහසට ගෞරව කරන අතර, කොපමණ තරහා වුණත්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ටිකක් භය වුණා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මාව භය කරන්න කාටවත් බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න කෝ එතුමාට කථා කරන්න දීලා. අපි ඒක එහෙම්මම තියමු.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*මීළඟට සභාවේ වැඩ කටයුතු කළ යුතු භාෂා. රීති අංක 17(1) -*

*"සභාවේ වැඩ කටයුතු රාජ්‍ය භාෂාවලින් කරගෙන යා යුතුය. එසේ වුවද, සභාවේදී කථා කිරීමේදී හා තම රාජකාරී කටයුතු ඉටු කිරීමේදී සම්බන්ධීකරණ භාෂාව භාවිතා කිරීමට මන්ත්‍රීවරුන්ට හැකි විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 17(2) -*

*"සභාවේදී පවත්වන ලද සෑම කථාවක්ම එය පවත්වන ලද භාෂාවෙන්, පළාත් සභා විවාද නිල[හැන්සාඩ්] වාර්තාවෙහි පළ විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 17(3) -*

*"සභාවේදී සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන් එකකින් පවත්වන කථාවක භාෂණ පරිවර්තනවලට සවන් දීමට මන්ත්‍රීවරුන්ට පහසුකම් සලසා දීමට හැකි හැම අවස්ථාවකදීම සභාපතිවරයා විසින් විධිවිධාන සැලසිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*පිට අය. රීති අංක 18(1) -*

*"සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව මිස කිසිම පිටස්තර පුද්ගලයෙක් සභා රැස්වීමක් හෝ පූර්ණ කාරක සභාවේ රැස්වීමක් පැවැත්වෙන වේලාව තුළදී සභා ගර්භය සහ සභාපතිතුමා විසින් තීරණය කරනු ලබන එයට ආසන්න ප්‍රදේශයට ඇතුළුවීම හෝ රැඳී සිටීම නොකළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 18(2) -*

*"අවසර ලබා නොගෙන සභා ගර්භයේ රැඳී සිටින පිටස්තර පුද්ගලයකු ඉන් ඉවත් විය යුතු යැයි නියෝග කිරීමටද, අවසර ලබාගෙන තිබෙන්නේ වුවද, අවස්ථාවෝචිතව හැඟී යන කරුණු මත යම් පිටස්තර පුද්ගලයකු සභා ගර්භයෙන් ඉවත් කළ යුතු බව සභාපතිවරයාට හැඟෙන්නේ නම් එවන් අවස්ථාවක දීද එකී පිටස්තර පුද්ගලයාට සභා ගර්භයෙන් ඉවත් විය යුතු යැයි සභාපතිවරයා විසින් නියෝග කළ හැක්කේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 18(3) -*

*"රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා සභාපතිවරයාගේ නියමය පරිදි කැඳවනු ලැබූ නිලධාරීහු පිට අය වශයෙන් නොසැලකෙති."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 18(4) -*

*"පළාත් සභා රැස්වීම ආවරණය කිරීම සඳහා ජනමාධ්‍ය නියෝජිතයන් සභා පරිශ්‍රයට ඇතුළුවීම සඳහා සභාපතිවරයාගෙන් අවසර ලබා ගත යුතුය. පළාත් සභාවේ හෝ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝණය වන වාර්තාවක් හෝ අසත්‍ය වාර්තාවක් එම ප්‍රවෘත්ති මාධ්‍යයෙහි පළ කළහොත් අවවාද කිරීම හෝ සභාපතිතුමාගේ අභිමතය පරිදි කටයුතු කිරීම හෝ කළ හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*සභාවේ වැඩ කටයුතු.*

*රීති අංක 19(1) -*

*"සභාවේ වැඩ කටයුතු කරගෙන යා යුතු අනුපිළිවෙළ පහත සඳහන් පරිදි විය යුතුය."*

*(අ) අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්*

*(ආ) ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ*

*(ඇ.) සභාපතිවරයාගේ නිවේදන*

*(ඈ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා*

*(ඉ) ලිපි ලේඛන පිළිගැන්වීම*

*(ඊ) කාරක සභා වාර්තා පිළිගැන්වීම*

*(උ) පෙත්සම්*

*(ඌ) ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම*

*(එ) පෞද්ගලික ප්‍රකාශ කිරීම්*

*(ඒ) කලින් අවසරගත් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ*

*(ඓ) අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ හෝ අදාළ වරප්‍රසාද කඩවීම් සම්බන්ධව දිය යුතු පිළිතුරු*

*(ඔ) ශෝක ප්‍රකාශ යෝජනා*

*(ඕ) පොදු කටයුතු ආරම්භයේදී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා*

*(ඖ) පොදු කටයුතු ආරම්භයේදී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා*

*(ක) පළාත් සභාවේ පොදු කටයුතු*

*(ග) පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 19(2) -*

*"පොදු කටයුතු පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලබන නිර්දේශ පිළිබඳ කරුණු තහවුරු කර ගැනීමෙන් අනතුරුව, ඒවා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ යෝග්‍යතාව සභාපතිවරයා විසින් සලකා බලා, ඒවා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*19(3) -*

*"පෞද්ගලිකව මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන පොදු කටයුතු පිළිබඳ යෝජනා සහ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු සම්බන්ධයෙන් ලේකම්වරයා වෙත දැනුම් දෙන ලද අනුපිළිවෙළ අනුව ඒවා න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*19 (4) (අ)*

*"කිසියම් පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ යෝජනාවක් පිළිබඳ විවාදය එම යෝජනාව සාකච්ඡාවට ගැනෙන දිනයේදී ම සාකච්ඡා කර අවසානයේදී ඡන්දය විමසිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*19 (4) (ආ)*

*"එසේකුදු වුවද, සභාවේ ගණ පූරණය නොමැති වීම නිසා හෝ සභාවේ නොසන්සුන්තාවය නිසා හෝ සභාව කල් තබන අවස්ථාව එළැඹ තිබෙන නිසා හෝ වෙනත් පාලනය කර ගත නොහැකි හේතුවක් නිසා හෝ සාකච්ඡා වෙමින් තිබුණු යම් පෞද්ගලික යෝජනාවක් වෙතොත් එම යෝජනාව ඊළඟ දින න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය. එකී යෝජනාවට අදාළ සාකච්ඡාව නතර වූ තැන් පටන් ඊළඟ රැස්වීම් දිනයේදී සාකච්ඡාව කරගෙන යා හැක්කේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*19 (4) (ඇ)*

*"එවැනි යෝජනාවකට ඊළඟ දින න්‍යාය පත්‍රයේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*ලිපිලේඛනාදිය පිළිගැන්වීම.*

*රීති අංක 20(1) -*

*"ලිපිලේඛන පිළිගැන්විය හැක්කේ සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභාපති නාමාවලියේ මන්ත්‍රීවරයෙකු හා එදින යෝජනා සම්මතයෙන් මූලසුන හොබවන මන්ත්‍රීතුමාට හා අමාත්‍යවරයකුට සහ යම් අමාත්‍යවරයෙකු වෙනුවෙන් සභා නායකවරයාට පමණි."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*20(2) -*

*"කිසියම් ලිපි ලේඛනයක් පිළිගැන්වීමේදී එහි අඩංගු කරුණු ගැන කෙටියෙන් විස්තරයක් කළ හැකිය. එහෙත් ඒ සම්බන්ධයෙන් විවාදයක් නොපැවැත් විය යුතු ය."*

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

20(2) ට තිබෙනවා සංශෝධනයක්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් කාරණාවක් මතු කළා. කිසියම් ලිපිලේඛනයක් පිළිගැන්වීමේදී එහි අඩංගු කරුණු ගැන කෙටි විස්තරයක් කළ හැකිය කියලා. එතුමා යෝජනා කළේ ඒ කෙටි විස්තරය ඒ යෝජනාව ඉදිරිපත් කරන මන්ත්‍රීතුමාටත් කෙටි විස්තරයක් කරන්න අවස්ථාව දෙන්නය කියලා. ගරු මන්ත්‍රීතුමා, එහෙම නේද? මමත් විශ්වාස කරනවා, ඒ යෝජිත සංශෝධනය අපි සලකා බැලිය යුතුය කියලා. මම දන්නේ නැහැ මම පැහැදිලිව කිව්වාද කියලා. දැන් ලිපිලේඛන පිළිගැන්විය හැක්කේ සභාපතිවරයාට -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ සංශෝධනය ඇතුළත් කරමු.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

කිසියම් ලිපි ලේඛනයක් පිළිගැන්වීමේදී එම කරුණු ගැන පෙත්සම ඉදිරිපත් කරන ගරු මන්ත්‍රීවරයාට ද කියන වචනය ඇතුළත් කිරීමෙන් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ලිපි ලේඛන.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

සමාවෙන්න. මම ඒක නැවත කියන්නම්. *"කිසියම් ලිපිලේඛනයක් පිළිගැන්වීමේදී එහි අඩංගු කරුණු ගැන* කියන වචනයයි කෙටියෙන් කියන වචනයයි අතර, *කරුණු ගැන එකී ලේඛනය ඉදිරිපත් කරන ගරු මන්ත්‍රීවරයාට කෙටියෙන් විස්තරයක් කළ හැකිය."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරිද ඒක.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මේක හරියට ආවා නම් මෙන්න මෙහෙම එන්න ඕනෑ. එකී ලිපි ලේඛනයක තිබෙන අඩුපාඩුවක් වේ නම් මන්ත්‍රීවරයෙකුට එය පෙන්වා දීමට ඉඩකඩ තිබිය යුතුය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හොඳයි. ඒ කියන්නේ 20(2) සංශෝධනය වෙනවා. දෙවන වාක්‍යය අගට එකී ලිපි ලේඛනයක යම් දෝෂ සහගත තත්ත්වයක් ඇත්නම් එය පෙන්වා දීමට කිසියම් හෝ මන්ත්‍රීවරයෙකුට හැකියාව ඇත්තේ ය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව සංශෝධන රීතිය වන්නේ,

*"කිසියම් ලිපි ලේඛනයක් පිළිගැන්වීමේදී එහි අඩංගු කරුණු ගැන කෙටියෙන් විස්තරයක් කළ හැකිය. එහෙත් ඒ සම්බන්ධයෙන් විවාදයක් නොපැවැත් විය යුතු ය. එකී ලිපි ලේඛනයක යම් දෝෂ සහගත තත්ත්වයක් ඇත්නම් එය පෙන්වා දීමට කිසියම් හෝ මන්ත්‍රීවරයෙකුට හැකියාව ඇත්තේ ය."*

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒකට යටත්ව අපි ඒකට එකඟයි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 20(3) -*

*"පිළිගන්වන ලද ලිපි ලේඛන සියල්ලක්ම සභා මේසය මත තිබිය යුතු යැයි නියෝග කරන ලද්දක් මෙන් සැලකිය යුතුය. තවද, එම ලිපි ලේඛනවල මුද්‍රණය කිරීමට ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් වෙතොත්, සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව සභාගත වූවා සේ සැලකිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරක සභා වාර්තා පිළිගැන්වීම.

*රීති අංක 21(1) -*

*"යම් කාරක සභාවක සභාපතිවරයා විසින් හෝ ඔහු වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජිකයකු විසින් හෝ කාරක සභා වාර්තාවක් පිළිගැන්විය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 21(2) -*

*"එම වාර්තාව ගැන සභාවට කරුණු ඉදිරිපත් කළ හැකි වුවත්, එම අවස්ථාවේදී විවාදයක් නොපැවැත්විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*පෙත්සම්.*

*රීති අංක 22(1)*

*"පළාත් සභාවට ඉදිරිපත් කරන සෑම පෙත්සමක්ම පළාත් සභාවට ව්‍යවස්ථානුකූලව පැවරී ඇති විෂයයකටද, බස්නාහිර පළාතට ද අදාළ එකක් විය යුතු අතර, එය මෙම අනුරීතියේ පහතින් සඳහන් විධිවිධාන අනුව ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*22 (2) -*

*"පෙත්සමක් සභාපතිවරයා වෙත ආමන්ත්‍රණය විය යුතු අතර, එය මන්ත්‍රීවරයකු විසින් පිළිගැන් විය යුතු වන අතර එම පෙත්සම න්‍යාය පත්‍රයේ පෙත්සම් ඉදිරිපත් කරන කාලවේලාව තුළ දී අදාළ මන්ත්‍රීවරයා විසින් ම ඉදිරිපත් කළ යුතු පෙත්සමක් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (3) -*

*"සෑම පෙත්සමක්ම ගෞරවාන්විත භාෂාවෙන් ලිවිය යුතු අතර, කාරණයට අදාළ නොවන කරුණු එහි අඩංගු නොවිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (4) -*

*"සෑම පෙත්සමක්ම එය ලියා අත්සන් කරන දිනය හා පෙත්සම්කරුගේ පෞද්ගලික ලිපිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු අතර, සෑම පෙත්සමක්ම කිය විය හැකි පරිදි පැහැදිලිව ලියා තිබිය යුතුවාක් මෙන්ම අපේක්ෂිත සහනය පැහැදිලිව දැක්වෙන ආයාචනයක්ද අඩංගු විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (5) -*

*"අදාළ පෙත්සම්කරු පදිංචි දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් විසින්ම පෙත්සම ඉදිරිපත් කළ යුතු අතර, එකී පෙත්සම පැවැත්වෙන අනුකාරක සභාවට එකී දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් ඇතුළත් නොවිය යුතු ය."*

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඒකට සංශෝධනයක් තිබෙනවා. මේ අපේ යෝජනාව තිබෙන්නේ, ඒ වගන්තිය ඉවත් කරන්න ඕනෑය කියලා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

කොයි වගන්තියද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

22(5).

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා. මම අතුරු යෝජනාවක් කරනවා. මම හිතන්නේ, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට තිබුණා ඒ පිළිබඳව ප්‍රශ්නයක්. එතුමා මතු කරපු කාරණාත් එක්ක මම විශ්වාස කරනවා, මෙන්න මේ වචන දෙක ඉවත් කළා නම් ඒක යථා තත්ත්වයට පැමිණෙනවාය කියලා. ඒ කියන්නේ, අදාළ පෙත්සම්කරු පදිංචි දිස්ත්‍රික්කයේ කියන වචන ටික ඉවත් කරලා, මන්ත්‍රීවරයෙකු විසින් පෙත්සම ඉදිරිපත් කළ යුතු අතර, එකී පෙත්සම පැවැත්වෙන අනු කාරක සභාවට එකී දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් ඇතුළත් නොවිය යුතුය කියලා. එහෙම කිව්වොත් ඔබතුමා සෑහීමකට පත් වෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි ගැටළුව මම -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ පිළිබඳව පෙත්සම් කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙකු හැටියට මම කියන්නම්. සමහර පෙත්සම් ආපුවාම ඒ අදාළ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු නොසිටියහොත් ඇත්තටම හරි පින්තූරය පේන්නේ නැහැ. මේ මන්ත්‍රීවරු දිහා සැකෙන් බලන්න එපා. මේක වැරදියි. මොකද, මම දැක්කා පසුගිය වතාවක එක පෙත්සමක් - තමුන්නාන්සේටත් මතක ඇති. ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ හරක් මස් කඩ ගැන පෙත්සමක් ආවා. එතැන මම ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ නොවුණත් ඒ සිද්ධිය සම්බන්ධයෙන් මම හොඳටම දන්න හින්දා මට ඒ පෙත්සම් කාරක සභාවට කරුණු කියන්න මට හැකියාව තිබුණා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

විසඳගන්න ලේසියි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

විසඳුමක් ගන්න ලේසියි. ඒ නිසා මේක කරුණාකරලා අයින් කරනවා නම් හොඳයි කියන එකයි මගේ අදහස.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ වගන්තිය ඉවත් කරන්නයි ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අපේ මේ කාරක සභා ගැන - දැන් අපේ මන්ත්‍රීවරුන්ට ඇයි අපි චෝදනා කරන්නේ? අපි ඕනෑ තරම් පෙත්සම් ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතාම විශ්වාස විධියට, සාධාරණ විධියට ඒවා විසඳලා තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

22(5) ඉවත් කරමු.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම ඔබතුමාගේ අදහසට ගෞරව කරමින් මම මගේ අදහස හැටියට කියන්නේ. මම දන්නේ නැහැ අනික් මන්ත්‍රීවරු ගැන කියන්න. මට නම්, මම ඉදිරිපත් කරපු පෙත්සමකට අදාළව මම එතැන ඉන්නවා නම්, මම අඳුරන මනුස්සයෙකු එතැන ඉන්නවා නම් ඒ මනුස්සයාට පුළුවන් විධියට උදව් කරන්න මගේ හදවතේ උවමනාවක් තිබෙනවා. ඒ නිසා තමයි මම හිතන්නේ අපි යෝජනා කළේ. අනිකුත් සියලුම මන්ත්‍රීවරු මට වඩා හුඟාක් -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

දැන් ඔබතුමාට ඒ කටයුත්ත කර ගන්න බැරි වෙනවා, මේ කාරණාව තිබුණොත්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පරාර්ථකාමී, ස්වාධීනව කටයුතු කරන අය වෙන්න පුළුවන්. මම කිව්වේ, මගේ හදවතේ ඇති වන සිතිවිල්ල. මම පෙත්සමක් ඉදිරිපත් කරලා ඔහු මම දන්න මනුස්සයෙකු නම්, ඒ පෙත්සම ගැන මට අවබෝධයක් තිබෙන හින්දා එහි සිටිද්දී යම්කිසි බලපෑමක් කිරීමට ඉඩක් තිබෙනවා නම්, මගේ හදවත හැම තිස්සේම කියනවා පොඩි බලපෑමක් කරන්න උත්සාහ ගන්නය කියලා. ඒ නිසා තමයි අපි කිව්වේ, ඒ මන්ත්‍රීවරයා ඒ දිස්ත්‍රික්කයෙන් ඉවත් කරන්නය කියලා. හැබැයි, ඔබතුමන්ලා කියන කථාවේත් සත්‍යයක් තිබෙනවා. හරයක් තිබෙනවා. ඒ කියන්නේ, අපේ සිරිකමල් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මම හිතන්නේ ඒ දිස්ත්‍රික්කය පිළිබඳ වැටහීමක් තිබෙන්නේ එක එක මන්ත්‍රීවරුන්ට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම් ගරු සභාපතිතුමනි, ඉදිරිපත් කරන -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ ඒ වගන්තියම ඉවත් කරන්න ඕනෑ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, ඒ එක්කම අපි දකිනවා. අපට පුද්ගලිකව තනි තීරණ ගන්න බැහැ. මොකද, පෙත්සම් කාරක සභාවේදී අදාළ බලධාරීන්, නිලධාරීන් සේරම එතැනට කැඳවලා තමයි අපි තීන්දු තීරණ ගන්නේ. හැම පක්ෂයේම මන්ත්‍රීවරු ඉන්නවා. එතකොට දේශපාලන අධිකාරියට ඕනෑ විධියට තීන්දු කරන්න පුළුවන් ස්ථානයක් නොවෙයි, පෙත්සම් කාරක සභාව කියන්නේ. ඔබතුමා පැහැදිලිවම දන්නවා. පෙත්සම් කාරක සභාවේ ගරු සභාපතිතුමා විධියට. අපට පෞද්ගලික අවශ්‍යතාවයක් පිරිමහන්න පුළුවන් අවස්ථාවක් නොවෙයි එතැන. සෑම මන්ත්‍රීවරයෙකුම යථාර්ථය තේරුම් අරගෙන තීන්දු තීරණ ගන්න සභාවක් තමයි පෙත්සම් කාරක සභාව. මෙතෙක් කල් එහෙම ආත්මාර්ථකාමී විධියට තීන්දු තීරණ අරගෙන අපි කවදාවත් තීන්දු අරගෙන නැහැ. ඔබතුමා කියන එකට ගරු කරනවා. නමුත් ගරු ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා, අපි දකින විධියට මෙපමණ කල් කරපු පෙත්සම් විභාගයන්වලදී එහෙම අසාධාරණයක් සිද්ධ වෙලා නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

දැන් ඉස්සරහාට කොහොමත් වෙන්නේ නැහැ. කොට්ඨාශයකට ගියාට පස්සේ කොහොමත් වෙන්නේ නැහැ නේ?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

තව එක කාරණාවක් කියන්න මට අවසර දෙන්න. තවත් ප්‍රශ්නයක් මෙතැන මතු වෙනවා. අපි එතැනට යන්නේ නිකම් අධිකරණයකට යනවා වාගේ සාධාරණත්වය ඉල්ලා

ගෙන නේ? එතකොට නීතියේ පිළිගත්ත සිද්ධාන්තයක් තිබෙනවා. ඒකට එන දෙපාර්ශවයක් ඉන්නවා නේ? එක පාර්ශවයක් නොවෙයි නේ? අපට යුක්තිය ඉෂ්ට වෙනවා පමණක් නොව, යුක්තිය ඉෂ්ට වෙනවාය කියලා හැඟීමකුත් ඇති වෙන්න ඕනෑ. එතකොට ඔබතුමා X කියන මනුස්සයා වෙනුවෙන් පෙනී ඉඳලා පෙත්සමක් ඉදිරිපත් කරනවා නම්, ඒකේ විරුද්ධ පක්ෂයේ ඉන්න අය, ඊට අනික් පැත්තේ ඉන්න අයට හැඟීමක් එන්න පුළුවන් මෙතැන අර අනික් පැත්තත් එක්ක සම්බන්ධකමක් තිබෙන මන්ත්‍රීවරයාගේ මැදිහත් වීම හේතු කොට ගෙන මට අසාධාරණයක් වුණාය කියලා හිතා ගෙන මම ගෙදර යන්න පුළුවන්. ඒ කාරණාව සැලකිල්ලට ගන්න.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, කවදාවත් පෙත්සම ඉදිරිපත් කරන මන්ත්‍රීවරයා පෙත්සම් කාරක සභාවේ නැහැ. පෙත්සම ඉදිරිපත් කරන මන්ත්‍රීවරයා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. එහෙම නැහැ. අනික් එක මේකේ ඊළඟට පස්සේ වගන්තියක් තිබෙනවා. එහෙම ප්‍රශ්නයක් මතු වුණොත් කෙළින්ම සභාපතිතුමා ළඟට ඒ පෙත්සම ගන්නවාය කියලා. එතකොට එහෙම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ වගන්තිය සම්පූර්ණයෙන් අයින් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අයින් කරාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට රීති අංක 22(6) -

*"පෙත්සම්කරු ඉහත සඳහන් පරිදි සහනයක් ලබා ගැනීමට තමන් විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග ගැන පෙත්සමෙහි සඳහන් කර තිබිය යුතු ය. එකී සඳහනේ පෙත්සම්කරු අදාළ ගැටලුව විසඳා ගැනීම සඳහා සාධාරණ උත්සාහයක් දරා ඇති බව ගම්‍ය විය යුතු ය."*

ඒක 22(5) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (7) -*

*"පෙත්සම්කරු විසින් සිය පෙත්සම අත්සන් කර තිබිය යුතු ය."*

මෙය 22(6) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, ඒක ශ්‍රීනාත් මන්ත්‍රීතුමා දාලා තිබෙන්නේ ජෝර්ජ් ඉදියි කියලා. ප්‍රශ්නයක් නැහැ. නැත්නම් එයා විනය කමිටුවට යනවා නේ ජෝර්ජ් හිටියොත් එහෙම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22(8)*

*"පෙත්සමේ ඇති කරුණු සනාථ කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ යම් ලේඛන ඇත්නම් ඒවායේ සහතික කළ ඡායා පිටපත් එකී පෙත්සමට ඇමිණිය යුතු ය."*

මෙය 22(7) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22(9) -*

*"අධිකරණයක හෝ ඔම්බුඩ්ස්මන්වරයා හෝ සමථ මණ්ඩලයක හෝ වෙනත් කිසිදු යුක්තිය පසඳලීමේ ආයතනයක් ඉදිරියේ හෝ විභාග වෙමින් පවතින කාරණයක් සම්බන්ධයෙන් හෝ බේරුම්කරණය සඳහා දැනටමත් ඉදිරිපත් කර ඇති කාරණයක් සම්බන්ධයෙන් හෝ නොවන බවට පෙත්සම්කරු විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කළ යුතු ය."*

මෙය 22(8) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 22 (10) -

*"පෙත්සමකට අත්සන් කර ඇති පුද්ගලයා සඳහන් කර ඇති කාරණා සත්‍ය බවට එය ඉදිරිපත් කරන මන්ත්‍රීවරයා සෑහීමකට පත් විය යුතු ය."*

මෙය 22(9) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (11) -*

*"මන්ත්‍රීවරයකුට තමන් වෙනුවෙන්ම පෙත්සමක් පිළිගැන්විය නොහැක. එහෙත් වෙනත් මන්ත්‍රීවරයකුට එම පෙත්සම පිළිගැන්වීමට බාධා නොමැත."*

මෙය 22(10) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (12) -*

*"පළාත් සභාවට ඉදිරිපත් කිරීම පිණිස පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් මහජන පෙත්සම් භාර ගැනීමට පෙර ඉහත අවශ්‍යතා සම්පූර්ණ වී ඇති බව තහවුරු කරගත යුතු ය."*

මෙය 22(11) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (13) -*

*"පෙත්සම් කාරක සභාවට එම පෙත්සම් ගැන ක්‍රියා කිරීමට නොහැකි බව පෙනී යන්නේ නම්, සුදුසු කටයුතු කිරීම සඳහා ඒවා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස් වෙත ඉදිරිපත් කළ හැකි ය."*

මෙය 22(12) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (14) -*

*"පෙත්සමක් පිළිගන්වන මන්ත්‍රීවරයෙක් "ගරු සභාපතිතුමනි, ............. පදිංචි................ විසින්/හා තව .................... දෙනෙක් විසින් ඉදිරිපත් කරන පෙත්සම පිළිගන්වමි." යන්නට පමණක් සිය කථාව සීමා කළ යුතු වේ. මේ පිළිබඳ කිසිම විවාදයකට ඉඩ නොතැබිය යුතු ය."*

මෙය 22(13) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (15)(අ) -*

*"සභාවට පිළිගන්වන පෙත්සම්, මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු ය."*

මෙය 22(14) (අ) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 22 (15) (ආ) -*

*"අදාළ පෙත්සම මෙම රීතිවලට අනුකූලව ඉදිරිපත් කර නොමැති විටකදී එය ප්‍රතික්ෂේප වන අතර ඒ පිළිබඳව පෙත්සම ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය.*

මෙය 22(14) (ආ) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 22(16) -

*"එකම කාරණයක් පිළිබඳව පෙත්සමක් ඉදිරිපත් කළ හැක්කේ එක් වරක් පමණි."*

මෙය 22(15) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 22 (17) -

*"පෙත්සම් කාරක සභාව විසින් දෙන ලද නිර්දේශයන් ක්‍රියාත්මක නොවූ අවස්ථාවකදී, අදාළ පෙත්සම ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට හෝ ඔහු වෙනුවෙන් වෙනත් මන්ත්‍රීවරයෙකුට ඒ පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළ හැකි ය."*

මෙය 22(16) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 22(18) -

*"නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු සති 06 ක් ඇතුළත එය ක්‍රියාත්මක කර නොමැති විටකදී පෙත්සම් ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා පෙත්සම විභාග කළ අනුකාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයෙකුට එය ප්‍රමාද වීමට හේතු දක්වමින්, සභාවට ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභාවේ සභාපතිතුමාට ඉදිරිපත් කළ යුතු ය."*

මෙය 22(17) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 22(19) -

*"පෙත්සම් විභාග වන අවස්ථාවේදී පෙත්සම් විභාගයට පැමිණි වගඋත්තරකරුවෙකු හෝ පෙත්සම්කරුවෙකු විසින් පෙත්සම විභාග කරනු ලබන ගරු මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන් විරෝධය මතු කළහොත් අනුකාරක සභාව විසින් එම පෙත්සම විභාග කිරීම අත්හිටුවා, එකී විරෝධතාව*

*සභාපතිතුමා වෙත යොමු කළ යුතු ය. ගරු සභාපතිතුමා විසින් ඒ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් දෙන තුරු පෙත්සම විභාග නොකළ යුතු ය."*

මෙය 22(18) වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, 19 හි ප්‍රශ්නයක් තිබෙනවා. එතැන තිබෙන්නේ, පෙත්සම් විභාග කරන අවස්ථාවේදී පෙත්සම් විභාගයට පැමිණි වගඋත්තරකරු හෝ විත්තිකරු කියලා. හෝ පෙත්සම්කරුවෙකු කියලා එන්නත් ඕනෑ. ඒ ටික එකතු වෙන්න ඕනෑ. මොකද, පෙත්සම්කරුවාටත් ඒ ප්‍රශ්නය එන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

හෝ පෙත්සම්කරුවෙකු කියලා අපි -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේකේ සංශෝධනයක් එන්න ඕනෑ තැනකුත් තිබෙනවා ගරු සභාපතිතුමනි. මේ පෙත්සම්වල තීන්දු තීරණ දෙනවා නේ අපි. විශේෂයෙන්ම රාජ්‍ය ආයතනවලට, පළාත් පාලන ආයතනවලට තීන්දු තීරණ දුන්නාම යම්කිසි කාල සීමාවක් තීරණය කරනවා, මේ කාල සීමාවෙන් ඉස්සෙල්ලා මේකට විසඳුමක් ලබා දෙන්නය කියලා. නමුත් මේ පසුගිය කාල සීමාවේදී අපි දැකපු අත්දැකීම තමයි හුඟාක් අවස්ථාවලදී ඒ නියෝග ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නියෝග ක්‍රියාත්මක නොවුණොත්, මේ පෙත්සම් කාරක සභාවට තිබෙන බලය මොකක්ද කියන එක පිළිබඳව පොඩි ප්‍රශ්නයක් අපට තවම තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව මෙතැනට යමක් ඇතුළත් කළොත් හොඳයි. මම ඕනෑ නම් ඔබතුමාට උදාහරණත් එක්ක කියන්නම්. විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවලට යම් යම් නියෝග නිකුත් කළාම පසුගිය කාලයේ ඒවා සත පහකට ගණන් ගත්තේ නැහැ. එතකොට අපි මේ පෙත්සම් කාරක සභාවේ දෙන තීන්දුව ක්‍රියාත්මක නොවුණාම ගන්නා ක්‍රියාමාර්ගය පිළිබඳව මොනවා හරි මේකට ඇතුළත් විය යුතුමයි. ඒ පිළිබඳව සාකච්ඡා කරන්න වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඒකට සභා රීතියක් තිබෙනවා. මේකේ 17. 17 න් කියලා තිබෙන්නේ මෙතුමා කියන කාරණාව. පෙත්සම් කාරක සභාවක් විසින් දෙන ලද නිර්දේශයක් ක්‍රියාත්මක නොවූ අවස්ථාවකදී ඉහත පෙත්සම ඉදිරිපත් කළ මන්ත්‍රීවරයෙකුට හෝ ඔහු වෙනුවෙන් වෙනත් මන්ත්‍රීවරයෙකුට ඒ පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වරප්‍රසාද ප්‍රශ්නයක් විතරයි. වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමෙන් ඒක - නමුත් මොකක්ද ගන්න ක්‍රියාමාර්ගය කියලා නැහැ. එතැනින් එහාට. තමුන්නාන්සේ දන්නවා නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවසානයේ නීති ප්‍රශ්නයකට යන්න පුළුවන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මොකද, යම් මතයක් ගොඩ නැඟිලා තිබෙනවා. මේ පෙත්සම් කාරක සභාව බස්නාහිර පළාත් සභාවේ දෙන තීන්දු ක්‍රියාත්මක නොවුණාට, මේක අධිකරණයෙන් දෙන තීන්දුවක් නිසා එපමණ ගණන් ගන්න වුවමනා නැහැයි කියන මතය දැන් ප්‍රචාරය වෙලා තිබෙනවා. ඒ නිසයි මම ඔය කථාව කියන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, එකෙන් ගම්‍ය වෙනවා. දැන් වරප්‍රසාදයක් කඩ වෙලා කියලා මෙතැන තීරණය කරනවා නම්, ඊට පස්සේ සභාපතිතුමාට තිබෙනවා ඒ අනුව කටයුතු කරන්න. ඒක කියවෙන කාරණයක් නේ? මම හිතන්නේ කාරණයක් විධියට ඇතුළත් කළ යුතුද?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

සත පහකට ගණන් ගන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එසේ නම් සංශෝධන රීතිය වන්නේ,

*"පෙත්සම් විභාග වන අවස්ථාවේදී පෙත්සම් විභාගයට පැමිණි වගඋත්තරකරුවෙකු හෝ විත්තිකරුවෙකු හෝ පෙත්සම්කරුවකු විසින් පෙත්සම විභාග කරනු ලබන ගරු මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන් විරෝධය මතු කළහොත් අනුකාරක සභාව විසින් එම පෙත්සම විභාග කිරීම අත්හිටුවා, එකී විරෝධතාව සභාපතිතුමා වෙත යොමු කළ යුතු ය. ගරු සභාපතිතුමා විසින් ඒ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් දෙන තුරු පෙත්සම විභාග නොකළ යුතු ය."*

එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*වාචික පිළිතුරු හෝ ලිඛිත පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න.*

රීති අංක 23(1) -

*"යම් අමාත්‍යවරයෙකුගේ විෂයය පථය තුළ ඇති කාරණාවලට අදාළ ව ඕනෑ ම මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්න විමසීමට හැකි ය. එම ප්‍රශ්නවලට අදාළව වාචික ව පිළිතුරු ලබා දිය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක *23(2)*

*"ප්‍රශ්නයක නිසි අරමුණ විය යුත්තේ, එම ප්‍රශ්නය යොමු කෙරෙන අමාත්‍යවරයාගේ අධිකාරීත්වය යටතේ වන කරුණක් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා හෝ අවශ්‍ය ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා හෝ ඔහු පොළඹවාලීම ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 24(1) -

*"කල් ඇතිව ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයක් ලිඛිත ව සභා ලේකම්වරයා වෙත යොමු කළ යුතු ය. ලේකම්වරයා එය සභා කටයුතු කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 24(2) -

*"ප්‍රශ්නයක් ගැන දැනුම් දෙන මන්ත්‍රීවරයා එය ලිඛිත පිළිතුරක් අපේක්ෂිත ප්‍රශ්නයක් දැයි සඳහන් කර තිබිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 24(3) -

*"ලිඛිතව ප්‍රශ්නය ඉදිරිපත් කිරීමෙන් ඉක්බිති ව එළැඹෙන රැස්වීම් දින න්‍යාය පත්‍රයට එම ප්‍රශ්නය ඇතුළත් කළ යුතු ය. එසේ වුවද, එක් දිනකට ප්‍රශ්න 15 කට වඩා න්‍යාය පත්‍රයේ ඇතුළත් නොවිය යුතු ය. එක් දිනකට න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා ප්‍රශ්න 15 කට වැඩියෙන් ලැබී ඇති*

*අවස්ථාවලදී, ඒ වැඩිපුර ප්‍රශ්න ඊළඟ දින න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 25(1) -

*"ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුත්තේ ඒවා ලේකම් වෙත භාරදෙන අනුපිළිවෙළ අනුව ය. ලේකම් සෑම ප්‍රශ්නයකටම අංකයක් දිය යුතු ය. ප්‍රශ්නය න්‍යාය පත්‍රයේ ඇතුළත් විය යුත්තේ එකී අංකය ද සමඟ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 25(2) -

*"කල් ගන්නා ලද ප්‍රශ්නද ඇතුළුව එක් මන්ත්‍රීවරයෙකුගේ නමින් එක් දිනකට ප්‍රශ්න තුනකට වඩා න්‍යාය පත්‍රයට ඇතුළත් නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 26 -

*"යම් ප්‍රශ්නයක් රීතිවලට පටහැනි වන කල්හි හෝ ව්‍යාකූල වන බව පෙනෙන කල්හි හෝ එය සංශෝධනය කර එවන ලෙස අදාළ මන්ත්‍රීවරයාට දැනුම් දීමට හෝ එම ප්‍රශ්නය මුළුමණින්ම ප්‍රතික්ෂේප කිරීමට හෝ සභාපතිවරයාට හැකි විය යුතු ය. එවැනි අවස්ථාවලදී ඊට හේතු අදාළ මන්ත්‍රීවරයාට ලිඛිත ව දැනුම් දීම හෝ මන්ත්‍රීවරයාගේ වාරය පැමිණි විට වාචිකව දැනුම් දීම හෝ කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 27(1) -

*"ඕනෑම වාචික ප්‍රශ්නයකට දෙන ලද පිළිතුරක් සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අතුරු ප්‍රශ්න තුනකට නොවැඩි ගණනක් ඇසිය හැකිය. ප්‍රශ්නය යොමු කර ඇති මන්ත්‍රීවරයා එකී අතුරු ප්‍රශ්න නොඅසන්නේ නම්, වෙනත් මන්ත්‍රීවරයෙකුට එම අතුරු ප්‍රශ්න ඇසීමට පිළිවන. මුල් ප්‍රශ්න විෂය පථයට අදාළ නොවූ කරුණු අතුරු ප්‍රශ්නවලට ඇතුළත් නොවිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 27(2) -

*"අතුරු ප්‍රශ්නවලට දෙන පිළිතුරු ඇසුරින් අතුරු ප්‍රශ්න ඇසිය හැකි වුවද රීති අංක 27(1) හි විධිවිධානය යටතේ ඇසිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 27(3) -

*"අතුරු ප්‍රශ්න කෙටි ප්‍රශ්න ස්වරූපයෙන් විමසිය යුතුය."*

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අතුරු ප්‍රශ්න සම්බන්ධයෙන් මම යෝජනාවක් දුන්නා. 27(2) සම්බන්ධයෙන්. පිළිතුරු දෙන අවස්ථාවේදී කෙටියෙන් ප්‍රශ්න අහපුවාම ඊළඟ සභාවේදී උත්තර දෙනවාය කියලා වෙලාව ඉල්ලා ගන්නවා. කොහේවත් සඳහන් වෙන්නේ නැහැ. සභා න්‍යාය පත්‍රයට හරි මේක ඇතුළත් වෙන්න ඕනෑ. අතුරු ප්‍රශ්නවලට ලේඛන හරි පිළිතුරු හරි ඉදිරිපත් කරන්න පොරොන්දු වුණොත් එළඹෙන සභා වාරයේදී ඒක ඇතුළත් කරන්න ඕනෑ කොහේ හරි. නැත්නම් ඒක එහෙම්මම වැහිලාම යනවා. ප්‍රශ්නවලින් හැංගිලා යන්න අවස්ථාක් තිබෙනවා එතැන. ලබන සභා වාරයේ කියන්නම් කියලා එතැනින්ම ලිස්සනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතැනින්ම යට යනවා ඒක.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පසුගිය සභා වාරයේ අතුරු ප්‍රශ්න කියලා පොඩි ඉඩක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක 19(1)(ඌ) ලෙස ඇතුළත් කර තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 28(1)-

*"ප්‍රශ්නයකට ලිඛිත හෝ වාචික පිළිතුරක් ඉල්ලා ඇති කල්හි, සභා නිල (හැන්සාඩ්) වාර්තාවේ පළ කිරීම සඳහා එකී පිළිතුර සභා ලේකම් වෙත භාර දීමට ඒ පිළිතුරු දෙන අමාත්‍යවරයා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 28(2) -

*"ප්‍රශ්නයකට පිළිතුරු දෙන ලද දිනයේ නිල (හැන්සාඩ්) වාර්තාවෙහි එම ප්‍රශ්නය හා ඊට දෙන ලද පිළිතුර ද එම ප්‍රශ්නයේ අතුරු ප්‍රශ්න හා ඒවාට දෙන ලද පිළිතුරු ද ඇතුළත් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 28(3) (අ) -

*"ගරු මන්ත්‍රීවරයෙක් විසින් සභාවේදී අසනු ලබන ප්‍රශ්නයකට අසත්‍ය පිළිතුරු ලබා දුන් බව සභාවේදී අනාවරණය වූ විට ඊට අදාළ නිලධාරීන් සභා කටයුතු කාරක සභාවට කැඳවා විමසා බැලීමට හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 28(3) (ආ) -

*"ප්‍රශ්නයට ඉදිරිපත් කරන ලද පිළිතුරු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරයා සෑහීමකට පත් නොවන්නේ නම්, එම මන්ත්‍රීවරයාට එය සභා කටයුතු කාරක සභාවෙන්, සභාවට ලිඛිත ව යොමු කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 28(3) (ඇ) -

*"ඒ සම්බන්ධයෙන් සභා කටයුතු කාරක සභාවට සෑහීමකට පත් විය නොහැකි පිළිතුරක් බව හැඟී යන්නේ නම්, එකී මන්ත්‍රීවරයාට ඒ පිළිබඳව පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ ප්‍රමුඛතාව ලබා දී ඒ පිළිබඳව ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දිය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 28(3) (ඇ) -

*"එවන් අවස්ථාවකදී සභා කටයුතු කාරක සභාව තීරණය කරන්නේ නම් පමණක්, අදාළ ගැටලුව ගරු ආණ්ඩුකාරවරයාට යොමු කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න ඇසීමේ අයිතිය තුළ සීමා.

රීති අංක 29 -

*"ප්‍රශ්න ඇසීමේ අයිතිය පහත සඳහන් සීමාවන්ට යටත් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29 (1) -

*"එක් ප්‍රශ්නයක් වචන 150 කට නොවැඩි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(2) -

*"ප්‍රශ්නයක්, විෂයයන් එකකට වැඩි ගණනකට යොමු නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(3) -

*"ප්‍රශ්නයක් පැහැදිලි කරලීම පිණිස අනිවාර්යයෙන් අවශ්‍ය වන නමක් හැරෙන්නට, වෙනත් නමක් හෝ ප්‍රකාශයක් ප්‍රශ්නයේ පළ නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(4) -

*"ප්‍රශ්නයක ප්‍රකාශයක් ඇතුළත් වේ නම්, එහි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රශ්නය අසන මන්ත්‍රීවරයා වගකීම භාරගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(5) -

*"තර්කයක්, අනුමානයෙන් බැසගත් තීරණයක්, ආරෝපිත චෝදනාවක්, අනවශ්‍ය විස්තර දක්වන පදයක් හෝ අවඥා සහගත පදයක් හෝ ප්‍රශ්නයකට ඇතුළත් නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(6) -

*"කාරක සභා වාර්තාවක් මගින් සභාව වෙත ඉදිරිපත් කර නොමැති සභාවේ කාරක සභාවක වැඩ කටයුතු සම්බන්ධයෙන් කිසිදු ප්‍රශ්න විමසීමක් නොකළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(7) -

*"අධිකරණයක විනිශ්චයකට භාජනය වෙමින් පවතින කරුණක් ගැන හෝ දීමට නියමිත අධිකරණ තීරණයකට විෂයය වන කරුණක් ගැන හෝ ප්‍රශ්නයක සඳහන් නොවිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(8) -

*"නෛතික කරුණක් සම්බන්ධයෙන් හෝ වෙනත් මත ප්‍රකාශයක් සම්බන්ධයෙන් හෝ ඉල්ලුම් කරන ප්‍රශ්න විමසීමක් නොකළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(9) -

*"යම් පුද්ගලයකුගේ නිල හෝ රාජකාරී තත්ත්වය සම්බන්ධයෙන් විනා ඔහුගේ පැවැත්ම සම්බන්ධව ප්‍රශ්න විමසීමක් නොකළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(10) -

*"ජනාධිපතිගේ හෝ ආණ්ඩුකාරවරයකුගේ හෝ විනිශ්චයකාරවරයකුගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රශ්න විමසීමක් නොකළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(11) -

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ පළාත් සභා පනතින් හෝ නියම කර ඇති ප්‍රමාණයට ආණ්ඩුකාරවරයකු විසින් තම කාර්යයන් සපුරාලීම කෙරෙහි බලපාන කිසියම් කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්න විමසීමක් නොකළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29 (12) (1) -

*"සම්පූර්ණ පිළිතුරු සපයා ඇති ප්‍රශ්නයක් එම ආකාරයෙන්ම හෝ වෙනත් ආකාරයකින් හෝ අවුරුද්දක් තුළ දී හෝ යළිත් නොවිමසිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29 (12) (2) -

*"එසේ වුවද, එකම ආකාරයේ ප්‍රශ්නයක් යම් මන්ත්‍රීවරයෙකු ඉදිරිපත් කරන්නේ නම් එම ප්‍රශ්නය කාලීන වශයෙන් වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් යැයි සභා කටයුතු කාරක සභාවට පෙනී යන්නේ නම් සභාපතිවරයාගේ එකඟතාවය මත න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 29(13) -

*"ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට ප්‍රථම ඉදිරිපත් කරන මන්ත්‍රීවරයා විසින් එම ප්‍රශ්නය සම්බන්ධයෙන්, එකී ප්‍රශ්නය අදාළ වන රාජ්‍ය ආයතනවලින් හා පළාත් සභා ආයතනවලින් ඒ සඳහා පිළිතුරු ලබා ගැනීමට සාධාරණ උත්සාහයක් දරා තිබෙන බවට සහතික කළ යුතුය."*

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා. සම්පූර්ණයෙන් ඒ කොටස නම් ඉවත් කරන්න ඕනෑ. මේකේ තිබෙන්නේ, "*ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට ප්‍රථම ඉදිරිපත් කරන මන්ත්‍රීවරයා විසින් එම ප්‍රශ්නය සම්බන්ධයෙන් එකී ප්‍රශ්නය අදාළ වන රාජ්‍ය ආයතනවලින් හා පළාත් සභා ආයතනවලින් ඒ සඳහා පිළිතුරු ලබා ගැනීමට සාධාරණ උත්සාහයක් දරා තිබෙන බවට සහතික කළ යුතුය*" කියලා. එතකොට අපට ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමේදී ලිපි ලේඛනත් අමුණන්න වෙනවා. මේක අපි කොහොමද උත්සාහ කළේ කියලා. ඇත්තටම මන්ත්‍රීවරයෙකුගේ ප්‍රශ්න අහන්න තිබෙන වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් මේකේදී වෙන්නේ. මේක සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක අයින් කරන්න ඕනෑ කියන තැන මමත් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, කාලය දික් කිරීමක් කරලා දෙන්න.

# රීති අංක 09 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 09

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, "*මෙම සභාවේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කළ යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක අයින් කරමු නේද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක අයින් කරන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක අයින් කරමු. ඒක අවශ්‍ය නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ප්‍රශ්න ඇසීම හා පිළිතුරු දීම.

රීති අංක 30 (1) -

*"ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට නියමිත මන්ත්‍රීවරයාගේ නම සභාපතිවරයා විසින් කැඳවන ලද විට එම මන්ත්‍රීවරයා සිය අසුනින් නැඟී සිට එම ප්‍රශ්නයේ අංකය සඳහන් කර "............ (මන්ත්‍රීවරයාගේ නම) ........... නමින් යුතු ප්‍රශ්නය .......... (ඇමතිවරයාගේ නම) ........... අමාත්‍යවරයා වෙත යොමු කරනවා" යැයි ප්‍රකාශ කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 30(2) -

*"ප්‍රශ්නය ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා නොපැමිණ සිටින්නේ නම්, එකී මන්ත්‍රීවරයා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු නම් ආණ්ඩු පක්ෂයේ සංවිධායකටද, එකී මන්ත්‍රීවරයා විපක්ෂයේ මන්ත්‍රීවරයකු නම් විපක්ෂයේ සංවිධායකටද, එකී මන්ත්‍රීවරයාගේ කැමැත්ත ලබාගෙන එම ප්‍රශ්නය ඉදිරිපත් කළ හැකි ය".*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 30(3) -

*"යම් අමාත්‍යවරයකු විසින් පිළිතුරු දිය යුතු ප්‍රශ්නයකට ඒ අමාත්‍යවරයා නොපැමිණ ඇති කල්හි අදාළ මන්ත්‍රීවරයා එකඟ වේ නම්, වෙනත් අමාත්‍යවරයෙකුට ඒ සඳහා පිළිතුරු සැපයිය හැකි ය. එවන් අවස්ථාවකදී එකී මන්ත්‍රීවරයා විසින් අතුරු ප්‍රශ්න අසන්නේ නම්, එකී අතුරු ප්‍රශ්න එළැඹෙන සභා වාරයේදී යළිත් ඇසිය හැකි වන අතර අදාළ විෂයය භාර අමාත්‍යවරයා විසින් ඒවාට පිළිතුරු සැපයිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 30(4) -

*"ප්‍රශ්නයකට පිළිතුරක් ඉදිරිපත් කරන අවස්ථාවේදී එකී ප්‍රශ්නය සම්බන්ධව පැහැදිලි කිරීමක් හෝ විවාදයක් නොතිබිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 30(5) -

*"න්‍යාය පත්‍රයේ සඳහන් ප්‍රශ්නයකට පිළිතුරක් සූදානම් නැති කල්හි අදාළ අමාත්‍යවරයා හෝ ඔහු වෙනුවෙන් වෙනත් අමාත්‍යවරයකු හෝ ඒ සඳහා පිළිතුරු දීමට කල් ඉල්ලා සිටිය යුතු ය. කල් ඉල්ලීම් එක් වරකට දෙමාසයක කාලයක නොඉක්මවිය යුතු ය. එසේ වුවද, වරින් වර කල් ඉල්ලීමේදී, කල් ඉල්ලිය හැකි උපරිම කාලය මාස 03 කට සීමා විය යුතු ය."*

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඒකට එකතු කරන්න තිබෙනවා. නොවැළැක්විය හැකි හේතුවක් නිසා කියලා. නොවැළැක්විය හැකි හේතුවක් නිසා ඒ අමාත්‍යවරයා නොපැමිණ ඇති කල්හි අදාළ මන්ත්‍රීවරයා එකඟ වේ නම් වෙනත් අමාත්‍යවරයෙකුට ඒ සඳහා පිළිතුරු සැපයිය හැකිය.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 30 (6) (අ) -

*"න්‍යාය පත්‍රයේ සඳහන් ප්‍රශ්නයකට පිළිතුරක් සූදානම් නැති කල්හි අදාළ අමාත්‍යවරයා හෝ ඔහු වෙනුවෙන් වෙනත් අමාත්‍යවරයකු හෝ ඒ සඳහා පිළිතුරු දීමට කල් ඉල්ලා සිටිය යුතු ය. කල් ඉල්ලීම් එක් වරකට දෙමාසයක කාලයක නොඉක්මවිය යුතු ය. එසේ වුවද, වරින් වර කල් ඉල්ලීමේදී, කල් ඉල්ලිය හැකි උපරිම කාලය මාස 03 කට සීමා විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 30 (6) (ආ) -

*"එසේ සභාගත කරන ලද පිළිතුරක් සම්බන්ධව අතුරු ප්‍රශ්න ඇසීමට ප්‍රශ්නය ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට අවශ්‍ය නම්, රීති අංක 30(3) හි විධිවිධානය යටතේ හෝ පිළිතුර සභාගත කළ දින සිට මසක් ඇතුළත හෝ එය අදාළ අමාත්‍යවරයාගෙන් ලිඛිත ව විමසිය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 30 (6) (ඇ) -

*"ඕනෑම වාචික ප්‍රශ්නයකට දෙන ලද පිළිතුරක් සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අතුරු ප්‍රශ්න තුනකට නොවැඩි ගණනක් ඇසිය හැකි ය. ප්‍රශ්නය යොමු කර ඇති මන්ත්‍රීවරයා එකී අතුරු ප්‍රශ්න නොඅසන්නේ නම්, වෙනත් මන්ත්‍රීවරයෙකුට එම අතුරු ප්‍රශ්න ඇසීමට පිළිවන. මුල් ප්‍රශ්නයේ විෂයය පථයට අදාළ නොවූ කරුණු අතුරු ප්‍රශ්නවලට ඇතුළත් නොවිය යුතු අතර අතුරු ප්‍රශ්න සඳහා නැවත අතුරු ප්‍රශ්න ඇසිය නොහැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 30(7) -

*"අදාළ මන්ත්‍රීවරයාට ලබා දීම සඳහා ප්‍රශ්නවලට ඉදිරිපත් කරන ලද පිළිතුරේ පිටපතක් සභා රැස්වීම් දිනට පෙර හෝ සභා රැස්වීම් දින පෙ.ව. 9.00 ට පෙර සභා ලේකම්වරයාට ලබා දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කියපු සංශෝධනය පිළිගන්නවාද? මොකද, නොවැළැක්විය හැකි හේතුවක් කියන එක සභා රීතියකට එතරම් ගැලපෙනවාද කියන ප්‍රශ්නය මට තිබෙනවා. මොකද, වැළැක්විය හැකි හේතුවකටත් නැවිදින් ඉන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. දැන් මේ රීතිය සම්මත කළොත් එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. අමාත්‍යවරයෙකු මේකට උත්තර දෙන්න ආවේ නැත්නම් අමාත්‍යවරයෙකුට ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මේ රීතියට අනුකූලව එයාට මේකට එන්නේ නැතිව ඉන්න පුළුවන්. ඒ නිසා මෙතැන නොවැළැක්විය හැකි හේතුවක් නිසා කියලා දැම්මොත් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම සාධාරණ ප්‍රශ්නයක් නිසා ආවේ නැත්නම් මිසක් අනිවාර්යයෙන්ම මේ සභාවට එන්න ඕනෑ, ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ කියන්නේ. අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ නේ අනික් ඇමතිවරුන්ට.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ආපහු අහන්න පුළුවන්. එකී අතුරු ප්‍රශ්න එළඹෙන සභා වාරයේදී යළිත් ඇසිය හැකි වන අතර, අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් ඒවාට පිළිතුරු සැපයිය යුතුය. ඒ අවස්ථාව මේකේ යට තිබෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, ගොඩක් සාකච්ඡා කරලා, මහන්සි වෙලා තමයි මේ රීති සංශෝධනය ගෙනාවේ. මන්ත්‍රීවරයෙකු අදහසක් ප්‍රකාශ කළ පමණින්ම එය ඉවත් කරන්න කටයුතු කරන්න එපා. යම්කිසි තර්කයකට ඇවිත්, මොකක්ද ඒකේ අභ්‍යන්තරයට ගොනු වෙලා තිබෙන්නේ කියලා බලලා ඒ රීතිය වෙනස් කරන්න උත්සාහ කරන්න. නැත්නම් කෙනෙකු කියපු සැනින් ආ ඒක අපි අයින් කරමු කිව්වොත් ගත්ත උත්සාහය, ඔබතුමා ඇතුළු මේ කණ්ඩායම ගත්ත උත්සාහය නිකම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාවක් තිබෙනවා අදහස් දක්වන්න. එතුමාට වාගේම ඔබතුමාටත් තිබෙනවා. එතුමාටත් තිබෙනවා. අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අනික් එක එකතු කිරීමක් මේ කරන්නේ. අයින් කිරීමක් නොවෙයි. මේකට එකතු කිරීමක් කරන එකක් තිබෙන්නේ. පාර්ලිමේන්තුවේ එකේ පවා දාලා තිබෙනවා ඒක.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙහෙම දෙයක් තිබෙනවා. වගකීමෙන් කටයුතු කරනවා නේ? සාමාන්‍යයෙන් තමන්ගේ ප්‍රශ්නයට උත්තර දෙනවා. බැරි වෙලාවට කාට හරි දෙන්නේ. ඇමතිවරු සාමාන්‍යයෙන් මග අරින්නෙත් නැහැ නේ? උත්තරයක් දෙනවා නේ? ඒ නිසා අපි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි රැස් වුණෙත් ඒකටයි. මොකද, අදහස් අරගෙන රීති සංශෝධනය කරන්න තමයි අපි රැස් වුණේ. එතුමා සංශෝධන ඉදිරිපත් කරනවා. කවුරුත් අදහස් ඉදිරිපත් කරන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒකත් එක්ක මරාගෙන මැරෙන්න මට ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ආණ්ඩු පක්ෂයේ කවුරුවත් නැහැ. රීති කාරක සභාවේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඇයි අපි ඉන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉන්නවා. හැබැයි, කාරක සභාව නියෝජනය කළ අය නැහැ. කියන්න එපැයි.

*කල් තැබීමේ යෝජනා යටතේ අසනු ලබන ප්‍රශ්න.*

රීති අංක 31(1) (අ)

*"14(6) රීතිය යටතේ සභාව කල් තබන අවස්ථාවේදී යම් අමාත්‍යවරයකුගේ විෂය පථය යටතේ ඇති කාරණයකට අදාළව පොදු වැදගත්කමකින් යුත් හදිසි කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්න විමසීමට ඕනෑම මන්ත්‍රීවරයෙකුට පුළුවන."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් රීති අංක 31 (ආ) -

*"එවැනි ප්‍රශ්න විමසීමේ අයිතිය පහත සඳහන් රීතීන්ට යටත් විය යුතු ය.*

*(i) පොදු වැදගත්කමකින් යුත් 29 වන රීතිය යටතේ ඉඩ ලැබෙන කරුණක් සම්බන්ධයෙන් වන ප්‍රශ්න පමණක් විමසීමට අවසර ලැබේ.*

*(ii) ප්‍රශ්න සංක්ෂිප්ත මෙන්ම නිවැරදි විය යුතු ය.*

*(iii) ප්‍රශ්න විවාදයට ලක් නොවිය යුතු ය.*

*(iv) අදාළ දින පෙ.ව. 10.00 ට ප්‍රථම පිටපතක් සහිතව සෑම ප්‍රශ්නයක්ම සභා ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු ය. පෙරවරු 10.00 න් පසු ඉදිරිපත් කරනු ලබන හෝ මෙම රීතිවලට පටහැනි ප්‍රශ්න තම අභිමතය පරිදි සභාපතිවරයාට ප්‍රතික්ෂේප කළ හැකි ය.*

*(v) තමන් වෙත යොමු කරන ප්‍රශ්නයකට අමාත්‍යවරයාට එදින හෝ සභාපතිවරයාගේ අවසරය පරිදි ඊළඟ රැස්වීම් දිනයේදී හෝ පිළිතුරු දිය හැකි ය. ඒ සඳහා එකී ප්‍රශ්නය ඊළඟ රැස්වීම් දිනයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.*

*(vi) කිසියම් පිළිතුරක් සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න තුනකට නොවැඩි ගණනක් විමසීමට සභාපතිවරයාගේ පූර්ණ අභිමතය පරිදි ඉඩ දිය හැකි ය."*

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම (v) ට සංශෝධනයක් දීලා තිබෙනවා. "තමන් වෙත යොමු කරන ප්‍රශ්නයකට අමාත්‍යවරයාට කියන තැනින් 'ට' ඉවත් කරලා එකතු කරන්නය කියලා. *"පිළිතුරු දීමට උත්සාහ ගත යුතුය. නොහැක්කේ නම්"* කියලා. මොකද, විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අපි අත් විඳින එකක් තමයි හදිසි ප්‍රශ්නයක් යොමු කළාට පස්සේ, ඒ හදිසි ප්‍රශ්නය සාමාන්‍ය ප්‍රශ්නයක් විධියට තමයි ඇමතිවරු ගන්නේ. අනික් දවසේ උත්තර දෙන්නම් කියලා. ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගැන අදහස් තිබෙනවාද ඔබතුමන්ලාගේ. ශ්‍රීනාත් මන්ත්‍රීතුමා, මොකක් හරි අදහසක් ප්‍රකාශ කරනවාද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පිළිතුරු දෙන්නත් පුළුවන්. නැත්නම් න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නත් පුළුවන්. ඒක එහෙම්මම යමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

(v) සංශෝධනය වෙනවා. එනම්,

*"තමන් වෙත යොමු කරන ප්‍රශ්නයකට අමාත්‍යවරයා පිළිතුරු දීමට උත්සාහ කළ යුතු ය. නොඑසේ නම් අමාත්‍යවරයාට එදින හෝ සභාපතිවරයාගේ අවසරය පරිදි ඊළඟ රැස්වීම් දිනයේදී හෝ පිළිතුරු දිය හැකි ය. ඒ සඳහා එකී ප්‍රශ්නය ඊළඟ රැස්වීම් දිනයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 31(1) (ඇ) -

*"අදාළ අමාත්‍යවරයා හෝ අමාත්‍යවරුන් හෝ නොපැමිණ සිටින කල්හි එම ප්‍රශ්න වෙනත් අමාත්‍යවරයකු වෙත හෝ සභානායකවරයා වෙත හෝ යොමු කිරීමට සභා ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය. එවන් අවස්ථාවකදී එකී අමාත්‍යවරයා හෝ සභානායකවරයා විසින් එම ප්‍රශ්න ඊළඟ රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභාවේදී යෝජනා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*රීති අංක 31(1) (ඇ) -*

i. *ප්‍රශ්නයක් අසනු ලබන දිනයේ දී ඊට පිළිතුරු දීමට අදාළ අමාත්‍යවරයා අපොහොසත් වෙන්නේ නම්, ඊළඟ රැස්වීම් දිනයේ දී පිළිතුරු දෙන බව කල් තැබීමේ අවස්ථාවේදී ප්‍රශ්නය යොමු කළ විට ප්‍රකාශ කළ යුතු ය. පිළිතුරු දීමට කල් ගන්නා ලද ප්‍රශ්නයක් ඊළඟට පැවැත්වෙන සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභා ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය.*

ii. *රීතිවලට අනුකූල නොවන ප්‍රශ්නයක් ප්‍රතික්ෂේප කිරීමට හෝ රීතිවලට අනුකූල වන සේ සංශෝධනය කිරීමට හෝ සභාපතිවරයාට හැකි විය යුතු ය.*

iii. *අසන ලද ප්‍රශ්නයත් ඊට දෙන පිළිතුරත් අදාළ දින නිල (හැන්සාඩ්) වාර්තාවෙහි ඇතුළත් විය යුතු ය.*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කල් තැබීමේ යෝජනාව යටතේ කරන යෝජනා.

රීති අංක 31(2) (අ) -

*"සභාව කල් තබන අවස්ථාවේදී හදිසි පොදු වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට කිනම් මන්ත්‍රීවරයෙකුට වුවද හැකි විය යුතු ය. සභාව කල් තබන අවස්ථාවේදී පිළිතුරු දීමට ප්‍රශ්න වෙතොත්, ඒවාට පසුව යෝජනාව ඉදිරිපත් කළ යුතු වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 31(2) ආ -

*"අදාළ යෝජනාව විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ නම් අදාළ විපක්ෂ කණ්ඩායම් නායකයාගේත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ නම් සභානායකවරයාගේත් අත්සන සහිතව එදින පෙරවරු 10.00 ට පෙර එය ඉහත සඳහන් ධූර දරන මන්ත්‍රීවරයා විසින් ලේකම්වරයාට භාර දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 31(2) (ඇ) -

*"ඒ සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ලේකම්වරයා විසින් යෝජනාව අදාළ අමාත්‍යවරයාට දැනුම් දිය යුතු ය. මේ සම්බන්ධයෙන් සභාපතිවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 31(2) (ඈ) -

*"සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ පසු අදාළ මන්ත්‍රීවරයා කරුණු පැහැදිලි කරමින් යෝජනාව ඉදිරිපත් කළ යුතු අතර, වෙනත් මන්ත්‍රීවරයෙකු විසින් එය ස්ථිර කළ යුතු වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 31(2) (ඉ) -

*"මේ සඳහා වෙන් කර ඇති කාලය ආණ්ඩු පක්ෂයට සහ විරුද්ධ පක්ෂයට සමව බෙදා දෙනු ලබන අතර, පිළිතුරු සැපයීම සඳහා නියමිත අමාත්‍යවරයාට ආණ්ඩු පක්ෂයේ කාලයෙන් ප්‍රමාණවත් කාලයක් වෙන් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 31(2) (ඊ) -

*"මෙවැනි යෝජනාවක් සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් සිදු නොවේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 31(2) (උ) -

*"කිසියම් දිනයකදී සාකච්ඡාවට ගනු ලබන්නේ, එක් යෝජනාවක් පමණි."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 31(2) (ඌ) -

*"නියමිත කාලයේදී අදාළ මන්ත්‍රීවරයා විසින් යෝජනාව ඉදිරිපත් නොකළ හොත්, එය අහෝසි වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 32 -

*"අදාළ දින න්‍යාය පත්‍රයේ පළ කර ඇති කිසිදු කරුණක් සම්බන්ධව 31 රීතිය යටතේ ප්‍රශ්න හෝ යෝජනා ඉදිරිපත් නොකළ යුතු ය.*

*එසේ වුවද, අදාළ දින න්‍යාය පත්‍රයේ පළ කර තිබුණු කරුණක් සම්බන්ධව වුවද, එදින සාකච්ඡාවට නොගන්නේ නම් 31 රීතිය යටතේ ප්‍රශ්න හෝ යෝජනා ඉදිරිපත් කළ හැකි ය.*

*කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කළ හැකි වනුයේ එක් යෝජනාවක් සහ ප්‍රශ්න දෙකක් පමණි."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*ශෝක ප්‍රකාශ.*

රීති අංක 33 (1) -

*"ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කළ හැක්කේ පහත සඳහන් අයවලුන්ගේ අභාවයන් වෙනුවෙනි."*

*(අ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා හෝ හිටපු රාජ්‍ය නායකයෙක්,*

*(ආ) අග්‍රාමාත්‍යවරයා හෝ හිටපු අග්‍රාමාත්‍යවරයෙක්*

*(ඇ) බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා හෝ බස්නාහිර පළාතේ හිටපු ආණ්ඩුකාරවරයෙක්*

*(ඇ) බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හෝ එම පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්,"*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 33(2) -

*"අභාවප්‍රාප්ත වූ පුද්ගලයා සම්බන්ධ ගුණකථනවලට පමණක් ශෝක ප්‍රකාශ යෝජනාවක් යටතේ කෙරෙන කථා සීමා විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 33(3) -

*"කථාවල අඩංගු විය හැකි විවේචන හා අනුචිත කොටස් ඉවත් කිරීමට සභාපතිවරයාට හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක *33 (4)* - *ශෝක ප්‍රකාශ යන්නේ.*

*"ශෝක ප්‍රකාශ යෝජනාවක් යටතේ පවත්වන ලද කථාවල වාර්තාවක් අභාවප්‍රාප්ත වූ අයගේ කිට්ටුම ඥාතිවරයාට යැවීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 33(5) -

*"ශෝක ප්‍රකාශ යෝජනාවක් න්‍යාය පත්‍රයට ඇතුළත්ව ඇති විට එය එදිනම අවසන් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 33(6) -

*"දැනට පළාත් සභාවේ සිටින මන්ත්‍රීවරයකු මිය ගිය විට, හැකි ඉක්මණින් ශෝක යෝජනාව සභාවට ගෙන ආ යුතු අතර, හිටපු ගරු මන්ත්‍රීවරයෙකු පිළිබඳ ශෝක යෝජනාව ද නොපමාව සභාවට ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නොපැමිණ සිටීමේ අවසරය.

රීති අංක 34(1) -

*"කිසියම් මන්ත්‍රීවරයකුට සාධාරණ හේතූන් මත සභා රැස්වීම්වලට සහභාගි වීමට නොහැකි වන අවස්ථාවකදී, තමා විසින් ම හෝ වෙනත් මන්ත්‍රීවරයකු විසින් සභාපතිතුමාගෙන් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් හෝ ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මගින් හෝ නොපැමිණ සිටීමේ අවසරය ලබාගත හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 34(2) -

*"එවන් යෝජනාවක් මන්ත්‍රීවරයා තමා ම ඉදිරිපත් නොකරන අවස්ථාවක,විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු නම් විපක්ෂයේ වෙනත් මන්ත්‍රීවරයකු විසින් ද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නම් ආණ්ඩු පක්ෂයේ වෙනත් මන්ත්‍රීවරයකු විසින්ද කළ යුතු වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 34(3) -

*"කිසියම් මන්ත්‍රීවරයකු සභාවේ අවසරය නොලබා දින 90 කට හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩව සභා රැස්වීම්වලට සහභාගි නොවූවහොත් ඔහුගේ මන්ත්‍රී ධුරය අහෝසි වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අමාත්‍යාංශ නිවේදන හා අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ.

රීති අංක 35(1) -

*"අමාත්‍යවරයකුට ස්වකීය විෂයය පථයට අදාළව සභාව දැනුවත් කළ යුතු යැයි හැඟෙන කරුණු සම්බන්ධයෙන් නිවේදන ඉදිරිපත් කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 35(2) -

*"අමාත්‍යවරයෙකු ස්වකීය අමාත්‍යාංශයේ විෂයය පථයට අයත් කරුණු සම්බන්ධයෙන් හෝ ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමේ දී උද්ගත වූ කරුණක් සම්බන්ධයෙන් හෝ සභාවේ මතු වූ වෙනත් කරුණක් සම්බන්ධයෙන් හෝ කරුණු පැහැදිලි කිරීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව ප්‍රකාශයක් කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 35(3) -

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ පළාත් සභා විෂය පථයට අයත් වූ එහෙත් අමාත්‍යවරයෙකුට පවරා නැති විෂයයකට අදාළ කරුණක් සම්බන්ධයෙන් ඉහත (1) සහ (2) උප ඡේදයන්ට යටත්ව ප්‍රකාශයක් කිරීමට ප්‍රධාන අමාත්‍යවරයාට අවකාශ තිබිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 35(4) -

*"ඉහත (1) හා (2) යටතේ ප්‍රකාශයක් පුද්ගලයකුගේ පෞද්ගලික හැසිරීම විවේචනය කිරීම සඳහා යොදා නොගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 35(5) -

*"මේ යටතේ කරනු ලබන ප්‍රකාශයක අඩංගු කරුණු පිළිබඳව වෙනත් මන්ත්‍රීවරයෙකුට කථා කිරීමට හෝ එවැනි ප්‍රකාශයක අඩංගු කරුණු එම අවස්ථාවේදී විවාදයට ලක් කිරීමට හෝ අවස්ථාව නොමැත්තේ ය.*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 35(6) –

*ගරු අමාත්‍යවරයෙකුගේ ප්‍රකාශය හුදෙක් අමාත්‍යාංශ විෂය පථයට අදාළ එකක් විය යුතු අතර එය මන්ත්‍රීවරයෙකු අගතියට පත්වන ප්‍රකාශයක් නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික ප්‍රකාශ කිරීම්.

රීති අංක 36(1) -

*"කාලීන වැදගත්කමකින් යුත් පෞද්ගලික ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මන්ත්‍රීවරයෙකු විසින් සිය ප්‍රකාශය තම ලිපි ශීර්ෂයක සවිස්තරාත්මකව ලියා සභා රැස්වීමට පෙර දින ප.ව. 04.15 ට පෙර සභාපතිතුමාට හෝ සභා ලේකම්වරයාට ලැබීමට සැලැස්විය යුතු ය."*

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, 36(1) ට මම සංශෝධනයක් දීලා තිබෙනවා. නමුත් මෙතුමා කියනවා ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒක වැඩ කරන දිනය තමයි අවසාන දිනය කියලා ගැනෙන්නේ කියලා. එහෙම නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මම කිව්වේ, දැන් සාමාන්‍ය අර්ථ නිරූපනයේදී පෙර දිනය කියලා කිව්වාම පෙර දිනය කියලා කියන්නේ වැඩ කරන දිනයක්. එතකොට ඊට ඉස්සෙල්ලා දවස ප්‍රසිද්ධ නිවාඩු දවසක් නම් පෙර දිනය විය යුත්තේ මම හිතනවා, ඊට ඉස්සරින් -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මම මේකේදී ඉල්ලා සිටිනවා. අර උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කියපු වැදගත් සංශෝධනය සැලකිල්ලට ගන්නය කියලා. මේකේ කියන්නේ, කාලීන වැදගත්කමකින් යුත් පෞද්ගලික ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මන්ත්‍රීවරයා විසින් තම ප්‍රකාශය සවිස්තරව ලියා සභා රැස්වීමට පෙර දින දෙන්නය කියලා. ඉතින් මේක බරපතළ ප්‍රශ්නයක්. සභා රැස්වීමට පෙර දවසේ දෙනවාය කියන්නේ කලින් ලියන්න ඕනෑ. කලින් එවන්න ඕනෑ. නැත්නම් කලින් ගෙනැල්ලා භාර දෙන්න ඕනෑ. කළුතර කෙනත් කලින් දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ෆැක්ස් කරන්න පුළුවන් නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔව්. ෆැක්ස් කරන්න පුළුවන්. හැබැයි, දැන් ඒ දෙකම කරන්න බැරි වුණොත්, පහුවැනිදා උදේට ඇවිල්ලා හදිසි ප්‍රකාශයක් - රෑ වුණු එකක් නම් සිද්ධිය පහුවැනිදාට දෙන්න තිබෙන අයිතිය මන්ත්‍රීවරයෙකුට තිබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පාර්ලිමේන්තු සම්ප්‍රදාය තමයි මෙතැනට අපි ගත්තේ. පාර්ලිමේන්තුවේ එහෙමයි. කලින් දවසේ දෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හතර දෙනාටයි දෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔව්. හතර දෙනාටයි දෙන්නේ ඉතින්. පහුවදා ආවොත් මන්ත්‍රීවරයෙකුට දා ගන්න තිබෙන ඉඩකඩ ඇහිරෙනවා මේ කාරණාව නිසා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. කණ්ඩායම් රැස්වීමට ඇවිල්ලා කණ්ඩායම් රැස්වීම තීරණය කරලා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔව්. ඉතින් ඒ සියලු කාරණා මග ඇරිලා ප්‍රශ්නයක් මතු වුණොත් කොහොමද ඒක දෙන්නේ කියන කාරණාව මතු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කණ්ඩායම් රැස්වීමට එන්නෙත් නැහැ. උදේ ඇවිල්ලා මොකක් හරි ලියලා දෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් කරන්නෙත් එහෙම නේද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නැහැ. දැන් පහුවදා උදේට දෙන්න පුළුවන් නේ? ප්‍රශ්නයක් රාත්‍රියේ මතු වුණොත් කොහොමද ඒක කරන්නේ? දීගන්න බැරි වුණොත්. හදිසියේ මතු වුණොත් කොහොමද කරන්නේ. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මතු කළේ ඒක. ඇත්තටම උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා සිරගත වෙලා හිටියේ. එතුමාට ෆැක්ස් කරන්නත් බැහැ. එතුමාට ෆොටෝ කොපි ගහන්නත් බැහැ. එතුමාව අරගෙන ආවේ එදා උදේ. එදා උදේ ප්‍රකාශයක් කරන්න වුණා නම්, එතුමාට ඒක කරන්න බැහැ. ඉතින් ඒ නිසයි එතුමා මතු කළේ. ඒ වාගේ තමත් මන්ත්‍රීවරයෙකුට ඒ ප්‍රශ්නය මතු වෙන්න පුළුවන්. ඉතින් ඒ නිසා ඉඩකඩක් තියන්න ඕනෑය කියන කාරණය මම කියන්නේ. එතුමා මතු කළෙත් ඒ කාරණය. මන්ත්‍රීවරයෙකුට එදා උදේට දෙන්න තිබෙන අයිතිය තියන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියපු කාරණාව සම්බන්ධයෙන් 37(2) යටතේ තිබෙනවා. 53 පිටුව. ඒකේ පැහැදිලිව කියලා තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ කියන්නේ සභා පරිශ්‍රය තුළ. සභා පරිශ්‍රය තුළ කියන්නේ එදා දවසේ වෙන එකක්. ගරු සභාපතිතුමනි, මේක කලින් දවසේ රෑ වෙනවා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් කියවන්න කෝ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

සභාපතිතුමාගේ අභිමතය පරිදි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුවිශේෂී අවස්ථාවක.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

එහෙම නැති වුණත් මම විශ්වාස කරනවා, ගරු සභාපතිතුමාට අවශ්‍ය අවස්ථාවකදී අභිමතය පාවිච්චි කරලා අවස්ථාව දෙයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. එහෙම දෙනවා නේ අපි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක 37(4) ත් පැහැදිලිව තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිබෙනවා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

වරප්‍රසාද ප්‍රශ්නයත්, පෞද්ගලික ප්‍රකාශ කියන එකත් දෙකක් නේ ගරු සභාපතිතුමනි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, ඒක තිබුණු විධියට තිබුණා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය ප්‍රශ්නයක් වෙනවා නේ? අනික් එක ඉවරයකුත් නැහැ නේ? 9.45 ටත් දෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කොපමණ දුන්නත් හතරයි දෙන්න පුළුවන්. කලින් ඇවිල්ලා තිබුණත් හතරයි. ඒ හතර තමයි ගන්න වෙන්නේ ඔබතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මෙහෙමයි. දැන් එක එක්කෙනා එක එක ඒවා ලියලා ගෙනැල්ලා දෙනවා. 9.30 ට. මට කියවා ගන්නත් වෙලාවක් නැහැ. අදහසක් ගන්නත් බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක අපි ගන්නේ නැහැ නේ? ඒක ගන්නේ සංවිධායක -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මොකටද ප්‍රමුඛතාවය දෙන්නේ කියලා ඔබතුමා තීන්දු කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා තීන්දු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැනට ආවාම න්‍යාය පත්‍රය වෙනමම නේ යන්නේ. ඒකට පොඩි නිදහසක් තිබෙන්න ඕනෑ. කවුරු හරි මූලාසනයේ ඉන්න කෙනාට ඒ අයිතිය තිබෙන්න ඕනෑ. අනික් එක ලියලා තිබෙන දේ නොවෙයි කියන්නේ. වෙන දේවල් කියවන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, පැහැදිලි කර ගැනීමක් ඕනෑ. දැන් මට නම් මේක හැඟුනේ ලිඛිතව දෙනවාය කියන එකේ. ඒ ලිඛිතව දෙන එක තමයි මෙතැන කියවන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කියවන්න ඕනෑ. ඒක තමයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ කියන්නේ එවෙලේ මොකුත් ප්‍රකාශ කරන්න බැහැ. දැන් ඔබතුමා කියන ආකාරයේ වරප්‍රසාද ප්‍රශ්නයකට හරි අර කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ වාගේ එකකට. නමුත් මේකේදී වෙන්නේ විශේෂ ප්‍රකාශයක් කියන අදහස.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රකාශයක්. වරප්‍රසාද වෙන එකක්. ඒ නිසා අපි ඒක මෙහෙම තියමු.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 36(2) -

*"සභාපතිවරයා ඒ පිළිබඳව සෑහීමකට පත් වන්නේ නම්, ඒ සඳහා අවස්ථාවක් දිය යුතු අතර, සභාපතිවරයා විසින් ගරු මන්ත්‍රීවරයා ඉදිරිපත් කළ පෞද්ගලික ප්‍රකාශයේ රීති විරෝධී හා අන්‍යාකාරයෙන් වරප්‍රසාද කඩවන කරුණු ඉවත් කර ඇති විටක, එසේ ඉවත් කරන ලද කොටස් හැර, ඉතිරි ප්‍රකාශය ගරු මන්ත්‍රීවරයා විසින් සභාවට කියැවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 36(3) -

*"එසේ සභාපතිවරයාගේ අවසරය ලබා ගන්නා කරුණුවලට පමණක් අදාළ ව පෞද්ගලික ප්‍රකාශය කිය විය යුතු අතර එම ප්‍රකාශය අවසානයේ, ප්‍රකාශය ඇතුළත් එකී ලේඛනය සභාගත කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 36(4) -

*"පෞද්ගලික ප්‍රකාශ ගැන විවාදයක් ඇති නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 36(5) -

*"සභාවෙන් බාහිර ව මන්ත්‍රීවරයකු විසින් කරන ලද හෝ කියන ලද හෝ දෙයක් ගැන සභාවේදී පැහැදිලි කිරීම් ඉදිරිපත් කළ නොහැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 36(6) -

*"එක් මන්ත්‍රීවරයෙකුට එක සභා වාරයකදී එක් කරුණක් පිළිබඳව පමණක් පෞද්ගලික ප්‍රකාශයක් කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 36(7) -

*"යම් අමාත්‍යාංශයක විෂය පථයට අදාළ ව පෞද්ගලික ප්‍රකාශයක් කිරීමේදී ඉදිරිපත් වූ කරුණක් සම්බන්ධව එකී පෞද්ගලික ප්‍රකාශය අවසානයේදී හෝ එළැඹෙන පළාත් සභා රැස්වීමේදී අදාළ අමාත්‍යවරයා විසින් සභාපතිවරයාගේ අවසරය මත ඒ සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දිය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 36(8) -

*"එවන් පැහැදිලි කිරීමක් සඳහා ලබා දිය හැක්කේ උපරිම විනාඩි පහක කාලයකි."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 36(9) -

*"යම් පෞද්ගලික පැහැදිලි කිරීමකින් ප්‍රකාශ කරන්නා වූ කාරණා පළාත් සභාවට විශේෂයෙන් බලපාන කාරණා බව පළාත් සභාවේ සභාපතිවරයා තීරණය කරන්නේ නම්, එය උපදේශක කාරක සභාවකට හෝ අනිකුත් කාරක සභාවකට යොමු කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද සම්බන්ධ ප්‍රකාශ.

රීති අංක 37 (1) -

*"පළාත් සභා මන්ත්‍රීවරයකුගේ ගරුත්වයට හෝ තම කටයුතු කරගෙන යෑමට අවහිර වන ආකාරයේ ක්‍රියාවක් හෝ බලපෑමක් හෝ ඇති වුවහොත් එය වරප්‍රසාද කඩවීමක් ලෙස සැලකිය හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 37(2) -

*"සභා පරිශ්‍රය තුළ ඇතිවන මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් සම්බන්ධයෙන් වන විටකදී හැරෙන්නට, යම් මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් පිළිබඳව එකී මන්ත්‍රීවරයා විසින් ලිඛිත ව ගරු සභාපතිතුමා වෙත අදාළ ආකෘතිය පුරවා පෙ.ව.09.30 ට ප්‍රථම ව ලබා දිය යුතු වන අතර, සභාපතිතුමා එය මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩ වී ඇති බව නිගමනය කළහොත් පමණක්, එකී කාරණාව පිළිබඳව එම මන්ත්‍රීවරයාට ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දිය හැකි ය.*

*එසේ වුවද, සුවිශේෂී අවස්ථාවක සභාපතිවරයාගේ අභිමතය පරිදි වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 37(3) -

*"එකී වරප්‍රසාද කඩවීම පිළිබඳව අදාළ මන්ත්‍රීවරයා විනාඩි දෙකක කාලයක් තුළ සිය වරප්‍රසාද කඩවීම පිළිබඳව පැහැදිලි කිරීම අවසන් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 37(4) -

*"ඒ හැරත් සභාව පැවැත්වෙන කාලපරාසය තුළ යම් මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීමක් සිදු වූයේ නම්, එකී වරප්‍රසාදය කිනම් හෝ අවස්ථාවක සභාවට ඉදිරිපත් කිරීමට හැකියාව ඇති අතර, ඒ සඳහා ප්‍රමුඛතා ව ලබා දීමට සභාපතිවරයා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 37(5) -

*"වරප්‍රසාද කඩ කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා ගනු ලබන තීරණය අවසන් තීරණය වන්නේ ය. ඒ පිළිබඳව විවාදයක් ඇති නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 37(6) -

*"මන්ත්‍රීවරයකු පළාත් සභාවේදී කරන ලද කථාවක් හෝ ඉන් කොටසක් හෝ වැරදි ආකාරයකට හෝ අර්ථය වෙනස් වන ආකාරයකට හෝ ජනමාධ්‍ය මගින් හෝ අන් ලෙසකින් හෝ පළ කිරීම මන්ත්‍රීවරයකුගේ වරප්‍රසාද කඩ කිරීමක් ද වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 37(7) -

*"ඉහත රීති අංක 6 හි වරප්‍රසාද කඩවීම සම්බන්ධව වහා ම නිවැරදි කිරීමක් සිදු කළ යුතු බව, එකී ජනමාධ්‍ය ආයතනයට හෝ ඊට අදාළ කවර ආයතනයකට ගරු සභාපතිවරයා විසින් එවලේ වාචිකව සහ පසුව ලිඛිත ව දැනුම් දිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 37(8) -

*"වරප්‍රසාද කඩවීමක් සිදු වී ඇද්දැයි සොයා බැලීමට එම කාරණය සභා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කිරීමට සභාපතිවරයාගේ නියෝගය මත ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 37(9) -

*"සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ලැබීමෙන් පසු සභාපතිවරයාට සුදුසු යැයි හැඟෙන ආකාරයට ක්‍රියා කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*පොදු කටයුතු ආරම්භයේදී පූර්ව දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා. රීති අංක 38.*

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, පොදු කටයුතු ඉවර වෙලා වරප්‍රසාද අවසානයේදී මම යෝජනාවක් දුන්නා යම්කිසි මන්ත්‍රීවරයෙකු සභාවට පත් වෙලා ඇති වන මුල් අවස්ථාවේදීම ඒ ලැබිය යුතු සියලු වරප්‍රසාද ඒ මන්ත්‍රීවරයාට ලබා දිය යුතුය කියලා වගන්තියක් ඇතුළත් වෙන්න ඕනෑය කියලා. දැන් අපි හිතමුකෝ එයාට කම්පියුටරයක් දෙනවා නම්, මොනවා හරි දීමනාවක් දෙනවා නම්, කාර්ය මණ්ඩලයක් දෙනවා නම්, යාන වාහනයක් දෙනවා නම්, ඒ හැම දේම ඒ මන්ත්‍රීවරයා පත් වුණු මුල් අවස්ථාවේදීම ලබා දීමට කටයුතු කළ යුතුය කියලා. ඒකේදී මධ්‍යම ආණ්ඩුව සම්බන්ධ ඒවා කවදා දෙනවාද කියන ප්‍රශ්නය නොවෙයි. අපි රීතියක් හැටියට ඒක ඇතුළත් කර ගැනීම හොඳයි කියලා. වරප්‍රසාද -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පාර්ලිමේන්තුවෙත් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක ඇතුළත් කරලා තිබුණා නම් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වාහන බලපත්‍රය ගැන -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මුල් අවස්ථාවේදීම මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එහෙම ලැයිස්තුවක් තිබෙනවාද ගරු සභාපතිතුමා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මන්ත්‍රීවරයා සභාවට පැමිණි මුල් අවස්ථාවේදී -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු ශ්‍රීනාත් මන්ත්‍රීතුමා, යූ.එන්.පී. එකට විරුද්ධව මොනවා හරි කියන්න තිබෙනවා නම් දැන් කිව්වාට කමක් නැහැ. මොකද, ජෝර්ජ්ට නින්ද ගිහිල්ලා නිසා ප්‍රශ්නයක් නැහැ. දැන් කියන දෙයක් කියන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම නිදා ගන්න වෙලාවට කියන්නේ නැහැ. ඇහැරලා ඉන්න වෙලාවට කියන්නේ. අපි කකුල් දෙක ගහගෙන හිටියේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 38.

*"රීතින් මගින් අන් ලෙසකින් විධිවිධාන සැලසෙන්නේ නම් පමණක් පහත දැක්වෙන යෝජනා හැර වෙනත් සෑම යෝජනාවක් ගැනීම දැනුම් දීමක් කළ යුතු ය."*

*(1) පූර්ණ කාරක සභාවකට ලක් කළ යුතු යෝජනාවක්,*
*(2) සාකච්ඡාවක් නිම කිරීම පිණිස වූ හෝ කල් තැබීම පිණිස වූ හෝ යෝජනාවක්,*
*(3) වරප්‍රසාදයකට අදාළ යෝජනාවක්*
*(4) මන්ත්‍රීවරයකුගේ සභා සහභාගීත්වය අත් සිටුවීම පිණිස වූ යෝජනාවක්,*
*(5) දිනට නියමිත කිසියම් විෂයයක් තුළින් පැන නැඟෙන කාරණයක් පිළිබඳව එම විෂයය අවසන් වූ වහාම හා අලුත් විෂයයකට එළැඹීමට පෙර ගෙනෙන යෝජනාවක්,*
*(6) සභා නිල වාර්තා සහ කාර්ය සටහන්වල වැරැදි නිවැරැදි කිරීම පිණිස වූ යෝජනාවක්.*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක රීති අංක 39 (1) -

*"සභාව අන් ලෙසකින් තීරණය කළහොත් මිස මෙම රීති යටතේ අවශ්‍ය දැනුම් දීම මන්ත්‍රීවරුන් වෙත කිරීමෙන් තොරව කිසියම් කරුණක් සම්බන්ධයෙන් විවාදයක් ඇති නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 39 (2) (අ) -

*"මෙම රීති මගින් අන් ලෙසකින් විධිවිධාන සැලසෙන්නේ නම් පමණක් විනා, දිනට නියමිත න්‍යාය පත්‍රයේ දැක්වෙන කාර්ය විෂයයන් සම්බන්ධයෙන් හැර වෙනත් කරුණක් සම්බන්ධයෙන් විවාදයක් ඇති නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 39 (2) (ආ) -

*"ප්‍රශ්නයකට යෝජනා කෙරෙන සංශෝධනයක් එම ප්‍රශ්නයට අදාළ එකක් විය යුතු ය."*

*"සභා රැස්වීම් සහ සභාවේ වැඩ කටයුතු හා අදාළ යෝජනා රැස්වීමක න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු අතර, ඒවා එම රැස්වීමට දින 10 කට කලින් ලේකම්වරයා වෙත ලබා දිය යුතු ය."*

*"මන්ත්‍රීවරුන් ලබා දෙන යෝජනා අනුපිළිවෙළ අනුව න්‍යාය පත්‍රයෙහි ඇතුළත් ප්‍රඥප්ති සහ යෝජනාවල පිටපත් ඉදිරිපත් කිරීමේදී ඒ ගැන කටයුතු කිරීමට යොදා ගෙන ඇති දිනය මන්ත්‍රීවරුන් වෙත දැනුම් දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

එතැනින් එහාට අවුලක් නැහැ. මම දන්න විධියට. 55 ට ප්‍රශ්නයක් මතු වුණා. ඒක අපි නිරාකරණය කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි නේ?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අනික් ඒවායේ ප්‍රශ්නයක් නැහැ. ඒක අනුමත කළ හැකියි. ඔබතුමා අංක ටික කියවාගෙන යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒත් වෙලාව යනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, 87 හි ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි පිළිවෙළට එමු. ප්‍රඥප්ති සම්පාදනය. ප්‍රඥප්ති ඉදිරිපත් කිරීම.

රීති අංක 40 (1) -

*"ප්‍රඥප්තියක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන යම් අමාත්‍යවරයකු එකී ප්‍රඥප්තිය සඳහා වන කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු එකී කෙටුම්පත සිංහලෙන් හා දෙමළෙන් සකස් කර ඉංග්‍රීසි පරිවර්තනයක් සමග මතු දැක්වෙන ලියවිලිද සහිතව සභාවේ ලේකම්වරයා වෙත භාර දිය යුතු ය."*

*(අ) ප්‍රඥප්ති කෙටුම්පතේ අඩංගු කරුණ හෝ කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ කවර ලැයිස්තුවක සඳහන් එකක් දැයි නිශ්චිත ලෙස දැක්වෙන ප්‍රකාශයක්.*

*(ආ) ප්‍රඥප්ති කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව එහි පිටපතක්.*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 40 (2) -

*"ලේකම්වරයා විසින් යෝජිත ප්‍රඥප්ති කෙටුම්පත සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එය ප්‍රඥප්ති ඉදිරිපත් කිරීමේ දී බලපාන නීතිරීති හා අනුකූල වන්නේ දැයි සභාපතිවරයා විසින් තීරණය කළ යුතු ය. සභාපතිවරයා විසින් එකී ප්‍රඥප්ති කෙටුම්පත අදාළ නීතිරීතිවලට අනුකූල යැයි තීරණය කරනු ලබන්නේ නම්, එය න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම පිණිස ලේකම්වරයාට භාර දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 40 (3) -

*"නියමිත විෂයය අංකය යටතේ අමාත්‍යවරයාගේ තනතුරු නාමය සඳහන් කරමින් "............ (................) ........... විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කොට, ප්‍රඥප්තියේ නම සහ එහි පූර්විකාව න්‍යාය පත්‍රයේ සඳහන් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 40 (4) (අ) -

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ දැක්වෙන කරුණු පමණක් අඩංගු වී ඇති විට*

*පළාත් සභාවට එම ප්‍රඥප්ති කෙටුම්පත සම්මත කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 40 (4) (ආ) -

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උලේඛනයේ 2 වන ලැයිස්තුවේ දැක්වෙන යම් කරුණක් ප්‍රඥප්තියේ අඩංගු වී ඇති විට එම කරුණු සහිතව ප්‍රඥප්ති සම්මත කළ නොහැක්කේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 40 (5) -

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 3 වන ලැයිස්තුවේ දැක්වෙන කිසියම් කරුණක් අඩංගු ප්‍රඥප්තියක් සම්මත කිරීම සඳහා ඉදිරිපත් කරන විට එම ප්‍රඥප්තිය, ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු ය. එම කාරක සභාව එම ප්‍රඥප්තිය සලකා බලා මාස 03 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ අදහස් දන්වා එවන ලෙස පාර්ලිමේන්තුවේ කථානායකවරයාට යෝජනා කළ යුතු ය.පාර්ලිමේන්තුවේ අදහස් ලැබීමෙන් පසුව එකී අදහස්වලට යටත්ව ප්‍රඥප්තිය සම්බන්ධයෙන් පළාත් සභාවට තවදුරටත් කටයුතු කරගෙන යා හැකි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්තිය පළමුවර කියැවීම.

රීති අංක 41 (1) -

*"අදාළ අමාත්‍යවරයා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් අමාත්‍යවරයකු විසින් හෝ සභා රැස්වීමේ න්‍යාය පත්‍රයේ එම විෂය අංකයට පැමිණි විට ප්‍රඥප්තියේ නම සඳහන් කොට එකී ප්‍රඥප්තිය පළමුවර කියැවීම සඳහා සභාවට යෝජනා කරන බව ප්‍රකාශ කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 41 (2) -

*"ඉන් පසුව සභාපතිවරයාගේ නියමය පරිදි ලේකම්වරයා විසින් හෝ වැඩ බලන ලේකම්වරයා විසින් හෝ තමන් වාඩි වී සිටින අසුනින් නැඟී සිට එම ප්‍රඥප්තියේ පූර්විකාව කියැවිය යුතු ය. මෙය ප්‍රඥප්තියක පළමුවර කියැවීම වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 41 (3) -

*"ලේකම්වරයා හෝ වැඩ බලන ලේකම්වරයා විසින් ප්‍රඥප්තියේ පූර්විකාව කියැවීමෙන් පසුව එය දෙවනවර කියැවීම සඳහා එදින සිට මාසයක් ඇතුළත එළඹෙන දිනයක් නියම කළ යුතු ය. එසේ වුවද, අවශ්‍ය වූ විටකදී සභාපතිවරයාට එකී කාලය දීර්ඝ කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 41 (4) -

*"එමෙන්ම අදාළ ප්‍රඥප්තියේ නෛතික භාවය පිළිබඳව තවදුරටත් විමසා බැලීම සඳහා යෝජනා කරන්නේ නම් අදාළ ප්‍රඥප්තිය, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන අතර එකී වාර්තාව මාසයක් ඇතුළත සභාවට ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 42 -

*"අමාත්‍යවරයකු විසින් ප්‍රඥප්තියක් පළාත් සභාවට ඉදිරිපත් කරනු ලබන දිනයේ දී මන්ත්‍රීවරුන්ට බෙදා දීමට හැකි වන පරිදි අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් එහි පිටපත් ලේකම්වරයා වෙත සැපයිය යුතු ය. මන්ත්‍රීවරුන්ට තමන් කැමැති පරිදි සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ භාෂාවකින් ප්‍රඥප්තියේ පිටපත් ඉල්ලා සිටිය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්තිය දෙවන වර කියැවීම.

රීති අංක 43 (1) -

*"අදාළ අමාත්‍යවරයා විසින් දෙවන වර කියැවිය යුතු යැයි යෝජනා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (2) -

*"ප්‍රඥප්තියක් දෙවන වර කියැවීමේදී ඒ පිළිබඳව විවාදයක් ඇති විය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (3) -

*"දෙවන වර කියැවීමේ යෝජනාව යටතේ විවාදයක් ඇති වේ නම්, එය ප්‍රඥප්තිය හා බැඳුණු ප්‍රතිපත්තිමය කරුණුවලට පමණක් සීමා විය යුතු අතර, එය පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වීමට ප්‍රථම එනම්, රීති අංක 79 හි විධිවිධාන යටතේ සිදු කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (4) -

*"ප්‍රඥප්තිය දෙවන වර කියැවීම සඳහා සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වීමට යෝජනා කිරීමට සභානායකවරයාට හෝ අමාත්‍යවරයකුට හෝ හැකි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (5) -

*"ප්‍රඥප්තියක් සලකා බැලීම සඳහා සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි සභානායකවරයා*

*විසින් හෝ අමාත්‍යවරයකු විසින් හෝ යෝජනා කළ පසු, "දැන් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වන්නේ යැයි" සභාපතිවරයා විසින් ප්‍රකාශ කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (6) -

*"සභාවේ පූර්ණ කාරක සභාවේදී ප්‍රඥප්තියේ එක් එක් වගන්තිය සභාපතිවරයා විසින් කියවනු ලැබිය යුතු වන අතර, ඒ එක් එක් වගන්තිය යටතේ සාකච්ඡා කළ හැකි ය. නමුත් විවාදයක් සිදු නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (7) -

*"පූර්ණ කාරක සභා අවස්ථාවේ දී අදාළ ප්‍රඥප්තියේ ලුහුඬු නාමය හෝ පූර්විකාව හෝ වගන්තියක් හෝ වගන්ති කිහිපයක් හෝ සංශෝධනය කළ හැකි ය. නැතහොත් ඉවත් කළ හැකි ය. ප්‍රඥප්ති කෙටුම්පතට විෂය වන කරුණුවලට අදාළව ද ඒ හා සමගම සභා රීතිවලට අනුකූලව ද අලුත් වගන්තියක් එකතු කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (8) (අ) -

*"කාරක සභා අවස්ථාවේදී ප්‍රඥප්තියට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡාවට භාජනය නොකළ යුතු ය. ප්‍රඥප්තියේ වගන්තිවලට අදාළ වන විස්තරාත්මකව කරුණු පමණක් සාකච්ඡාවට භාජනය කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (8) (ආ) -

*"කාරක සභා අවස්ථාවේදී එකඟත්වයට පැමිණි ප්‍රඥප්තියක පූර්ව කොටසක් පිළිබඳව ගන්නා ලද තීරණයකට අනුකූල නොවන සංශෝධනයක් එම කාරක සභාවේ පසු කොටසේ දී යෝජනා කළ නොහැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (9) -

*"පූර්ණ කාරක සභා අවස්ථාවකදී ඉදිරිපත් කරනු ලබන සංශෝධනයන් පිළිබඳ යෝජනාවක් ස්ථිර කිරීම අවශ්‍ය නොවන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (10) -

*"පූර්ණ කාරක සභා අවස්ථාවකදී අදාළ ප්‍රඥප්තියේ වගන්ති එකින් එක සාකච්ඡාවට භාජනය වී අවසානයේදීම සභාපතිවරයා විසින් ඒ ඒ අවස්ථාවේ දී එක් එක් වගන්තිය පිළිබඳව සභාවේ එකඟතාවය ලබා ගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (11) -

*"ප්‍රඥප්තියක සියලුම වගන්ති සලකා බැලීමෙන් පසුව පූර්ණ කාරක සභාව යළිත් සභාව බවට පරිවර්තනය වන බව සභාපතිවරයා විසින් ප්‍රකාශ කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 43 (12) -

*"පූර්ණ කාරක සභා අවස්ථාවේ දී ප්‍රඥප්තිය බෙදීමක් ඇතිව හෝ නැතිව සභා සම්මත වීමෙන් අනතුරුව පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වූ පසු, පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ප්‍රකාශ කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්තිය තුන්වන වර කියැවීම.

රීති අංක 44 (1) -

*"දෙවන වර කියැවීමෙන් අනතුරුව ප්‍රඥප්තිය තුන්වන වර කියැවිය යුතු බව අමාත්‍යවරයකු විසින් යෝජනා කළ යුතුය. එම යෝජනාවට සංශෝධන ඉදිරිපත් කළ නොහැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 44 (2) -

*"තුන්වන වර කියැවීමේදී ප්‍රඥප්තිය පිළිබඳ විවාදයක් ඇති නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 44 (3) -

*"තුන්වන වර කියැවීම සම්බන්ධයෙන් බෙදීමක් ඇතිව හෝ නැතිව හෝ සම්මත වීමෙන් පසු එය නියමානුකූල ලෙස සම්මත වූ බවට සභාපතිවරයා විසින් සහතික කිරීමෙන් පසු ලේකම්වරයා විසින් ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයාගේ අනුමතයට යොමු කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 44 (4) -

*"එම අනුමතය ලැබීමෙන් පසු අදාළ ඇමතිවරයා විසින් ප්‍රඥප්තිය ආණ්ඩුකාරතුමාගේ අනුමතය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන බව ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නියෝග, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා සම්මත කිරීම.

රීති අංක 45(1) -

*"නියෝග, රෙගුලාසි හෝ අතුරු ව්‍යවස්ථාවක් සම්මත කිරීම සඳහා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය වූ විට, ඊට අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම මගින් සභාපතිවරයා වෙත යොමු කළ යුතු ය.*

*අනතුරුව අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් යෝජනාවක් මගින් එය සභාවට ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 45 (2) (අ) -

*"එසේ ඉදිරිපත් වූ අනු රීතියක් හෝ අතුරු ව්‍යවස්ථාවක් විස්තරාත්මකව සලකා බැලීම සඳහා ප්‍රඥප්ති හා නීති කාරක සභාවට එය යොමු කළ හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 45 (2) (ආ) -

*"එවන් නිර්දේශයක් එකී අනුරීති හෝ අතුරු ව්‍යවස්ථා එම කාරක සභාවට ඉදිරිපත් කළ දිනයේ සිට මසක කාලයක් ඇතුළත සලකා බලා එකී නිර්දේශ සභාවට ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 45 (2) (ඇ) -

*"එසේ වුවද, අවශ්‍ය වූ විටකදී සභාපතිවරයාට එකී කාලය දීර්ඝ කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික මන්ත්‍රී ප්‍රඥප්ති.

රීති අංක 46 (1) -

*"ප්‍රඥප්ති කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මන්ත්‍රීවරයා විසින් ඒ සඳහා පළාත් සභාවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රඥප්ති කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත මූලික අරමුණු ඇතුළත් යෝජනාවක් සමඟ එකී ප්‍රඥප්ති කෙටුම්පත සභා ලේකම්වරයාට භාර දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 46 (2) -

*"එවන් ප්‍රඥප්ති කෙටුම්පතක් සම්බන්ධයෙන් සභාවේ අවසරය ලබා ගැනීමෙන් පසුව මාසයක් ඇතුළත එකී ප්‍රඥප්ති කෙටුම්පත ප්‍රවෘත්ති පත්‍රයන්හි හෝ පළාත් ගැසට් පත්‍රයක් වේ නම්, එම ගැසට් පත්‍රයේ හෝ එවැනි ගැසට් පත්‍රයක් නොමැති නම්, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ හෝ භාෂාත්‍රයෙන්ම පළ කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරන ලෙස සභා ලේකම්වරයාට නියෝග කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 46 (3)

*"ඉන් අනතුරුව එය රීති අංක 40, 41, 42, 43 සහ 44 යන රීතීන්ට අනුකූලව සාමාන්‍ය ප්‍රඥප්තියක් ලෙස සලකා කටයුතු කළ යුතු ය.*

*එසේ වුවද, ප්‍රඥප්ති කෙටුම්පත ඉදිරිපත් කිරීම, දෙවැනි වර කියැවීම සහ තෙවන වර කියැවීමේ යන යෝජනාවන් ප්‍රඥප්ති කෙටුම්පත ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාට හිමි විය යුතු අතර, ඔහු නොමැති විට අදාළ අමාත්‍යවරයාට කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක *46 (4) -*

*"ඒ අනුව 40(3) අනු රීතියේ කෙසේ සඳහන් වුවද, නියමිත විෂය අංකය යටතේ ප්‍රඥප්තිය ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාගේ නාමය සඳහන් කරමින් " (............) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කොට, ප්‍රඥප්තියේ නම සහ එහි පූර්විකාව න්‍යාය පත්‍රයේ සඳහන් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාර්ෂික මුදල් ප්‍රකාශය.

රීති අංක 47 (1) -

*"පළාත් සභා පනතේ 25 වන වගන්තියේ විධිවිධාන අනුව වාර්ෂික මුදල් ප්‍රකාශය ගැන පළාත් සභාව අවස්ථා දෙකකින් ක්‍රියා කළ යුතු ය.*

*(අ) පොදු සාකච්ඡාව.*

*(ආ) සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වී ඉල්ලීම් සලකා බැලීම හා ඡන්දයෙන් අනුමත කිරීම."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 47 (2) -

*"පොදු සාකච්ඡාව සමස්තයක් වශයෙන් වාර්ෂික මුදල් ප්‍රකාශය සම්බන්ධයෙන් සහ ඒ හා බැඳුණු ප්‍රතිපත්තිම ය කරුණුවලට පමණක් සීමා විය යුතු ය. වාර්ෂික මුදල් ප්‍රකාශය සම්බන්ධ පොදු සාකච්ඡාව අවසානයේ සභාවේ කැමැත්ත විමසීමක් නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 47 (3) -

*"පොදු සාකච්ඡාව අවසානයේ දී මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් හෝ නොවැළැක්විය හැකි හේතුවක් නිසා ඔහුට පැමිණිය නොහැකි විට ඔහු වෙනුවෙන් වෙනත් අමාත්‍යවරයෙකු විසින් හෝ පිළිතුරු දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 47 (4) -

*"පොදු සාකච්ඡාව අවසානයේ දී සභානායකවරයා විසින් හෝ අමාත්‍යවරයෙකු විසින්, "ප්‍රදානයන් සඳහා වූ ඉල්ලීම සලකා බැලීම පිණිස මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි" යෝජනාව ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 47 (5) -

*"ඉහත සඳහන් යෝජනාව සම්මත වීමෙන් පසුව සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වන බවට සභාපතිවරයා විසින් ප්‍රකාශ කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 47 (6) -

*"වාර්ෂික මුදල් ප්‍රකාශයේ සඳහන් සියලුම ප්‍රදාන පිළිබඳ ඉල්ලීම් සලකා බලා අවසන් වනතුරු 47 (4) රීතිය යටතේ සම්මත වූ යෝජනාව බල පවත්වන්නේ ය. එනිසා ඒ ඒ දිනවල අවශ්‍ය අවස්ථාවල දී සභාපතිවරයා විසින්, "ප්‍රදාන පිළිබඳ ඉල්ලීම සලකා බැලීමට මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වන්නේ ය" යනුවෙන් ප්‍රකාශයක් කිරීම ප්‍රමාණවත් ය. එකී ප්‍රකාශයෙන් පසුව ප්‍රදානයන් පිළිබඳ සාකච්ඡාව ආරම්භ කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 47 (7) -

*"පූර්ණ කාරක සභාවේ දී ප්‍රදානයන් සම්මත වීම, සභාවේ දී සම්මත වීමක් ලෙස සැලකිය යුත්තේ ය. ඒ හෙයින් සභාවේ දී නැවත ඡන්ද විමසීමක් අවශ්‍ය නොවන අතර පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය සභාපතිවරයා විසින් සභාවට දැනුම් දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 47 (8) -

*"ප්‍රශ්නයක් සලකා බැලීම සඳහා පූර්ණ කාරක සභාව පැවැත්වෙන සෑම දිනකම එදිනට නියමිත සලකා බැලීම් නිම වූ වහාම එම පූර්ණ කාරක සභාව නැවත සභාව බවට පරිවර්තනය වන බව සභාපතිවරයා විසින් ප්‍රකාශ කළ යුතු අතර, එදින පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ද සභාවට වාර්තා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංකේත කපා හැරීම.

රීති අංක 48 (1) (අ) -

*"කිසියම් ඉල්ලීමකට පාදකව ඇති ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අප්‍රසාදය පළ කිරීම පිණිස හෝ සභාවේ වගකීමට අයත් වන තෘප්තියට පත් නොවන කරුණක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම පිණිස හෝ කිසියම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන සංකේත කපා හැරීමක් යෝජනා කිරීමට ඕනෑම මන්ත්‍රීවරයෙකුට හැකි විය යුතු ය."*

*(ආ) කිසියම් ඉල්ලීමක ඉතිරි කිරීමක් ඇති කිරීම පිණිස අපේක්ෂිත ඉල්ලීම නිරූපණය කරන ප්‍රමාණයේ මුදලක් කපා හැරීමට හෝ ඉල්ලීමෙහි අඩු කළ කිසියම් කරුණක් ඉවත් කිරීමට හෝ යෝජනා කිරීමට ඕනෑම මන්ත්‍රීවරයෙකුට හැකි විය යුතු ය.*

*(ඇ) එවැනි එක් යෝජනාවක් එක ඉල්ලීමකට පමණක් සීමා විය යුතු ය.*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 48 (2) -

*"සංකේත කපා හැරීමක් පිළිබඳ යෝජනාවක් ස්ථිර කිරීම අවශ්‍ය නොවන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 48 (3) -

*"සංකේත කපා හැරීමක් නොමැති කල්හි එම ඉල්ලීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම නොමැති ලෙස සලකා, එම ඉල්ලීමේ ශීර්ෂ අංක ඉදිරිපත් කරමින්, ඒවා සම්බන්ධයෙන් පූර්ණ කාරක සභාවේ කැමැත්ත විමසීමට සභාපතිවරයා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 48 (4) -

*"කිසියම් ප්‍රදානයක් සම්බන්ධයෙන් සංකේත කපා හැරීමක් යෝජනා කළ නොහැකි යැයි සීමා පැනවීමක් නොවිය යුතු ය. එසේ වුවද, පළාත් සභා පනතේ 25 (3) අනු වගන්තියේ පළාත් සභා අරමුදලට වැය බරක් හැටියට නිශ්චිතව සඳහන් කර ඇති කරුණක් පිළිබඳව විමසීමක් නොකළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (1) -

*"වාර්ෂික මුදල් ප්‍රකාශය හා ඊට අදාළ කටයුතු සඳහා, එම ප්‍රකාශය සභාගත කිරීමෙන් අනතුරුව දින දෙකකට පසුව ආරම්භ වන විශේෂිත දින 21 කට නොවැඩි දින ගණනක්, සභා කටයුතු පිළිබඳ කාරක සභාව විමසා බැලීමෙන් පසුව සභාපතිවරයා විසින් වෙන් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (2) -

*"පොදු සාකච්ඡාව සඳහා දින 7 කට වැඩියෙන් නොගත යුතු ය. පූර්ණ කාරක සභාව සඳහා දින 14 කට වැඩියෙන් නොගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (3) -

*"වාර්ෂික මුදල් ප්‍රකාශය වෙනුවෙන් වෙන් කරන ලද සෑම දිනකම එය පොදු කාර්ය විෂය ලෙසින් සැලකිය යුතු ය. එවැනි දිනයක වෙනත් කිසිදු කාර්යයක් පස්වරු 5.00 වනතුරු සාකච්ඡාවට නොගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (4) -

*"වාර්ෂික මුදල් ප්‍රකාශය පිළිබඳව කටයුතු කිරීමේ දී පාලක පක්ෂයට සහ විරුද්ධ පක්ෂයට විවාදය සඳහා වෙන් කෙරෙන කාලය සම්බන්ධයෙන් සභා කටයුතු පිළිබඳ කාරක සභාව විමසා සීමාවක් පැනවිය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (5) -

*"වාර්ෂික මුදල් ප්‍රකාශය සාකච්ඡා කෙරෙන, ඒ සඳහා වෙන් කරන ලද දිනවල සභා රැස්වීම් පැවැත්වෙන කාල වේලා පහත සඳහන් පරිදි විය යුතු ය.*

*පූ.භා 9.00 සිට ප.භා. 1.00 දක්වා*
*ප. භා. 2.00 සිට ප.භා. 5.00 දක්වා"*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (6) -

*"වාර්ෂික මුදල් ප්‍රකාශය වෙනුවෙන් කටයුතු කෙරෙන දිනයක එකී කටයුතු පවත්වාගෙන යන කාලය නිම වීමෙන් පසුව රීති අංක 31 යටතේ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කර එය යටතේ පැය භාගයකට නොවැඩි කාලයක් කටයුතු කර ගෙන යා හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (7) -

*"වාර්ෂික මුදල් ප්‍රකාශය සාකච්ඡා කෙරෙන, ඒ සඳහා වෙන් කරන ලද දිනයක එකී කටයුතු පවත්වාගෙන යන කාලය නිම වීමෙන් පසුව වෙනත් හදිසි කටයුත්තක් සඳහා සභාවේ එකඟත්වය ඇතිව කාලය වෙන් කර ගත හැකි ය. එවැනි වෙනත් කටයුත්තක් සාකච්ඡා කර අවසන් වූ වහාම කල් තැබීමේ යෝජනාවක් නොමැතිව සභාව ඊළඟ දිනය තෙක් කල් තැබිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (8) -

*"81 (1) (අ) අනු රීතියෙහි ඇතුළත් විධිවිධානයන් පිළිබඳ තැකීමකින් තොරව කිසියම් ඉල්ලීමක් අඩු කිරීම පිණිස හෝ කිසියම් ඉල්ලීමක යම් විෂයාංකයක් කපා හැරීම පිණිස හෝ වූ සෑම යෝජනාවක්ම පිළිබඳ දැනුම් දීම, එම ඉල්ලීම සාකච්ඡාවට ගැනීමට දින තුනකට නොඅඩු කාලයකට ප්‍රථමයෙන් සභා ලේකම්වරයා වෙත ලිඛිත ව ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (9) -

*"සාකච්ඡා කිරීමට යෝජිත ප්‍රතිපත්තිය පිළිබඳව හෝ ප්‍රකාශ කිරීමට අපේක්ෂිත තෘප්තියට පත් නොවන කරුණ පිළිබඳව හෝ ඇති කිරීමට බලාපොරොත්තු වන ඉතිරි කිරීම පිළිබඳව හෝ විස්තර එම දැනුම් දීමෙහි කෙටියෙන් සඳහන් වියුතු ය. එම දැනුම් දීමෙහි දැක්වෙන කරුණුවලට පමණක් සාකච්ඡාව සීමා විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (10) -

*"එක් ඉල්ලීමක් සම්බන්ධයෙන් යෝජනා ගණනාවක් ඉදිරිපත්ව ඇති විට, ඒවා සභාපතිවරයා තීරණය කරන පිළිවෙළ අනුව සාකච්ඡාවට ගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 49 (11) -

*"ප්‍රදානයන් සඳහා කාරක සභා තීරණ කලින් අවසන් නොවන්නේ නම්, එම ප්‍රදානයන් සලකා බැලීම සඳහා වෙන් කර ඇති අවසන් දිනයේ පස්වරු 4.30 ට ඒ වන විට සාකච්ඡා වෙමින් පැවතෙන වැය ශීර්ෂය හා ඉන් පසුව ඇති සියලු වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් කාරක සභාවේ තීරණය දිය යුතු ය. එදින සභාවේ වැඩ කටයුතු කලින් අවසන් නොවන්නේ නම්, පස්වරු 5.00 ට සභාපතිවරයා විසින් සංශෝධනය කිරීමක් හෝ විවාදයට භාජනය කිරීමකින් හෝ තොරව මුදල් ප්‍රකාශය සම්බන්ධයෙන් සභාව විසින් නිගමනය කළ යුතු ව ඇති සියලු කරුණු පිළිබඳව සභාවේ තීරණය විමසිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විසර්ජන පනත් කෙටුම්පත. 

රීති අංක 50 (1) -

*"40 වන රීතියේ දැක්වෙන විධිවිධානයන් කෙරෙහි තැකීමකින් තොරව, වාර්ෂික මුදල් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කෙරෙන දිනම ඒ වාර්ෂික මුදල් ප්‍රකාශයට නීතිමය බලපෑම හිමි වන විසර්ජන පනත් කෙටුම්පතද ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 50 (2) -

*"වාර්ෂික මුදල් ප්‍රකාශය සම්මත වූ වහාම විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳව කටයුතු කර ගෙන යා යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 50 (3) –

*"වාර්ෂික මුදල් ප්‍රකාශය පිළිබඳ සාකච්ඡාවේ දී සැලකිල්ලට භාජනය නොවුණු පොදු වැදගත්කමකින් යුත් පරිපාලන ප්‍රතිපත්ති හා ඊට අදාළ කරුණුවලට පමණක් විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන විවාදය සීමා විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාරාවසාන කිරීම.

රීති අංක 51 -

*"වාර්ෂික මුදල් ප්‍රකාශය හා ඊට අදාළ විසර්ජන පනත් කෙටුම්පතේ වැඩ කටයුතු අවසන් වූ පසු එළැඹෙන ඊළඟ රැස්වීම් දින ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය ප්‍රකාරව සැසි වාරය අවසන් කළ හැක්කේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පරිපූරක ප්‍රදාන.

රීති අංක 52 (1) -

*"පළාත් සභා පනතේ 28 වන වගන්තිය යටතේ වූ ඇස්තමේන්තුගත වියදම් පිළිබඳ ප්‍රකාශයක් හෝ අතිරික්ත සඳහා ඉල්ලීමක් හෝ එම පනතේ 29 වන වගන්තිය යටතේ ගිණුම් පිළිබඳ වැයක් හෝ සම්බන්ධයෙන් 40 වන රීතියේ විධිවිධානයන් කෙරෙහි තැකීමකින් තොරව කටයුතු කරගෙන යැමට පළාත් සභාවට හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 52 (2) -

*“එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කළ හැක්කේ අමාත්‍යවරයකුට පමණි.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 52 (3) -

*“එවැනි ඉල්ලීමක් කිරීමේ හේතු එම ඉල්ලීම සමග විය යුතු ය.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 52 (4) -

*“එවැනි ඉල්ලීමක් සමග ඒ ඉල්ලීමට අදාළව බලය ලැබෙන විසර්ජන ප්‍රඥප්තියක් ද ඉදිරිපත් කළ යුතු ය.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 52 (5) -

*“එවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ට යටත් පිරිසෙයින් දින 7 කට පෙර දැනුම් දිය යුතු ය.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 52 (6) -

*“පරිපූරක ප්‍රදාන ගැන කටයුතු කිරීමෙන් පසුව එදිනම ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය ගැන ද කටයුතු කර අවසන් විය යුතු ය.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 52 (7) -

*“පරිපූරක ප්‍රදානයන් සම්බන්ධයෙන් කටයුතු කරන විට සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය වීම අවශ්‍ය නොවේ.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික මන්ත්‍රී යෝජනා.

රීති අංක 53 (1) -

*“පොදු වැදගත්කමකින් යුත් ඕනෑම කරුණක් විවාදයට ලක් කිරීම පිණිස යෝජනා කිරීමට ඕනෑම මන්ත්‍රීවරයකුට වුව ද හැකි විය යුතු ය.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 53 (2) -

*“එම යෝජනා ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ඔහු එය සභාපතිවරයාගේ අවධානයට යොමු කළ*

*යුතු ය. එම යෝජනාව රීති විරෝධී නොවන බවට සභා කටයුතු කාරක සභාවේ අදහස් ද විමසා බලා සභාපතිවරයා තීරණය කරන්නේ නම්, එය න්‍යාය පුස්තකයට / පත්‍රයට ඇතුළත් කිරීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 53 (3) -

*"න්‍යාය පුස්තකයේ ඇතුළත් වී තිබෙන යෝජනාවල අනුපිළිවෙළ නොඉක්මවා ඒ ඒ සභා රැස්වීම්වල තිබෙන න්‍යාය පත්‍රයට, සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ ද එකඟත්වය මත යෝජනා යම් සංඛ්‍යාවක් ඇතුළත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 53 (4) -

*"පහත සඳහන් කරනු ලබන කොන්දේසි සපුරාලන්නේ නම් පමණක් එකී යෝජනාවට සංශෝධන ඉදිරිපත් කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 53 (4) (අ) -

*"එකී සංශෝධනය/සංශෝධන එම යෝජනාව සභා සම්මත වීමට පෙර ඕනෑම අවස්ථාවකදී ඉදිරිපත් කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 53 (4) (ආ) -

*"එවැනි සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා එම යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා එකඟත්වය පළ කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 53 (4) (ඇ) -

*"එම සංශෝධනයේ අන්තර්ගතය මුලින් ඉදිරිපත් කළ යෝජනාවේ අන්තර්ගතයට පටහැනි නොවිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 54 (1) -

*"යෝජනාවක් ඉදිරිපත් කර ඇති මන්ත්‍රීවරයෙකුට එම යෝජනා විවාදයට භාජනය වන දිනයේ දී සභා රැස්වීම සඳහා පැමිණිය නොහැකි වුවහොත්, සභා රැස්වීම ආරම්භ වීමට ප්‍රථම සභාපතිවරයා දැනුවත් කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඉදිරිපත් කිරීමේ බලය වෙනත් මන්ත්‍රීවරයකුට පැවරිය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 54 (2) -

*"මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් තවත් මන්ත්‍රීවරයකු විසින් ස්ථිර කරනු නොලබන්නේ නම්, එය සාකච්ඡා නොවිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 54 (3) -

*"ඕනෑම පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් සාකච්ඡා වෙමින් පවතින විට ඉහත 53(4) හි විධිවිධානයන්ට යටත්ව ඊට සංශෝධනයක් ඉදිරිපත් කිරීමට ඕනෑම මන්ත්‍රීවරයකුට හැකි විය යුතු ය. එවන් සංශෝධනයක් වේ නම්, එකී සංශෝධනය ලිඛිතව මූලාසනයට ඉදිරිපත් කළ යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 54 (4) -

*"කිසියම් පෞද්ගලික යෝජනාවක් හැකි තරම් දුරට සංක්ෂිප්ත විය යුතු අතර, වචන 150 ක් නොඉක්මවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 54 (5) -

*"යෝජනා කොට ස්ථිර කරන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉල්ලා අස් කර ගත හැක්කේ, සභාවේ එකඟතාවය මත පමණි."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 54 (6) -

*"යම් මන්ත්‍රීවරයෙකු පෞද්ගලික මන්ත්‍රී යෝජනා කිහිපයක් අනුපිළිවෙළට ඉදිරිපත් කර ඇති විටක වුවද, එක් න්‍යාය පත්‍රයකට ඇතුළත් කළ හැකි වන්නේ, එයින් එක් යෝජනාවක් පමණි."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 54 (7) (අ) -

*"ගණපූරණය නොමැතිව පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් කල් තබන්නේ නම්, එම යෝජනාව ඊළඟ සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙසට යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කළ යුතු ය. එසේ ඉල්ලීමක් නොකරන්නේ නම් අදාළ යෝජනාව අහෝසි වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 54 (7) (ආ) -

*"ගණපූරණය නොමැතිව ඊළඟ දින න්‍යාය පත්‍රයට කල් තබන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව විවාදයට ගනු ලබන නියමිත දිනයේ දී එම යෝජනාව යළිත් ඉදිරිපත් කිරීම සඳහා අදාළ ගරු මන්ත්‍රීවරයා සභා ගර්භයේ රැඳී සිටිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විශ්වාසභංග යෝජනා.

රීති අංක 55 –

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 55 (1) -

*"විශ්වාසභංග යෝජනාවක් පාලක පක්ෂයට හෝ අමාත්‍යවරයෙකුට හෝ එරෙහිව ඉදිරිපත් කළ හැකිය. එම විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් වීමට පදනම් වූයේ කුමක් ද යන්න පැහැදිලිව සහ සවිස්තරව එම යෝජනාවේ ඇතුළත් විය යුතු ය."*

මුලින් කථා කරගත් පරිදි එයට ඇතුළත් වෙනවා, 11 වන රීතිය ප්‍රකාරව ගරු සභාපතිතුමාට හෝ ගරු නියෝජ්‍ය සභාපතිතුමා යන වචන එරෙහිව යන වචනයට පෙර ඇතුළත් කරනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 55 (2) -

*"එවැනි යෝජනාවක් ලිඛිතව පළාත් සභාවේ සමස්ත මන්ත්‍රීවරු (නොපැමිණි මන්ත්‍රීවරුද ඇතුළත්ව) සංඛ්‍යාවෙන් 1/5 ක් හෝ ඊට වැඩි පිරිසකගේ අත්සන් සහිතව සභා ලේකම්වරයාට භාර දිය යුතු ය."*

මෙම රීතිය අගට *"භාර දිය යුතු අතර, එවැන්නක් ගරු සභාපතිතුමාට හෝ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට එරෙහිව ගෙන ඒමේදී පනතේ 7(2)(ඇ) සහ 8 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය."* කියලා 55(2) සංශෝධනය වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 55 (3) -

*"එකී විශ්වාසභංග යෝජනාව නිසියාකාරව සකස් කර ඉදිරිපත් කර ඇති බවට සභාපතිවරයා සෑහීමකට පත් වන්නේ නම්, එය සභා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු වන අතර, එකී යෝජනාව රීති විරෝධී නොවන බවට එම කාරක සභාව නිගමනය කරන්නේ නම්, ඊළඟට යෙදෙන සභා රැස්වීම් දින න්‍යාය පත්‍රයට එකී යෝජනාව ඇතුළත් කළ යුතු අතර, එයට එම න්‍යාය පත්‍රයේ ප්‍රමුඛස්ථානය දිය යුතුය.*

*එමෙන්ම,*

*"එසේ වුවද, සභාතිවරයාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් ඇති විට සභාපතිවරයා එකී සභා කටයුතු කාරක සභාවේ මුලසුන නොදැරිය යුතු අතර, නියෝජ්‍ය සභාපතිතුමා එහි මුලසුන දැරිය යුතු ය. නියෝජ්‍ය සභාපතිවරයා නොමැති විටක කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයෙකුව යෝජනා ස්ථිරත්වයෙන් මුලසුන සඳහා පත් කර ගත යුතු අතර, එවිට කාරක සභාවේ ගණපූරණය ද තිබිය යුතු ය."*

මෙම රීතිය 55(4) ලෙස නව රීතියක් වශයෙන් ඇතුළත් වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 55 (4) -

*අමාත්‍යවරයෙකුට එරෙහිව ඉදිරිපත් කරන එවන් විශ්වාසභංග යෝජනාවක් සභා සම්මත කිරීමෙන් පසුව අදාළ අමාත්‍යවරයා ඉල්ලා අස් නොවන්නේ නම්, ඒ පිළිබඳව වැඩිදුර තීන්දු ගැනීම සඳහා ආණ්ඩුකාරතුමා වෙත යොමු කළ යුතුය."*

මෙම රීතිය 55(5) ලෙස නම් වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනා ඉල්ලා අස් කර ගැනීම.

රීති අංක 56 -

*"මෙම රීතිවල මෙයට පටහැනි වූ විධානයන් ඇති අවස්ථාවන්වලදී හැරෙන්නට සභාව වෙත ඉදිරිපත් කරන ලද කවර හෝ යෝජනාවක් සම්බන්ධයෙන් දැනුම් දී ඇති අමාත්‍යවරයෙකුට හෝ මන්ත්‍රීවරයෙකුට, සභාපතිවරයාට ලිඛිතව දැනුම් දීමෙන් හෝ සභාවේ එම විෂයයට පැමිණි අවස්ථාවේදී ප්‍රකාශයක් කිරීමෙන් හෝ එම යෝජනාව ඉල්ලා අස් කර ගත හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සංශෝධන.

රීති අංක 57 (1) -

*"මූලාසනයෙන් සභාභිමුඛ කරන ප්‍රශ්නයක්, කවර හෝ යෝජනාවක් සම්බන්ධයෙන් වන විටකදී,*

*(අ) වෙනත් වචන ඇතුළත් කිරීම සඳහා ඇතැම් වචන අත්හැරීමෙන් හෝ*

*(ආ) ඇතැම් වචන අත්හැරීමෙන් හෝ*

*(ඇ) වෙනත් වචන ඇතුළත් කිරීමෙන් හෝ එකතු කිරීමෙන් හෝ සංශෝධනය කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 57 (2) -

*"සෑම සංශෝධනයක්ම එම සංශෝධන යෝජනා කරන මන්ත්‍රීවරයා විසින් ලිඛිතව ලේකම්වරයාට භාර දිය යුතු ය. රීති විරෝධී බවට සභාපතිවරයා තීරණය නොකරන්නේ නම් සහ ඒ සඳහා වේලාව ඇත්නම් එහි පිටපතක් පිළියෙල කොට සෑම මන්ත්‍රීවරයකුටම ලබා ගැනීමට සැලැස් විය යුතු ය. ප්‍රශ්නයකට යෝජනා කෙරෙන සංශෝධනයක් එම ප්‍රශ්නයට අදාළ එකක් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 57 (3) -

*"ප්‍රශ්නයකට/යෝජනාවකට කිසියම් කොටසකට කෙරෙන සංශෝධනයක් සම්බන්ධයෙන් තීරණයක් දීමෙන් එකී සංශෝධනයට සහසම්බන්ධ වන වෙනත් සංශෝධන ද කළ නොහැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 57 (4) -

*"ප්‍රශ්නයකට / යෝජනාවක කෙරෙන සංශෝධනයක් එම ප්‍රශ්නයට/යෝජනාවට කලින් කර ඇති සංශෝධනයක් හා පටහැනි නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 57 (5) -

*"මූලාසනයේ සභාභිමුඛව කරන ලද ප්‍රශ්නයකට/යෝජනාවකට සංශෝධනයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත්ව ඇති විට සංශෝධන සම්බන්ධයෙන් සුදුසු කටයුතු අවසන් වනතෙක් සභාභිමුඛ ප්‍රශ්නය, මුල් ප්‍රශ්නය ලෙස සලකා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 57 (6) -

*"මූලාසනයෙන් සභාභිමුඛ කර ඇති සංශෝධනයකට සංශෝධනයක් යෝජනා කිරීමට හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 58 (1) -

*"යෝජිත ප්‍රඥප්තියක ඡේදයකට හෝ උප ලේඛනයකට කෙරෙන සංශෝධනයක් සම්බන්ධයෙන් එම ප්‍රඥප්තිය සැලකිල්ලට භාජනය කළ යුතු දිනට පුරා දිනකට කලින් දැනුම් දීමක් නොකරන්නේ නම්, එම සංශෝධනය ඉදිරිපත් කිරීම ගැන ඕනෑම මන්ත්‍රීවරයකුට විරුද්ධත්වය ප්‍රකාශ කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 58 (2) -

*"සභාපතිවරයා අදාළ සංශෝධනය ඉදිරිපත් කිරීමට ඉඩ නොදෙන්නේ නම්, විරුද්ධත්වය වලංගු වන්නේ ය. කෙසේ වුවද, දැනුම් දීමකින් තොරව කෙරෙන යෝජනාවක් අනුව සභාව එකඟත්වයකට පත් වන්නේ නම්, ප්‍රශ්නය සාකච්ඡාවට භාජනය කිරීම සඳහා අවශ්‍ය විමසා බැලීම් අවසන් වනතුරු කල් තැබිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 58 (3) -

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උප ලේඛනයේ ii වන ලැයිස්තුවේ දක්වා ඇති කිසියම් කරුණක් ඉදිරිපත් කිරීමට තුඩු දෙන කිසිදු සංශෝධනයකට ඉඩ දෙනු නොලැබේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 58 (4) -

*"පනතේ 24 වන වගන්තියට පටහැනි වන කිසිදු සංශෝධනයකට ඉඩ දෙනු නොලැබේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 58 (5)

*"පාර්ලිමේන්තුවෙන් විමසා ඇති බවට සභාපතිවරයා සෑහීමකට පත් නොවෙන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ iii වන ලැයිස්තුවේ දක්වා ඇති කරුණකට අදාළ ප්‍රශ්නයකට සංශෝධනයක් ඉදිරිපත් කිරීමට හෝ එම ලැයිස්තුවේ දක්වා ඇති කරුණක් ඉදිරිපත් කිරීමට තුඩු දෙන කිසිදු සංශෝධනයක් ඉදිරිපත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාකච්ඡාවක් නිම කිරීම.

රීති අංක 59 (1) -

*"සභාභිමුඛ කර ඇති ප්‍රශ්නයක්/යෝජනාවක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකුට ස්වකීය ආසනයෙන් නැඟී සිට "ප්‍රශ්නය/යෝජනාව දැන් විමසිය යුතු" යැයි ඉල්ලා සිටිය හැකිය. එවිට, එම ඉල්ලීම සභා රීති අයුතු අන්දමට පාවිච්චි කිරීමකැයි හෝ සෙසු පාර්ශවයන්ගේ අයිතිවාසිකම් කඩ කිරීමකැයි මූලාසනයට පෙනෙතොත් මිස "එකී යෝජනා පිළිබඳව ඡන්දය දැන් විමසිය යුතුය" යන ප්‍රකාශය කොට ඡන්දය විමසිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 59 (2) -

*"මෙම රීතිය යටතේ කිසියම් ප්‍රශ්නයක්/ යෝජනාවක්, ගණපූරණයට යටත්ව එදින පැමිණ සිටින මන්ත්‍රීවරුන්ගේ බහුතර ඡන්දයෙන් වලංගුභාවයට පත් වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බෙදීම.

රීති අංක 60 (1) -

*"සභාපතිවරයා විසින් ප්‍රශ්නය/යෝජනාව සභාවට ඉදිරිපත් කර ඊට "පක්ෂයි" සහ "විරුද්ධයි" යනුවෙන් කටහඬවල් අනුව ඡන්දය ගෙන එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් මේ ජෝර්ජ් මන්ත්‍රීතුමා, දැන් මේ කාර්ය පටිපාටි රීති සම්බන්ධයෙන් ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කරන ලද සේවය අගය කිරීමක් වශයෙන් සියලුම චෝදනාවලින් නිදහස් කරන්න ඕනෑය කියලා මම යෝජනා කරනවා. හරි. සම්මතයි නේද? ශ්‍රීනාත් මන්ත්‍රීතුමා, දැන් උත්තර දෙන්න ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, 60(11) රීතියට සංශෝධනයක් තිබෙනවා. ඉදිරිපත් කරනවාද? විද්‍යුත් ඡන්ද ක්‍රමය ගැන.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, *"විද්‍යුත් මාධ්‍යයෙන් ඡන්දය විමසන විට මන්ත්‍රීවරුන් සභාපතිතුමා විසින් නියම කරනු ලබන*

*කාල සීමාව තුළ ඔවුන්ගේ තීරණය දැක්වීම සඳහා අදාළ බොත්තම එබිය යුත්තේය."* මේක ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවේ යෝජිත ස්ථාවර නියෝගවල 47(2)(ආ) යටතේ තිබෙන කාරණයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයි නේද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක අපි අලුතින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අලුත් ගොඩනැගිල්ලට ගියාට පස්සේ ඒක අපි පාවිච්චි වෙනවා. දැනට පාවිච්චි වෙන්නේ නැහැ ඒක.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, 60 (11) යටතේ ඒක තිබෙනවා. නව තාක්ෂණය උපයෝගී කර ගෙන සභාවේ ඡන්ද විමසන විට කියලා. විද්‍යුත් ඡන්ද ක්‍රමය සඳහා පාර්ලිමේන්තුව අනුගමනය කරනු ලබන රීති කියලා තිබෙනවා. මම කිව්වේ, පාර්ලිමේන්තුව අනුගමනය කරන රීතියට අනුකූල කාරණයක්. ඕනෑ නම් ඒ කාරණය එහෙමම්ම ඇතුළත් කර ගන්නත් පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදාළ රීතිය 60(4) ලෙස ඇතුළත් වෙනවා. 60(11) රීතිය වෙනුවට. අනික් රීති පසුව පිළිවෙළට නම් වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (2) -

*"ප්‍රශ්නයක්/යෝජනාවක් සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා සිටින්නේ නම්, එවැනි අවස්ථාවකදී බෙදීම සිදු කළ යුත්තේ, විනාඩි දෙකක් සීනුව නාද කරවීමෙන් පසුව ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (3) -

*"එසේ බෙදීමක් ඉල්ලා සිටින කල්හී පළමුව යෝජනාවට පක්ෂව සිටින මන්ත්‍රීවරුන්ට නැඟී සිටීමට නියම කොට ලේකම්වරයා මගින් ගණන් කර වීමටත්, දෙවනුව විරුද්ධව සිටින මන්ත්‍රීවරුන්ට නැඟී සිටීමට නියම කොට ලේකම්වරයා මගින් ගණන් කර වීමටත්, තෙවනුව යෝජනාවට වැළකී සිටින මන්ත්‍රීවරුන්ට නැඟී සිටීමට නියම කොට ලේකම්වරයා මගින් ගණන් කිරීමටත් සලස්වා ලේකම්වරයා විසින් තමන්ට දැනුම් දෙන ලද ගණන් කිරීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට සභාපතිවරයා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (4) -

*"නමින් ඡන්දය විමසිය යුතු යැයි 60 (2) අනුරීතිය යටතේ යම් මන්ත්‍රීවරයකු ඉල්ලා සිටිය හොත් සභාපතිවරයාට තම අභිමතය පරිදි නමින් ඡන්දය විමසීමට හෝ 60 (3) අනුරීතිය යටතේ ක්‍රියා කිරීමට හෝ හැකි ය."*

මෙය 60(5) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (5) -

*"නමින් ඡන්දය විමසීමේ දී ඒ ඒ මන්ත්‍රීවරයාගේ නම ප්‍රකාශ කරන විට ඒ මන්ත්‍රීවරයා තම අභිමතය පරිදි*

*"පක්ෂයි" හෝ "විරුද්ධයි" හෝ යනුවෙන් ප්‍රකාශ කළ යුතු ය."*

මෙය 60(6) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (6) -

*"නමින් ඡන්දය විමසීමේ දී ආණ්ඩු පක්ෂයේ නම් මුලින්ම ප්‍රධාන අමාත්‍යවරයාගෙන් ද, විපක්ෂයේ නම් විපක්ෂ නායකවරයාගෙන් ද ආරම්භ කර ආසන අනුපිළිවෙළට ඡන්දය විමසිය යුතු ය."*

මෙය 60(7) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (7) -

*"තමන් ඡන්දය දීමෙන් වළකින බව ප්‍රකාශ කිරීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට මන්ත්‍රීවරුන්ට හැකි ය. එවැනි අවස්ථාවකදී ඔවුන් ඡන්දය දීමෙන් වැළකී සිටි අය ලෙස ලේකම් විසින් සටහන් කළ යුතු ය."*

මෙය 60(8) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (8) -

*"ලේකම්වරයා විසින් ඡන්ද සංඛ්‍යාව සභාපතිවරයාට දැනුම් දිය යුතු අතර, අසමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබී ඇති විට සභාපතිවරයා විසින් එම ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු ය."*

මෙය 60(9) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (9) -

*"සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබී ඇති විට, ප්‍රතිඵල නිකුත් කිරීමට පෙර සභාපතිවරයා විසින් ඔහුගේ තීරක ඡන්දය පාවිච්චි කළ යුතු ය."*

මෙය 60(10) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (10) (අ) -

*"ප්‍රධාන අමාත්‍යතුමා හෝ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හා විපක්ෂ නායකතුමා හෝ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයෙකුට යම් යෝජනාවක් සම්බන්ධයෙන් රහස් ඡන්දයක් ලබා දිය යුතු යැයි ඉල්ලා සිටිය හැකිය. එවන් අවස්ථාවකදී එකී යෝජනාවට අදාළව රහස් ඡන්දයක් පැවැත් වීමට කටයුතු සැලසිය යුතු ය."*

මෙය 60(11) (අ) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (10) (ආ) -

*"එවැනි අවස්ථාවකදී විනාඩි දෙකක් කැඳවීම් සීනුව නාද කිරීමෙන් පසුව ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්දය විමසිය*

*යුතුය. එසේ වුවද, රහස් ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය සඳහා කාලය අවශ්‍ය බව හැඟී යන්නේ නම්, සභාපතිවරයා තීරණය කරන පරිදි කෙටි කාල සීමාවකට සභාව තාවකාලිකව අත්සිටු විය හැකි ය."*

මෙය 60(11) (ආ) වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 60 (11) රීතිය 60(3) ලෙස සංශෝධනය කළා.

රීති අංක 60 (12) -

*"ඡන්ද විමසීමේ ප්‍රතිඵල අදාළ දින කාර්ය සටහන්වල ඇතුළත් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේක්ෂණය.

රීති අංක 61 -

*"සභාවේ න්‍යාය පත්‍රයට කලින් සිට ඇතුළත් යෝජනාවක හෝ යෝජිත ප්‍රඥප්තියක විෂයය කරුණු හා අදාළව යෝජනාවක් ඉදිරිපත් කිරීම හෝ සංශෝධනයක් යෝජනා කිරීම හෝ රීති විරෝධී වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 62 (1) –

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ I වන ලැයිස්තුවෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් සම්පාදනය කිරීමට යෝජිත යම් නීතියක් පිළිබඳව සභාවේ අදහස් විමසා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලිපියක් ලැබුණු යම් අවස්ථාවක දී එය ලැබුණු බව සභාපතිවරයා විසින් ඊළඟ පළාත් සභා රැස්වීමේ දී ප්‍රකාශ කළ යුතු ය. එබඳු ලිපියක් ලැබෙන අවස්ථාවක දී සභාවේ රැස්වීමක් පැවැත් වේ නම්, සභාවේ වැඩ කටයුතු එම ප්‍රකාශය කිරීම සඳහා තාවකාලිකව අත්හිටුවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 62 (2) -

*"ඉන් අනතුරුව එම දැන්වීම ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය. ප්‍රඥප්ති සහ නීති පිළිබඳ කාරක සභාව එම දැන්වීම ලැබී දින තුනක් ඇතුළත රැස්වීමෙන් අනතුරුව පසු දිනම ස්වකීය වාර්තාව යෝජිත නීතියට අදාළ පළාත් විෂයය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 62 (3) -

*"එම වාර්තාව ඊළඟට පැවැත්වෙන පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමට අදාළ අමාත්‍යවරයා විසින් යොමු කළ යුතු අතර, එහිදී යෝජිත නීතිය පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ තීරණය සභාවේ ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 62 (4) -

*"ලේකම්වරයා ඊළඟට පැවැත්වෙන පළාත් සභාවට එය ඉදිරිපත් කළ යුතු අතර, පළාත් සභාවේ තීරණය පළාත් සභාව රැස්වී දින තුනක් ඇතුළත ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලෙස සභාව ලේකම්වරයාට නියම කළ යුතු ය.*

*එසේ වුවද, අවශ්‍ය වූ විටකදී සභාපතිතුමාගේ එකඟත්වයට යටත්ව එකී කාලසීමාවන් දීර්ඝ කළ හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 63 (1) -

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ III වන ලැයිස්තුවෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් සම්පාදනය කිරීමට යෝජිත යම් නීතියක් පිළිබඳව සභාවේ අදහස් විමසා පාර්ලිමේන්තුවෙන් ලිපියක් ලැබුණු බව සභාපතිවරයා විසින් ඊළඟ පළාත් සභා රැස්වීමේ දී ප්‍රකාශ කළ යුතු ය. එබඳු ලිපියක් ලැබෙන අවස්ථාවේ දී සභාවෙහි රැස්වීමක් පැවැත් වේ නම්, සභාවෙහි වැඩ කටයුතු එම ප්‍රකාශය කිරීම සඳහා තාවකාලිකව අත්හිටුවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 63 (2) -

*"ඉන් අනතුරුව එම දැන්වීම ප්‍රඥප්ති සහ නීති කාරක සභාවට යොමු කළ යුතු ය. ප්‍රඥප්ති හා නීති කාරක සභාව එම දැන්වීම ලැබී දින 03 ක් ඇතුළත රැස්වීමෙන් පසු දින තම වාර්තාව ඊළඟ පළාත් සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට හැකි වන සේ ලේකම්වරයාට භාර දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 63 (3) -

*"පළාත් සභාවේ අදහස් සලකා බැලීමෙන් පසුව එම යෝජිත නීතිය පිළිබඳව සභාවේ තීරණය දින 03 ක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ලේකම්වරයාට නියම කළ යුතු ය. එසේ වුවද, අවශ්‍ය වූ විටකදී සභාපතිතුමාගේ එකඟත්වයට යටත්ව එකී කාලසීමාවන් දීර්ඝ කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාද පිළිබඳ රීති.

රීති අංක 64 (1) -

*(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) (4) ව්‍යවස්ථාවට යටත්ව ජනාධිපතිවරයාගේ හෝ ආණ්ඩුකාරවරයකුගේ හෝ විනිශ්චයකාරවරයකුගේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ හෝ පැවැත්ම සභාවේ සාකච්ඡා කිරීම තහනම් කරන පනතේ 18 වන වගන්තිය දැඩි ලෙස පිළිපැදිය යුතු ය. එසේ වුවද ඉහත ධූරධාරීන්ගේ පැවැත්මට සහ චරිතයට අගතියක් නොවන පරිදි සභාපතිවරයාගේ අභිමතය පරිදි සාකච්ඡා කළ හැකිය.*

*(ආ) යම් මන්ත්‍රීවරයෙකු 64(1)(අ) යටතේ කථා කිරීමට කටයුතු කරන්නේ නම් එය සභාපතිවරයාගේ අභිමතය පරිදි විය යුතුය.*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 64 (2) -

*"පළාත් සභා මන්ත්‍රීවරයකුගේ පැවැත්ම පිළිබඳව එම විෂයය සඳහා වන විශේෂ යෝජනාවක දී හැරුණු විට සාකච්ඡා නොකළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 64 (3) -

*"ස්වකීය අභිමතය පරිදි කටයුතු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ පනතින් ඉඩ ලැබෙන තාක් දුරට, ආණ්ඩුකාරවරයකුට තම කාර්යයන් සපුරාලීම කෙරෙහි බලපාන කිසියම් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමක් සිදු නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 64 (4) -

*"ඉහත අංක (1) සහ (2) අනු රීතිවල සඳහන් වන්නා වූ පුද්ගලයකුගේ පැවැත්ම පිළිබඳවත් අංක (3) අනු රීතියෙහි දැක්වෙන කිසියම් කරුණක් පිළිබඳවත් යම් සංශෝධනයක දී හෝ අමාත්‍යවරයකු වෙත ඉදිරිපත් කෙරෙන යම් ප්‍රශ්නයක දී හෝ විවාදයක දී හෝ සඳහන් කිරීම නොකළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 64 (5) -

*"සභාව ඉදිරියේ ඇති කිසියම් යෝජනාවක් පිළිබඳව පහත සඳහන් තත්ත්වයන් හා කරුණු යටතේ විනා කිසිදු මන්ත්‍රීවරයකු එක් වරකට වැඩියෙන් කථා නොකළ යුතු ය."*

*(අ) අලුතින් කරුණු ඉදිරිපත් කිරීමකින් තොරව, ස්වකීය කථාවේ වරදවා තේරුම් ගෙන ඇති වැදගත් කොටසක් පැහැදිලි කරලීම පිණිස පමණක් සභාපතිවරයා වෙතින් ලත් පූර්ණ අවසරය මත*

*(ආ) රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන්*

*(ඇ) වරප්‍රසාද ප්‍රශ්නයක් සම්බන්ධයෙන්*

*(ඈ) පූර්ණ කාරක සභාවට යොමු කළ කරුණක් සම්බන්ධයෙන්*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 64 (6) -

*"කෙසේ වුවද යෝජනාවක් ඉදිරිපත් කරන මන්ත්‍රීවරයාට, එම යෝජනාව සම්බන්ධයෙන් සභාව ඇමතීමට සිටින අනිකුත් මන්ත්‍රීවරුන් සභාව ඇමතීමෙන් අනතුරුව පිළිතුරු දීමට හැකි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 65 (1) -

*"යම් යෝජනාවක් හෝ සංශෝධනයක් ඉදිරිපත් කරන මන්ත්‍රීවරයාට ඒ වෙනුවෙන් කථා කිරීමට පිළිවන්කම*

*ලැබුණු ද, එම යෝජනාව හෝ සංශෝධනය හෝ නිසි පරිදි ස්ථිර කෙරෙන තුරු ඒ සම්බන්ධයෙන් විවාදයකට ඉඩ නොලැබෙන අතර, ඒ පිළිබඳ විමසීමක් ද නොකළ යුතු ය. එතෙකුදු වුවත් අමාත්‍යවරයකු විසින් ගෙනෙනු ලබන පොදු කටයුතු සම්බන්ධයෙන් කරනු ලබන කිසියම් යෝජනාවක් හෝ සංශෝධනයක් හෝ ස්ථිර කිරීම අවශ්‍ය නොවේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 65 (2) -

*"ඕනෑම මන්ත්‍රීවරයකුට තමන්ට වෙන් කර ඇති ආසනයෙන් නැඟී සිට මූලාසනයට ආචාර කොට කිසියම් යෝජනාවක් ස්ථිර කිරීමට හෝ සංශෝධනයක් ස්ථිර කිරීමට හෝ පුළුවන. එය ඒ මන්ත්‍රීවරයාට පසුව කථා කිරීමට ඇති අයිතියට අවහිරතාවයක් නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 66 (1) -

*"සභාපතිවරයා විසින් ප්‍රශ්නයක් සමාප්තියට පත් කරනු ලැබීමෙන් පසු කිසිදු මන්ත්‍රීවරයකු ඒ සම්බන්ධයෙන් කථා නොකළ යුතු ය. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසු එම ප්‍රශ්නය සමාප්තියට පත් වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 66 (2) (අ) -

*"යෝජනා කොට විවාදයට ලක් කිරීමෙන් පසු නිගමනය කර ඇති යම් කරුණක් එකම වසරක් තුළ දී හෝ නැවත යෝජනා කොට විවාද කළ නොහැක්කේ ය."*

*(ආ)*

*"එසේ වුවද, කාලීන වැදගත්කමින් යුත් කරුණක් ලෙස සභාපතිවරයාට හෝ සභා කටයුතු කාරක සභාවට හැඟී යන්නේ නම් සභාව හෝ සභා කටයුතු කාරක සභාව තීරණය කරන පරිදි ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරුන්ගේ කථා පැවැත්වීම හා සම්බන්ධ රීති.

රීති අංක 67 (1) -

*"තමන්ට වෙන් කර දී ඇති ආසනයෙන් පිට සිට මන්ත්‍රීවරයකු සභාව ඇමැතීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීම හෝ නොකළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (2) -

*"අන් අයුරකින් කථා කිරීමට සභාපතිවරයා අවසර දුන්නොත් මිස, සෑම මන්ත්‍රීවරයකුම කථා කළ යුත්තේ නැඟී සිට ය. සෑම මන්ත්‍රීවරයකුම සභාපතිවරයා අමතමින් කථා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (3) -

*"එක්වර මන්ත්‍රීවරු දෙදෙනෙක් හෝ වැඩි දෙනෙක් හෝ නැඟී සිටිත් නම්, සභාපතිවරයා මුලින්ම තම නෙත ගැටුණු*

මන්ත්‍රීවරයාට ආමන්ත්‍රණය කොට කථා කිරීමට ඔහුට දැන්විය යුතු ය. සභාපතිවරයාගේ තීරණය අභියෝගයට ලක් නොකළ යුතුය."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (4) -

"මන්ත්‍රීවරයකුට යම් නිරීක්ෂණයන් වේ නම්, ඒවා සභාපතිවරයා වෙත යොමු කළ යුතු ය."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (5) -

"මන්ත්‍රීවරයකුට සභාව ඉදිරියේ ඇති යම් විෂයයක් සම්බන්ධයෙන් හෝ ඊට යෝජනා කොට ඇති සංශෝධනයක් සම්බන්ධයෙන් හෝ විවාදයේ දී උද්ගත වන රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් හෝ විනා වෙනත් කරුණක් සම්බන්ධයෙන් කථා කිරීමට නොපිළිවන."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (6) -

"මන්ත්‍රීවරයකු ස්වකීය අදහස් දැක්වීම සාකච්ඡාවට භාජනව ඇති විෂයයට සීමා කළ යුතු ය."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (7) (1) -

"කිසියම් මන්ත්‍රීවරයකු අධිකරණයක විනිශ්චයකට භාජනව ඇති කරුණක් සම්බන්ධයෙන් හෝ අධිකරණමය තීන්දුවක් අපේක්ෂා කරන කැරුණක් සම්බන්ධයෙන් හෝ සාකච්ඡා කිරීම හෝ හැඟවීම් කිරීම හෝ නොකළ යුතු ය."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (7) (2) -

"67(7)(1) රීතියේ ප්‍රතිපාදන යටතේ යම් මන්ත්‍රීවරයෙකු විරෝධය පළ කරන්නේ නම්, එකී මන්ත්‍රීවරයා විසින් එය සනාථ කිරීම සඳහා කටයුතු ඉටු කළ යුතු ය."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (8) -

"කිසිදු මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකු වෙත අපහාසාත්මක ප්‍රකාශයන් හෝ පෞද්ගලික චෝදනා නැගීම හෝ නොකළ යුතු ය."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (9) -

"කථා කරමින් සිටින මන්ත්‍රීවරයකු අදාළ විෂයයෙන් පිටස්තරව කථා කරන්නේ නම්, ඔහුව සභාපතිවරයා හරහා දැනුවත් කළ හැක්කේ ය."

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (10) -

*"සභාවේ ඒ පිළිබඳ ප්‍රශ්නයක් සභාභිමුඛ කර නොතිබුණ ද, සභාපතිවරයාගේ අවසරයට යටත්ව මන්ත්‍රීවරයකුට තමා පිළිබඳ වූ පෞද්ගලික කරුණු පහදා දිය හැකි ය. එහෙත් එවැනි කරුණු විවාදයකට භාජනය කළ නොහැකි ය. එමෙන්ම එම කථාව තමාගේ පැවැත්ම දෝෂමුක්ත කිරීමට පමණක් සීමා විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 67 (11) -

*"රීතිවලින් බැහැරව යන කිසියම් මන්ත්‍රීවරයකු සභාපතිවරයා විසින් වහාම හෝ, රීති ප්‍රශ්නයක් මතු කිරීම මගින් වෙනත් මන්ත්‍රීවරයකු විසින් හෝ නිසි මාර්ගයට යොමු කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරුන්ගේ හැසිරීම.

රීති අංක 68 (1) -

*"මන්ත්‍රීවරුන් සභා ප්‍රදේශය ඇතුළත සියලුම අවස්ථාවන්හි දී සභාවේ ගරුත්වය හා සභාපතිවරයාගේ අධිකාරිය රකිමින් විනීත අන්දමින් හැසිරිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 68 (2) -

*"මන්ත්‍රීවරුන් සභාවට පැමිණෙන විට සහ සභාවෙන් පිට වන විට මූලාසනයට හිස නමා ආචාර කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 68 (3) -

*"සභාවේ හෝ කාරක සභාවක රැස්වීම්වලට සහභාගී වන විට සභාවේ සභාපතිවරයා විසින් නියම කර ඇති උපදෙස් පරිදි මන්ත්‍රීවරුන් සභා අත්පොතෙහි සඳහන් ඇඳුමින් සැරසී සිටිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 68 (4) -

*"සභාවේ රැස්වීමක් හෝ මුළු සභාවෙහි ම කාරක සභා රැස්වීමක් හෝ පැවැත්වෙන කාලය තුළදී මන්ත්‍රීවරයකු ;*

*(අ) රැස්වීම් ශාලාවට ඇතුළු වීම හෝ ඉන් පිට වීම හෝ අවශ්‍ය වන විට නිශ්ශබ්දව හා අවහිරයක් සිදු නොකොට එසේ කළ යුතු ය.*

*(ආ) සභා ගර්භය මැදින් හෝ මූලාසනයත්, කථා කරමින් සිටින මන්ත්‍රීවරයාත් අතරින් හෝ ගමන් නොකළ යුතු ය.*

*(ඇ) සභාවට ඉදිරිපත් කොට තිබෙන කාර්යයන්ට අදාළ පුවත්පත්, ලිපි ලේඛන හැර, අදාළ නොවන පුවත්පත්, පොත්, ලියුම් හෝ වෙනත් යමක් හෝ නොකියැවිය යුතු ය.*

*(ඇ) යම් ලේඛනයක උපුටනයක් ගෙන හැර දක්වමින් යම් මන්ත්‍රීවරයෙකු කථා කරන්නේ නම්, එම උපුටනය අඩංගු ලේඛනයේ නම, ප්‍රකාශනයට පත් කර ඇති දිනය හා පිටු අංකය ද, අදාළ ඡේදය ද තම කථාවේ දී සඳහන් කළ යුතු අතර, එම ලේඛනය සභාගත කිරීමට ද මන්ත්‍රීවරුන් විසින් වගබලා ගත යුතු ය.*

*(ඉ) සභාවේ දී සඳහන් කළ ප්‍රකාශය සහ සභාගත ලියවිල්ලේ අදාළ කොටස අතර යම් පරස්පරතාවක් තිබෙයි නම්, එම පරස්පරතාවයෙන් යුතු කොටස නිල වාර්තාවෙන් ඉවත් කිරීමේ බලය සභාපතිවරයාට ඇත්තේ ය.*

*(ඊ) රීති විරෝධී යැයි සැලකෙන යම් කරුණක් හෝ ප්‍රකාශයක් ඇත්නම් එම කරුණ හෝ ප්‍රකාශය නිල වාර්තාව සභාගත කිරීමට පෙර ඉවත් කිරීමේ බලය සභාපතිවරයාට ඇත්තේ ය.*

*(උ) සභා ගර්භය තුළ දුම්පානය කිරීම හෝ යම් ආහාර පාන ගැනීම ආදියක් හෝ නොකළ යුතු ය. එසේ වුවද සභාව අමතන අවස්ථාවේ යම් මන්ත්‍රීවරයකුට වතුර පානය කිරීමට අවශ්‍ය වුවහොත් ඊට බාධාවක් නොතිබිය යුතු ය.*

*(ඌ) වෙනත් මන්ත්‍රීවරයකු කථා කරන විට නිශ්ශබ්දව සිටිය යුතු අතර, එසේ කථා කරන මන්ත්‍රීවරයා විසින් ඉඩ දෙනු ලැබුවොත් මිස, ඔහුගේ කථාවට බාධා නොකළ යුතු ය.*

*(එ) සභාව ඉදිරියේ අදහස් ප්‍රකාශ කරන මන්ත්‍රීවරයෙකුට තමාගේ කථාවට අදළ තොරතුරු තහවුරු කිරීම සඳහා හෝ පරීක්ෂා කිරීම සඳහා සභාපතිවරයාගේ අවසරය මත පරිගණක භාවිතා කළ හැක. එසේ වුවද, සභාවේ අවධානය කඩවන පරිදි ඒවා භාවිතා කරන බව පෙනී යන්නේ නම්, සභාවේ අවධානය එම මන්ත්‍රීවරයා වෙත යොමු කරවා ඔහුගේ කථාව හෝ ක්‍රියාව නතර කිරීමට සභාපතිවරයාට බලය ඇත.*

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, කාරණා දෙකක් මම මතු කළා කලින්. එකක් අර බීමත්ව පැමිණීම කියන එක. අනික් එක සෙංකෝලය සම්බන්ධයෙන්. ඒක කොහොමද මේකේ ඇතුළත් වෙන්නේ කියන එක පිළිබඳව සාකච්ඡා කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, දැන් සෙංකෝලය පළාත් සභා ගර්භය ඇතුළත තැන්පත් කර ඇති විට යම් මන්ත්‍රීවරයෙකු එය ස්පර්ශ කිරීම හෝ එසවීම හෝ කිසියම් හෝ අලාභයක් සිදු කිරීම බරපතළ විනය විරෝධී ක්‍රියාවක් වන අතර, එම වරද කරනුයේ පළමුවරට කියන කාරණය නොසලකා එම මන්ත්‍රීවරයාට පළාත් සභාව කොපමණ කාලයකටද - දැන් අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා මාස තුනකට වඩා වැඩි වෙන්න බැහැ. එහෙම වුණොත් එහෙම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රී ධුරය අහෝසි වෙනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මාසයක.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

එතකොට හැම මන්ත්‍රීවරයාම උස්සයිද දන්නේ නැහැ. මාසයක නිවාඩුවක් හම්බ වෙන හින්දා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතකොට දැන් මෙහෙමයි. ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ නම් මාසයක් කියන්නේ වාර අටක්. ගරු සභාපතිතුමනි, රැස්වීම් අටයි. අපේ රැස්වීම් අටක් කියන්නේ මාස හතරක්. ඒක හිතලා තමයි මාස හතරක් කිව්වේ. හැබැයි, මාස තුනකට පහු වුණොත් ඒ ප්‍රශ්නය එන නිසා -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මාසයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි. එතකොට වාර දෙකයි. මාස දෙකයි. - මාස දෙකකට අත් හිටුවනු ලැබිය යුත්තේය. දැන් අපි කියන්නේ මාස දෙකයි කියලා නේ. ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා, මාස දෙකයි කියලා නේද යෝජනා කළේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මාස දෙකයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මාසයයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මාසයකට අත්හිටුවනු ලැබිය යුත්තේය. ඒ කියන්නේ සභා වාර දෙකයි. ඉහත රීතියට අනුකූලව එක් මන්ත්‍රීවරයෙකුට වඩා වැඩි පිරිසක් නම් එවලේ නම් නොකළ යුතුය. එය වරප්‍රසාද කාරක සභාවට යොමු කොට විමර්ශනයකින් අනතුරුව අදාළ මන්ත්‍රීවරුන් වරදකරුවන් වන්නේ නම් ඉහත රීතිය අනුව ක්‍රියා කළ යුතුය.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

එහෙම නම් දෙවැනි වෙලාවටත් මේ සෙංකෝලය ඉස්සුවොත් මොකද කරන්නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි. මාසයක් හෝ රැස්වීම් වාර දෙකක් කියලා දැම්මොත් හොඳ නැද්ද? සමහර වෙලාවට එක මාසයට රැස්වීම් තුනකුත් තියන අවස්ථා ඇවිල්ලා තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක කමක් නැහැ. මාසයක් කියලා දාමු.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මාසයක් හෝ රැස්වීම් වාර දෙකක්.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ගරු සභාපතිතුමනි, සෙංකෝලය වීදුරු පෙට්ටියක ආවරණය කරලා තිබ්බොත් ඊට වඩා හොඳ නැද්ද? මේ නීති රීති දාන එක මම හිතන හැටියට සෙංකෝලය ආවරණය කරමු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බැහැ. එතකොට සෙංකෝලය උස්සාගෙන එන්නේ කොහොමද? ඒක ප්‍රායෝගික නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සෙංකෝලයට අපි විදුලිය සම්බන්ධ කරමු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අලි වැටක් ගහමු.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

තව ටික දවසකින් ඩිජිටල් ෆොටෝ එකක් දාන්න කියයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මාසයකට අත්හිටුවන්න කියලා කියන්නේ ඒ මාසය තුළ සියලු වරප්‍රසාද, දීමනා අහිමි වෙනවා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

වැටුපත් අයින් කරනවාද? ඒක හොඳයි

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වැටුප් හා දීමනා කියලා දාන්න.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

දැන් ගියවර සභා රැස්වීමකදී මම හිතන හැටියට 25 ක් 30 ක් විතර සෙංකෝලය අත ගැහුවා. ඒ වාගේ කණ්ඩායමක් වුණොත් 30 දෙනෙක් විතර අහිමි වෙනවා සභාවට එන එක. ඒ නිසා වීදුරු පෙට්ටියක් හදලා -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

30 දෙනෙකුට එක පාර කරන්න බැහැ නේ? ඉස්සෙල්ලාම එන කෙනා සොයන්න පුළුවන් නේ පැහැදිලිවම.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

නමුත් ඕකත් එක්ක හැප්පුනා නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒවා නවත්වන්න තමයි දාන්නේ. කට්ටිය යන්නේ නැහැ එතකොට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට රීතිය වන්නේ, 68(4)(ඒ) ලෙස,

*"සෙංකෝලය පළාත් සභා ගර්භය ඇතුළත තැන්පත් කර ඇති විට යම් මන්ත්‍රීවරයෙකු එය ස්පර්ශ කිරීම හෝ එසවීම හෝ කිසියම් හෝ අලාභයක් සිදු කිරීම බරපතළ විනය විරෝධී ක්‍රියාවක් වන අතර, එම වරද කරනුයේ පළමුවරට කියන කාරණය නොසලකා එම මන්ත්‍රීවරයාට පළාත් සභාව මාසයකට අත්හිටවනු ලැබිය යුත්තේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට රීති අංක 69 -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේක ජූලි මාසේ 28 වැනිදා තිබුණු වැඩ මුළුවේදීත් මම මතු කළා. මත්ද්‍රව්‍යයක් පානය කර ඇති බව කවුරු හරි මන්ත්‍රීවරු දෙදෙනෙක් පැමිණිලි කළ හොත් - එදා අපි සාකච්ඡා කළා දීර්ඝ වශයෙන් වැඩ මුළුවේදී. මන්ත්‍රීවරු දෙදෙනෙක් නම් කළොත් ඒ පිළිබඳව සභාපතිවරයාට පුළුවන් යම් තීරණයක් ගන්න කියලා. ඒක ගැනත් යම් අදහසක් මෙතැනට ඇතුළත් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එයාව ඉවත් කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ බීමත්ව නේ. මන්ත්‍රීවරයෙක් පිස්තෝලයක් ගෙනාවොත් සභාවට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එක්කෙනෙක් නොවෙයි. මන්ත්‍රීවරු දෙදෙනෙකුට වැඩි ගණනක්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, බීලා එන එක අන්තිම වැරදියි. නමුත් සමහර අය කියනවා, මෙයා බීලාද අහනවා ඉන්නේ. ඇත්තටම ඒ මනුස්සයා බීලා නොවෙයි. අපි කවුරු හරි නම් කළොත් එහෙම බීලා කියලා ඒ මනුස්සයාව එළියට දැම්මොත් පත්තරවල යයි ඒ මනුස්සයාව බීලා ඉවර වෙලා එළියට දැම්මාය කියලා. ඒක ලොකු අසාධාරණයක් වෙනවා මන්ත්‍රීවරයාට. එහෙම නම් වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. ඇත්තටම බීලා ඇවිල්ලා මෙතැන හැසුරුණාට පස්සේ එයාගේ මුහුණටම කිව්වාම බීලා කියලා. මොකක්ද මට කියපු කාරණාව? ඒක රීතිවල නැහැ. බීලා එන්න එපාය කියලා රීතිවල නැහැයි කිව්වා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු මන්ත්‍රීතුමා කියන එක පැහැදිලියි. බීලා එන එක වැරදියි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

පසුගිය සිදුවීම් නොවෙයි. අනාගතයට නොවෙන්න නේ මේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

සභාවට බීලා එන එක සම්පූර්ණ වැරදියි. නමුත් ඒක සභාපතිතුමාට තීන්දු කරන්න බැහැ බීලා ද නැද්ද කියලා. දැන් ගැටළුවක් නැහැ නේ? බියර් ලාභ කරලා තිබෙන්නේ. බොන්න කියලා තිබෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මෙතුමා අහනවා බීලා එන එකද හොඳ? පිස්තෝලයක් අරන් එන එක ද හොඳ? කියලා. ඕක නොවෙයි ප්‍රශ්නය. බීලා පිස්තෝලයකුත් අරන් අවොත් මොකද කරන්නේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

මෙහෙමයි. දැන් ප්‍රශ්නයක් නැහැ. ඉස්කෝල ළමයින්ටත් බියර් බොන්න කියලා තිබෙන්නේ. ඒ හින්දා ප්‍රශ්නයක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ බහුතරයක් වැදගත් විධියට ඉන්නවා නේ. අපි ඒ සම්බන්ධව ප්‍රශ්නයක් ආවොත් පොලීසියට භාර දෙමු. ඒක රීතියට අවශ්‍ය වනේනෙ නැහැ. සභාපතිතුමාගේ අභිමතය තියා ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. අපි ඊළඟ එකට යමු කෝ. රීති අංක 69.

*"සභාවෙහි සෑම රැස්වීවකදීම හෝ මුළු සභාවේම කාරක සභා රැස්වීමකදී හෝ සභා පිළිවෙත පිළිබඳ නියමයන් පිළිපැදීම ගැන සභාපතිවරයා වගකිව යුතු අතර, එම පිළිවෙත පිළිබඳ යම් රීති ප්‍රශ්නයකට අදාළව ඔහුගේ තීරණය ගැන ප්‍රශ්න කිරීම කළ නොහැකි ය. එමෙන්ම දැනුම් දීමකින් පසුව කෙරෙන වෙනත් යෝජනාවක් මගින් මිස, සභාව විසින් එම තීරණය සමාලෝචනය නොකළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 70 -

*"විවාදයක් අතරතුරදී සභාපතිවරයා සභාව අමතන යම් අවස්ථාවකදී, කථා කරමින් සිටින හෝ කථා කිරීම සඳහා ඉදිරිපත් වන යම් මන්ත්‍රීවරයෙකු සිය ආසනයෙහි අසුන් ගත යුතු අතර, සභාපතිවරයාගේ කථාව අවහිරතාවයකින් තොරව ඇසෙන පරිදි සභාව හෝ කාරක සභාව හෝ නිශ්ශබ්ද විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 71 -

*"අනුගමනය කළ යුතු රීති පිළිබඳව ප්‍රශ්නයක් නැඟීමෙන් පසු එය නගන මන්ත්‍රීවරයා තම අසුනෙහි වාඩි විය යුතු අතර, සභාපතිවරයා අවසර දුනහොත් හැර වෙනත් කිසිදු මන්ත්‍රීවරයකු එම ප්‍රශ්නය ගැන සභාපතිවරයා තීන්දුවක් දෙන තුරු නැඟී නොසිටිය යුතු ය. මූලාසනය එම තීන්දුව දුන් පසු ඒ අනුව ක්‍රියා කරමින් එම ප්‍රශ්නය නැඟූ අවස්ථාවේ දී සභාව හෝ කාරක සභාව අමතමින් සිටි මන්ත්‍රීවරයාට කථාව තවදුරටත් කර ගෙන යෑමට අයිතිය ඇත."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 72(1) -

*"අනුගමනය කළ යුතු රීති ක්‍රියාත්මක කිරීම පිළිබඳව හෝ එහි අර්ථ නිරූපනය පිළිබඳව හෝ සභාවේ වැඩ කටයුතු විධිමත් කිරීමට අදාළ වන රීතියක් සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අනු දැනුම ඇතිව රීති ප්‍රශ්නයක් නැගිය හැකි විය යුතු ය. මෙම රීති සම්බන්ධයෙන් හෝ සභාවේ කටයුතු විධිමත් කිරීමට අදාළ වන කුමන රීතියක් සම්බන්ධයෙන් හෝ අර්ථ නිරූපනය පිළිබඳව යම් වරදක් සිදු වූ ඉක්බිතිවම රීති ප්‍රශ්නය මතු කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 72(2) -

*"එම රීති ප්‍රශ්නය මතු කරන අවස්ථාවේදී කථා කරමින් සිටින මන්ත්‍රීවරයා එම රීති ප්‍රශ්නය සම්බන්ධයෙන් සභාපතිවරයාගේ තීරණය දී අවසන් වනතුරු සිය අසුනෙහි වාඩි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 72(3) -

*"රීති ප්‍රශ්නයක් මත රීති ප්‍රශ්නයක් නැඟිය නොහැකි ය. රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සභාපතිවරයාගේ තීරණය දෙන තුරු තවත් රීති ප්‍රශ්නයක් මතු කළ නොහැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 72(4) -

*"රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සභාපතිවරයා යම් තීරණයක් දුන් පසු ඒ පිළිබඳව තවදුරටත් ප්‍රශ්න කළ නොහැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 73 -

*"අදාළ නොවන කරුණු දැක්වීම හෝ තමාගේම තර්ක හෝ විවාදයට සම්බන්ධ සෙසු මන්ත්‍රීවරුන් පාවිච්චි කරන තර්ක පීඩාකාරී ලෙසින් නැවතත් ඉදිරිපත් කිරීමෙහි නිරත යම් මන්ත්‍රීවරයකු සිටින බව පෙනී යන්නේ නම් හෝ යම් මන්ත්‍රීවරයෙකු සභාවේ ගෞරවයට හානි වන ලෙස අවනීත ලෙස හැසිරේ නම් හෝ සභාවේ අවධානය එම මන්ත්‍රීවරයා වෙත යොමු කරවා ඔහුගේ කථාව නතර කරන ලෙස නියම කිරීමට සභාපතිවරයාට හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 74 -

*"යම් මන්ත්‍රීවරයකුගේ හෝ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම හෝ කථා විලාසය නුසුදුසු යැයි සභාපතිවරයාට හැඟී යන්නේ නම්, එම මන්ත්‍රීවරයාට හෝ මන්ත්‍රීවරුන්ට සභාවේ හෝ කාරක සභාවේ හෝ එම දිනයේ ඉතිරි රැස්වීම්වලින් වහාම ඉවත් වන ලෙස සභාපතිවරයා විසින් නියෝග කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරයෙකුගේ සභා සහභාගීත්වය තහනම් කිරීම.

රීති අංක 75(1) -

*"මූලාසනයේ බලතල ගැන නොතකන්නා වූ හෝ සභාවේ හෝ කාරක සභාවේ හෝ වැඩ කටයුතුවලට හිතාමතාම අවහිර කරමින් සභාවේ නියෝග උල්ලංඝණය කරන්නා වූ හෝ ඉහත 74 වන රීතිය යටතේ කරනු ලබන නියෝගයකට අනුව කටයුතු නොකරන්නා වූ යම් මන්ත්‍රීවරයකු සභාපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය. එම වරද සභාවෙහිදී සිදු කර ඇත්නම්, සංශෝධනයකින් හෝ රැස්වීම කල් තැබීමකින් හෝ විවාදයකින් හෝ තොරව හෝ සභාපතිවරයා එම මන්ත්‍රීවරයාගේ නම සඳහන් කරමින් ".......... (නම) .......... සභාවට සහභාගී වීම තාවකාලිකව අත්හිටුවමි" යැයි ප්‍රකාශ කළ යුතු ය. පූර්ණ කාරක සභාවක දී එම වරද සිදු කර ඇත්නම් වහාම සභාව බවට*

*පරිවර්තනය වී, එම වරද සභාවේදීම කරන ලද්දක් සේ සලකා ඉහත සඳහන් යෝජනාව ඉදිරිපත් කොට ඒ ප්‍රශ්නයම ඒ ආකාරයෙන්ම නැඟිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 75(2)(අ) -

*"මෙම නියෝගය යටතේ යම් මන්ත්‍රීවරයකුගේ සභා සහභාගීත්වය තාවකාලිකව අත්සිටුවනු ලැබුවහොත්, ඔහුගේ එම අත්සිටුවනු ලැබීම ප්‍රථම අවස්ථාවේදී එක් සභා වාරයකට වලංගු වනු ඇත. දෙවන අවස්ථාවේදී හෝ එම සැසි වාරය තුළ දී එය සභා වාර දෙකක් වනු ඇත. තුන්වන හෝ ඊට පසු යම් අවස්ථාවකදී හෝ එම සැසි වාරය තුළදීම එය සභා වාර හතරක් වනු ඇත."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 75(2)(ආ) -

*"යම් මන්ත්‍රීවරයෙකුගේ සභා සහභාගීත්වය මාස කිහිපයකට තාවකාලිකව හෝ අත්සිටුවන අවස්ථාවකදී එකී මන්ත්‍රීවරයාට හිමි සියලු වරප්‍රසාද හා දීමනා ඔහුට අහිමි වනු ඇත."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 75(3) -

*"මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු සාමූහිකව වරද සිදු කිරීමෙන් මෙම නියෝගය යටතේ තාවකාලිකව අත්සිටුවීමට නතුවන අවස්ථාවකදී එකී මන්ත්‍රීවරුන් සියලු දෙනාගේම සභා සහභාගීත්වය එක විට තහනම් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 76 -

*රීති අංක "74 හෝ 75 රීතීන් යටතේ ඉවත් වන ලෙස නියම කරනු ලබන්නා වූ හෝ තාවකාලිකව අත්සිටුවනු ලබන්නා වූ හෝ මන්ත්‍රීවරුන් වහාම සභා සීමාවෙන් ඉවත් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 77 -

*"මන්ත්‍රීවරයකු සභාව තුළදී කරන ලද වරදක් සම්බන්ධයෙන් ඔහු සභාව තුළ නොමැති අවස්ථාවක දී ඔහුව නම් කරනු ලැබූ විට, ඔහුගේ සභා සහභාගීත්වය තාවකාලිකව අත්සිටුවීමට යෝජනා කිරීමට සභාපතිවරයාට පුළුවන. එවැනි අවස්ථාවල දී ඒ බව ඒ මන්ත්‍රීවරයාට ලිඛිත ව දැනුම් දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 78 -

*"ඉවත් වන ලෙස නියම කරනු ලබන්නා වූ හෝ තාවකාලිකව සභා සහභාගීත්වය අත්සිටුවනු ලබන්නා වූ*

*හෝ යම් මන්ත්‍රීවරයකු සභා ගැබෙන් ඉවත් නොවේ නම්, එම මන්ත්‍රීවරයා ඉවත් කරවා එම නියෝගය ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ලේකම්වරයාට නියම කිරීමට සභාපතිවරයාට හැකි ය. එවැනි අවස්ථාවලදී සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රතිපත්තිමය සාකච්ඡාව.

රීති අංක 79 -

*"පූර්ණ කාරක සභාවට යොමු වූ කරුණක් සම්බන්ධව වන සියලුම ප්‍රතිපත්තිමය සාකච්ඡාවන් පළාත් සභාව, පූර්ණ කාරක සභාවක් බවට පත් වීමට කලින් සිදු කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පූර්ණ කාරක සභාව.

රීති අංක 80(1) -

*"අවශ්‍ය ඕනෑම වෙලාවක සභාවට පූර්ණ කාරක සභාවක් බවට පත් විය හැකි අතර, යළිත් සභාවේ කටයුතු ඇරඹීමේදී පූර්ණ කාරක සභාවේ කෙරුණු සාකච්ඡාවල ප්‍රගතිය සභාපතිවරයා විසින් සභාවට වාර්තා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 80(2)

*"පූර්ණ කාරක සභාවේ වැඩ කටයුතු කාර්ය සටහන්වල ඇතුළත් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 80(3)

*"සභාපතිවරයා හෝ ඔහු නොමැති විට නියෝජ්‍ය සභාපතිවරයා හෝ ඔහුත් නොමැති විට මූලාසනය දැරීම සඳහා 8(1) සහ 8(3) රීතීන් යටතේ ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 80(4) -

*"පූර්ණ කාරක සභාවක් විසින් සලකා බැලිය යුත්තේ, එම කාරක සභාව වෙත යොමු කර තිබෙන කරුණු පමණකි."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 81(1) -

*"සභා රැස්වීමකට අදාළ කාර්ය පටිපාටි රීති පූර්ණ කාරක සභා රැස්වීමට ද අදාළ වේ. එසේ වුවද, පූර්ණ කාරක සභා රැස්වීමකට අදාළව, "*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 81(1)(අ) -

*"යෝජනාවක් සඳහා කල් දීමක් අවශ්‍ය නොවේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 81(1)(ආ) -

*"යෝජනාවක් ස්ථිර කිරීම අවශ්‍ය නොවේ.'*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 81(1)(ඇ) -

*"එකම ප්‍රශ්නය ගැන එක් වරකට වඩා කථා කිරීමට මන්ත්‍රීවරයකුට හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 81(2)(අ) -

*"පූර්ණ කාරක සභාවකදී ඡන්දය පාවිච්චි කිරීම කළ යුතු වන්නේ ද 60 වන රීතිය යටතේ සභාවේ ඡන්දය පාවිච්චි කිරීමේ පිළිවෙළ අනුව ය. ප්‍රථම අවස්ථාවේදී සභාපතිවරයා ඡන්දය දිය යුතු නොවන නමුත් සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබී තිබෙන අවස්ථාවක ඔහු තීරක ඡන්දය දිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 81(2)(ආ) -

*"පූර්ණ කාරක සභාවකදී ඇති කර ගන්නා ලද එකඟතාවයක් සම්බන්ධයෙන් පූර්ණ කාරක සභාව, යළිත් පළාත් සභාව බවට පත් වූ පසු එකඟතාවයකට පැමිණීම අවශ්‍ය නොවේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපදේශක කාරක සභා.

රීති අංක 82(1) -

*"පළාත් සභාවේ විධායක කටයුතු කාර්යක්ෂමව ගෙන යාම සඳහා සෑම අමාත්‍යවරයකු සඳහා ම උපදේශක කාරක සභාවක් බැගින් පත් වී තිබිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 82(2) -

*"එවැනි සෑම උපදේශක කාරක සභාවක් ම පහත සඳහන් පරිදි සකස් විය යුතු ය."*

(අ) *"අදාළ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා එහි සභාපතිවරයා විය යුතු ය."*

(ආ) *"අමාත්‍යවරුන් නොවන, සභාවේ වෙනත් මන්ත්‍රීවරුන් 20 දෙනෙකු පළාත් සභාවේ සභාපතිවරයා විසින් උපදේශක කාරක සභාවක් සඳහා නම් කරනු ලැබිය යුතු ය. එම නම් කිරීම හැකිතාක් දුරට සභාවේ පිළිගත් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල සාමාජිකත්වය පිළිබිඹු කෙරෙන ආකාරයට විය යුතු අතර, පළාතට අයත් දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි විය යුතු අතර එකී සාමාජිකත්වය වසර 2 ½ කට සීමා වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 82(3) -

*"උපදේශක කාරක සභාවක කාර්යයන් පහත සඳහන් පරිදි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 82(3)(අ) -

*"උපදේශක කාරක සභාවල සභාපතිවරුන් වෙත පළාත් සභාව විසින් යොමු කරන ලද පළාත් සභාවේ පැවැත්මට අදාළ ඕනෑම කරුණක් පිළිබඳව සති හයක් ඇතුළත පළාත් සභාවට වාර්තා කළ යුතු ය. වාර්තාව සභාව වෙත ලැබීම හෝ සති හයක කාලයක් ඉකුත් වීම යන දෙකෙන් පළමුව එළඹෙන සිදුවීම තෙක්, එසේ යොමු කරන ලද කරුණ පිළිබඳව සභාව විසින් ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය. කෙසේ වෙතත්, උපදේශක කාරක සභාවේ සභාපතිවරයාගේ යෝජනාවක් අනුව, වාර්තාව ඉදිරිපත් කිරීමට මුළුමනින්ම තුන් මසක කාලයකට නොවැඩි කාලයක් ලබා දීමට සභාවට හැකි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 82(3)(ආ) -

*"උපදේශක කාරක සභාවල සභාපතිවරු වන ප්‍රධාන අමාත්‍යවරයාට හෝ වෙනත් අමාත්‍යවරයකුට හෝ යොමු කරන ලද කරුණක් සම්බන්ධයෙන් උපදෙස් දීම."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 82(4) -

*"උපදේශක කාරක සභාවක සභාපතිවරයා වෙත යොමු කරන ලද කරුණක් සම්බන්ධයෙන්,"*

*(අ) "අදාළ කාරක සභාවේ සභාපතිවරයාගෙන් කිසියම් තොරතුරක් ලබා ගැනීම."*

*(ආ) "අවධානයට යොමු වන ඕනෑම කරුණක් අදාළ කාරක සභාවේ සභාපතිවරයාගේ දැන ගැනීමට සැලැස්වීම,"*

*(ඇ) "ගත යුතු ක්‍රියාමාර්ගයක් යෝජනා කිරීම."*

*(ඈ) "සභාව වෙත ප්‍රඥප්තියක් ඉදිරිපත් කිරීමට යෝජනා කිරීම,*

*උපදේශක කාරක සභා රැස්වීමකදී එහි ඕනෑම සාමාජිකයකු විසින් කරනු ලැබිය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 83 -

*"උපදේශක කාරක සභාවක සභාපතිවරයා විසින් කැඳවීමක් කළ විටකදී හෝ සාමාජිකයන් 04 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ලිඛිත ඉල්ලීමක් මගින් රැස්වීමක් පැවැත්වීමට ඉල්ලා සිටිනු ලබන විටකදී හෝ එම කැඳවීම පිළිබඳ දැන්වීම ලැබීමෙන් දින 07 ක් ඇතුළත අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උපදේශක කාරක සභාව කැඳ විය යුතුය. කෙසේ වෙතත් සෑම උපදේශක කාරක සභාවක්ම අඩු වශයෙන් දින 30 කට වරක් රැස්විය යුතුම ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(1) -

*"උපදේශක කාරක සභා රැස්වීමේදී එහි සභාපතිවරයා මූලාසනය උසුලනු ලැබිය යුතු ය. එහි සභාපතිවරයා නොමැති අවස්ථාවකදී කාරක සභාවක සාමාජිකයන් විසින් ඔවුන්ගෙන් අයෙකු මූලාසනය දැරීමට තෝරා ගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(2) -

*"උපදේශක කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් 07 දෙනෙකු විය යුතු අතර, ගණපූරණය තීරණය කිරීමේදී කාරක සභාවේ සභාපතිවරයා හෝ මූලාසනය ගනු ලබන මන්ත්‍රීවරයා ද ඇතුළත් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(3)(අ) -

*"කාරක සභාවේ පූර්ව නිවාඩු අනුමැතියකින් තොරව, උපදේශක කාරක සභාවක සාමාජිකයකු එහි රැස්වීම් වාර තුනකට නොකඩවා නොපැමිණීමෙන් එහි සාමාජිකත්වය අත්හැර ගියා සේ සැලකිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(3)(ආ) -

*"එසේ වුවද, සාමාජිකයකු ප්‍රථමයෙන් පළාත් සභාවෙන් අවසරය ලබා ගෙන සභා රැස්වීම්වලට නොපැමිණෙන කාල සීමාවල පවත්වන කාරක සභා රැස්වීම්වලට හෝ අදාළ උපදේශක කාරක සභාවෙන් අවසර ලබාගෙන ඇති විටක ඉහත විධිවිධාන අදාළ නොවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(4) -

*"ඉහත 84(3)(අ) රීතිය ප්‍රකාරව සාමාජිකත්වය අහෝසි වන මන්ත්‍රීවරයෙකු නැවත වසරක කාලයක් යනතුරු කිනම් හෝ උපදේශක කාරක සභාවකට පත් නොකළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(5) -

*"84(3)(අ) අනු රීතිය අනුව යම් මන්ත්‍රීවරයකුගේ උපදේශක කාරක සභා සාමාජිකත්වය අහිමි වූ වහා ම එකී මන්ත්‍රීවරුන් සම්බන්ධව ලේඛනයක් උපදේශක කාරක සභාවේ ලේකම් විසින් සභාවට වාර්තා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(6) -

*"උපදේශක කාරක සභාවක සාමාජිකත්වයේ කිසියම් පුරප්පාඩුවක්, පළාත් සභාවේ සභාපතිවරයා විසින් කරනු ලබන නම් කිරීමකින් පිරවිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(7) -

*"සාමාජිකත්වයේ පූරප්පාඩුවක් නොසලකා හැර, රැස්වීමට හෝ සිය කාර්යයන් ඉටු කිරීමට හෝ උපදේශක කාරක සභාවකට අයිතිය ඇත්තේය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(8) -

*"ඡන්ද සමාන වූ විටෙක තීරක ඡන්දය උපදේශක කාරක සභාවක සභාපතිවරයාට හෝ මුලසුන ගන්නා මන්ත්‍රීවරයාට හෝ හිමි වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(9) -

*"සෑම උපදේශක කාරක සභාවක් ම මසක් ඇතුළත පැවති කාරක සභා රැස්වීම්වල දී ගනු ලැබූ තීරණයන් පිළිබඳව සංක්ෂිප්ත වාර්තාවක් එහි සභාපතිවරයා විසින් හෝ සාමාජික මන්ත්‍රීවරයකු විසින් මාසික රැස්වීමෙන් අනතුරුව පැවැත්වෙන පළමුවන පළාත් සභා රැස්වීමේදී ඉදිරිපත් කළ යුතුය. උපදේශක කාරක සභා වාර්තාවෙන් පැන නගින කරුණක් පළාත් සභාවේ සභාපතිවරයා හරහා උපදේශක කාරක සභාවට යොමු කළ හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 84(10) -

*"පළාත් සභාවේ සභාපතිවරයා විසින් වරින් වර මෙකී කාරක සභාවලින් නිර්දේශ ඉල්ලා සිටිය හැකි අතර, සුදුසු පරිදි අදාළ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයට යොමු කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරක සභා

රීති අංක 85(1) -

*"පළාත් සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳ කාර්යක්ෂමතාවය සහ සඵලදායකත්වය ඉහළ දැමීමටත් පළාත් සභාවේ ව්‍යාපෘති සහ වැඩ සටහන් මෙහෙයවීමටත්, අනිසි පරිපාලනය හඳුනා ගැනීම සහ එය වැළැක්වීමටත් නව ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා තොරතුරු එක්රැස් කිරීමටත්, මහජන අවශ්‍යතා විධායකය තුළින් ඉටු වන්නේදැයි සොයා බැලීමටත්, අගතියට පත් පළාතේ ජනතාවගේ ඉල්ලීම් පිළිබඳ සොයා බැලීමටත්, පළාතේ ආදායම් ප්‍රවර්ධනය කිරීමටත්,පරිපාලන ක්‍රියාවන් මානව හිමිකම්වලට අනුකූලද යන්න නිරීක්ෂණය කිරීමටත් සභාපතිවරයාට කාරක සභා පත් කිරීමට බලය ඇත්තේය."*

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අපි 85 ට සංශෝධනයක් ඉදිරිපත් කළා කාරක සභාවේදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

85 යේ ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

86. පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව හැර අනිකුත් කාරක

සභාවලට සභාපතිවරුන් පත් කිරීමේ බලය සභාපතිවරයා සතු වේ කියලා.

**ගරු මන්ත්‍රීවරියක්**
An hon. Member

අමාත්‍යාංශ උපදේශක කාරක සභාවලටද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවයි, පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාවයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හදලා තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම සංශෝධනය වෙන්න ඕනෑ. ප්‍රධාන අමාත්‍යවරයා තමයි සභාපතිවරයාව පත් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ඒ විධියට තිබෙනවා. ඒක ගැටලුවක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අමාත්‍යාංශයක විෂයය භාර අමාත්‍යවරයා. එතකොට ඒකේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඊට අමතරව තිබෙන්නේ - උපදේශක කාරක සභාව නොවෙයි. කාරක සභා දෙක ගැන මේ කියන්නේ. පළාත් ගිණුම් කාරක සභාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දාලා තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔව්. එහෙම දාලා තිබෙනවා. ඒ සංශෝධනය එහෙම තිබෙන්න ඕනෑ කියන කාරණය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ගැටලුවක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 85(2)(1) -

*"ඒ අනුව සෑම සැසිවාරයක් ආරම්භයේ ම සභාපතිවරයා විසින් පහත සඳහන් කාරක සභාවන් පත් කළ යුතු වුවද, අඛණ්ඩව වසර 2 ½ කට වඩා වැඩි කාලයකට සාමාජිකත්වය දැරිය නොහැක."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 85(2)(1)(අ) -

*"කාර්ය පටිපාටි රීති පිළිබඳ කාරක සභාව"*

*(ආ) "සභා කටයුතු පිළිබඳ කාරක සභාව"*

*(ඇ) "ගෘහ කාරක සභාව"*

*(ඈ) "ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව"*

*(ඉ) "පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාව"*

*(ඊ) "මහජන පෙත්සම් කාරක සභාව"*

*(උ) "අවදි කාරක සභාව"*

*(ඌ) "පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව"*

*(එ) "පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලුම අධිකාරී, ආයතන විමසුම් කාරක සභාව"*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 85(2)(2) -

*"පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව හැර අනිකුත් සියලුම කාරක සභාවලට පළාත් සභාවේ සභාපතිවරයා නිල බලයෙන් සභාපති ලෙස පත් වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 85(3) -

*"ඉහත සඳහන් වූ කාරක සභා අතුරින් විමර්ශන කාරක සභා ලෙස මහජන පෙත්සම් කාරක සභාව, අවදි කාරක සභාව, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව, පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලුම අධිකාරී, ආයතන විමසුම් කාරක සභාව සැලකිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 85(4) -

*"පළාත් සභාවේ දෛනික කටයුතුවලට අදාළ කාරක සභා පත් කිරීමේ බලතල රීති අංක 9(9) යටතේ සඳහන් වන අතර, සභාපතිවරයාට එකී සභාවන්හි කටයුතු කාර්යක්ෂමව හා සඵලදායකව සිදු කිරීම සඳහා මෙහෙයවීමට බලතල ඇත්තේය. එකී දෛනික කටයුතුවල අදාළ කාරක සභාව ලෙස ප්‍රඥප්ති හා නීති කාරක සභාව, කාර්ය පටිපාටි රීති කාරක සභාව සහ ගෘහ කාරක සභාව සැලකිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපදේශක කාරක සභාවකට හැර සෙසු කාරක සභාවල දෛනික කටයුතුවලට බලපාන පොදු කරුණු.

රීති අංක 86(1) -

*"සෑම කාරක සභාවකම සභාපතිවරයා ඇතුළු මුළු සාමාජික සංඛ්‍යාව 15 දෙනෙකු විය යුතු අතර ගණපූරණය 05 දෙනෙකු විය යුතුය. ගණපූරණය ගණන් ගැනීමේදී මුලසුන දරන මන්ත්‍රීවරයා ද ඊට ඇතුළත් විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(2) -

*"සෑම පළාත් සභාවක් ආරම්භයේදී ම පළාත් සභාවේ සභාපතිවරයා විසින් ඒ ඒ කාරක සභාවට සාමාජිකයන් නම් කළ යුතු ය. නිල බලයෙන් ම යම් කාරක සභාවක සභාපති වශයෙන් පත් වන කෙනෙකු නොමැති කාරක සභාවක සභාපතිවරයා ලෙස පළාත් සභාවේ සභාපතිවරයා විසින් නම් කළ යුතු ය.*

*අමාත්‍යාංශ උපදේශක කාරක සභා, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව, පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව හැර අනෙකුත් කාරක සභාවලට සභාපතිවරුන් පත් කිරීමේ බලය සභාපතිවරයා සතු වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(3) -

*"කාරක සභාවක සභාපතිවරයා එහි සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු වුවත්, සභාපතිවරයා හෝ නියෝජ්‍ය*

*සභාපතිවරයා නොමැති අවස්ථාවක පැමිණ සිටි සාමාජිකයන් විසින් එහි මූලසුන දැරීම සඳහා තමන් විසින් කෙනෙකු තෝරාගත යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(4) -

*"කලින් ලබා ගත් අවසරයක් නොමැතිව යම් සාමාජිකයෙකු නොකඩවා කාරක සභාවේ රැස්වීම් 03 කට සහභාගී නොවූ කල්හි එලෙස තනතුරින් ඉවත් කෙරුනු සාමාජිකයා නොවන වෙනත් සාමාජිකයෙකු නම් කිරීමක් මගින් සභාපතිවරයා විසින් එම පුරප්පාඩුව පිරවිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(5) -

*"කාරක සභා සමාජිකත්වය අහෝසි වීම සම්බන්ධයෙන් 84(4) රීතිය බල පැවැත් වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(6) -

*"නිල බලයෙන් සාමාජිකත්වය දරන යම් ධුරධාරියෙකු කලින් ලබා ගත් අවසරයක් නොමැතිව නොකඩවා කාරක සභා රැස්වීම් වාර 03 කට සහභාගී නොවුවහොත් ඒ බව අදාළ කාරක සභාවේ සභාපතිවරයා විසින් පළාත් සභාවට දැන්විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(7) -

*"කාරක සභාවක පුරප්පාඩුවක් ගැන නොසලකා රැස්වීමක වැඩ කටයුතු කරගෙන යෑමට කාරක සභාවකට අයිතිය ඇත."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(8) -

*"එක් එක් කාරක සභාවේ ලේකම්, සභාවේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩලයේ සේවය කරන වෙනත් නිලධාරියෙකු හෝ විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(9) -

*"කාරක සභාවේ සභාපතිවරයාට හෝ මූලසුන දරන සාමාජිකයකුට මුල් ඡන්දයක් සහ සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබුණු විට පාච්ච්චි කිරීම සඳහා තීරක ඡන්දයක් තිබේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(10) -

*"තමන් වෙත පැවරී ඇති කටයුතුවලට අදාළව තම සාමාජිකයන්ගෙන් ම යුතු අනු කාරක සභාවන් පත් කිරීමට කාරක සභාවකට හැකි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 86(11) -

*"කාරක සභා රැස්වීම්වල වාර්තා ලබා ගැනීමට සෑම මන්ත්‍රීවරයකුටම හැකි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහජන පෙත්සම් කාරක සභාව.

රීති අංක 87(1) -

*"මහජන පෙත්සම් කාරක සභාවක් අනු කාරක සභාවන් තුනකින් සමන්විත විය යුත්තේය. සාමාජිකත්වය 22 ක් වූ මහජන පෙත්සම් කාරක සභාවේ එක් අනු කාරක සභාවකට දිස්ත්‍රික්ක දෙකක් පමණක් නියෝජනය වන පරිදි සාමාජිකයන් හත් දෙනෙකු පත් කළ යුතු ය. පෙත්සම ඉදිරිපත් කළ දිස්ත්‍රික්කය නියෝජනය නොවන අනු කාරක සභාවකට එකී පෙත්සම විභාග කිරීම සඳහා යොමු කළ යුතු ය."*

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, 87 සංශෝධනයක් තිබෙනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, සංශෝධනයක් තිබෙනවා. මේකේ තිබෙනවා, පෙත්සම් කාරක සභාවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

87.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, 87 තිබෙනවා. *"මහජන පෙත්සම් කාරක සභාව අනු කාරක සභා තුනකින් සමන් විය යුතුයි"* කියන එක, අනු කාරක සභා දෙකකින් සමන් විය යුතුයි කියලා වෙන්න ඕනෑ. ඒ වාගේම සාමාජිකයන් 22 ක් කියලා දාලා තිබෙනවා. ඒ සාමාජිකයන් ගණන 15 දක්වා අඩු කරන්නය කියලා අපි කියනවා. අනු කාරක සභාවකට සාමාජිකයන් 7 දෙනෙකු සිටිය යුතු අතර පළාතේ ඕනෑම පෙත්සම් කාරක සභා නියෝජිතයෙකුට ඕනෑම දිස්ත්‍රික්කයක පෙත්සමක් විභාග කිරීම සඳහා පෙත්සම් කාරක සභාව නියෝජනය කරනු ලබන අනු කාරක සභාවකට සහභාගී වීමට හැකියාව ඇත" කියලා සංශෝධනය කරන්නය කියලා යෝජනා කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කලින් අපි කථා කරපු එක.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, තව කාරණයක් තිබෙනවා. 85(2)(1) ට සංශෝධනයක් ඉදිරිපත් කළා එදා තිබුණු වැඩ මුළුවේදී.

*"ඒ අනුව සෑම සැසිවාරයක් ආරම්භයේ ම සභාපතිවරයා විසින් පහත සඳහන් කාරක සභාවන් පත් කළ යුතු වුවද, අඛණ්ඩව දෙවසරකට වඩා වැඩි කාලයකට සාමාජිකත්වය දැරිය නොහැක."*

කියලා. අපි මේක ගිණුම් කාරක සභාව ගැන සඳහන් කරලා කිව්වා. අවුරුදු 05 ක කාලසීමාව තියන්න ඕනෑ කියලා. ඒ සංශෝධනය එදා පිළිගත්තා. දැන් අවුරුදු දෙකක් කිව්වාම ගිණුම් කාරක සභාවේ සාමාජිකයොත්, අනික් ප්‍රධාන කාරක සභාවල සාමාජිකයොත් අවුරුදු දෙකකින් පස්සේ සාමාජිකත්වය අහෝසි වෙනවා. ඉතින් මේකේදී දිගින් දිගට වැඩ කරන්න හැකියාව නැතිව යනවා, කාරක සභාවල ඉන්න මන්ත්‍රීවරුන්ට. සහ ඒ ගැන තිබෙන අවබෝධය නැති වෙලා යනවා. ඒ නිසා සභා කාලය සම්පූර්ණ කාල සීමාව දරන්න තිබෙන අයිතිය, එහෙම නැත්නම් මේ සංශෝධනය අයින් කරලා දාන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සම්පූර්ණයෙන් අයින් කරලා දාන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සම්පූර්ණයෙන් අයින් කරලා දාන්න ඕනෑ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, එදා ඒ සංශෝධනයේදී -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, එදා අපි ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තත්පරයක් ඉන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, එදා අපි ඒ සංශෝධනය ඉදිරිපත් කළේ යම් කාරණා කීපයක් නිසා. ඒ යම් යම් කාරක සභාවලට, දැන් මම කියලා ගත්තොත් අපටත් ඒවාට සහභාගි වෙන්න ඉඩ තිබෙනවා. ඒ අනුව කාරක සභාවලට දීර්ඝකාලීනව එකම කට්ටියක් පත් කරන්නේ නැතිව කෙටි කාලයක් තුළ අපටත්, ඒ යම් උනන්දුවක් තිබෙන මන්ත්‍රීතුමන්ලාටත් ඒ අවස්ථාව ලබා දෙන්න කියන එක තමයි එදා සංශෝධනය ඉදිරිපත් කළේ. මමත්, සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාත් අපි දැඩිව ප්‍රකාශ කළා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා කියපු කාරණාවට අමතරව මම හිතන්නේ අපි මෙහෙම යෝජනා කරන්න තවත් හේතුවක් තිබුණා. මම හිතන්නේ අපි දැකපු දෙයක් තමයි සමහර කාරක සභාවලට මන්ත්‍රීවරු එන්නේ නැහැ. මගේ ඇස් දෙකට දැකලා තිබෙනවා. දැන් පාර්ලිමේන්තුවේ ඉන්නවා, ඒ මන්ත්‍රීතුමා හෝ මන්ත්‍රීතුමිය. කාරක සභාවට ඇවිල්ලා වෙන සාකච්ඡාවක යෙදිලා ඉන්නේ. මම හිතන්නේ යෝජනා කළේ, අවුරුදු 2 ½ ක් ඉඳලා අයින් කරන්න කියන අදහසින් නොවෙයි. ඒ අවුරුදු 2 ½ හිටපු අය නැවතත් ඉදිරි අවුරුදු 2 ½ ටත් පත් කළ හැකියි. නමුත් අපි අවස්ථාවක් සලසා දෙනවා, අර වාගේ උනන්දුවකින් කටයුතු නොකරන මන්ත්‍රීවරුන්ව හලන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නැහැ ගරු මන්ත්‍රීතුමා, ඒකට ඉඩක් තිබෙනවා. දවස් තුනක් ආවේ නැත්නම් අහෝසි වෙනවා. එතකොට පත් කරන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු මන්ත්‍රීතුමා, මම මේ පැහැදිලි කිරීමක් විතරයි කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙමනම් උපදේශක කාරක සභාවලත් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සියලුම උපදේශක කාරක සභාවලට මේක ක්‍රියාත්මක කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවුරුදු 2 ½ න් මාරු කරන්න. ඒක හොඳයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි,

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතකොට හැමෝටම අවස්ථාවක් හම්බ වෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපිත් ආසයි මහ ඇමැතිතුමාගේ උපදේශක කාරක සභාවට යන්න. ඒත් චාන්ස් එකක් නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සමහර පරීක්ෂණ, ජේදයන් දීර්ඝ කාලයක් ඉදිරියට ගලාගෙන යනවා. ඒ පිළිබඳ ගත්ත තීන්දු තීරණ සහ නියෝග, පසුවිපරම් පරීක්ෂණ ඉදිරියට යද්දී කාලය අඛණ්ඩව තිබිය යුතුයි කියන එක තමයි අපේ මතය.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු මන්ත්‍රීතුමා, අපි මේක අවුරුදු 2 ½ ක් කියලා යෝජනා කළේ කාලය අවසාන කිරීමේ අරමුණින් නොවෙයි. ඒ අවුරුදු 2 ½ හිටපු එක්කෙනාව නැවත ඉදිරි අවුරුදු 2 ½ ටත් පත් කළ හැකියි. නමුත් ගරු සභාපතිතුමනි, මේ යෝජනාව කරන්න එක හේතුවක් තමයි -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු මන්ත්‍රීතුමා, එහෙම වගන්තියක් මේකේ නැහැ. මේකේ කෙළින්ම කියන්නේ ඊට වඩා වැඩි කාලයක් සාමාජිකත්වය දැරිය නොහැක . දරන්න බැහැ. අහෝසි වෙලා යනවා. ආයේ පත් කරන්න පුළුවන් කියලා නැහැ. මේ කාරණය අවශ්‍ය වෙන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පසු වගන්තියක් තිබෙනවා. ආයේ පත් කරන්න පුළුවන් කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේක සම්පූර්ණයෙන් අයින් කරලා දාමු. අඛණ්ඩව වාර තුනක් ආවේ නැත්නම් ඕනෑ කෙනෙකුගේ සාමාජිකත්වය අහෝසි වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි වෙනස් අදහසක් දරන්නේ. 104 ක් මන්ත්‍රීවරු ඉන්නවා. එක්කෙනෙක් අවුරුදු 05 ම හිටපුවාම වෙන කිසිම මන්ත්‍රීවරයෙකුට අවස්ථාවක් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

104 දෙනාටම ඉන්න පුළුවන් කාරක සභාවල් මේකේ තිබෙනවා. හැමෝම කාරක සභාවක සාමාජිකයෙක් වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නිල තල හැමදාම එක්කෙනෙක් දරන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කිසි ප්‍රශ්නයක් නැහැ. හැමෝටම එන්න පුළුවන්. අපිම ඉන්න ඕනෑ නැහැ, මේ කාරක සභාවේ. ඉන්න කෙනාට වැඩ කරන්න තිබෙන්න ඕනෑ, දීර්ඝ කාලයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම එකක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මේ ගිණුම් කාරක සභාවේ ඉන්න කට්ටිය.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක සභාවක් පත් වෙන කොට කියලා හදාගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වෙන කෙනෙකුට පත් වෙන්න දෙන්නේම නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. අපිව අයින් කළත් කමක් නැහැ. ඉන්න මන්ත්‍රීවරයාට වැඩ කරන්න දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අවුරුදු පහෙන් පස්සේ නොවෙයි. ඊළඟ පහත් පත් වුණොත් ඒ ඉන්නෙත් එයාමයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක මුලදී කථා කරලා අයින් කර ගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවුරුදු 15 ක් ඉන්න අය ඉන්නවා. ඒ කියන්නේ නිලධාරීන්ව හය කර ගන්නවා. අපියි සභාවේ ඉන්නේ. අපියි ගිණුම් කාරක සභාවේ ඉන්නේ. මෙහෙම කරමු.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නැහැ. නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක ඇත්ත. පූර්වාදර්ශයක් තිබෙනවා. ඒක ඇත්ත. සහතික ඇත්ත.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක නිසා අපි ඕවා දන්න නිසා තමයි -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පක්ෂවලින් නම් කරන අය තමයි. වෙන කවුරුත් නොවෙයි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගිණුම් කාරක සභාවට විතරයි ප්‍රශ්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි කියන්නේ අනික් මන්ත්‍රීවරුන්ටත් ඒකට යන්න අවස්ථාවක් දෙන්න කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අනික් එක සභාවේ අලුතින් පත් වෙන මන්ත්‍රීවරයෙකුට කිසිසේත්ම ඇවිල්ලා ගිණුම් කාරක සභාවේ වැඩ කරන්න බැහැ. ගිණුම් කාරක සභාව වාගේ කාරක සභාවකට එන්න ඕනෑ අවුරුදු 10 ක්, 15 ක් සභාවේ හිටපු අය තමයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. නැහැ. ඇත්ත කථාව අවුරුදු 15 ක් ඉන්න අය ඉන්නවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පක්ෂවලින් නම් කරන්නේ. කවුරුත් නම් කරන්නේ නැහැ. පක්ෂවලින් නම් කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එයාට තිබෙන දක්ෂකම තව කෙනෙකුට තිබෙනවා නේ? එයා විතරක් දක්ෂයෙක් නොවෙයි නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කාලසීමාව අවුරුදු 2 ½ ට සීමා කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඉන්න මන්ත්‍රීවරයාට තිබෙන දක්ෂකම අනික් මන්ත්‍රීවරයාටත් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ගරු මන්ත්‍රීතුමිය, පොඩ්ඩක් ඉන්න. ඊට පස්සේ ඔබතුමිය නැඟිටලා කියන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, අපි වෙනත් තර්කවලට කැමැති නැහැ. ගිණුම් කාරක සභාවට, අපව හෙට පත් කළත් අපිට වැඩ කරන්න පුළුවන්. අපි අලුත් මන්ත්‍රීවරු. අපිව හෙට පත් කරන්න ගිණුම් කාරක සභාවට. අපට වැඩ කරන්න පුළුවන්. එහෙම අලුත් මන්ත්‍රීතුමන්ලා කියලා නැහැ. මේක සැම කෙනාටම බෙදිලා යන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක 2 ½ ට සීමා කරමු.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, මත දෙකක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගැන දැන් අදහස් ප්‍රකාශ කළා නේ? ඔක්කොම ඒක 2 ½ ට සීමා කරන්න එකඟයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි,

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඔයාට මම බලෙන් නේ දුන්නේ. ඔයා කටවහගෙන ඉන්න කෝ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක හොඳ අදහසක්. මේ හැම කාරක සභාවකටම ඒ තීරණය ගන්න. ඒක හොඳයි. උපදේශක කාරක සභාවලටයි. අනික් කාරක සභාවලයි. අවුරුදු 2 ½ යි සීමාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සියලුම කාරක සභාවට ඒ තීන්දුව ගමු. එච්චරයි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඔයා ඕනාවට වඩා වැඩිය ගියොත් මම ඊළඟ එක්කෙනා කවුද කියලා කියන්නද? කිදෙල්පිටිය.

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අවුරුදු 2 ½ ට තිබීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මෙතැන කණ්ඩායම් නායකයාට හරි කාට හරි යම් අභිමතයක් තිබෙන්න ඕනෑ, ඒ කණ්ඩායම ඇතුළේ - මම මේ කියන්නේ මේකේ සංකල්පමය වශයෙන් මේකේ දිගුවක්. අභිමතයක් තිබෙන්න ඕනෑ. කණ්ඩායම් අතර සාකච්ඡා කරලා කැමැති නම් හිටපු කෙනාටම ඉන්න දෙනවාද? තව කෙනෙක් පත් කරනවාද කියන එක ගැන තීරණයක් ගන්න. හැබැයි, එතැනදී හිටපු සාමාජිකයා කරපු කාර්ය භාරය ගැනත් සලකා බලන්න ඕනෑ. නැත්නම් කියයි අහවලා යන්න. ඔයා යන්න. මම මෙයාව දානවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක කණ්ඩායම් නායකයා කරයි. ඒක පක්ෂයෙන් කරයි.

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම කියන්නේ ඒක වගකීමෙන් කරන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 88.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, 87(11).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ දැන් ගිහිල්ලා ඉවරයි. ගොඩක් ගිහිල්ලා ඉවරයි.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ඉතින් ඔබතුමා කියන්න දුන්නේ නැහැ නේ? කියවගෙන ගියා නේ. එක පාරට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔයා කොහෙද හිටියේ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

87 නේ දැන් කියවගෙන ගියේ. 88 කිව්වාට මේ එක වගන්තියක් ගැනවත් රිෆර් කළේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔයා කොහේද හිටියේ?

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

මම දැන් මෙතැන හිටියේ. ඔබතුමා කියවගෙන යන Speed එකට කියවන්න පුළුවන් යෑ. දැන් සභාපතිතුමාට බඩගිනිද දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

87 අනේ ඉස්සෙල්ලා ඔයා කථා කළා නේ?

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

87(11). ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ පෙත්සම් කාරක සභාවේ සභාපතිතුමා. වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා.

*"පෙත්සම් කාරක සභාව විසින් කැඳවන මහජන නියෝජිතයන් හා නිලධාරීන් අනිවාර්යයෙන්ම පෙත්සම් කාරක සභාව හමුවේ පෙනී සිටිය යුතුය. එසේ පෙනී නොසිටින්නේ නම් ..*

කියන එකට මොකක්වත් දාලා නැහැ. පෙනී නොසිටින වෙලාවට මොකද කරන්නේ කියලා. නමුත් නිර්දේශ ක්‍රියාත්මක කර එක දින 30 ක් ඇතුළත් කළේ නැත්නම්, අදාළ විෂයය භාර අමාත්‍යවරයා විනයානුකූලව කටයුතු කරයි කියන්නේ. එතකොට නිර්දේශ ක්‍රියාත්මක කරන්න ඉස්සෙල්ලා මේ නිලධාරීන් අද බහුතරයක් අපේ පෙත්සම් කාරක සභාවේ පෙත්සම් විභාග කරන අවස්ථාවේ සහභාගි වෙන්නේ නැහැ. එක්කෝ ඒ ගොල්ලන්ට කියන්න ඕනෑ, පෙත්සම දැනුම් දුන්නාට පස්සේ අඩු තරමේ පෙත්සම් කාරක සභාව පැවැත්වෙන දිනයට ප්‍රථම ඒ ගොල්ලෝ එන්නේ නැත්නම් අදාළ පෙත්සම් කාරක සභාවට දැනුම් දෙන්නය කියලා. මෙකේ නිර්දේශය ගැන සඳහන් වෙලා තිබෙනවා. නමුත් සහභාගි නොවන නිලධාරීන් ගැන සඳහනක් නැහැ, මොකද කරන්නේ කියලා. ලිඛිත දැනුම් දීමක් කරන්න ඕනෑ කියලා. මොකද, ඒ වෙලාවේ ගරු සභාපතිතුමනි, අදාළ සියලු දෙනා සහභාගි වෙලා ඉන්දැද්දී අත්‍යවශ්‍ය පුද්ගලයෙක් ඒ වෙලාවට සහභාගි වුණේ නැත්නම්, තීන්දුවක් ගන්න බැහැ. ඒක නිසා පොඩ්ඩක් ඒ සම්බන්ධයෙන් මෙතැන මොකක් හරි අවශ්‍යතාවයක් තිබෙනවා. නොපැමිණෙන නිලධාරීන්ට කරන්නේ මොකක්ද කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, එතුමා කියන කාරණයම මේක ලේසියෙන්ම අපට amend කරගන්න පුළුවන්. පිළිගත හැකි හේතු නොදක්වා ක්‍රියාත්මක නොකරන්නේ නම් කියන එක, නොපැමිණීම සඳහා හා හේතු නොදක්වා ක්‍රියාත්මක නොකිරීම. එහෙමනම් ඇමැතිවරයාට බලය ලැබෙනවා. නොපැමිණී සිටියත් මොහු, නොසලකා හැරියත් දඬුවමක් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නිලධාරීන් කියන වචනයත් ඇතුළත් වෙන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මෙතැන නීති කරුණක් -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, නිර්දේශය ක්‍රියාත්මක කිරීමට දින 30 ක් දෙන එක සාධාරණයි. ඒක අපි පිළිගන්නවා. නමුත් ගරු සභාපතිතුමනි, අපි අත්විඳලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් ප්‍රාදේශීය සභාවක ඉදිරිපත් වන ප්‍රශ්නයකදී අදාළ ප්‍රාදේශීය සභාවේ - දැන් නම් ක්‍රියාත්මක වෙන්න සභාපතිවරයෙක් නැහැ. ලේකම්වරයා ඉන්නවා නම්, අදාළ ලේකම්තුමා හෝ තුමිය අදාළ පෙත්සම් කාරක සභාවට සහභාගි වුණේ නැත්නම්, පාර්ශවයන් සේරම සහභාගි වෙලා තිබෙනවා නම් අපට හරියාකාර තීන්දුවක් ගන්න බැහැ, ගරු සභාපතිතුමනි. එවැනි අවස්ථාවක ඒ අදාළ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය හෝ තුමා එන්නේ

[ගරු ප්‍රදීප් උඳුගොඩ]

නැත්නම්, අපට කරුණාකර ඒකට තීන්දු තීරණ ගන්න පුළුවන් පුද්ගලයෙක් සහභාගි වීම පිළිබඳව දැනුම් දීමක් පෙත්සම් කාරක සභාවට කරන්න ඕනෑ. නිර්දේශ ක්‍රියාත්මක කිරීමට දින 30 ක් දීම පිළිබඳව මගේ ප්‍රශ්නයක් නැහැ. නමුත් නොපැමිණෙන නිලධාරීන් සම්බන්ධයෙන් මෙතැන කිසිඳු සඳහනක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මම නීති කරුණක් කියන්න යන්නේ. දැන් යම් කාරක සභාවක් ක්‍රියාත්මක වෙද්දී අපි මෙතැන හදන්නේ මන්ත්‍රීවරුන්ගේ රීති නේ. දැන් නිලධාරී ක්‍රියා කිරීම ගැන මෙතැනට ඇතුළත් කරන්න පුළුවන්ද කියලා, ඒ දෙක වෙන් කර ගන්න ඕනෑ. නිලධාරියෙක් මේකට අදාළ නැහැ. අපි මන්ත්‍රීවරුන්ට අදාළව රීති හදන්නේ. එහෙමනම් කාරක සභාවේ නියමයක් අරගන්න ඕනෑ, ආවේ නැත්නම් අපි මොකද කරන්නේ කියන එකට. මේක වෙන් කරලා අඳුනගෙන දාන්න. මොකද, නිලධාරීන් සම්බන්ධව රීති මෙතැනට දාන්න බැහැ. මන්ත්‍රීවරුන්ගේ රීති පමණයි අපි හදන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධව අපි ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කළා. ආණ්ඩුකාරතුමා එකඟ වුණා. ඉදිරියේදී අපි ඒ නීති තබාගෙන කෙටුම්පතක් සකස් කරලා අදාළ අමාත්‍යතුමන්ලා සහ ඒ කට්ටිය දැනුවත් කරන්න.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, මේකට ඇතුළත් කරන්න පුළුවන් නම් ඒ නොපැමිණී නිලධාරීන් සම්බන්ධයෙන් කුමන ආකාරයෙන් ද අදාළ නිලධාරීන් කටයුතු කළ යුත්තේ කියන එක සම්බන්ධයෙන්. එහෙම සඳහනක් මෙතැන නැහැ. ඒකත් ඇතුළත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම අපට කරන්න පුළුවන්ද? අපට බැහැ නේද? අපට ඒක කරන්න බැහැ. මේක මන්ත්‍රීවරුන්ට අදාළ වන්නේ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

එහෙමනම් මේ දින 30 ක් ඇතුළත නිර්දේශ නොකරන නිලධාරීන්ට දැනුවත් කරලා තිබෙන්නේ මොකක්ද එතකොට. ඒකත් එහෙමනම් බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකක්ද?

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

දැන් දින 30 කින් නිර්දේශය ක්‍රියාත්මක නොකළා නම් ඒ අයට විරුද්ධව කටයුතු කරන එක ගැන මේකේ සඳහනක් කරලා තිබෙන්නේ. ඒක කොහොමද එතකොට කරන්නේ? මේකේ නිර්දේශ ක්‍රියාත්මක නොකරන නිලධාරීන්ට දඬුවම් කරන එක සම්බන්ධයෙන් තිබෙනවා. එන්නේ නැති අය ගැන මොකක්වත් නැහැ නේ? එහෙමනම් ඒකත් දාන්න බැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එසේ පෙනී නොසිටින්නේ නම් කියලා මෙතැන උඩ තිබෙනවා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ඔව්. පෙනී නොසිටින්නේ නම් එච්චරයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හෝ -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

එතකොට අනික් එක කථා කරන්නේ නිර්දේශය ගැන.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙමනම් ඔය වාක්‍යය දෙකට කඩලා ලියන්න ඕනෑ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ඒක තමයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

වාක්‍යය දෙකට කඩලා ලියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙපැත්තක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

දෙපැත්තම තිබෙනවා. එහෙමනම් දෙකම අයින් කරන්න ඕනෑ. නැත්නම් දෙකටම ඇතුළත් කරන්න ඕනෑ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

එහෙමනම් දෙකම අයින් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි. මම පිළිගන්නවා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

එකක් සඳහන් කරලා තිබෙනවා. නිර්දේශ ක්‍රියාත්මක නොකරන නිලධාරීන්ට දඬුවම් කිරීම සම්බන්ධයෙන් තීන්දුවක් මෙතැන තිබෙනවා. නොපැමිණි අය සම්බන්ධයෙන් නැහැ. එහෙමනම් දෙකම අයින් කරන්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අපි ඇතුළත් කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි අනික් එකත් දාමු නේද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

හරි. හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

රීති අංක 87(2) -

*"සභාව විසින් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කරනු ලබන පෙත්සම් විමර්ශනය කර සුදුසු පියවරක් ගැනීම එම කාරක සභාවේ කාර්යය විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(3) -

*"කාරක සභාවකට අවශ්‍ය යැයි හැඟී ගිය විටක තමන් වෙත ඉදිරිපත් කර ඇති කවර හෝ පෙත්සමක් හෝ වාර්තාවක් කාරක සභාව විසින්ම හෝ අනු කාරක සභාවක් යටතේ හෝ පරීක්ෂා කළ හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකහයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(4)

*"කාරක සභාව විසින් හෝ අනු කාරක සභාවක් විසින් තමන් වෙත ඉදිරිපත් වූ පෙත්සමක් හෝ වාර්තාවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කර ඇති විටෙක ඒ සඳහා වන සාක්ෂි විභාග කිරීම සඳහා වන සාක්ෂිකරුවන් වෙත කාරක සභාව හෝ අනු කාරක සභාව ඉදිරිපිට පෙනී සිටීම සඳහා වන දැන්වීම්, කාරක සභාවේ ලේකම් විසින් පරීක්ෂණ දිනයට අවම වශයෙන් දින*

*තුනකට පූර්වයෙන් පාර්ශවයක් වෙත ලිඛිතව භාර දීමට සැලසිය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(5) -

*"කාරක සභාවක් ඉදිරියේ පෙත්සම්කරු හෝ සාක්ෂි දීම සඳහා වන කවර පාර්ශවයක් විසින් ලබා දෙන සාක්ෂිය දිවුරුම් පිට ලබා දෙන සාක්ෂියක් විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(6) -

*"සභාවේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන සභා ලේකම් කාර්යාලයේ වෙනත් යම් නිලධරයෙකු හෝ කාරක සභාවේ ලේකම් විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(7) -

*"යම් පෙත්සමකින්, රජයේ නිලධාරියෙකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක නිලධාරියෙකු විසින් හෝ මූලික අයිතිවාසිකමක් කඩ කරනු ලැබ ඇති බව හෝ වෙනත් අයුක්තියක් සිදු කරනු ලැබ ඇති බව හෝ අනාවරණය වන බව කාරක සභාවේ අදහස වන අවස්ථාවක පෙත්සම පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්වරයා) වෙත යොමු කරනු ලැබිය හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(8) -

*"සභාපතිවරයාගේ අනුමැතියට යටත්ව, පහසුවෙන් ලබා ගැනීමට නොමැති තොරතුරු සපයා ගැනීම සඳහා හෝ කාරක සභාවට නියමිත කරුණුවලට අදාළ සංකීර්ණ කරුණු පැහැදිලි කර ගැනීම සඳහා හෝ ශිල්පීය දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහාය ලබා ගැනීමටත්, වෘත්තීමය පුද්ගලයින් හෝ නිලධාරීන් කැඳවීමටත් බලය ඇත්තේය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(9) -

*"මහජන පෙත්සම් කාරක සභාවට හෝ කාරක සභාව විසින් බලය දෙනු ලබන එකී අනු කාරක සභාවකට හෝ පළාත් රාජ්‍ය සේවයේ ඕනෑම පුද්ගලයකු කැඳවා ප්‍රශ්න කිරීමට හෝ කිසියම් පත්‍රිකා, පොත්පත්, වාර්තා, පළාත් සභාවේ ඕනෑම ආයතනයකට ලිපි ලේඛන ගෙන්වා පරීක්ෂා කිරීමටත්, ඕනෑම ආයතනයකට හෝ ස්ථානයකට ඇතුළු වීමටත්, ස්ථානීය පරීක්ෂණයක් කිරීමටත් බලය තිබිය යුතු ය.*

*එවැනි අවස්ථාවකට සහභාගී වන නිලධාරීන්ගේ හෝ පුද්ගලයන්ගේ ආරක්ෂාව සලසා ගැනීම සුදුසු විධිවිධාන අනුව කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(10) -

*"කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම් පිළිබඳ මත, අදහස් මෙන්ම ඒ පෙත්සම් සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට සුදුසු යැයි තමන් කල්පනා කරන අනිකුත් අදහස් ඇතුළත් කාරක සභාවේ වාර්තාව මසකට වරක් පළාත් සභාවට වාර්තා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(11) -

*"පෙත්සම් කාරක සභාව විසින් කැඳවන මහජන නියෝජිතයන් හා නිලධාරීන් අනිවාර්යයෙන්ම පෙත්සම් කාරක සභාව හමුවේ පෙනී සිටිය යුතුය. එසේ පෙනී නොසිටින්නේ නම් හෝ දෙනු ලබන නිර්දේශය දැනුම් දුන් දිනයේ සිට දින 30 ක් ඇතුළත පිළිගත හැකි හේතු නොදක්වා ක්‍රියාත්මක නොකරන්නේ නම් අදාළ විෂයය භාර අමාත්‍යවරයා විසින් අදාළ පාර්ශවයන්ට විරුද්ධව විනයානුකූල ව කටයුතු කළ යුතු වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 87(12) -

*"මහජන පෙත්සම් කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, එහි එක් අනු කාරක සභාවක ගණපූරණය 03 දෙනෙකු විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව.

රීති අංක 88 (1) –

*"ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවේ මූලික වගකීම විය යුත්තේ,*

*(අ) එම කාරක සභාවට යොමු කෙරෙන ප්‍රඥප්ති කෙටුම්පතක, නීතියක, රෙගුලාසියක නීත්‍යානුකූල භාවය සලකා බැලීමත්, අඩුපාඩු හා සංශෝධනය විය යුතු තැන් පෙන්වා දීමත්,*

*(ආ) පළාත් සභාවට යම් අධිකරණමය කටයුත්තකට මැදිහත් වන්නට සිදු වන සෑම අවස්ථාවකදීම ඒ සම්බන්ධයෙන් උපදෙස් දීමත් වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 88 (2) -

*"ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හෝ පාර්ලිමේන්තුවෙන් හෝ සංදේශයක් මගින් රීති 62 යටතේ ප්‍රඥප්තියක් කාරක සභාව වෙත යොමු කළ විට, එවැනි නීතියක් සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයට හෝ පාර්ලිමේන්තුවට හෝ ඉදිරිපත් කළ යුතු නිගමනයන් පිළිබඳව, කාරක සභාව එම දැන්වීම ලැබ දින තුනක් ඇතුළත රැස්වී, රැස්වීමෙන් පසු දිනම එකී නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන උපලේඛනයෙහි I වැනි ලැයිස්තුවට අදාළ වේ නම්, වාර්තාව යෝජිත නීතියට අදාළ පළාත් විෂය භාර අමාත්‍යවරයාට ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වෙනි උපලේඛනයෙහි III වන ලැයිස්තුවට අදාළ වේ නම්, වාර්තාව ඊළඟ පළාත් සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට හැකි වන සේ ලේකම්වරයාට භාර දිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව.

රීති අංක 88 (3) -

*"ප්‍රඥප්ති කෙටුම්පත හෝ වෙනත් කරුණක් හෝ කාරක සභාවට ඉදිරිපත් කරනු ලැබූ විට එම ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණට අනුකූල නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව.

රීති අංක 88 (4) –

*"ප්‍රඥප්ති කෙටුම්පතේ යම් නීතියක් හෝ වෙනත් කරුණක් කාරක සභාව වෙත ඉදිරිපත් කර, සාකච්ඡා කරන අවස්ථාවේදී අදාළ විෂය භාර අමාත්‍යවරයාට කාරක සභාවේ මතයන්ට බලපෑමක් නොවන පරිදි පැහැදිලි කිරීමක් සඳහා රැස්වීමට සහභාගී වීමට හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව.

රීති අංක 89 –

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ III වන ලැයිස්තුවේ සඳහන් විෂයයකට අදාළ ව යම් ප්‍රඥප්තියක් පිළිබඳ පළාත් සභාව විසින් පාර්ලිමේන්තුවෙන් කරන විමසීම ද, එවැනි පනතක් පිළිබඳව පාර්ලිමේන්තුව විසින් පළාත් සභාවෙන් කරන විමසීමද ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය. එම යොමු කිරීම පිළිබඳව කාරක සභාවේ නිර්දේශ එහි සභාපතිවරයා විසින් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාව.

රීති අංක 90 –

*"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ III වන ලැයිස්තුවට අදාළ ප්‍රඥප්තියක් පිළිබඳව ප්‍රඥප්ති සහ නීති පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ඉක්මණින් අවශ්‍ය වූ විට, එම ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමට අදහස් කරන අමාත්‍යවරයා ඒ බවට විශේෂ සටහනක් සහිතව එය ලේකම්වරයා වෙත යොමු කරන්නේ නම්, ලේකම්වරයා ඒ බව සභාපතිවරයාට දැනුම් දීමෙන් පසුව, හැකි ඉක්මණින් කාරක සභාව රැස් කිරීමටත්, ඉන් අනතුරුව සභාවට ඉදිරිපත් කිරීමට සහ අනිකුත් අවශ්‍ය කටයුතු කිරීමටත් ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාර්ය පටිපාටි රීති කාරක සභාව.

රීති අංක 91(1) -

*"පවතින රීති වරින් වර සමාලෝචනය කොට සුදුසු යැයි හැඟෙන නිර්දේශ යෝජනා කිරීමත්, සභාව විසින් හෝ අනිකුත් කාරක සභාවලින් ඉදිරිපත් කරනු ලබන රීති සම්බන්ධව සියලු කරුණු ගැන සලකා බලා සභාවට වාර්තා කිරීමත් කාර්ය පටිපාටි රීති කාරක සභාවේ කාර්යය විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු පිළිබඳ කාරක සභාව.

රීති අංක 92(1) -

*"සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ මූලික වගකීම විය යුත්තේ:"*

*(අ) "න්‍යාය පත්‍රය සකස් කිරීමට සභාපතිවරයාට සහාය වීම."*

*(ආ) "යම් පළාත් සභා රැස්වීමකදී සාකච්ඡාවට නියමිත විෂයයන්ට අදාළව ආණ්ඩු පක්ෂයට, විපක්ෂයට හා මැතිවරණයට ඉදිරිපත් වූ විපක්ෂයේ සෙසු පක්ෂවලට වෙන් විය යුතු කාලය තීරණය කිරීම."*

*(ඇ) "සභා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කරන ලද පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා සභා රීතිවලට අනුකූලදැයි සලකා බලා, සභා රීතිවලට අනුකූල නම්, හදිසියේ සලකා බැලිය යුතු යෝජනාවලට පුමුඛත්වය ලබා දී න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා ලේකම්වරයාට උපදෙස් දීම සහ,"*

*(ඈ) "මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කිරීම් පිළිබඳව කාරක සභාව වෙත කෙරෙන යොමු කිරීම් ගැන පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම වේ."*

*(ඉ) "අවශ්‍ය වූ විටක අදාළ අවස්ථාවලදී එකී වරප්‍රසාද කඩ කළ අයගෙන් කාරක සභාවට කැඳවා නිදහසට කරුණු විමසිය හැකි ය. ඒ සම්බන්ධයෙන් කරනු ලබන නිර්දේශයන් සභාවට ඉදිරිපත් කළ යුතු ය."*

*(ඊ) "වරප්‍රසාද ප්‍රශ්නයක් පැන නැගුණු විට එකී ප්‍රශ්නය කාරක සභාවට යොමු කිරීමේ අභිමතය සභාපතිවරයා සතු ය. එවැනි අවස්ථාවකදී සභා කටයුතු කාරක සභාව වරප්‍රසාද කමිටුවක් බවට පරිවර්තනය වන අතර, යොමු වූ ප්‍රශ්නයේ බරපතළ භාවය මත අදාළ කමිටුව හදිසි ප්‍රශ්නයක් ලෙස සලකා රැස් කිරීමේ බලය සභාපතිවරයා සතු ය."*

*(උ) "72 හා 73 රීති සම්බන්ධයෙන් පරිශිෂ්ටයේ (1) "අ" හා "ආ" යටතේ කරන ලද යොමු කිරීම් පිළිබඳව විමසා තීරණයක් ලබා දීම."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 92(2) -

*"සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ අදහස් විමසා බලා සභා රීතිවලට එකඟ නොවන යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමට සභාපතිවරයාට හැකි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගෘහ කාරක සභාව.

රීති අංක 93(1) -

*"ගෘහ කාරක සභාවේ වගකීම විය යුත්තේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, අයිතිවාසිකම්, අවශ්‍යතා සලකා බලා කටයුතු කිරීම වේ."*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, 93 තිබෙන්නේ ගෘහ කාරක සභාව පිළිබඳව. සභාපතිවරයාට, ඔබතුමාට සහ ආණ්ඩුකාරතුමාට බලතල පවරලා තිබෙනවා. අලුත් එකේ තිබෙන්නේ,

*"ගෘහ කාරක සභාවේ වගකීම විය යුත්තේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, අයිතිවාසිකම්, අවශ්‍යතා සලකා බලා කටයුතු කිරීම වේ."*

කියලා දාලා තිබෙන්නේ. 2 දාලා තිබෙනවා.

*"කාරක සභාව විසින් අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර මන්ත්‍රීවරුන්ගේ අයිතීන් හා වරප්‍රසාද පිළිබඳව සහන සලසා දීමට කටයුතු කළ යුතු ය."*

[ගරු කිත්සිරි කහටපිටිය]

එතකොට ගරු සභාපතිතුමනි, අපි අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත් අදහස් දක්වන කොට, යෝජනා ඉදිරිපත් කරන කොට එතුමිය ඉදිරිපත් කළා. මේ මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාද. ඒ කියන්නේ අද පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාදයක් තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තුවට පත් වුණාම එතුමාට අවශ්‍ය වන වාහන පර්මිට් එකක් ලබා දීමේ තීරුබදු ඒ අයිතිය තිබෙනවා. මේ වරප්‍රසාද. එතකොට මේ වරප්‍රසාද කමිටුවේ එහෙම එකක් සඳහන් වෙලා නැහැ, ගරු සභාපතිතුමනි. අපි යෝජනා කරනවා. මේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් ඒ වරප්‍රසාදය මේ ගෘහ කාරක සභා කමිටුවට ඇතුළත් කරලා මන්ත්‍රීවරුන් පත් වන ප්‍රථම අවස්ථාවේදී අවුරුද්දක් යන්න කලින් මන්ත්‍රීවරුන්ට ඒ වාහන පර්මිට් එක පාර්ලිමේන්තුවේත් ලබා දෙනවා වාගේම පළාත් සභාවේත් මේ රීතිවලට ඇතුළත් කරලා ඒ පහසුකම ලබා දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට ඒක කරන්න අමාරුයි. අපි කොහොමද ඒක කරන්නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

රීතිවලට ඇතුළත් කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට ඒක කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට ඒක කරන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔහොම ඉන්න කෝ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ඒ යෝජනාවට මගේ විරුද්ධත්වයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපිත් එකඟයි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

නමුත් ප්‍රායෝගික ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ඒ වාහන Duty free ලබා දීමේ අනුමැතිය දෙන්න පුළුවන් මුදල් ඇමැතිතුමාට විතරයි, Custom shoddiness එක යටතේ. එතකොට අපේ කාරක සභාවකට ඒක තීන්දු කරන්න බැහැ. ඒක පාර්ලිමේන්තුව තුළින් මුදල් ඇමැතිතුමා විසින් කරන තීන්දුවක් මිසක් අපට කරන්න පුළුවන් තීන්දුවක් නොවෙයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේකේ දෙක මම පැහැදිලි කරන්නම්. ඔබතුමන්ලාට ඒක තේරුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ වැටුප් හා දීමනා ලැබෙන්නෙත් පාර්ලිමේන්තු ක්‍රමයට.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පාර්ලිමේන්තුවෙන් කරන්න ඕනෑ ඒක.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

දැන් ගරු සභාපතිතුමනි, උතුරු පළාත් සභාවක් තිබෙනවා. එතකොට 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නොවෙයිද ඒ පළාත් සභාව ස්ථාපිත කරලා තිබෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙමනම් ඒ අයට පර්මිට් එකක් දුන්නා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ දුන්නේ මෙහෙමයි. ඒකේ දාලා තිබෙනවා, මුල් වතාවට විතරක් වන විධියට.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක රීතියට ඇතුළත් විය යුතුයි කියන යෝජනාව තමයි අපි දාන්නේ. එතකොට මේ පළාත් සභාව 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තොරව පිහිටවපු එකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙමනම් ඒ අයට දුන්නා නම් ඇයි මේ අනික් පළාත් සභා මන්ත්‍රීවරුන්ට ඒ වරප්‍රසාදය නැද්ද? වරප්‍රසාදය කියන්නේ මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එකඟයි. තර්කය නම් හරි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙමනම් රීතියකට මෙතුමා ඇතුළත් කරලා තිබෙනවා, මේකේ දෙක. ඔක්කොටම දුන්නා. මේ පළාත් සභා ක්‍රමය යටතේ පහසුකම තිබුණා. අද තිබෙන්නේ දේශපාලන තීරණයක් මත තමයි මේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදය කඩලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඒක රීතිවලට දාන්න බැහැ. ඕක රීතිවලට දාන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේක රීතියට ඇතුළත් කරන්න. මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් සහ මේ කාරක සභාවෙන් කරන්නේ මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරක සභාවෙන් කරන්නේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පහසුකම් දෙන එක අපි කරන්නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ කාරක සභාවේ අර්ථය මොකක්ද? ගෘහ කාරක සභාවේ අර්ථය මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වරප්‍රසාද සහ අයිතිවාසිකම්. එහෙමනම් මේ වරප්‍රසාදයක් අපි අයින් කරලා මේ රීති හදන එක හරිද? ඒක ඇතුළත් කරලා රීතියක් හදන එක හරිද? කියලා මට කියන්න. ඊළඟට මේ මන්ත්‍රීවරුන්ට කාර්යාල පහසුකම් සඳහා ඒ දීමනා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා. 50,000 ක් දෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒකෙන් භාගයක් දෙනවා. එතකොට මන්ත්‍රීවරුන්ට ලිපි ලේඛන දෙනවා. එතකොට මන්ත්‍රීවරුන්ට දුරකථන දීමනා දෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වැටුප් හා දීමනා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි,

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, වාහන බලපත්‍ර නිකුත් කරන්නේ අපේ මුදල් අමාත්‍යාංශයෙන්. ඒක අපට දෙන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වාහනයක් අනික් අයට දෙනකන් හෝ එහෙමනම් දීමනාවක් ලබා දීම කියන එක මේකට ඇතුළත් කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දැන් මේකේ අවස්ථා කිහිපයකදී එහෙම වෙලා තිබෙනවා. දැන් පළමුවැනි පළාත් සභාවේදී ඔය ක්‍රමය නොවෙයි අනුගමනය කෙරුවේ. මධ්‍යම රජයෙන් වාහන ගෙනැල්ලා මේ සභාවට දීලා සභාවෙන් ණයක් දීලා, ක්ෂය වීමේ පදනම මත තමයි දුන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

රුපියල් 10/- යේ මුද්දරය විතරයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතකොට දැන් හය වන කොට පස් පාරකට විවිධ විධියට ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා මේක ඇතුළත් කරන්න බැරි කමක් නැහැ. නමුත් නීත්‍යානුකූල නැහැ. මෙතුමා කියනවා වාගේ. අපට නොවෙයි අයිතිය තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

වාහන ලබා දීම ප්‍රතිපත්තිමය කාරණයක් මිසක, ඒක රීතිවලට ඇතුළත් කරන්න බැහැ, ගරු සභාපතිතුමනි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මෙතුමන්ලා කියනවා, මන්ත්‍රීවරුන්ගේ අයිතිය සහ වරප්‍රසාද පිළිබඳව සලසා දීමට ආණ්ඩුකාරතුමාත් එක්ක සාකච්ඡා කරනවාලු. ඉතින් ආණ්ඩුකාරතුමාට -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

එහෙම හැකියාවක් තිබුණත් සම්ප්‍රදාය සහ සදාචාරය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, වාහනයක් දෙන එක ප්‍රතිපත්තිමය කාරණාවක්. ඒක රීතිවලට දාන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගෘහ කාරක සභාව අවම වශයෙන් - වැඩේ වෙන්නේ නැහැ නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කිත්සිරි ගරු මන්ත්‍රීතුමා කියනවා නම් දාන්න පුළුවන් කියලා, මේක දැම්මොත් වාහනය හම්බ වෙනවා නම් දාමු.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඒ වුණාට ප්‍රශ්නයක් තිබෙනවා, සදාචාරය පිළිබඳව.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එක පළාත් සභාවකට දෙනවා නම් ගරු සභාපතිතුමා, ඒ වරප්‍රසාදය, ඒ අයිතිවාසිකම් අනික් හැම පළාත් සභාවකම මන්ත්‍රීවරුන්ට තිබිය යුතුයි. මොකද, 13 වැනි ව්‍යවස්ථාවෙන් ආපු ආයතනයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කහටපිටිය ගරු මන්ත්‍රීතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනික් පළාත් සභාවලට වැඩිය බස්නාහිර පළාත් සභාවේ අපි පහසුකම් දෙනවා. දීලා තිබෙනවා. අනික් පළාත් සභාත් එක්ක බලන කොට.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒවා ගැන නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීතිවල දාන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වරප්‍රසාද පහසුකම් ගැන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා රජයත් එක්ක කථා කරන්න. අගමැතිතුමා ඉන්නවා. ජනාධිපතිතුමා ඉන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කරන්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කිව්වාට කරන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වරප්‍රසාදවලට ඇතුළත් කරන්න. මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදවලට ඒක ඇතුළත් කරලා දෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි,

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒකේ වාහන කියලා නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

ලේඛනයක් ඇතුල් කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වාහන කියලා නැහැ. තිබෙන වරප්‍රසාද මුල් අවස්ථාවේ දෙන්න ඕනෑය කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. දාන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

ඇමුණුම් අංකයක් කියලා දාන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ලැබෙන වරප්‍රසාද මුල් අවස්ථාවේ ලැබිය යුතුයි කියලා දානවා.

**ගරු ප්‍රදීප් උඩුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි,

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

වරප්‍රසාද සහ අයිතිවාසිකම්වලට ඒක අයිති වෙනවා නේ?

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු සභාපතිතුමනි, පර්මිට් එකක් කියන්නේ අපි වැරදි විදියට දකින්න හොඳ නැහැ. මේක ඇත්තටම මන්ත්‍රීවරයෙකුට වාහනයක් නැතිව අද දේශපාලන කටයුතු කරන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අවශ්‍යයි.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

වරප්‍රසාදයක් කියන්නේ ඒ මනුස්සයාට මේ කොට්ඨාශ ටිකේ පයින් යන්න බැහැ නේ. ඉතින් පර්මිට් එක කියලා ගත්තාම අපේ මිනිස්සු දකින්නේ මේක විකුණන එක. විකුණන එක නොවෙයි. මේක ඒ මනුස්සයාට මහජනතාව ගාවට යන්න වාහනයක් තිබෙන්න එපැයි. වාහනයක් නැතිව කොහොමද යන්නේ? වාහන නැති මන්ත්‍රීවරුන්ට මේවා දෙන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වරප්‍රසාද අයිතිවාසිකමක්.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ඔව්. මේක අයිතිවාසිකමක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සැරිසරන වපසරියේම තමයි පළාත් සභා මන්ත්‍රීවරයා ඉන්නෙත්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. ඒ දිස්ත්‍රික්කයේ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක තේරුම් ගන්න ඕනෑ. මුළු දිස්ත්‍රික්කයක්.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

දකින්නේ මේක විකුණලා ගන්න එක ගැන නේ. විකුණලා ගන්න එක නොවෙයි. ඒ මිනිස්සු යන්න එපැයි මහජනතාව ළඟට.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපට පේන්නේ විකුණන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කියවන්න කෝ ඔබතුමා. කියවන්න කෝ.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

නැත්නම් අපට ගෙනත් දෙන්න කියන්න කෝ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

වරප්‍රසාද කියන එකේදී වාහනය තිබෙනවා. නමුත් වාහනයක් ඉල්ලලා අපට මේකට ඇතුල් කරන්න බැහැ. නිකන් අපි තර්ක කරලා වැඩක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වාහන කියලා දාන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඒක අපි තීන්දු කරන්නේ නැහැ නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එතකොට පාර්ලිමේන්තුවට කොහොමද දෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

නැහැ නේ ගරු මන්ත්‍රීතුමා. දැන් බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තිබෙන්නේ වරප්‍රසාදවල.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

නැහැ, චක්‍රලේඛ තිබෙනවා. දැන් මේ අපේ සල්ලිවලින් ගන්න - උදාහරණයකට, සංවිධායකවරුන්ට, සභා නායකවරුන්ට ගන්නත් මුදල් අමාත්‍යාංශය අනුමත කරන්න ඕනෑ. අපේ සල්ලිවලින් ගන්නත්. ඒක නිසා ඕකට කාලය ගන්න එපා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දාන්න කෝ සැම මන්ත්‍රීවරයෙකුටම ප්‍රවාහන පහසුකම් සැපයිය යුතුයි කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වරපසාද හැටියට දාන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඒ clause එක යටතේ ඔක්කොටම අයිතිවාසිකම් තිබෙනවා. වාහනෙත් ඒකේ include වෙලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු මහ ඇමැතිතුමා දාන්න සැම මන්ත්‍රීවරයෙකුටම ප්‍රවාහන පහසුකම් සැපයිය යුතුයි. වැඩේ ඉවරයි. පර්මිට් ගැන කථා කරන්න එපා. සැම මන්ත්‍රීවරයෙකුටම ප්‍රවාහන පහසුකම් සැපයිය යුතුයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා, ඒක හරි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

කිත්සිරි මන්ත්‍රීතුමා, හරි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට රස්සාවක් දෙන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

රාජකාරී කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සැපයිය යුතුයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේකේ තර්ක කරන විධියේ පුංචි අවුලක් තිබෙනවා. මම කියන්නේ මේ අපටවත්, හිතවත් මන්ත්‍රීතුමන්ලාටවත් නොවෙයි. අනාගතයේ බලපාන ප්‍රශ්නයක්. මේ වරප්‍රසාද කියන එක මේ වාහනයකට සීමා වෙලා නැහැ. යම්කිසි කෙනෙක් පත් වුණාම පාර්ලිමේන්තුවට එක දවසක් ගියත් ඒ සියලු වරප්‍රසාද හම්බ වෙනවා. ඒ නිසා අපි ඇතුළත් කළ යුතු වගන්තිය වෙන්නේ. මගේ යෝජනාව මේ හැම කෙනාම ඇහුම්කන් දෙනවා නම් යම්කිසි මන්ත්‍රීවරයෙක් පත් වුණු මුල් අවස්ථාවේදීම ඒ ධූරයට අදාළ යම් වරප්‍රසාදයක් වේ නම් ඒ සියල්ල මුල් අවස්ථාවේදීම ලබා දිය යුතුයි. එච්චරයි අපි දාන්නේ. අපි ඒකෙන් අර ගොල්ලෝ දෙන්න පරක්කු වුණා කියලා අපි නඩු දාන්නේ නැහැ. ඒක එච්චරයි ඇතුළත් කරන්නේ. ඒකට කොම්පියුටරයක් වෙන්න පුළුවන්. පඩි වෙන්න පුළුවන්. දීමනා වෙන්න පුළුවන්. වෛද්‍ය පහසුකමක් වෙන්න පුළුවන්. මොකද, අවුරුදු පහ අවසන් වෙලා ඒවා දීලා වැඩක් නැහැ. ජනතා සේවයට. එච්චරයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ඊළඟට රියදුරු දීමනාව. රියදුරු දීමනාවක් දැන් දෙනවා නේ? රියදුරු දීමනාව දෙන කොට රියදුරාට EPF එකක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවා අපට රීතිවලට දාන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. නැහැ. අයිතිවාසිකම් සහ අපේ වගකීම්වලට ඇතුළත් විය යුතු දේ මම ඔබතුමාට කියන්නේ. ආණ්ඩුකාරතුමාට යෝජනා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි ඒක කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒක වෙනම කරමු. ඒක අර විධියට ඇතුල් වෙන්න ඕනෑ. අවුරුදු පහ පහු වෙලා මොකුත් ලැබිලා වැඩක් නැහැ නේ. සේවය කරන්න. මුලදී හම්බ වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 93(1) -

*"ගෘහ කාරක සභාවේ වගකීම විය යුත්තේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, අයිතිවාසිකම්, අවශ්‍යතා සලකා බලා කටයුතු කිරීම වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 93(2)

*"කාරක සභාව විසින් අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර මන්ත්‍රීවරුන්ගේ අයිතීන් හා වරප්‍රසාද පිළිබඳව සහන සලසා දීමට කටයුතු කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 93(3) -

*"ගෘහ කාරක සභාව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාව.

රීති අංක 94(1) -

*"පළාතේ වියදම් දැරීම සඳහා සභාව විසින් දෙනු ලැබ ඇති මුදල් විසර්ජනය කොට ඇති ආකාරය දක්වන ගිණුම් ද සභාවට ඉදිරිපත් කොට ඇති වෙනත් ගිණුම් ද ඒ ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව සමඟ පරීක්ෂා කර බැලීම පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ කාර්යය විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 94(2) -

*"පළාත් සභා අරමුදලින් ප්‍රතිපාදන ලබන පළාතේ යම් අමාත්‍යාංශයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් ආයතනයක හෝ පරීක්ෂා කරන ලද ගිණුම් මූල්‍ය තත්ත්වයන්, කාර්යය සාධනය, මූල්‍ය කටයුතු පිළිබඳ කාර්ය පටිපාටි හා සාමාන්‍ය කළමනාකාරීත්වය ගැන ද, ඒ සම්බන්ධයෙන් පැන නගින කරුණුත් පිළිබඳව කාරක සභාව විසින් සභාවට වාර්තා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 94(3) -

*"කාරක සභාව විසින් නියම කරනු ලබන කවර හෝ අමාත්‍යාංශයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත්*

*ආයතනයක හෝ සියලුම ගිණුම්, මුදල් තත්ත්වය හා කළමනාකාරිත්වය පිළිබඳව පරික්ෂා කර පළාත් සභාවට වාර්තා කිරීම සඳහා කාරක සභාවට අවශ්‍ය යැයි හැඟී ගිය විටෙක කාරක සභාවේම සාමාජිකයන්ගෙන් සමන්විත අනු කාරක සභා පත් කිරීමට කාරක සභාවට හැකි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 94(4) -

*"කාරක සභාවට හෝ කාරක සභාව විසින් බලය දෙනු ලබන එහි අනුකාරක සභාවකට හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ ඕනෑම පුද්ගලයකු කැඳවා ප්‍රශ්න කිරීමට හෝ කිසියම් පත්‍රිකා, පොත්පත් වාර්තා හෝ පළාත් සභාවේ අමාත්‍යාංශයක ලිපි ලේඛන ආදිය ගෙන්වා පරික්ෂා කිරීමට හා එවැනි ඕනෑම අමාත්‍යාංශයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් ආයතනයක ගබඩා දේපළ ආදියට ඇතුළු වීමට හෝ බලය තිබිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කිරීම.

රීති අංක 95(1) -

*"ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාවට යොමු කිරීම සඳහා එවන ලද විගණකාධිපතිවරයාගේ වාර්තාව සභාපතිවරයා විසින් පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබුවායින් පසුව එය පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කිරීම සිදු විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 95(2)

*"පළාත් සභාව යටතේ ඇති යම් අධිකාරියක යම් වර්ෂයක ගිණුම්ද සමග එම අධිකාරිය විසින් අදාළ අමාත්‍යවරයා වෙත වාර්ෂික වාර්තාව සභාපතිතුමාට පිටපතක් සහිතව ඉදිරිපත් කළ යුතුය. සභාපතිවරයා විසින් එකී ගිණුමේ සහ වාර්ෂික වාර්තාවේ පිටපතක් සෑම මන්ත්‍රීවරයෙකු වෙතම ලබා දිය යුතුය. අදාළ අමාත්‍යවරයා විසින් පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව එය පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කිරීම සිදු විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවදි කාරක සභාව.

රීති අංක 96 (1) -

අවදි කාරක සභාවේ මූලික වගකීම විය යුත්තේ,

*(අ) "පළාත් සභාවේ ප්‍රතිපාදන යොදවා කරන්නා වූ ව්‍යාපෘතිවල ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම හා නාස්තිය වළක්වා ගැනීම සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයාට නිර්දේශයන් ඉදිරිපත් කිරීම සහ,*

*(ආ) "එකී ව්‍යාපෘති පිළිබඳව සභාපතිවරයාට මන්ත්‍රීවරුන්ගෙන් හා මහජනයාගෙන් ලැබෙන පැමිණිලි පරික්ෂා කර බලා, අවශ්‍ය යැයි තීරණය කරනු ලබන නිර්දේශයන් ඉදිරිපත් කරමින්, ඒ ගැන අදාළ අමාත්‍යවරයා දැනුවත් කිරීම වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 96 (2) -

*"අවදි කාරක සභාවට ඉහත 94(1) වගන්තියේ සඳහන් ව්‍යාපෘති සම්බන්ධව පළාත් සභාව යටතේ සේවය කරන ඕනෑ ම පුද්ගලයකු හෝ පළාත් සභා විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරන ඕනෑම නිලධාරියෙකු හෝ පුද්ගලයෙකු හෝ කැඳවා ප්‍රශ්න කිරීමටත්, පත්‍රිකා පොත්පත් වාර්තා ලිපි ලේඛන ආදිය ගෙන්වා පරීක්ෂා කිරීමටත්, වැඩ බිම් හා දේපළ ආදිය පරීක්ෂා කිරීමටත් බලය තිබිය යුතු ය. මේ කාර්යයන් කිරීම සඳහා පහසුකම් සහා ලේකම් කාර්යාලයෙන් සැපයිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 96 (3) -

*"අවශ්‍ය යැයි හැඟෙන සෑම අවස්ථාවකදී ම අවදි කාරක සභාව රැස් විය යුතු අතර අවදි කාරක සභාවට ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලැබූ පෙත්සම්, චෝදනා හා යෝජනා සලකා බලා නිර්දේශයන් ද ලබා දීම කාරක සභාවේ වගකීම වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 96 (4) -

*"අවදි කාරක සභාව සිය කාර්යයන් පිළිබඳව ඊළඟට පැවැත්වෙන ආසන්නත ම පළාත් සභාවට වාර්තා කළ යුතු ය. එම කාරක සභාව විසින් අමාත්‍යවරයෙකුට ඉදිරිපත් කරන ලද නිර්දේශ හෝ උපදෙස් හෝ එම වාර්තාවට ඇතුළත් විය යුතු ය. එවැනි වාර්තාවක් පළාත් සභාවේදී සාකච්ඡාවට භාජනය කරන ලෙසට ඉල්ලා සිටීමට මන්ත්‍රීවරයකුට අයිතියක් තිබිය යුතු ය. එවැනි අවස්ථාවලදී ඒ සඳහා දිනයක් නියම කිරීම පළාත් සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව.

රීති අංක 97(1) -

*"පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාවේ කාර්ය භාරය විය යුත්තේ, පළාත් සභාවට රැස් කළ හැකි ආදායම් මාර්ග හඳුනා ගැනීම සහ එකී ආදායම් මාර්ග ඔස්සේ ආදායම් රැස් කිරීම සඳහා සම්පාදනය කළ යුතු ප්‍රඥප්ති සහ රීති සෑදීම සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දීම, ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය විමසා බැලීම සහ ඒවා රැස් කිරීම කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීමය"*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 97(2) -

*"පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාවට ඉහත වගන්තිය පරිදි කටයුතු කිරීමේදී පළාත් සභාව යටතේ සේවය කරන ඕනෑම නිලධාරියෙකු හෝ සේවකයෙකු කැඳවා ප්‍රශ්න කිරීමටත්, පොත්පත්, වාර්තා, ලිපි ලේඛන, ගෙන්වා පරීක්ෂා කිරීමටත් කාර්යාල වෙත ගොස් ඒවා පරීක්ෂා කිරීමටත් බලය තිබිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 97(3) -

*"අවශ්‍ය යැයි හැඟෙන සෑම අවස්ථාවකදීම ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාව රැස් විය යුතු අතර මෙම කාරක සභාවට ගරු මන්ත්‍රීවරුන් යොමු කරනු ලබන කරුණු සහ යෝජනා සලකා බලා නිර්දේශයන් ලබා දීම කාරක සභාවේ වගකීම වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 97(4) -

*"ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාවේ වාර්තාව කාරක සභාව පවත්වා මාසයක් ඇතුළත පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු අතර එවැනි වාර්තාවක් පළාත් සභාවේදී සාකච්ඡාවට භාජනය කරන ලෙස ඉල්ලා සිටීමට මන්ත්‍රීවරයෙකුට අයිතියක් තිබිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලුම අධිකාරී, ආයතන විමසුම් කාරක සභාව.

රීති අංක 98 -

*"පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලුම අධිකාරී ආයතන විමසුම් කාරක සභාවේ කාර්යභාරය විය යුත්තේ මෙම අධිකාරී, ප්‍රඥප්තියේ සඳහන් අරමුණු හා පරමාර්ථය අනුව කටයුතු කිරීම පිළිබඳව පරීක්ෂා කර බලා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමත්, එම අධිකාරී විසින් ක්‍රියාත්මක කරන්නා වූ ව්‍යාපෘතිවල ඵලදායීත්වය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම හා නාස්තිය වළක්වා ගැනීම සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීමත් සහ එම අධිකාරී විසින් කරන්නා වූ කාර්යයන් පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් සහ මහජනයාගෙන් ලැබෙන පැමිණිලි පරීක්ෂා කර බලා අවශ්‍ය යැයි සලකනු ලබන නිර්දේශයන් සභාව වෙත ඉදිරිපත් කිරීමත් වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 99 -

*"මෙම කාරක සභාව සඳහා ද 97(2), 97(3) හා 97(4) රීතීන් ද බල පවත්වන බව සැලකිය යුත්තේය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විශේෂ කාරක සභා.

රීති අංක 100 -

*"පළාත් සභාවේ සම්මත වන යෝජනාවක් අනුව යම් නිශ්චිත කාර්යයක් හෝ කාර්යයන් ගැන ක්‍රියා කිරීම සඳහා විශේෂ කාරක සභා පත් කිරීමට සභාපතිවරයාට හැකි විය යුතුය. එම කාරක සභා සඳහා ද අනෙකුත් කාරක සභා සම්බන්ධ පොදු රීතීන් අදාළ විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිල බලයෙන් කාරක සභාවලට පත් වීම්.

රීති අංක 101(1) -

*"නිල බලයෙන් කාරක සභාවලට පත් වීම් සිදු විය යුතු ආකාරය පහත සඳහන් වේ."*

කාර්ය පටිපාටි රීති කාරක සභාව.

රීති අංක 101(1)(අ) -

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික
සභානායකවරයා - සාමාජික
විපක්ෂ නායකවරයා - සාමාජික
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක - සාමාජික
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක - සාමාජික

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු පිළිබඳ කාරක සභාව.

රීති අංක 101(1)(ආ) -

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික
සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා - සාමාජික
සභානායකවරයා - සාමාජික
විපක්ෂ නායකවරයා - සාමාජික
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා - සාමාජික
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා - සාමාජික

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගෘහ කාරක සභාව.

රීති අංක 101(1)(ඇ) -

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික
සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා - සාමාජික
සභානායකවරයා - සාමාජික
විපක්ෂ නායකවරයා - සාමාජික
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා - සාමාජික
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා - සාමාජික

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්ති හා නීති කාරක සභාව.

රීති අංක 101(1)(ඈ) -

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති
පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව.

රීති අංක 101(1)(ඉ)

මුදල් විෂය භාර අමාත්‍යවරයා - සභාපති

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහජන පෙත්සම් කාරක සභාව

රීති අංක 101(1)(ඊ) –

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති

පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවදි කාරක සභාව.

රීති අංක 101(1)(උ) -

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති

පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් ආදායම් ප්‍රවර්ධන කිරීමේ කාරක සභාව.

රීති අංක 101(1)(ඌ) -

මුදල් විෂය භාර අමාත්‍යවරයා - සභාපති

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභා ප්‍රඥප්තියකින් ස්ථාපිත සියලුම අධිකාරී, ආයතන විමසුම් කාරක සභාව.

රීති අංක 101(1)(එ) -

පළාත් සභාවේ සභාපතිවරයා - සභාපති

පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා - සාමාජික

සභානායකවරයා - සාමාජික

විපක්ෂ නායකවරයා - සාමාජික

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 101(2)

*"පළාත් සභාවේ සභාපතිවරයා යම් කාරක සභාවක සභාපතිවරයා වශයෙන් සිටියදී නියෝජ්‍ය සභාපතිවරයා එහි සාමාජිකයෙකු වශයෙන් සිටින්නේ නම්, සභාපතිවරයා නොපැමිණ සිටින අවස්ථාවක නියෝජ්‍ය සභාපතිවරයා මූලාසනය ගත යුතුය. ඒ දෙදෙනාම නොපැමිණ සිටින අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් කෙනෙකු මූලාසනය සඳහා පත් කර ගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 101(3) -

*"පළාත් සභා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ හා පළාත් ආදායම් ප්‍රවර්ධනය කිරීමේ කාරක සභාවේ සභාපතිවරයා මුදල් විෂය භාර අමාත්‍යවරයා විය යුතු නමුත්, ඔහු වෙනුවෙන් කටයුතු කර ගෙන යෑමට වෙනත් මන්ත්‍රීවරයෙකු නම් කිරීමට ඔහුට හැකි විය යුතුය. එවැනි නම් කිරීමක් වේ නම් එය පළාත් සභාවේ සභාපතිවරයාට දැනුම් දී සභාවේ නිවේදනය කිරීමෙන් පසුව වලංගුභාවයට පත් වන්නේය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අයිවැය. රීති අංක 102(1) -

*"මෙම රීතියෙහි (5) වන අනු රීතියේ දැක්වෙන අන්දමට කරුණු යෙදුණු විටදී හැර, මුදල් වර්ෂයක අවසානයෙන් පසු එම වර්ෂයේ ප්‍රයෝජනය සඳහා මෙහි මින් මතු අයිවැය යනුවෙන් හඳුන්වනු ලබන මුදලක් දීම පිණිස යෝජනාවක් නොපිළිගත යුතු ය"*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 102(2) -

*"වැඩ සටහනක කිසියම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් දරන ලද කිසියම් අයිවැයක් ඇතොත්, එය පරීක්ෂා කර එම අයිවැය දරා ඇත්තේ වැඩ සටහන සම්බන්ධයෙන් ද නැතහොත් එම වැඩ සටහනෙහි ව්‍යාපෘති එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් පමණක් දැයි ස්වකීය වාර්තාවෙහි ප්‍රකාශ කිරීමට පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට කරනු ලබන නියමයක් විය යුත්තේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 102(3) -

*"අයිවැය සිදු වී ඇත්තේ ව්‍යාපෘති එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් පමණක් නම් එම අයිවැය දරා ඇත්තේ නිසි බලය සහිතව හා අරපරිස්සම ගැන පරීක්ෂාකාරීව ද යනු සොයා බලා කාරක සභාව සෑහීමකට පත් වෙයි නම් ඒ අනුව වාර්තා කළ යුතු ය. ඊට වැඩිමනක් අනුමැතියක් එම අයිවැය සඳහා අවශ්‍ය නොවිය යුතුය. එතෙකුදු වුවත්, අයිවැය සිදු වී තිබෙන්නේ කිසියම් පෞද්ගලික පඩි නඩි ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් නම් වියදම දරන ලද්දේ එවකට පැවති වැටුප් පරිමාණයන්ට අනුව යැයි ද පෞද්ගලික පක්ෂ භජනයෙන් මුළුමනින්ම තොරව යැයි ද, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව සෑහීමකට පත් විය යුතුය. පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව එලෙස සෑහීමකට පත් වෙයි නම් ඒ අනුව වාර්තා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 102(4) -

*"පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව එලෙස සෑහීමකට පත් නොවේ නම් එම අයිවැය තමන් අනුමත නොකරන බව හෝ තමන්ට සුදුසු යැයි හැඟෙන කවර ප්‍රමාණයක් තමන් අනුමත නොකරන බව හෝ වාර්තා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 102(5) -

*"වැඩ සටහනක් සම්බන්ධයෙන් අයිවැයක් දරා ඇති බව හෝ සමහර වැය විෂයයන් තමන් අනුමත නොකරන බව හෝ පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව වාර්තා කරන සෑම විටම එම අයිවැය හෝ අනුමත නොකරන ලද විෂයයක් සඳහා මුදලක් දීම, මුදල් විෂයය භාර අමාත්‍යවරයා නියම කරන දිනයකදී සලකා බැලීම සඳහා පළාත් සභාව කාරක සභාවකට පරිවර්තනය විය යුතු යැයි යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා එම අමාත්‍යවරයා විසින් එම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරවා ගැනීමට ක්‍රියා කළ යුතු ය. එම අයිවැය අයත් වර්ෂයට පසු වර්ෂයෙහි දෙසැම්බර් 31 වැනි දිනට පසු එවැනි යෝජනාවක් භාර නොගත යුතුය. එතකුදු වුවත්, මෙම රීති මාලාව ක්‍රියාත්මක වීමට නියමිත කෙරෙන දිනයට පෙර වූ දෙසැම්බර් 31 වැනි දිනයට පෙර සිදු වූ අයිවැය පළාත් සභාවෙන් අනුමත කරවා ගැනීමේදී මෙම ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතුය. පළාත්*

*රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශය මත එවැනි අධිවැය සම්මත කිරීමට පළාත් සභාවට හැකි විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 102(6) -

*"අධිවැයක් ඇතිව හෝ නැතිව නිසි බලය නොමැතිව කරන ලද කිසියම් වියදමක් අනුමත නොකිරීමට පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට ඇති බලය මෙම රීතියෙහි ඇති කිසිවකින් අඩු නොවිය යුතුය. මෙම රීතියෙහි (5) වන අනු රීතියේ විස්තර කෙරෙන ක්‍රියා පිළිවෙළ එවැනි අනුමත නොකිරීමක් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අත්තිකාරම් ගිණුම් සීමා ඉක්මවීම.

රීති අංක 103 (1) -

*"කවර හෝ අත්තිකාරම් ගිණුම් කටයුත්තක් සම්බන්ධයෙන් යම් මුදල් වර්ෂයක නීතියෙන් බලය දී ඇති උපරිම සීමාවන් ඉක්මවා යන්නා වූ හෝ අවම සීමාවලට අනුකූල නොවන්නා වූ කිසිම යෝජනාවක් මෙම රීතියෙහි (3) වන අනු රීතියේ දක්වා ඇති අවස්ථාවක් ඇති වූ විටෙක හැර නොපිළිගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 103 (2) -

*"අත්තිකාරම් ගිණුම් උපරිම හෝ අවම හෝ සීමාවන්ට අනුකූල නොවීම නීතියට එකඟව සිදු කර නොමැති කල්හි, එම සීමාවන් එසේ අනුකූල නොවීම සම්බන්ධයෙන් අවසර දිය යුතු ද, නොදිය යුතු දැයි පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් තීරණය කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 103 (3) -

*"අත්තිකාරම් ගිණුම් කටයුතු සීමාවන්ට අනුකූල නොවීම් කිසිවක් වෙතොත් ඒවාට අවසර දිය යුතු ද, නොදිය යුතු දැයි පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව නිර්දේශ කොට ඇති සෑම විටකම හෝ අත්තිකාරම් ගිණුම් කටයුතුවල අවසර නොලත් පාඩු කිසිවක් වෙතොත් ඒවාට අවසර දිය යුතු ද නොදිය යුතු දැයි පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව නිර්දේශ කර ඇති කවර විටෙකදී හෝ එම නිර්දේශ සලකා බැලීම සඳහා පළාත් සභාව කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු බවට යෝජනාවක් මුදල් විෂය භාර අමාත්‍යවරා විසින් තීරණය කරනු ලබන දිනයක සලකා බැලීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැකි ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභාවට අයත් මුදල් සම්බන්ධයෙන් බලය පැවරෙන යෝජනා හෝ ප්‍රඥප්ති.

රීති අංක 104

*"පළාත් සභා අරමුදලින් හෝ වෙන යම් අරමුදල්වලින් හෝ ගෙවිය යුතු මුදල වියදම් කිරීමට, ගෙවිය යුතු යැයි වියදම් නියම කිරීම නැතහොත් කිසියම් බද්දක් පැනවීමට, එවකට තිබෙන බද්දක් අවලංගු කිරීමට, බද්දක් වැඩි කිරීමට, බද්දක් අඩු කිරීමට බලය පැවරෙන යෝජනාවක් හෝ ප්‍රඥප්තියක් හෝ ප්‍රඥප්තියකට ඉදිරිපත් කෙරෙන සංශෝධනයක් හෝ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු*

*ලැබුවහොත් මිස පළාත් සභාව විසින් සලකා බැලීම නොකළ යුතු ය. එවැනි යෝජනාවක් හෝ ප්‍රඥප්තියක් හෝ ප්‍රඥප්තියකට ඉදිරිපත් කෙරෙන සංශෝධනයක් හෝ එසේ ඉදිරිපත් කිරීමට පෙර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව එම අමාත්‍යවරයා පළාත් සභාවට දැන්විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාර්යය සටහන්.

රීති අංක 105(1) -

*"සභාවේ සහ පූර්ණ කාරක සභාවල කාර්ය සටහන් ලේකම් විසින් තබා ගත යුතු අතර, එම කාර්ය සටහන්වල පිටපතක් ඊළඟ සභා රැස්වීම් දින ඔහු විසින් මන්ත්‍රීවරුන් අතර බෙදා දිය යුතුය. එම කාර්ය සටහන්වල පැමිණි/නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නම් සහ සභාවේදී ගනු ලැබූ තීරණයන් සටහන් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 105(2) -

*"සභාවේ හෝ පූර්ණ කාරක සභාවක හෝ බෙදීමක් ඇති වූ විට 60(3) අනු රීතිය යටතේ ප්‍රශ්නයකට පක්ෂව සහ විරුද්ධව දී ඇති ඡන්ද ද, 60(6) රීතිය යටතේ බෙදීමක් හට ගෙන ඇති විට එසේ ඡන්දය දුන් මන්ත්‍රීවරුන්ගේ නම් ද, 60(7) අනු රීති යටතේ ඡන්දය දීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරුන්ගේ නම් ද කාර්ය සටහන්වල ඇතුළත් විය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 105(3) -

*"කාර්ය සටහන් තහවුරු කිරීම අනවශ්‍ය නමුත් එහි සංශෝධනය විය යුතු තැන් ඇතොත් සභාවේ අවසරය මත ඊළඟ රැස්වීමේදී ඉදිරිපත් කෙරෙන යෝජනාවක් මගින් හෝ ඊට පෙර සභාපතිවරයාට ලිඛිතව දැන්වීමෙන් හෝ එසේ වූ විට ඊළඟ රැස්වීම් දින එම නිවැරැදි කිරීම් සටහන් කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිල වාර්තාව.

රීති අංක 106 -

*"කාර්ය සටහන්වලට අමතරව සභාවේ හෝ පූර්ණ කාරක සභාවක කෙරෙන කටයුතුවල සියලු විස්තර ඇතුළත් නිල (හැන්සාඩ්) වාර්තාවක් සභාව සඳහා විය යුතුය. නිල (හැන්සාඩ්) වාර්තාව සකස් කිරීමේදී සභාය කර ගනු පිණිස සභාවේ කෙරෙන සියලු කටයුතු පටිගත කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට ලේකම්වරයා ක්‍රියා කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 107 -

*"එම නිල (හැන්සාඩ්) වාර්තාවේ පිටපත් ලබා ගැනීමට මන්ත්‍රීවරුන්ට අයිතිය ඇත."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 107(අ) -

*"නිල (හැන්සාඩ්) වාර්තාවේ නිවැරදි කිරීමක් අවශ්‍ය වන්නේ නම්, සංශෝධනය විය යුතු තැනක් වෙතොත් ඊළඟ සභා රැස්වීමේදී ඉදිරිපත් කරන ලද යෝජනාවක් මගින් හෝ නිවැරදි කළ හැකිය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 107(ආ) -

*"නිල (හැන්සාඩ්) වාර්තාව සභාගත කිරීමට පෙර වෙනත් මන්ත්‍රීවරයෙකු හෝ මන්ත්‍රීවරුන් විසින් කර ඇති ප්‍රකාශයන්වල පිටපතක් ලබා ගැනීමට හිමිකමක් නොමැත."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පාර්ලිමේන්තුව සමඟ සන්නිවේදනය.

රීති අංක 108 -

*"යෝජිත ඕනෑම ප්‍රඥප්තියක් හෝ නීතියක් සම්බන්ධයෙන් සභාව හා පාර්ලිමේන්තුව අතර ඇති වන සියලුම කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සමඟ ලිඛිතව හා වාචිකව ගනුදෙනු කිරීම සභාව වෙනුවෙන් සභාවේ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සමඟ කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ සීමාවන්.

රීති අංක 109(1) -

*"සභාවේ රැස්වීම පැවැත්වෙන සීමාව සභා ගර්භය ලෙස හැඳින් වේ."*

*සභා ගර්භය ඇතුළත් ගොඩනැගිල්ල පිහිටි භූමිය සභා පරිශ්‍රය ලෙස හැඳින් වේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 109(2)

*"සභා ගර්භයේදී හැර, අන් තැනකදී රැස්වීමට සභාව නීත්‍යානුකූලව කැඳවනු ලැබූ විට එම රැස්වීම සඳහා අවශ්‍ය ඉඩකඩ හා ගොඩනැඟිලි ඇතුළුව එම ස්ථානය එම රැස්වීම පැවැත්වීම සඳහා අවශ්‍ය කාල පරිච්ඡේදය තුළදී සභාවෙහි සීමා ප්‍රදේශය වශයෙන් ගණන් ගනු ලැබේ."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාර්ය පටිපාටි රීති අත්සිටුවීම.

රීති අංක 110 (1) -

*"හදිසියේ කළ යුතුව ඇති අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා කාර්ය පටිපාටි රීති එකක් හෝ කිහිපයක් හෝ බාධාවක් බව පෙනෙන කල්හි ඕනෑ ම අමාත්‍යවරයෙකුට එම රීතිවල අංක සඳහන් කරමින් ඒවා අත්සිටුවීමට යෝජනා කළ හැකි විය යුතුය. සභා රීති අත්සිටුවීමට හේතු වන කාරණය හෝ*

*කාරණා හෝ එම යෝජනාවේ කෙටියෙන් සඳහන් විය යුතු ය.“*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 110 (2) -

*“මන්ත්‍රීවරයෙකුට එවැනි යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය. මන්ත්‍රීවරයෙකුගේ එබඳු යෝජනාවක් තවත් මන්ත්‍රීවරයකු විසින් ස්ථිර කළ යුතුය.“*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 110 (3) -

*“යෝජනාවට පක්ෂවන මන්ත්‍රීවරුන් ගණන ගණපූරණයට අවශ්‍ය ගණනට වඩා අඩු වන්නේ නම්, එම යෝජනාව සම්මත නොවූ ලෙස සැලකිය යුතු ය.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 110 (4)(අ)

*“කාර්ය පටිපාටි රීති අත්හිටුවා ගනු ලබන යෝජනාව හෝ යෝජනාවන් හදිසි යෝජනා ද යන්න සලකා බැලීම සඳහා ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු කාරක සභාව රැස් විය යුතු ය.“*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 110 (4)(ආ) -

*“එසේ වුවද, යම් කරුණක් රටටම හෝ පළාතට බලපාන විශේෂ වැදගත්කමක් ඇති කාරණයක් නම්, එය සභා කටයුතු කාරක සභාවට යොමු නොකොට සභාපතිවරයා තීන්දු කරන්නේ නම්,107(4)(අ) රීතියෙන් බාධාවක් නොවිය යුතු ය.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 110 (5) -

*“110 රීතිය යටතේ අත්සිටුවනු ලබන රීතීන් සම්බන්ධව සලකනු ලබන්නේ සභාපතිවරයා තීරණය කරන පරිදිය.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාර්ය පටිපාටි රීති සංශෝධනය කිරීම.

රීති අංක 111(1) -

*“යෝජිත සංශෝධනයට අදාළ වගන්තිය සඳහන් කරමින් යෝජනාවක් පිළිබඳ දැන්වීමක් ලේකම්වරයාට දීමෙන් කිසියම් මන්ත්‍රීවරයෙකුට මෙම කාර්ය පටිපාටි රීති සංශෝධනය සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය.”*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 111(2) -

*"එවැනි යෝජනාවක් ඉදිරිපත් කොට ස්ථිර කරනු ලැබූ විට එය කාර්ය පටිපාටි රීති පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ යුතු ය. කාර්ය පටිපාටි රීති කාරක සභාව විසින් මාසයක් තුළදී පළාත් සභාවට වාර්තා කරන තුරු පළාත් සභාව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම නතර කළ යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 111(3) -

*"එකී වාර්තාව මාසයක් ඇතුළත ඉදිරිපත් නොවන්නේ නම් අදාළ මන්ත්‍රීතුමා සභාවට ඉදිරිපත් කර සභාවේ අනුමැතිය ලබා ගත යුත්තේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාපතිවරයාගේ සාමාන්‍ය අධිකාරිය.

රීති අංක 112(1) -

*"සභාවේ කටයුතු සම්බන්ධයෙන් මෙම රීතිවල විධිවිධාන සලස්වා නොමැති සියලුම කරුණු සම්බන්ධයෙන් තීන්දු ගැනීමේ පූර්ණ බලය සභාපතිවරයාට තිබිය යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 112(2) -

*"ගොඩනැඟිලි පරිපාලනය, ආරක්ෂක විධිවිධාන සහ සභා ගර්භය පිළිබඳ සාමාන්‍ය පරිපාලන බලධාරියා වන්නේ සභාපතිවරයා ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 112(3) -

*"මෙම රීති අනුව සභාපතිවරයා සතු සියලුම බලතල මූලාසනාරූඪ වී සිටින නියෝජ්‍ය සභාපතිවරයාට හෝ මූලාසනාරූඪ වී සිටින වෙනත් මන්ත්‍රීවරයෙකුට හිමි වන්නේ ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 112(4) -

*"9 වන රීතිය මගින් කියවෙන සභාපතිවරයා සතු බලතල සභාපතිවරයාගේ සාමාන්‍ය අධිකාරිය යටතේද ගණන් ගත යුතු ය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අර්ථ නිරූපණය. රීති අංක 113.

*"සභාපතිවරයා" යනුවෙන් අදහස් කෙරෙනුයේ, බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභාපතිවරයා ය.*

*"නියෝජ්‍ය සභාපතිවරයා" යනුවෙන් අදහස් කෙරෙනුයේ, බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා ය.*

*"සභාව" යනුවෙන් අදහස් කෙරෙනුයේ, බස්නාහිර පළාතේ පළාත් සභාව ය.*

*"පොදු කටයුතු" යනුවෙන් අදහස් කෙරෙනුයේ, ඇමතිවරයෙකුගේ නමින් ඉදිරිපත් කෙරෙන පළාත් සභා විෂය පථයට අයත් විෂය කාර්යයක් වේ.*

*"රාජ්‍ය භාෂා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(1) (2) වගන්තිවලින් දී ඇති අර්ථ නිරූපනය අදාළ වේ.*

*"සම්බන්ධීකරණ භාෂා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(3) වගන්තිවලින් දී ඇති අර්ථ නිරූපනය අදාළ වේ.*

*"ලේකම්වරයා" යනුවෙන් අදහස් කෙරෙනුයේ, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා ය.*

*"සැසිවාරය" යනුවෙන් අදහස් කරනුයේ, සෑම වසරකම රැස්වීම පැවැත්වෙන දිනෙන් පටන් ගෙන සෑම වර්ෂයකම එම වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලය යි.*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අංක 114 -

*"මෙම රීති සංග්‍රහයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය."*

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනික් පැත්තේ පරිශිෂ්ටය තිබෙනවා.

***පරිශිෂ්ටය***

1. *9 රීතියේ 4 වන උප රීතිය යටතේ පහත සඳහන් ආකාරයට සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක විය යුතුය.*

*(අ) 76 වන රීතිය යටතේ සභාවේ කටයුතු විධිමත් කිරීම හෝ අර්ථ නිරූපණය සම්බන්ධයෙන් රීති ප්‍රශ්නයක් මතු කල කල්හි සභාපතිවරයා විසින් එකී ප්‍රශ්නය සම්බන්ධයෙන් එකල්හිම හෝ සභා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කොට අදාළ ප්‍රශ්නයට විසඳුමක් ලබා දිය යුතුය. අදාළ ප්‍රශ්නය සභා කටයුතු කාරක සභාවට යොමු කරන ලද අවස්ථාවක අදාළ කාරක සභාව ඒ පිළිබඳ තීරණය ඉදිරියේදී සභාව පැවැත්වෙන පළමු අවස්ථාවේදී සභාපතිවරයා මගින් සභාවට දැනුම් දිය යුතුය.*

*(ආ) 77 වන රීතිය යටතේ දැක්වෙන කරුණක් සම්බන්ධයෙන් අදාළ මන්ත්‍රීවරයාගේ කථාව හෝ අවිනීත හැසිරීම නතර කරන ලෙස සභාපතිවරයා විසින් දැනුම් දීමෙන් අනතුරුව තවදුරටත් සභාපතිවරයාගේ තීරණය උල්ලංඝනය කරනු ලබන අවස්ථාවකදී අදාළ මන්ත්‍රීවරයා සම්බන්ධයෙන් 79 රීතියට අනුව කටයුතු කිරීම සඳහා පක්ෂ නායකයින්ගේ රැස්වීමක් සභා කටයුතු තාවකාලිකව අවසන් කොට කැඳවිය යුතු අතර එකී රැස්වීමේදී අදාළ මන්ත්‍රීවරයාගේ හැසිරීම සාකච්ඡා කොට සමතයකට පත් කළ යුතුය.*

*යම් හෙයකින් පක්ෂ නායකයින්ගේ රැස්වීම තුළ අදාළ සමතයට එළැඹීමට නොහැකි වන්නේ නම් එකී මන්ත්‍රීවරයාට අදාළව පියවරක් ගැනීම සඳහා අදාළ කරුණ සහ කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය. එකී සභා කටයුතු පිළිබඳ කමිටුවේ තීරණය මත අදාළ මන්ත්‍රීවරයා සභා කටයුතුවලින් එම දිනයේදී සහ/හෝ ඉදිරි සභා වාර තුනක උපරිමයකට යටත්ව සභා සහභාගීත්වය හෝ ඉවත් කරීමට සභාපතිවරයා නියෝග කළ හැකිය.*

2. *9 වන රීතියේ 5 වන උප රීතියට අනුව කාරක සභාවට කැඳවන නිලධාරීන් කැඳවීමේ නියෝග කඩ කරන අවස්ථාවක අදාළ නිලධාරියා අයත් අමාත්‍යාංශයේ ලේකම්වරයා හට ඒ පිළිබඳව විනයානුකූලව කටයුතු කර නියමිත කාලයක් ඇතුළත තමා වෙත වාර්තා කරන ලෙස දන්වා සිටීමේ බලය සභාපතිවරයාට ඇත්තේය.*

3. *9 වන රීතියේ 6 වන උප රීතිය යටතේ පනවා ඇති රීතියක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් උද්ගත වන කල්හි සභාපතිවරයාට පවතින බලයට යටත්ව අදාළ කරුණ පිළිබඳව උපදේශයක් නීති හා ප්‍රඥප්ති කමිටුවෙන් ලබා ගැනීමට යොමු කළ හැකිය.*

4. *4 වන රීතියේ 10 වන උපරීතිය අනුව වරප්‍රසාද ප්‍රශ්නයක් නැඟූ කළ ඒ පිළිබඳ කටයුතු කිරීමේ සභාපතිවරයා සතු පූර්ණ බලතලවලට යටත්ව ඇතැම් අවස්ථාවලදී අදාළ වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් එනයින්ම ක්‍රියා කිරීමේ බලතල සභාපතිවරයා සතු වේ. යම් හෙයකින් එලෙස කටයුතු නොකරන අවස්ථාවකදී අදාළ වරප්‍රසාද කඩ කිරීම සභාපතිවරයා විසින් වරප්‍රසාද කමිටුව වෙත යොමු කළ යුතු අතර, අදාළ වරප්‍රසාදය හදිසි තත්ත්වයක් මත පැන නඟින්නක් නම් සහා කටයුතු අත්හිටුවා අදාළ කරුණ පිළිබඳව තම තීරණය එම දිනයේදීම ලබා දීම හෝ වෙනත් තත්ත්වයකදී යොමු කෙරෙන වරප්‍රසාද ප්‍රශ්නයක් නම් සභාවේ ඉදිරියේදී රැස්වන පළමු අවස්ථාවේදීම සභාපතිවරයා හරහා සභාවට දැනුම් දීම වරප්‍රසාද කමිටුවේ වගකීම වේ.*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ෆෝන් ගේන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. බැහැ. ෆෝන් ගේන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇයි ඒ? Off කරන් එන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරදරයි නේ? එතකොට කට්ටිය ෆොටෝ ගහනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

හරි නේද එහෙමනම්?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. තව පොඩ්ඩක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

විරෝධය ලියා ගන්න කිව්වා නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒකට ඡන්දයක් ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඡන්දයක් ගන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවේ එකඟතාවය අහලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

විරෝධය පාලා කියලා ලියා ගමු කෝ ඉතින්. සාධාරණව යන්න කෝ ඉතින්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම හරි යන්නේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. නැහැ. ඡන්දය ගන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

එතුමා මුලින් කිව්වෙත් ඒ කථාව නේ ඉස්සෙල්ලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

බෙදීම ගන්න එපැයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අයිතිවාසිකම නැහැ, අපට.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ලක්ෂමන් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ විරෝධතාවය සටහන් කරලා -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඡන්දයක් ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඒක නීත්‍යානුකූල වෙන්නේ නැහැ. අපේ විරෝධතාවය සටහන් කළයි කියලා. එහෙම වෙන්නේ නැහැ. මේක හරියට වෙන්නේ - අපි ඒක මතු කරලා තියෙන්නේ. ඒක නිසා ඒකට ඡන්දයක් ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කට්ටිය නැහැ. අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපට ඡන්දයකට යන්න බැහැ. අපට යන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ කාරක සභා අවස්ථාව නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒත් අපට යන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

කවුරුහරි ඉන්නවාද බලන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

නැහැ. නැහැ. කට්ටිය ඔක්කොම ගියා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මොකද, මෙහෙමයි අපි වැරැද්දක් කළා වෙනවා. ඇත්තටම අපට ඒ වැරැද්ද කරන්න බැහැ. මොකද දැන් මේකේ හැම එකක්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා ඉන්නවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අර පනතින් හා ව්‍යවස්ථාවෙන් වෙනස් කරගන්න බැරි දෙයක් අප ගත්තේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඡන්ද විමසීම ඊළඟ දවසට තියමු.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අද ඉවර කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම පුළුවන්ද? පල්ලෙහා කවුරු හරි භෝජනාගාරයේ ඉන්නවාද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

කවුරුත් නැහැ. භෝජනාගාරයේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සටහන් කරලා -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

සටහන් කරලා කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. ඒ අනුව කාර්යපාටිපාටි රීති සංශෝධන සහිතව සභා සම්මත වූ බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ලක්ෂ්මන් ගරු මන්ත්‍රීතුමා, ජනවාරි 01 වැනිදා සිට ක්‍රියාත්මක කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ජනවාරි 01 වැනිදා මේක ක්‍රියාත්මක කරනවා. පූර්ණ කාරක සභාව පළාත් සභා අවස්ථාවට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 02.31 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 02.31 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත***

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රය අනුව අපි මුලින් කිව්වත් පසුව ගන්නවා කියලා. කණ්ඩායම් නායකයෝ සහ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස් වී අපි හදිසියේම තීරණය කළා ගරු ආණ්ඩුකාරතුමා විසින් එවන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත අදම ගන්න. ඒ සම්බන්ධයෙන් සභාවේ බෙදීමක්, සංශෝධනයක් තිබෙනවාද? බෙදීමක් නැහැ. සංශෝධන මොකුත් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

නැහැ. නැහැ. මොකුත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව එම පනත් කෙටුම්පත සභාවේ සම්මත වූ බවට මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි නැවත වරක් ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කාර්යපටිපාටි රීති කාරක සභාවේ මම හිතන්නේ සභා රැස්වීම් 47 ක් පැවැත් වූවා. 1997 ට පස්සේ, අවුරුදු 20 කට පස්සේ තමයි මේ රීති සංශෝධනයක් වුණේ. ඒ නිසා විශේෂයෙන්ම අපේ ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම විශාල කැප කිරීමක් කළා. ඒ සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහයෝගය ලැබුණා. අද දවසේත් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා ඉතා වැදගත් අදහස් ප්‍රකාශ කරමින්, සංශෝධන ඉදිරිපත් කරමින්, -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ශ්‍රීනාත් මන්ත්‍රීතුමාගේ එක එක්සත් ජාතික පක්ෂයේ නායකයාට ලියලා යවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ වාගේම විශේෂයෙන් අපේ ගරු ආණ්ඩුකාරතුමා අපට විශාල සහයෝගයක් දැක් වූවා. ගරු ආණ්ඩුකාරතුමා, ආණ්ඩුකාර ලේකම්තුමා ඇතුළු සියලු දෙනාටත්, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ප්‍රධාන ලේකම් කාර්ය මණ්ඩලයට, ඒ වාගේම අමාත්‍යවරුන්ට, අමාත්‍යාංශ ලේකම්වරුන්ට, විශේෂයෙන්ම අපේ සභා ලේකම්තුමා ඇතුළු අපේ කාර්ය මණ්ඩලයට, නීති නිලධාරී පාලිත අබේවර්ධන මහත්මාට සහ අනිකුත් අයට ස්තූතිවන්ත වෙනවා. අද දවසට අදාළ න්‍යාය පත්‍රය මෙයින් අවසන් වෙනවා.

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව මෙම සභාව 2017 නොවැම්බර් මස 21 වැනි දින තමයි ආරම්භ වෙන්නේ. එදාට න්‍යාය පත්‍රයේ වෙන කිසිවක් නැහැ. මහ ඇමැතිතුමාගේ මුදල් ප්‍රකාශය ඉදිරිපත් කිරීම තිබෙන්නේ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලා අනිවාර්යයෙන්ම ගණපූරණය තිබෙන්නට ඕනෑ. ඒ නිසා අපේ සංවිධායකවරුන්ට මතක් කරනවා. ගණපූරණය තියා ගන්න අපි උත්සාහ කරමු. ඒ අනුව දැන් මම මෙම ගරු සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.34 ට, 2017 නොවැම්බර් මස 21 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 02.34 p.m till 9.30 a.m. on 21.11.2017*